**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**අටවැනි පාර්ලිමේන්තුවේ**
***සිව්වන* සැසිවාරය**

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 117

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

දෙවන වාර්තාව
(2019.02.20 දින සිට 2019.11.07 දක්වා විමර්ශන)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු **ලසන්ත අලගියවන්න** මහතා විසින්

2020 පෙබරවාරි මස 18 වන දින ඉදිරිපත්කරන ලදී.

අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වන සැසිවාරය

## **<u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>**

ගරු ලසන්ත අලගියවන්න මහතා (සභාපති)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

අටවැනි පාර්ලිමේන්තුවේ තුන්වන සැසිවාරය

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය**

(වාර්තාවේ ඇතුළත් විමර්ශන කාල සීමාවේදී)

ගරු ලසන්ත අලගියවන්න මහතා (සභාපති)

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු පාලිත රංගේ බණ්ඩාර මහතා

ගරු එස්.ශ්‍රීතරන් මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු චන්දිම ගමගේ මහතා (2019.10.22 දක්වා)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු (මහචාර්ය) ආශු මාරසිංහ මහතා (2019.10.23 සිට)

# පටුන

**පිටු අංකය**


- වාර්තාව 01
- විශේෂිත නිරීක්ෂණ 07
- පොදු නිරීක්ෂණ 09
- විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු, නිරීක්ෂණ හා නිර්දේශ 11
- ඇමුණුම 01 170
- ඇමුණුම 02 180
- ඇමුණුම 03 182
- ඇමුණුම 04 183
- ඇමුණුම 05 193
- ඇමුණුම 06 208
- ඇමුණුම 07 220
- ඇමුණුම 08 233
- ඇමුණුම 09 236
- ඇමුණුම 10 242
- ඇමුණුම 11 243
- ඇමුණුම 12 247
- ඇමුණුම 13 249
- ඇමුණුම 14 255
- ඇමුණුම 15 257
- ඇමුණුම 16 260
- ඇමුණුම 17 262
- ඇමුණුම 18 265
- සූචිය 266

# වාර්තාව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව එහි අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වන සැසිවාරයේ දෙවන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

8 වැනි පාර්ලිමේන්තුවේ තුන්වන සැසිවාරය තුළදී 2019.02.20 දින සිට 2019.11.07 දින දක්වා කාලසීමාව තුළ කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශනයන්ට අදාළව එක් එක් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද වාචික හා ලිඛිත පැහැදිලි කිරීම්, ඒ සඳහා කාරක සභාව විසින් සිදු කරන ලද නිරීක්ෂණ, ලබා දෙන ලද නිර්දේශ හා නියෝග මෙන්ම කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද පොදු නිරීක්ෂණද මෙම වාර්තාවේ අන්තර්ගත කර ඇත.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශන 42 කට අදාළ කරුණු මෙම වාර්තාවේ අංඩගු වේ.

**2019.02.20 දින සිට 2019.11.07 දින දක්වා කාලසීමාව තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතන හා සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාල සීමාව**

| | ආයතනය | විමර්ශනය කරන ලද දිනය | සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව / පූර්ව කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය/ වර්තමාන කාර්යසාධනය |
|---|---|---|---|
| 01 | මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2019 පෙබරවාරි 20 | 2014, 2015, 2016 වර්ෂ සහ වර්තමාන කාර්යසාධනය |
| 02 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2019 පෙබරවාරි 20 | පූර්ව කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා වර්තමාන කාර්යසාධනය |
| 03 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 2019 පෙබරවාරි 22 | 2013, 2014, 2015 හා 2016 වර්ෂ සහ වර්තමාන කාර්යසාධනය |
| 04 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 2019 මාර්තු 06 | පූර්ව කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |
| 05 | ශ්‍රී ලංකා රේගුව | 2019 මාර්තු 07 | 2013, 2014, 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |

| | | | |
|---|---|---|---|
| 06 | සුරාබදු දෙපාර්තමේන්තුව | 2019 මාර්තු 08 | 2013, 2014,2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 07 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 2019 මාර්තු 12 | 2013, 2014, 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 08 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 2019 මාර්තු 19 | 2013, 2014, 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 09 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 2019 මාර්තු 21 | වර්තමාන කාර්යසාධනය |
| 10 | අධ්‍යාපන අමාත්‍යාංශය | 2019 මාර්තු 22 | 2017 වර්ෂය හා වර්තමාන කාර්යසාධනය |
| 11 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2019 මැයි 07 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර ක්‍රියාත්මක කිරීමට යෝජිත ස්වයංක්‍රීය පරිගණක සැසඳුම් පද්ධතියේ කටයුතු ප්‍රමාද වීම පිළිබඳ සොයාබැලීමේ සාකච්ඡාව |
| 12 | අධ්‍යාපන අමාත්‍යාංශය | 2019 මැයි 09 | සිසුන්ගේ කායික හා මානසික සමබරතාවය පිළිබඳ පරිගණක දෘශ්‍ය වැඩසටහන |
| 13 | වයඹ පළාත් සභාව | 2019 මැයි 21 | 2015,2016,2017 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 14 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 2019 මැයි 23 | පරිගණක දෘශ්‍ය වැඩසටහන |
| 15 | සබරගමුව පළාත් සභාව | 2019 ජුනි 07 | 2015,2016,2017 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 16 | මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 2019 ජුනි 07 | 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |

| | | | |
|---|---|---|---|
| 17 | දුම්රිය දෙපාර්තමේන්තුව | 2019 ජුනි 21 | 2013, 2014, 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 18 | දිඹුලාගල ප්‍රාදේශීය සභාව | 2019 ජූලි 11 | 2014, 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 19 | අධ්‍යාපන අමාත්‍යාංශය | 2019 අගෝස්තු 08 | පූර්ව කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා වර්තමාන කාර්යසාධනය |
| 20 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 2019 අගෝස්තු 21 | 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 21 | බස්නාහිර පළාත් සභාව | 2019 අගෝස්තු 22 | 2017 වර්ෂය හා වර්තමාන කාර්යසාධනය |
| 22 | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | 2019 අගෝස්තු 23 | 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 23 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2019 සැප්තැම්බර් 04 | පූර්ව කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා වර්තමාන කාර්යසාධනය |
| 24 | මධ්‍යම පළාත් සභාව | 2019 සැප්තැම්බර් 05 | 2015, 2016,2017 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 25 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2019 සැප්තැම්බර් 06 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 302 කාණ්ඩය යටතේ පසුකාලීනව ලියාපදිංචි කරන ලද වාහන 10 පිළිබඳ විමර්ශනයේ වර්තමාන තත්වය |
| 26 | උතුරු මැද පළාත් සභාව | 2019 සැප්තැම්බර් 18 | 2015, 2016,2017 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 27 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 2019 සැප්තැම්බර් 19 | වර්තමාන කාර්යසාධනය |

| | | | |
|---|---|---|---|
| 28 | ශ්‍රී ලංකා රේගුව | 2019 සැප්තැම්බර් 20 | පූර්ව කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා වර්තමාන කාර්යසාධනය |
| 29 | උතුරු මැද පළාත් සභාව | 2019 සැප්තැම්බර් 24 | උතුරු මැද පළාත් සභාවේ වකුගඩු රෝගී ගැටළුව හා RO පද්ධති පිළිබඳ පරීක්ෂා කිරීම |
| 30 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2019 ඔක්තෝම්බර් 23 | පූර්ව කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා වර්තමාන කාර්යසාධනය |
| 31 | බස්නාහිර පළාත් සභාව | 2019 නොවැම්බර් 07 | වත්තල මාබෝල නගර සභාවේ පර්චස් 79ක ඉඩම විකිණීම සම්බන්ධව විශේෂ කාරක සභා රැස්වීම |

**විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ විමර්ශන/ කාර්යසාධන වාර්තා සම්බන්ධයෙන් කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශන**

| | විශේෂිත කරුණ | විමර්ශනය කරන ලද දිනය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාර්යසාධන විගණන වාර්තාව | 2019 පෙබරවාරි 21 |
| 02 | කිරි ගවයින් ආනයන ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019 මාර්තු 21 |
| 03 | කොළඹ මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව විශේෂ විගණන වාර්තාව | 2019 මාර්තු 22 |
| 04 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව පරීක්ෂාව | 2019 මාර්තු 27<br>2019 මැයි 08<br>2019 මැයි 24 |
| 05 | සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019 මාර්තු 29 |
| 06 | විලත්තියිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය සම්බන්ධයෙන් වන විශේෂ විගණන වාර්තාව | 2019 මැයි 10 |
| 07 | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019 මැයි 22 |

| | | |
|---|---|---|
| 08 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය විසින් සිදු කරනු ලබන වෛද්‍ය සැපයීම්, සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019 ජුනි 06 |
| 09 | ආබාධිත පුද්ගලයන් අධ්‍යාපනික හා වෘත්තීය වශයෙන් සවිබල ගැන්වීම වෙනුවෙන් රාජ්‍ය ආයතනවල මැදිහත් වීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019 සැප්තැම්බර් 06 |

# විශේෂිත නිරීක්ෂණ

### 1. *මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*

302 කාණ්ඩය යටතේ පසුකාලීනව ලියාපදිංචි කර ඇති වාහන සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය කරන ලිපිගොනු කොළඹ වංචා විමර්ශන ඒකකය විසින් දිගින් දිගටම ඉල්ලුම කළද, ඒවා මෙම විමර්ශනය පැවැත්වෙන 2019 පෙබරවාරි මාසය වන විටද එම ඒකකය වෙත භාර දී නොමැති බව අනාවරණය විය.

මේ පරීක්ෂණ කටයුතු කරගෙන යාම සඳහා සහයෝගය ලබා දෙන ලෙසට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී වෙත දැඩි ලෙස අවවාද කළ කාරක සභාව, ආයතන මට්ටමින්ද මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීමේ වැදගත්කම අවධාරණය කළේය.

### 2. *දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

බදු ගෙවන්නන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබා දෙනු ලබන චෙක්පත් අගරු වීමේ ප්‍රවණතාව වාර්ෂිකව ඉහළ යමින් පැවතියද එය නිවැරදි කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

චෙක්පත්වලින් අදාල බදු ගෙවීම් භාර නොගෙන බැංකු අණකර මඟින් බදු ගෙවීම් භාර ගැනීමට අදාළ නෛතික පසුබිම අධ්‍යයනය කොට නිසි ක්‍රියාවලියක් සකස් කරන ලෙස කාරක සභාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී වෙත නියෝග කළේය.

### 3. *සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය*

රජයේ රෝහල්වල පවත්වාගෙන යනු ලබන සුභසාධක සංගම් හා සමූපකාර සමිති වෙත ලබා දී තිබූ ආපනශාලාවලින් රජයට අය විය යුතු බදු කුලී, ජල බදු, විදුලි ගාස්තු හා දඩ මුදල් අය කර නොතිබීම හා වත්කම් වෙනත් පාර්ශවයන්ට කුලියට දීම නිසා රජයට වාර්ෂිකව විශාල මුදලක් අහිමි වී තිබුණි.

### 4. *මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය*

විලයිත්තිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය සම්බන්ධයෙන් වන විශේෂ විගණන වාර්තාව පිළිබඳ විමර්ශනයේදී අවතැන් වූ පුද්ගලයන්ට ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් හා රක්ෂිත වනාන්තර හෝ පාරිසරික වටිනාකමක් සහිත ප්‍රදේශ එළිපෙහෙළි කර පුද්ගලයන් පදිංචි කිරීම සඳහා යොදා නොගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට ජාතික ප්‍රතිපත්ති හඳුන්වා දීමේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

### 5. *සබරගමුව පළාත් සභාව- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය*

මෙම ආයතනයේ සුභසාධන කටයුතු වෙනුවෙන් අරමුදලක් ආරම්භ කර තිබූ අතර එම අරමුදලට ව්‍යවස්ථාවක් හා රීතිමාලාවක් සකස් කර නොතිබූ බව හෙළි විය. එමෙන්ම අවසාන ගිණුම් සකසා නොතිබීම, අදාළ පුද්ගලයන්ට ගෙවීම් සිදු නොකිරීම හා ආයතනයේ අරමුණුවලට බැහැරව මුදල් වෙන් කිරීමද සිදු කර තිබුණි.

ඒ අනුව, පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන මෙවැනි අධිකාරීවල පවත්වා ගෙන යන අරමුදල් සම්බන්ධ නීතිමය තත්ත්වය පිළිබඳව මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශවල

උපදෙස් මත පොදු චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස කාරක සභාව විසින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත නියෝග කරන ලදී.

### *6. උතුරු මැද පළාත් සභාව*

උතුරු මැද පළාත් සභාවේ රෝහල් සඳහා R.O. යන්ත්‍ර මිළදී ගත් සැපයුම්කරු මින් පෙර R.O. යන්ත්‍ර සැපයීමේ පළපුරුද්දක් තිබූ ආයතනයක් නොවන බවත්, මෙම යන්ත්‍ර අළෙවියේ පෙර පළපුරුද්දක් තිබීම ටෙන්ඩර් කොන්දේසිවල ඇතුළත් වුවත් එය නොතකා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස කටයුතු කළ ප්‍රධාන ජීව වෛද්‍ය ඉංජිනේරුවරයාගේ නිර්දේශයද නොතකා අඩු මිල සළකා මෙම ආයතනයෙන් යන්ත්‍ර මිලදී ගැනීම සිදු කර ඇති බව කාරක සභාවේදී අනාවරණය විය.

නියමිත ප්‍රසම්පාදන පටිපාටියන්ට අනුගත නොවීමත්, තාක්ෂණික දැනුමක් සහිත නිලධාරින්ගේ නිර්දේශ නොතකා මුදලේ ලාභය පමණක් සැළකීම නිසා සිදු වූ පාඩුව පිළිබඳව කාරක සභාව සිය දැඩි අප්‍රසාදය පළ කළේය.

### *7. වත්තල මාබෝල නගර සභාව*

වත්තල මාබෝල නගර සභාවට අයත්ව තිබූ පිඹුරුපත් අංක 1377C ලොට් අංක 1A2 දරණ පර්චස් 79ක් වූ විශාල ඉඩම විකිණීම, ටෙන්ඩර් පටිපාටියට බාහිරව ක්‍රියා කිරීම හා බදු ගිවිසුමට පටහැනිව ක්‍රියා කිරීම වැනි අක්‍රමිකතා සිදුව ඇති බව හා මෙම ඉඩම නැවත පවරා ගැනීමට ක්‍රියා කරන ලෙස පූර්ව කාරක සභාවේදී කළ නියෝගය හා මෙම ඉඩම සම්බන්ධයෙන් වන වර්තමාන තත්ත්වය කාරක සභාව නිරීක්ෂණය කළේය.

1973 වසරේ නගර සභාව විසින් මිලදී ගෙන ඇති මෙම මුල් ඉඩමේ ඔප්පුව අනුව එය අක්කර 9ක් හා පර්චස් 20ක් වන බව කාරක සභාවේදී අනාවරණය වූ අතර වත්තල මාබෝල නගර සභාව විසින් පසු උපලේඛන සකසා මෙම ඉඩමෙන් විශාල ප්‍රමාණයක් වෙනත් ආයතන සඳහා බදු දී ඇති බවට කරුණු හෙළි වී ඇතැයි ප්‍රධාන ගණන් දීමේ නිලධාරී පැවසීය.

ඒ අනුව, පර්චස් 79 ඉඩම සම්බන්ධව පමණක් විමර්ශනය කිරීම ප්‍රමාණවත් නොවන බවත්, අක්කර 9ක් හා පර්චස් 20ක් වුණු මුළු බිම් ප්‍රමාණය ගැනම විමර්ශනයට ලක් කළ යුතු බවත් කාරක සභාව නිර්දේශ කළ අතර මුල් ඉඩමේ අක්කර 3ක පමණ කොටසක් මේ වනවිට අතුරුදන්ව පවතින බැවින් මෙම ඉඩමේ නැවත මැනීම් කටයුතු සිදු කිරීමේ වැදගත්කම කාරක සභාව හමුවේ මතු විය.

ඒ අනුව අක්කර 9 පර්චස් 20ක් වූ මෙම මුල් ඉඩම පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් 2019.11.11 දින වන විට කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරීට නියෝග කරන ලද අතර එම විස්තර ප්‍රකාරව මෙම ඉඩම නැවත සම්පූර්ණයෙන් මැනීමට ලක් කර මසක් තුළ (2019.12.11) වාර්තා කරන ලෙස මැනුම්පතිට දැන්වීමට කාරක සභාව තීරණය කරන ලදී.

## පොදු නිරීක්ෂණ

### 1. නීති නිලධාරී හිඟය

*අ) සුරාබදු දෙපාර්තමේන්තුව*

2015.05.21 දින ස්කාගාර සමාගමක් සම්බන්ධයෙන් සිදු කරන ලද සුරාබදු පරීක්ෂණයකදී හෙළිවූ වැරදි වෙනුවෙන් 2015.12.31 දිනට ගෙවිය යුතු රු. 50,620,739/ -ක බදු මුදල අයකළ යුතු බවට ඊට අදාළ පරීක්ෂණය සිදු කිරීම සඳහා ස්ථාපිත කළ කමිටුව විසින්ද නිර්දේශ කර තිබුණද, 2019 ජනවාරි මස වන විටත් අදාළ සමාගමෙන් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇති බව අනාවරණය විය.

මේ සඳහා නීතිපති උපදෙස් ලබා ගන්නා ලෙසට කැබිනට් අනු කමිටුවක් මගින් 2018 නොවැම්බර් මාසයේදී දැනුම් දී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර නීති උපදෙස් අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තුවේ නීති නිලධාරියෙකු නොමැති බැවින් අමාත්‍යාංශය වෙත යොමු කරන බව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී පැවසීය.

සුරාබදු දෙපාර්තමේන්තුවට නීති නිලධාරියෙකු පත් කිරීමේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

*ආ) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය*

ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.1 (ආ) ඡේදයට පටහැනිව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්වීම් බලධාරියාගේ අනුමැතියකින් තොරව නීති නිලධාරී තනතුරේ වැඩ බැලීම සඳහා නීති නිලධාරී II ශ්‍රේණියේ නිලධාරිනියක් පත් කර තිබුණද, වසර 5ක් ගතව ඇතත්, එම තනතුර පිරවීමට කටයුතු කර නොතිබුණි.

I ශ්‍රේණියේ නීති නිලධාරී හිඟය නිසා මෙම තනතුර පිරවීමට නොහැකි වී ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.

### 2. තනතුරු පුරප්පාඩු

*අ) අධ්‍යාපන අමාත්‍යාංශය*

විදුහල්පති සේවාවේ දැනට 5536ක සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බවත්, ඒ අතුරින් පළමුවන ශ්‍රේණියේ තනතුරු 1750ක්, දෙවන ශ්‍රේණියේ තනතුරු 1868ක් සහ තුන්වන ශ්‍රේණියේ තනතුරු 1918ක් පවතින බවත්, චක්‍රලේඛ අංක 1/2014 අනුව දෙමළ භාෂා ප්‍රවීනත්වය ලබා නොගැනීම මෙම පුරප්පාඩු පිරවීමට බාධාවක් වී ඇති බවත් අනාවරණය විය.

*ආ) බන්ධනාගාර දෙපාර්තමේන්තුව*

- 2018.12.31 දින වන විට ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 27%ක් හෙවත් සංඛ්‍යාත්මක වශයෙන් 2138 ක් පවතින බව හෙළි විය.
- ස්කෑන් යන්ත්‍ර හරහා බන්ධනාගාරය තුළට ගෙන යන ද්‍රව්‍ය පරීක්ෂා කළද බන්ධනාගාර රැඳවියන් අත ජංගම දුරකථන වැනි උපකරණ තිබීම පිළිබඳව කාරක සභාව විසින් කරන ලද විමසුමට පිළිතුරු ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන්

දීමේ නිලධාරී ප්‍රකාශ කළේ නිලධාරින්ගේ හා නවීන තාක්ෂණික පරීක්ෂණ උපකරණවල දැඩි හිඟකම මත පරීක්ෂා කිරීමේ ගැටළු පවතින බවයි.

➢

*ඇ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව*

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව තුළ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 1 ක්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 3න් 2ක්, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු සහ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 33න් 22 ක් වශයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විශාල ප්‍රමාණයක පුරප්පාඩු පවතින බව හෙළි විය.

*ඈ). ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව*

- ➢ දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීමට වසර 10කට අධික කාලයක සිටම කටයුතු කර නොතිබූ අතර තනතුරු 10ක් සඳහා නිලධාරීන් 48 දෙනෙකු වැඩ ආවරණය කිරීමේ පදනම මත බඳවා ගෙන තිබිණ. එමෙන්ම, විවිධ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර දෙපාර්තමේන්තු සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 405 ක් නැවත සේවයේ යොදවා ගෙන තිබිණ.

- ➢ දුම්රිය මාර්ගවල සිල්පර හා රේල්පීලි නියමිත කාල වලදී මාරු නොකිරීම, මාර්ග නඩත්තුව නිසි පරිදි සිදු නොවීම හා කාර්ය මණ්ඩල පුරප්පාඩු යන හේතූ නිසා වේග සීමා පැනවීමේ අවස්ථා වැඩිවීමට හේතු වී තිබුණි. වේගය සීමා කිරීම් වැඩිවීම, දුම්රිය ධාවනය ප්‍රමාදවීමට හා ධාවන වාර අවලංගුවීමට සෘජුවම බලපා තිබිණ.

### 3. අමාත්‍යාංශ යටතට ගැනෙන දෙපාර්තමේන්තු නිශ්චය කිරීම

පැවරී ඇති විෂය කරුණු අනුව සමානකමක් ඇති දෙපාර්තමේන්තු එක් අමාත්‍යාංශයක් යටතට ගැනීමේ වැදගත්කම කාරක සභාව විසින් අනාවරණය කරන ලදී. මේ හේතුව නිසා එක් අතකින් පරිපාලනමය වශයෙන් පහසුවක් ඇති වන අතර එකිනෙකට සම්බන්ධිත විෂය කරුණු වැඩිදියුණු කිරීම හා පවතින දුෂ්කරතා හා දුර්වලතා මග හැර ගනිමින් කටයුතු කිරීමේ පහසුව ඇති වන බවද කාරක සභාව අවධාරණය කරන ලදී.

### 4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව

මෙම දෙපාර්තමේන්තු දෙක කාරක සභාව හමුවට කැඳවූ අවස්ථාවේදී ජෛව විවිධත්වයට අදාළ පරීක්ෂණ පැවැත්වීමේදී හා ලැබෙන ප්‍රතිඵල හුවමාරු කර ගැනීමේදී ගැටළුකාරී තත්ත්වයන් පවතින බව අනාවරණය විය. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා මැදිහත්කරුවකු වශයෙන් එක් අමාත්‍යාංශයක් පැවතිය යුතු බව කාරක සභාවේ නිර්දේශය විය.

### 5. විශේෂ අවධානය යොමු විය යුතු ප්‍රාදේශීය සභා

දුෂ්කර ප්‍රදේශවල ඇතැම් ප්‍රාදේශීය සභා සෑම අතින්ම දුර්වල මට්ටමක පවතින බවත්, අඩු පහසුකම් යටතේ ක්‍රියාත්මක වන බවත් නිරීක්ෂණය වී ඇත. මෙම ප්‍රාදේශිය සභා නගා සිටුවීම සඳහා සහකාර පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් හා රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීම අත්‍යවශ්‍ය කරුණක් බව කාරක සභාව අවධාරණය කරයි.

# කාරක සභාවේදී සාකච්ඡාවට ලක් වූ කරුණු, විමර්ශනයට ලක් වූ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ, කරුණු පැහැදිලි කිරීම් ආයතන සම්බන්ධයෙන් කාරක සභාවේ නිරීක්ෂණ, ලබා දන ලද නිර්දේශ/ නියෝග හා අදාළ ආයතන විසින් ලබා දෙන ලද පිළිතුරු

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| **මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>2019 පෙබරවාරි 20** | | |
| 1. | නැගෙනහිර පළාතේ ගොඩනැගිලි ප්‍රමිති අනුපාතයන් පිළිබඳ සැලකිලිමත් නොවී (BSR) ශක්‍යතා අධ්‍යනයකින් ද තොරව ඕලන්ද කොටුව අලංකරණ කාර්යයේ ඇස්තමේන්තුව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව මගින් කොන්ත්‍රාත්කරුට විශාල වශයෙන් මූල්‍ය ප්‍රතිලාභ ලබාගත හැකි අවස්ථාවන් සලසා දි තිබුණි.<br>(අ) පස් සන මීටර් 155.21 සැපයිම සඳහා අනුමත කළ මිල වන රු. 776,050/- අභිබවා රු. 547,580/= ක් ගෙවා තිබීම සහ අනුමත කාර්යයන් 46 ක් අතරින් කාර්යයන් 23 පමණක් ඉටුකර තිබිම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමුවිය. | "දැයට කිරුළ" වැඩ සටහන යටතේ 2014 වර්ෂයේ ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘතියේ උපදේශකත්වය ප්‍රධාන ගොඩනැගිලි ඉංජිනේරු විසින් සිදුකිරීමට නියමිතව තිබුණත් මතු වු ගැටලුකාරි තත්වයක් නිසා ඔහු එයින් ඉවත් වි ඇත. 2015 වර්ෂයේ දී මෙම කාර්යයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මැදිහත්වීම නිසා එහි මුල් සැලසුම් මෙන්ම ඇස්තමේන්තු වල ද විවිධ වෙනස් කම් සිදුවී ඇත. විවෘත මිල ගණන් කැදවා ඉදිකිරීම් කටයුතු බාර දී තිබුණත් රු.1,800/- ක් ලෙස මිල අනුමත කර තිබූ පස් සන මීටරය රු.5,000/- දක්වා වැඩිවිම වැය පාර්ශ්වය ඉහළ යාමට හේතුවක් වූ බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. මෙහි අවිනිශ්චිත වියදම් 10% සීමාව ඉක්මවා නොතිබීම නිසා ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබාගැනිමේ අවශ්‍යතාවය මතුනොවූ බව ද ඔහු වැඩිදුරටත් පැවසිය. |
| 2. | සමෘද්ධි ජීවනෝපාය වැඩසටහන සුපරීක්ෂණයේ පැවති දුර්වලතා හේතුවෙන් සමෘද්ධි ප්‍රතිලාභින් 23 දෙනෙකුගේ ඉතිරි කිරීම් ගිණුම්වලින් රු.307,200/- ක් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් | 2015-2016 වර්ෂවල කලවංචිකුඩි, කිරාන් සහ කෝරලෙයිපත්තු යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් මෙය වාර්තා වි තිබූ අතර සහකාර අධ්‍යක්ෂ සහ ගණකාධිකාරිගේ මෙහෙයවීම මත මූලික පරීක්ෂණයක් සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙස සමෘද්ධි අධ්‍යක්ෂ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක සේවකයින් විසින් වංචනික අයුරින් ලබාගෙන තිබුණි. නොසැලකිළිමත් ලෙස කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති බව අනාවරණය විය. | ජනරාල්වරයාට 2018.08.23 දින දන්වා ඇත. මෙම වංචාවට සම්බන්ධ වූ නිලධාරීන් 13 දෙනෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර තිදෙනෙකුගේ සේවය අත්හිටුවීමටත් තිදෙනෙකුගෙන් මුදල් යළි අයකර ගැනිමටත් කටයුතු කළ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 3. | කෝරලේපත්තු (මධ්‍යම) ප්‍රාදේශීය බල ප්‍රදේශයේ හෙක්ටයාර් 0.4618 ක වපසරියකින් යුත් බිම් කොටසක් ඇගලුම් කම්හලක් ඉදිකිරිම සඳහා පුද්ගලික ආයතනයකට අවු. 30 සහන බදු පදනම මත ලබා දි ඇති අතර ඉඩම් කොමසාරිස්වරයාගේ, ආයෝජන මණ්ඩලයේ සහ මඩකලපුව දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව එම ඉඩම සංචාරක හෝටල් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ලබා දී ඇති බව අනාවරණය විය. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2013.03.25 දිනැති ලිපිය මගින් රජය සතු මෙම ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා දිගුකාලින බදු පදනම මත ලබාදිමට කටයුතු කරන ලෙස කෝරලේපත්තු (මධ්‍යම) ප්‍රාදේශිය ලේකම් වෙත දන්වා තිබූ බැවින් ඒ අනුව කටයුතු කර ඇති බව ප්‍ර.ග.නී./ග.නි. පැවසිය. |
| 4. | සුනාමියෙන් විපතට පත් වුවන් නැවත පදිංචි කිරිම සඳහා ඉඩම් අත්පත් කර ගැනිමට අදාළව වන්දි ගෙවිමේදි පුද්ගලයන් තිදෙනෙකු විසින් ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර රු. මිලියන 6.3 ක වන්දි මුදලක් ලබාගෙන තිබීම. | ආයතන සංග්‍රහයේ 12:2 වගන්තියට අනුව විශ්‍රාම වැටුප් අත්හිටුවා පරීක්ෂණ පැවැත්විමට ප්‍රතිපාදන සලස්වා ඇති බැවින් ඉඩම් කොමසාරිස්වරයාට ඒ අනුව කටයුතු කිරිමට බාධාවක් නොමැති බව ප්‍ර.ග.නි. පැවසිය.<br>පරික්ෂණ කටයුතු අවසන් වූ වහාම ඒ පිලිබඳව කාරක සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br>මෙම වංචාවට සම්බන්ධ වූ නිලධාරින්ට එරෙහිව කටයුතු කරන ලෙස පළාත් ඉඩම් කොමසාරිස්වරයා වෙත දන්වා ඇති අතර ඊට සම්බන්ධ වූ නිලධාරියෙකු මැතකදි විශ්‍රාම ලබා ඇති බැවින් ඔහුගේ විශ්‍රාම වැටුප් ගෙවිම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | අත්හිටුවා ඇත. අනෙකුත් නිලධාරීන් පිළිබඳව පරික්ෂණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සිදුකරන අතර සති 3 පමණ කාලයකින් එය අවසන් කිරීමට හැකිවන බව ග.නි. ප්‍රකාශ කළේය. |
| 5. | අධ්‍යක්ෂ, සැලසුම් (මඩකලපුව), ප්‍රාදේශීය ලේකම් (මන්මුනෙයි බටහිර), කොමසාරිස් (ගොවිජන සේවා), සහ අධ්‍යක්ෂ (ගොවිජන සේවා) යන අයගෙන් සමන්විත කමිටුවක් මගින් සැලසුම් කර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇතත් ප්‍රමිතියකින් තොරව ඉදිකිරීම් හේතුවෙන් අක්කර 400 ක පමණ වගාකරුවන් පිරිසකට ඉන් දැඩි බලපෑමක් සිදුව ඇති අතර මෙම ඇලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් වැයකර ඇති රු. මිලියන 4.7 නිෂ්ඵල වියදමක් බව අනාවරණය විය. | මේ පිළිබඳව පරික්ෂාකර වාර්තා කිරීම සඳහා නියෝජ්‍ය වාරිමාර්ග ඉංජිනේරු, ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ අතිරේක ප්‍රාදේශීය ලේකම් යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති බවත් මෙය ඵලදායි ලෙස යොදා ගැනිමට නම් පෙරියකාලපෝට්ටමඩු නැමති ස්ථානයේ ද එවැනි ඉදිකිරිමක් සිදුකළ යුතු බව ග.නි. පැවසීය.<br><br>වංචාවක් සිදුවී ඇති බව පදනම් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමටත්, පැති බැමි යළි සකස් කිරිම සඳහා ගෙවා ඇති රු. 918,600.73 ක මුදල කොන්ත්‍රාත්කරුගෙන් යළි අයකර ගැනිම ඇතුලු නිර්දේශ 6 ක් කමිටුව විසින් ලබා දී ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි.පැවසීය. |
| | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**<br>**2019 පෙබරවාරි 20** | |
| 1. | ශ්‍රී ලංකා පොලිසිය හා එක්ව සිදු කෙරෙන රියදුරු අභිවෘද්ධි ලකුණු ලබාදීමේ ක්‍රමවේදය හා ඊට අදාළ නීතිමය තත්ත්වය | මෝටර් රථවාහන පනතට ගෙනෙන ලද සංශෝධනයට අනුව ශ්‍රී ලංකා පොලිසියට අභිවෘද්ධිතා ලකුණු ලබා දීමට නීතිමය බාධාවක් නැතත් ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා අභිවෘද්ධිතා ලකුණු ලබා දීමට අදාළ රෙගුලාසිවල සංශෝධනයක් කළ යුතු බවත්, ඒ සඳහා අවශ්‍ය මූලික කෙටුම්පතේ කටයුතු අවසන් කළ පසු එය නීති කෙටුම්පත් සම්පාදක වෙත යැවීම සිදු කිරීමට නියමිත බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>අදාළ කෙටුම්පත 2018 මාර්තු 20ට පෙර නීති කෙටුම්පත් සම්පාදකට ඉදිරිපත් කරන ලෙස |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. |
| 2. | රියදුරු බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ වර්තමාන තත්ත්වය | රියදුරු බලපත්වල කාල සීමාව අවසානයේ, රියදුරු බලපත්‍රය කල් ඉකුත් වී ඇති බව සඳහන් කරමින් පාරිභෝගිකයාට කෙටි පණිවුඩයක් පරිගණක පද්ධතිය හරහා යැවෙන බව ග.නි. පැවසීය. එවන් සේවාවක් සිදු වන්නේද යන්න හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ගොස් නිරීක්ෂණය කොට 2019.02.21 දින වාර්තාවක් සපයන මෙන් කාරක සභාව ජාතික විගණන කාර්යාලයට නියෝග කරන ලදී.<br><br>**ඒ අනුව ජාතික විගණන කාර්යාලය මඟින් 2019.02.22 දින ඉදිරිපත් කර තිබූ වාර්තාව අනුව රියදුරු බලපත්‍ර අලුත් කිරීම සඳහා කෙටි පණිවිඩ මඟින් දැනුම් දීම 2014 මැයි මස සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන බවත්, රියදුරු බලපත්‍රය අයදුම් කිරීමේදී හා නැවත අලුත් කිරීමේදී ජංගම දුරකතන අංකය සඳහන් කිරීම 2016 වසරේ සිට අනිවාර්යය කර ඇති බවත් අනාවරණය විය.** |
| 3. | රියදුරු බලපත්‍ර සඳහා ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කොට දැනට එය නවතා තිබීම. | අදාළ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් යොමු වූ පැමිණිලි විමර්ශනයේදී එම ප්‍රසම්පාදනයේ අඩුපාඩු හා ලේඛනාදියේ ගැටළු නිරීක්ෂණය වූ හෙයින් එම ප්‍රසම්පාදන කටයුතු නවතා නව ප්‍රසම්පාදනයක් ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව තීරණය කළ බව ප්‍ර.ග.නි./ග.නි පැවසීය.<br><br>මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ද, රියදුරු අභිවෘද්ධිතා ලකුණු ක්‍රමය ක්‍රියාත්මක වන දින වකවානු ඇතුළත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරී/ගණකන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | වාර්තාවක් 2018 මාර්තු 20ට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 4. | දෙපාර්තමේන්තුගත තනතුරු දරන නිලධාරීන් අනුරූප ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහනය කිරීම. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ චක්‍රලේඛ අංක 05/2018 ප්‍රකාරව දෙපාර්තමේන්තුගත තනතුරු දරන නිලධාරීන් අනුරූප ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහනය කිරීමට මනාපය පළ කිරීමට ලබා දුන් කාලය අවසන් වන දිනට පෙර අදාළ චක්‍රලේඛය ක්‍රියාත්මක වීම වළක්වමින් අධිකරණය විසින් අතුරු තහනම් නියෝගයක් ලබා දුන් බවද, 2019 සැප්තැම්බර් 20 දක්වා ඊලඟ නඩු වාරය කල් දමා ඇති බවද ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 5. | 302 කාණ්ඩය යටතේ පසුකාලීනව ලියාපදිංචි කරන ලද වාහන 10 පිළිබඳ වර්තමාන තත්ත්වය | කාරක සභාවේ නියෝගය පරිදි මෙම වාහන සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා කොළඹ වංචා විමර්ශන ඒකකයට භාර දී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>නමුත් අදාළ පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය කෙරෙන ලිපිගොනු කොළඹ වංචා විමර්ශන ඒකකය විසින් දිගින් දිගටම ඉල්ලුම් කළද, ඒවා තවමත් ලබා දී නොමැති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>මෙම පරීක්ෂණ කටයුතු කරගෙන යාම සඳහා සහයෝගය ලබා දෙන ලෙසට ප්‍ර.ග.නි./ග.නි. වෙත දැඩි ලෙස අවවාද කළ කාරක සභාව ආයතන මට්ටමින්ද මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීමේ වැදගත්කම අවධාරණය කළේය. |
| 6. | ඊ - මෝටරින් ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය | අදාල සමාගම සමඟ එක්ව ගත් තීරණය අනුව ඊ - මෝටරින් ව්‍යාපෘතිය 2019 අගෝස්තු 26 දින සිට ක්‍රියාත්මක වීමට කටයුතු යොදා ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. 2019 අගෝස්තු 26 දින |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | තෙක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සඳහා ගත යුතු එක් එක් පියවරයන්හි කාල රාමු ඇතුළත් සංක්ෂිප්ත වාර්තාවක් 2019 මාර්තු 01දින වන විට කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී.<br><br>ඊ - මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කෙරෙන නීතිමය පසුබිම හා නව නීති සම්පාදනය කළ යුතුද යන්න සඳහන් කරමින් වාර්තාවක් 2019 මාර්තු 10 දින වන විට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 7. | දෙපාර්තමේන්තුවේ විභාග ශාලාවල දීර්ඝ කාලයක් පුරා එකම කාර්ය මණ්ඩලයක් සේවයේ නියුතුව සිටීම. | විභාග ශාලාවල සේවයේ නියුතුව සිටින නිලධාරින් වරින් වර මාරු කිරීම සිදු වන බවත්, ඒ සඳහා මෑතකදී වැඩවාර සටහනක් සකසා ඇති බවත් ග.නි. පැවසීය. එම වැඩවාර සටහන සකසා ඇත්තේ කෙසේද හා ඒ පිළිබඳ විස්තර සඳහන් කරමින් වාර්තාවක් සපයන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| **ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාර්යසාධන විගණන වාර්තාව පරීක්ෂාව<br>2019 පෙබරවාරි 21** | | |
| 1. | විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධව 2008 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත්කර තිබුණද විගණිත දිනය වනවිටත් එම කටයුත්ත අවසන්කර නොතිබීම මෑතකදී සකස්කළ නව ප්‍රතිපත්ති කෙටුම්පතේ වර්තමාන තත්වය, නව ප්‍රතිපත්තිය සකස් කිරීමට හේතූන්, එහි අන්තර්ගත නව විෂය | පෙර පැවති ජාතික ප්‍රතිපත්තිය හරහා ඝන අපද්‍රව්‍ය පමණක් ආවරණය වූ බවත් නව ප්‍රතිපත්තිය යටතේ ඝන අපද්‍රව්‍ය, ද්‍රව අපද්‍රව්‍ය,වායු අපද්‍රව්‍ය කාණ්ඩ යටතේ ක්ෂේත්‍ර 15ක් ආවරණයවන බවත් ඒ හා සම්බන්ධ සියළු පාර්ශවයන්ගේ හා මහජන අදහස්ද සලකාබලා එය අවසන් කෙටුම්පත තෙක් අවසන්කර ඇති බව හා ඉදිරියේදී කැබිනට් අනුමැතිය ලබාගැනීමට අපේක්ෂිත බවත් ප්‍ර.ග.නි පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | ක්ෂේත්‍රයන් හා ඒ සම්බන්ධ ඉදිරික්‍රියාමාර්ග | |
| 2. | 2010-2016 කාලය තුළ ශ්‍රී ලංකාව තුළ මෙ.ටො. 92,000ක විද්‍යුත් අපද්‍රව්‍ය ජනනය වී ඇති බවත් වාර්ෂිකව මෙ.ටො.20,000ක් ජනනය වන බවත් 2030වන විට එය මෙ.ටො.43,000ක් වේ යැයි ඇස්තමේන්තුකර ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය. මේ හා සම්බන්ධව පවතින මූලික ගැටළු හා එම ගැටළුවලට අනෙකුත් රටවල් ගෙන ඇති ක්‍රියාමාර්ග. | විද්‍යුත් අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීමෙන් හා ඒවායේ අඩංගු බැර ලෝහ පරිසරයට මුදා හැරීමෙන් කාලයත් සමඟ ඒවා වියෝජනය වන බවත් එම බැරලෝහ කොටස් වර්ෂාවත් සමඟ ජලප්‍රවාහවලට මුසුවීමෙන් සියළු ජීවීන්ට අහිතකර තත්වයන් හා සෞඛ්‍ය ගැටළු උදාකරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>ලෝකයේ දියුණු රටවල් එම විද්‍යුත් අපද්‍රව්‍ය ඇතිවන අවස්ථාවේදීම ඒවා සාමාන්‍ය අපද්‍රව්‍ය හා සම්බන්ධ නොකර ප්‍රතිචක්‍රීකරණය කර ඉවත් කිරීමට ක්‍රියාකරන බවද ග.නි. පැහැදිලි කළේය. |
| 3. | එම ක්‍රමවේදයන් ශ්‍රී ලංකාව තුළද ක්‍රියාත්මක කිරීම සඳහා පවතින යෝජනා | මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2008 වර්ෂයේ සිට ජාතික පාරිසරික පනත යටතේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රෙගුලාසි සකස්කර ක්‍රියාත්මක කරන බවත් ආරම්භක අදියරේදී උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ බවත් ඒ හරහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මහපරිමාණ උපද්‍රවකාරී අපද්‍රව්‍ය ජනනය කරනු ලබන කර්මාන්ත හා ක්‍රියාවලීන් නියාමනය වන බවත් ග.නි. පැවසීය.<br><br>පොදු ජනතාවගෙන් ජනනය වන විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් රටතුළ නොමැත. එසේම ඒ සඳහා අනෙකුත් රටවල් විසින් "විස්තීර්ණය වූ නිෂ්පාදකයා වගකිවයුතු යන සංකල්පය" ක්‍රියාත්මක කරන බවද ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදකයන් අවම බැවින් මධ්‍යම පරිසර අධිකාරිය හා පරිසර අමාත්‍යාංශය එක්ව "විස්තීර්ණය වූ නිෂ්පාදකයා, වෙළෙන්දා හා පාරිභෝගිකයා වගකිවයුතු යන සංකල්පය" නිර්මාණය කළ බවද ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | එසේම එය නීතිගත කිරීමට ජාතික පාරිසරික පනත යටතේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් පනත සංශෝධනය කර එම සංකල්පය පනතට ඇතුලත් කර ඒ සඳහා නීතිමය ප්‍රතිපාදන සකස් කර එම පනත ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන බවද මෙහිදී අනාවරණය විය. |
| 4. | 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 ගැසට් නිවේදනය ප්‍රකාරව විද්‍යුත් හා විදුලි උත්පාදකයන් (ලැයිස්තුගත) සඳහා බලපත්‍ර ලබා ගත යුතු වුවද 2018 ඔක්තොම්බර් වන විට ඒ සඳහා ආයතන 21ක් පමණක් බලපත්‍ර ලබාගෙන තිබීම. | උපද්‍රවකාරී අපද්‍රව්‍ය බලපත්‍රලාභීන් ආසන්න වශයෙන් 500ක් සඳහා බලපත්‍ර නිකුත්කර ඇති බවත් කර්මාන්තවලින් බැහැරවන උපද්‍රවකාරී අපද්‍රව්‍ය තුළ උත්පාදනය වන විද්‍යුත් අපද්‍රව්‍ය කොටස අදාළ බලපත්‍රලාභීන් හරහා අපහරණය කරන බවත් එය තහවුරු කර ගැනීමෙන් පසු උපද්‍රවකාරී අපද්‍රව්‍ය බලපත්‍රය නිකුත් කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>2018 වර්ෂය තුළදී විද්‍යුත් අපද්‍රව්‍ය එකතුකර කළමනාකරණය සිදුකරන ආයතන 10ක් තිබෙන බවත් ඉහත සඳහන් ආයතන 21 තුළ විද්‍යුත් අපද්‍රව්‍ය උත්පාදනය වන ආයතනද තිබිය හැකි බවත් ඔහු වැඩිදුරටත් පැවසීය. |
| 5. | විද්‍යුත් උපකරණ හා විශේෂයෙන් ජංගම දුරකථන ආනයනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සතු වගකීම් හා ක්‍රියාත්මක කර ඇති පාලන ක්‍රමවේදයන්. | භාණ්ඩවලට අදාළ ප්‍රමිතීන් සකස්කිරීම හරහා ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ ආනයනයට දායකවන බවත් එලෙස ප්‍රමිතීන් සකස්කළ භාණ්ඩ 123ක් ගැසට්කර ඇති බව හා ඒ තුළ ජංගම දුරකථන ඇතුළත් නොවන බවත් ආනයනය කරනු ලබන නව ජංගම දුරකථන සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිර්දේශයන් යොදාගන්නා බව හා භාවිතා කළ දුරකථන හා විද්‍යුත් උපාංග අභ්‍යන්තර ක්‍රමවේදයන් හරහා පාලනය කරනු ලබන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 6. | විගණකාධිපතිවරයා විසින් 2016 වර්ෂයේ නිකුත් කරන ලද මෙම විගණන වාර්තාවේ වර්තමාන ප්‍රගතිය. | මෙම විගණන වාර්තාවේ සඳහන් ප්‍රධානතම නිර්දේශය වන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය උදෙසා නිෂ්පාදකයා හා වෙළෙන්දා වගකීමේ සංකල්පය ක්‍රියාත්මක කිරීම උදෙසා පෞද්ගලික අංශයේද සහභාගීත්වය සහිතව රැස්වීම්වාර කිහිපයක් පවත්වා ඇති බව ග.නි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | ප්‍රකාශ කළේය. එය ක්‍රියාත්මක කිරීමට දැනට පරිසර පනත යටතේ නීතිමය ප්‍රතිපාදන නොමැති බැවින් එය සංශෝධනය කර අදාළ නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත් මේ වන විට එය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇති බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.<br><br>මෙම විගණන වාර්තාවේ කරුණු අධ්‍යනය කර මෙම ගැටළුව නිරාකරණය උදෙසා කෙටිකාලීනව, මධ්‍යකාලීනව හා දිගුකාලීනව ගතයුතු ක්‍රියාමාර්ග, අවශ්‍ය නීති රීති හා යෝජනා ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් 2019.03.22 දින කාරක සභාව වෙත ලබාදීමට කටයුතුකරන ලෙස කාරක සභාව නියෝග කළේය.<br><br>**මීට අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත. ඒ අනුව,**<br>**● වර්තමාන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ජාතික පරිසර ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම.**<br><br>**● ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම.**<br><br>**● සියළුම වර්ගවල විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය ආනයනය සහ භාවිතා කරන ලද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික භාණ්ඩ වාණිජ කටයුතු සඳහා මෙරටට ගෙන්වීම තහනම් කිරීම.**<br><br>**● විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ හා අමතර කොටස් නිෂ්පාදනය සහ ආනයනයේදී සුදුසු ප්‍රමිතීන් හඳුන්වා දීමට කටයුතු කිරීම.**<br><br>**● විවිධ මාර්ගයන් හරහා රට තුළට ඇතුළු වන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ හා අමතර කොටස් පිළිබඳ දත්ත පද්ධතියක් මධ්‍යම පරිසර** |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
| | | අධිකාරිය තුළ ස්ථාපනය කොට පවත්වා ගෙන යෑම.<br><br>• වඩා පරිසර හිතකාමී මෙන්ම තමන් අත ඇති මුදලට දැරිය හැකි වන පරිභෝජන රටාවක් කරා ජනතාව යොමු කිරීමට තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ පනත් කෙටුම්පත සම්පාදනය කිරීම.<br><br>• දැනට දිවයින පුරා විසිරී සිටින අවිධිමත් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එකතු කරන්නන් නිසි නියාමනයකට ලක් කිරීම. (ඇමුණුම 01) |
| **රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br>2019 පෙබරවාරි 22** | | |
| 1. | දෙපාර්තමේන්තුවේ වර්තමාන තත්වය | නවීන පරිගණක තාක්ෂණය භාවිතා කර ඉඩම් ලියාපදිංචිය වැනි කාර්යයන් සඳහා එක් දින සේවාවන් ලබා දීමට කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බවත්, ජනගහන ලේඛන වැඩසටහන යටතේ ජාත්‍යන්තර මට්ටමින් පිළිගත හැකි උප්පැන්න සහතික භාෂා ද්විත්වයෙන්ම ඉංග්‍රීසි පරිවර්තනය සහිතව ලබා දීමේ වැඩපිළිවෙළක් 2019 මාර්තු මස 16 වැනි දා සිට ආරම්භ කරන බවත් ප්‍ර.ග.නි/ග.නි සඳහන් කළේය. |
| 2. | යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරිම හා මෘදුකාංග සංවර්ධනය සඳහා ලබා දී ඇති මිලියන 6 සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොමැති වීම හා 2016, 2017 වර්ෂවලදි දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන ප්‍රතිපාදනවල විශාල ඉතිරියක් තිබීම. | පුනරාවර්තන වියදම් සඳහා අක් මුදල් ලබා දෙන බවත් ආදායම් ලබන දෙපාර්තමේන්තුවක් බැවින් ප්‍රාග්ධන වියදම් සඳහා අක් මුදල් ලබා දි නොමැති බවත් මෙහිදී අනාවරණය විය.<br><br>යෝජිත කාර්යයන් සඳහා අග්‍රිම ඉල්ලුම් කිරිමේදී ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණයට පමණක් ඉල්ලුම් කළ යුතු බවත්, ඒ සම්බන්ධව මූලික අයවැයක් ඉදිරිපත් කළ යුතු බවත් යෝජිත |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | කාර්යයන්වල කටයුතු පියවරෙන් පියවර ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අවධානය යොමු කර ඒ අනුව වියදම් කළ යුතු බවත් කාරක සභාව අවධාරණය කරන ලදි. |
| 3. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සම්බන්ධයෙන් නවීන තාක්ෂණය යොදා ගන්නා ආකාරය හා මෙම ක්‍රියාවලියේදී ලෝකයේ රටවල් අතරින් ශ්‍රී ලංකාව පසුවන ස්ථානය. | ලෝකයේ රටවල් අතරින් ශ්‍රී ලංකාව 171 වන ස්ථානයේ පසු වන බවත්, e-land ව්‍යාපෘතිය යටතේ 1964 සිට ලියාපදිංචි කර ඇති පත්‍රිකා දකුණු සහ බස්නාහිර පළාත්වල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 20 ක පරිලෝකනය කර (Scan) අවසන් බවත් කොළඹ ඉඩම් කාර්යාලය තුළ පරිගණක මාර්ගගත (online System) ක්‍රමවේදය මගින් ඒවා ලබා ගත හැකි බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>ලියාපදිංචි කරනු ලබන පත්‍රිකා පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමේ වැඩපිළිවලක් කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය තුළ ක්‍රියාත්මක වන අතර අනෙක් ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සේවකයින් නොමැති බවත් ප්‍ර.ග.නි/ ග.නි වැඩිදුරටත් සඳහන් කරන ලදී. |
| 4. | ඊ - ජනගහන (e-population) ව්‍යාපෘතිය සම්බන්ධව දෙපාර්තමේන්තුව සතු ඉදිරි කාර්ය සැලැස්ම සහ තොරතුරු මධ්‍යගත කිරීමේ ක්‍රමවේදය. | උපතේදීම ඒ ඒ පුද්ගලයාට අංකයක් ලබා දීමට කටයුතු කරන අතර එම තොරතුරු අදාල ආයතනවලට ලබා දී ආයතන අතර සම්බන්ධතාවයක් ඇති කිරීමට හැකි බවත් දැනටමත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා විභාග දෙපාර්තමේන්තුව සමඟ මේ පිළිබඳ සාකච්ජා කර ඇති බවත් ග.නි පැවසීය. |
| 5. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධති එකිනෙකට සම්බන්ධ කිරීමේ (Link) හැකියාව | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වීමේ වැඩපිළිවෙළක් මෙතෙක් ආරම්භ කර නොමැති බව මෙහිදී අනාවරණය විය. මෙම ආයතන දෙක අතර අදාල පරිගණක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | පද්ධති එකිනෙකට සම්බන්ධ කිරීමේ වැදගත්කම කාරක සභාව අවධාරණය කළේය. |
| 6. | අභ්‍යන්තර විගණක තාවකාලිකව බඳවා ගෙන තිබීම හා එහි අවශ්‍යතාවය කාරක සභාව විසින් නිර්දේශ කිරීම. | දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇත්තේ අභ්‍යන්තර විගණක තනතුරක් පමණක් බවත් දෙපාර්තමේන්තුවට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කරන ලෙස ඉල්ලා ඇති අතර ඒ සඳහා ගණකාධිකාරි සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙකු අවශ්‍ය බවත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බවත් ග.නි පැවසීය. |
| **විදේශ කටයුතු අමාත්‍යාංශය<br>2019 මාර්තු 06** | | |
| 1. | විදේශ තානාපති කාර්යාල සඳහා ගොඩනැගිලි මිලදී ගැනීම / කුලී පදනම මත ලබා ගැනීම පිළිබඳ මූල්‍යමය වාසිය හෝ අවාසිය. | විධිමත් මූල්‍ය විශ්ලේෂණයකින් පසුව මේ පිළිබඳ තානාපති කාර්යාල මට්ටමින් ලබා ගත් සංඛ්‍යා දත්තවල තොරතුරු පදනම් කරගත් විශ්ලේෂණාත්මක වාර්තාවක් ජූනි 10වැනිදාට පෙර ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය.<br><br>**මේ පිළිබඳ තොරතුරු ඇතුලත් හා එක් එක් දූත මණ්ඩල කාර්යාල මට්ටමින් ගොඩනැගිලි මිලදී ගැනීම / කුලී පදනම මත ලබාගැනීම පිළිබඳ මූල්‍යමය වාසිය හෝ අවාසිය ඇතුලත් විශ්ලේෂණාත්මක වාර්තාවක් කාරක සභාවට ලබාදී ඇත. ඒ අනුව රජය විසින් බදු/කුලී පදනම මත ලබාගෙන ඇති දේපල වෙනුවෙන් මාසිකව දරනු ලබන වියදම සලකා බැලීමේදී දූත මණ්ඩල කාර්යාල සඳහා ගොඩනැගිලි මිලදී ගැනීම මූල්‍යමය වශයෙන් දීර්ඝකාලීනව වාසිදායක බව පෙන්වාදී ඇත.** |
| 2. | විදේශ තානාපති කාර්යාල සඳහා කාර්ය මණ්ඩල පත්කිරීම. | නිලධාරීන් බඳවා ගැනීමේදී විධිමත් නිර්ණායක පැවතීමේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව කාර්ය මණ්ඩල පත්කිරීමට එක් එක් රටවල් අනුව අදාළ කර ගන්නා නිර්ණායකයන් පිළිබඳව විශ්ලේෂණය කර මුදල් අමාත්‍යාංශය හා එක්වී අදාල නිර්ණායක ඇතුළත් වාර්තාවක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | මැයි 10 දිනට පෙර ලබා දෙන ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය<br><br>**කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග විවිධ අවස්ථාවලදී අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් සාකච්ඡාවකට දින යොදාගත්තද ඒවා සාර්ථක නොවුන බවද 2017.07.03 දිනැති ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව සමගද සාකච්ඡා කර ඉදිරියේදී මේ සඳහා සාකච්ඡාවක් සඳහා දිනයක් හා වේලාවක් ලබාදෙන බව විදේශ කටයුතු අමාත්‍යාංශයට දන්වා ඇති බව කාරක සභාවට විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දන්වා ඇත. මේ කාර්යය පිළිබඳ යොදා ගත් ලිපිවල පිටපත් කාරක සභාවට ඉදිරිපත් කරඇත.** |
| 3. | තානාපති කාර්යාලවල විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව පිළිබඳව නිවැරදි දත්ත නොපැවතීමද ඒ පිළිබඳ තොරතුරු පද්ධතියක් ඇති කිරීමට ගෙන ඇති පියවර. | නීත්‍යානුකූල නොවන මාර්ගයන්ගෙන් පැමිණ ඇති පුද්ගලයන්ගේ තොරතුරු තානාපති කාර්යාලවල ලේඛනගත නොවීම හා පුද්ගලික දත්ත රැස්කිරීමට ඇතැම් රටවල ඇති නීත්‍යානුකූල බාධා මෙම සංඛ්‍යා අතර පරස්පරතා ඇතිවීමට  බලපා ඇති බව ප්‍ර.ග.නි. පැවසීය.<br><br>**මේ සම්බන්ධ එක් එක් දූත මණ්ඩලයන්ගෙන් රැස්කළ දත්ත හා එම දත්ත රැස්කිරීමට ගනුලැබූ ක්‍රියාමාර්ග අතුලත් සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරඇත.**<br><br>**ඒ අනුව සියලුම ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයන් තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් නීතිමය බාධා නොමැති, තම ප්‍රතීතන රටවල අදාළ ආගමන අධිකාරියන් වෙතින් එම රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයන් පිළිබඳ තොරතුරු ඉල්ලාසිටි බව විදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 4. | ශ්‍රී ලංකාවේ සිටින විදේශ නියෝජිතයන් (නිර්වේතනික කොන්සල්වරු) හා විදේශයන්හි සිටින ශ්‍රී ලාංකික නියෝජිතයන් (නිර්වේතනික කොන්සල්වරු) සම්බන්ධ තොරතුරු | එක්සත් ජාතීන්ගේ රටවල් 194න් 26ක ශ්‍රී ලාංකික සබඳතා නොමැති බව මෙහිදී අනාවරණය වූ අතර අප්‍රිකා, ලතින් ඇමරිකා හා කැරිබියන් වැනි රටවල් පිළිබඳ මේ වසරේදී විශේෂ අවධානයක් යොමු කර සබඳතා ඇති කර ගැනීම පිළිබඳ කටයුතු කරන බව ප්‍ර.ග.නි. පැවසීය. මේ පිළිබඳ මැයි මස 06 වන දිනට පෙර වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය.<br><br>**නම් කරන ලද පුද්ගලයන් සත්‍යාපනය කරගැනීම 2017 අගෝස්තු 21 දිනැති විදේශ කටයුතු අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන් අනුව සිදුවේ.**<br><br>**ඒ අනුව මේ පිළිබඳ අදාළ පුද්ගලයන්ගේ නම් හා ඔවුන් පත් කිරීමට යොදා ගන්නා ක්‍රමවේදය හා ඔවුන්ගේ කාර්යභාරය ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරඇත.** |
| 5. | විදේශයන් සමග අත්සන් කළ ගිවිසුම් | ශ්‍රී ලංකාවේ අදාළ වර්තමාන අමාත්‍යාංශය අනුව ගිවිසුම් වර්ගීකරණයක් සිදුකර මෙම ගිවිසුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ආකාරය හා වර්තමාන තත්වයද ගිවිසුම් නීති කඩකර ඇත්නම් එසේවීමට හේතුද සඳහන් වාර්තාවක් මැයි 10 දිනට ප්‍රථම කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය.<br><br>**මෙම ගිවිසුම් පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.** |
| 6. | ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු ඕස්ට්‍රේලියානු ඩොලර් 2,589,000ක් වටිනා පැරණි මහ කොමසාරිස් කාර්යාලය 2012 වර්ෂයේ සිට හා මහකොමසාරිස් නිල නිවස 2007 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණි. | මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාලය මගින් සිදු කළ අධ්‍යයනයෙන් මෙම පළමු ගොඩනැගිල්ලට වෙන් කළ රු. මිලියන 780න් එක් ගොඩනැගිල්ලක් පමණක් නොව ගොඩනැගිලි තුනම ප්‍රතිසංස්කරණය කළ හැකි බවට නිර්දේශ කර ඇති බව කාරක සභාවේදී අනාවරණය විය. මේ පිළිබඳ වාර්තාවක් 2019 මැයි මස 10 වන දිනට පෙර රජයේ ගිණුම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | 2017 සැප්තැම්බර් 26 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය අනුව පැරණි ගොඩනැගිල්ල 2018 අයවැය ප්‍රතිපාදන මගින් මහ කොමසාරිස් නිලනිවස බවට පරිවර්තනය කිරීමට අනුමත වූ රු. මිලියන 780න් රු. මිලියන 260ක් වෙන්ක කළද ඒ සම්බන්ධයෙන් කිසිදු වියදමක් සිදු නොකිරීම හා මහ කොමසාරිස් නිල නිවස කඩා ඉවත් කර කාර්යමණ්ඩලයට නිවාස ඉදිකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. | පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය.<br><br>**කැන්බරාහි පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය සතු ශ්‍රී ලංකා රජය සතු ගොඩනැගිලි 3හි අලුත්වැඩියා කටයුතු සිදුකළ ආකාරය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.** |
| 7. | අතිගරු ජනාධිපතිතුමාගේ පිලිපීන සංචාරයේදී එරටට ශ්‍රී ලංකාවේ තානාපති සබඳතා ආරම්භ කිරීමට ඉඩමක් දීමට එකඟ වූ කරුණ හා ශ්‍රී ලාංකිකයන්ට පිලිපීන වීසා ලබා ගැනීමේ පවතින අපහසුතා | මේ සඳහා පිලිපීනය පාර්ශවයෙන් සන්නිවේදනයක් මෙතෙක් සිදු නොවූ බවද ඒ සම්බන්ධයෙන් පිලිපීන ශ්‍රී ලංකා තානාපතිනිය මගින් විමසීමක් සිදු කරන බවද ප්‍ර.ග.නි. පැවසීය. මේ සම්බන්ධයෙන් කටයුතු කඩිනම් කර මාර්තු 20වැනිදාට පෙර මේ පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය.<br><br>**ශ්‍රී ලංකාවේ පිලිපීන නිත්‍ය දූත මණ්ඩලය නැවත විවෘත කිරීම හා ශ්‍රී ලාංකික ප්‍රජාව සඳහා නිකුත් කරනු ලබන වීසා බලපත් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරඇත.** |
| | **ශ්‍රී ලංකා රේගුව<br>2019 මාර්තු 07** | |
| 1. | දැනට ක්‍රියාත්මක වන අතිකාල යෝජනා ක්‍රමය පිළිබඳව කාරක සභාවට එකඟවිය නොහැකි බැවින් කලාපයේ වෙනත් රටවල අතිකාල ගෙවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ක්‍රමවේදයන් අධ්‍යයනය කර සවිස්තර | රේගු අඥාපනතේ වගන්ති අංක 6 හි ප්‍රතිපාදනයන්ට අනුකූලව රේගු නිලධාරීන් සේවා ඉටු කිරිමේදි බාහිර පාර්ශ්වයන්ගෙන් අය කරන ගාස්තු පදනම්ක ර පිහිටුවා ඇති අරමුදලක් මගින් අතිකාල දිමනා ගෙවිම් සිදු කරන බවත් ඊට රජයේ මූල්‍ය ප්‍රතිපාදන භාවිතා නොකරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | වාර්තාවක් කාරක සභාවට ලබාදෙන ලෙස කළ නියෝගය. | එසේම කලාපිය රටවල ඒ සඳහා අනුගමනය කරන ක්‍රමවේදයන් අධ්‍යයනය කර වාර්තාවක් ලබාදීමට කටයුතු කරන බවට ප්‍ර.ග.නි./ග.නි. එකඟ විය.<br>**මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි.**<br><br>**කලාපයේ අනෙකුත් රටවල අතිකාල ගෙවීමේ අනුපාත හා සංසන්දය කිරීමේදී ශ්‍රී ලංකාව අවම අතිකාල ගෙවන රටවල් අතරින් දෙවන ස්ථානයේ පවතින බව සංඛ්‍යා ලේඛන මගින් පෙන්වා දී ඇති අතර මෙම අනුපාතයන් දිගමට පවත්වා ගැනීම සුදුසු බවට ග.නි. නිර්දේශ කර ඇත.** |
| 2. | නිෂ්පාදන බදු (විශේෂ) විධිවිධාන පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දින වකවානු සහිත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ලබා දී තිබු නියෝගය. | මෙම පනත් කෙටුම්පත 2016 මැයි 20 දින මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇතත් මේ දක්වා එය ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමට නොහැකි වී ඇත. එය ක්‍රියාත්මක කිරීමේ වගකීම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරී ඇති බැවින් ඒ පිළිබඳව සොයා බලා වර්තමාන තත්ත්වය කාරක සභාවට වාර්තා කිරීමට එකඟවිය.<br><br>මෙම පනත බලාත්මක නොවීම හේතුවෙන් රජයට විශාල ආදායමක් අහිමිවන බව ප්‍රකාශ කළ කාරක සභාව කෙටුම්පත පාර්ලිමේන්තුවේ අනුමැතියට යොමු කර කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස අවධාරණය කළේය. |
| 3 | නිලධාරින් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කර නියමානුකූල කර ගන්නා ලෙසත් ඒ සම්බන්ධයෙන් අධ්‍යනය කර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් ලබාදී තිබූ නියෝගය. | විවිධ ස්ථානවල විවිධ වූ කාර්යයන් පැවරි ඇති රේගු නිලධාරීන්ට ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමේදී මතුවන ගැටළු පිළිබඳ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයා සමග සාකච්ඡා කළ බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. අදාළ නිලධාරියා කුමන ස්ථානයකට අනුයුක්ත කර තිබුණත් පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ ක්‍රමවත් වූ අභ්‍යන්තර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බවත් එය නිසි අධීක්ෂණයකින් යුතුව සිදුකෙරෙන බැවින් ඒ සම්බන්ධව කිසිදු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | පැමිණිල්ලක් මේ දක්වා ලැබී නොමැති බව ග.නී. පැවසිය.<br><br>රේගු නිලධාරීන්ට රාජකාරි විවිධත්වය නිසා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමේ අපහසුතාවයක් පවතින්නේ නම් පරිපාලන කටයුතු ඉටුකරන කාර්යාලීය සේවක මණ්ඩලයට එය අනුගත කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව නිර්දේශ කළේය. අනෙකුත් කාර්ය මණ්ඩලයට ඉදිරියේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර හඳුන්වා දීමට කටයුතු කරන බවට ග.නි. එකඟ විය. |
| **4.** | මනුෂ්‍ය ආහාරයට නුසුදුසු සුදු ළූණු ඇතුළත් බහාලුම් 03 ක් ගැණුම්කරු වෙත මුදාහැරීම නිසා රු.1,134,000 ක රේගු බදු ආදායම් අහිමි වීම පිළිබඳව වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස කළ නියෝගය. | වරායට ගෙන එන නුසුදුසු භාණ්ඩ අපහරණය කිරීමේ වගකීම වරාය අධිකාරිය සතු කාර්යයක් වන අතර එය රේගු නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරික්ෂකගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකළ යුතු බව අනාවරණය විය. එසේ වුවත්, මෙම සුදුළූණු තොගය බැහැර කිරීමේදි එම ක්‍රමවේදයට අනුකූලව කටයුතු කර තිබේද යන්න සොයා බැලිය යුතු බැවින් ඒ පිළිබඳව පූර්ණ පරික්ෂණයක් සිදුකර සවිස්තර වාර්තාවක් ජූලි 7 දිනට පෙර කාරක සභාවට ලබාදෙන බවට ප්‍ර.ග.නි./ග.නී. එකඟවිය.<br><br>**මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණු අතර පිළිගත් ක්‍රමවේදයට අනුගතව මෙම සුදුළූණු බැහැර කිරීම සිදුකළ බවට තොරතුරු අනාවරණය කර ඇත.** |
| **5.** | ඉකුත් වර්ෂ 03 ක කාලය තුල තීරු බදු නිදහස් පදනම මත භාණ්ඩ අලෙවි කරන වෙළඳසැල් සඳහා ලබාදුන් භාණ්ඩවල වටිනාකම හා ලබාදුන් බදු සහනවල වටිනාකම ඇතුළත් වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාවට ලබා දෙන ලෙස කළ නියෝගය. | ගබඩාවේ සිට පාරිභෝගිකයා දක්වා වූ මෙම සමස්ත ක්‍රියාවලියම දැනට සිදුකරනු ලබන්නේ අත්පොත් භාවිතයෙන් (Manual system) වුවත් වඩාත් විනිවිද භාවයකින් යුතුව සිදුකිරීමේ අරමුණින් නව ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර එය අප්‍රේල් මස මුල් සතියේ සිට ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නී. අක්‍රමිකතා අවම කර ගැනීම මෙහි මූලික අරමුණ බව වැඩිදුරටත් පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| **6.** | රේගුවේ තොරතුරු ව්‍යාජ ලෙස වෙනස් කර වාහන 07 ක් ලියාපදිංචි කිරීමේදී සිදුවී ඇති අක්‍රමිකතාවයක් සම්බන්ධව පැවැත්වෙන පරීක්ෂණයේ වාර්තාව කාරක සභාවට ලබාදෙන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුම් දී ඇතත් එය ඉටු නොකිරීම. | 2013 වර්ෂයේ රේගු බදු වටිනාකම රු. ලක්ෂ 95 ක් වූ වාහන 6 ක් ආනයනය කර රු. ලක්ෂ 75 ක බදු මුදලකට රේගුවෙන් නිදහස් කර එම වාහන ලියාපදිංචිය ද සිදුකර පසුව එම එන්ජින් සහ චැසි අංක භාවිතා කර වෙනත් වාහන 7 ක් ලියාපදිංචි කර ඇති බවත් 2016 වර්ෂයේ ආනයනය කළ විදුලි කාරයක් වෙනුවට Hummer වාහනයක් ලියාපදිංචි කර රජයට බදු මුදලක් අහිමි කර ඇති බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නී./ග.නි. ඒ සඳහා රේගු නිලධාරීන්ගේ සහය ලැබී තිබේද යන්න සොයා බැලීම සඳහා මධ්‍යම විමර්ශන ඒකකය මගින් පරීක්ෂණය පවත්වා ගෙන යන බවත් නිලධාරින් අල්ලස් ලබාගෙන තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා මෙම කාරණය අල්ලස් කොමිසම වෙත භාර දී ඇති බවත් අනාවරණය විය. |
| | **සුරාබදු දෙපාර්තමේන්තුව**<br>**2019 මාර්තු 08** | |
| 1. | 2018.12.31 දිනවන විට කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ තනතුරු 29ක්, තෘතියික මට්ටමේ තනතුරු 54ක් හා ද්වීතියික මට්ටමේ තනතුරු 87ක පුරප්පාඩු පැවතීම | නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 04ක් සඳහා රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලැබීමට නියමිත බවත් සුරාබදු අධිකාරී තනතුරට අදාළව 2012 වර්ෂයේදී පවරා ඇති නඩුවේ අවසාන තීන්දුව ලැබීමෙන් පසු පුරප්පාඩු 12ක් පිරවීමට නියමිත බවත් සුරාබදු සැරයන් තනතුරු 84ක පුරප්පාඩු පිරවීම සඳහා අදාළ විභාග පැවැත්වීමට කටයුතු කරමින් සිටින බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 2. | සුරාබදු දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකට සම්බන්ධ වන පරිගණක දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ වර්තමාන තත්ත්වය. | සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා දත්ත පද්ධතියක් හඳුන්වාදීමේ අරමුණින් 2016 වර්ෂයේදී වසර දෙකක අධ්‍යනයක් සිදුකරමින් සුරාබදු ආදායම් කළමනාකරණ පද්ධතියක් (Excise Revenue Management System) මිලදී ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යොමු වූ බවත් එහිදී ගැටළු මතුවීම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු නැවතුන බවත් ප්‍ර.ග.නි./ග.නි පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරී/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | එසේම ස්ටිකර් කළමනාකරණ පද්ධතියක් (Sticker Management System) දෙපාර්තමේන්තුවට හඳුන්වාදීමට හා ලෝක බැංකුව හා යුරෝපා හවුල ඒකාබද්ධව දෙපාර්තමේන්තුවේ කටයුතු පරිගණකගත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට හා ආදායම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට මූලික කටයුතු සිදුකරමින් පවතින බවත් අනාවරණය විය. මේ අනුව අනෙකුත් ආයතන සමඟ සම්බන්ධවන පරිගණක දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂාකරන බව ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් පැවසීය.<br><br>නව පරිගණක දත්ත පද්ධතිය ක්‍රියාත්මකවන තෙක් මුදල් අමාත්‍යාංශයේ මූලික මැදිහත් වීම මත මෙම ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා සුරාබදු හා රේගු දෙපාර්තමේන්තුව අතර මෙන්ම මෙම ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් ආයතන සමඟ ලිපි ලේඛන හුවමාරු කර ගැනීම මඟින් ඒකාබද්ධ වැඩපිළිවෙලක් (Manual System ) ක්‍රියාත්මක කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 3. | 2014 වර්ෂයේදී ආපන ශාලාවක් සඳහා බාහිර පාර්ශවයක් විසින් සුරාබදු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා 2008 අප්‍රේල් 30 දිනැති අංක 902 දරන සුරාබදු නිවේදනයේ 13(2) වගන්තිය අනුව ඉදිරිපත් කළ මිනින්දෝරු සැලැස්ම සඳහා බලපත්‍ර ලබා දීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර එම මිනින්දෝරුවා විසින්ම ඉදිරිපත් කරන ලද සම දින දරණ වෙනත් මිනින්දෝරු සැලැස්මක් සඳහා බලපත්‍ර නිකුත් කර තිබීම. | මෙවැනි ගැටළුවකදී රජයේ මිනුම්දෝරු වාර්තාවක් කැඳවා එහි නිර්දේශ අනුව බලපත්‍රය නිකුත් කරන බවත් මෙහිදී ඒ අනුව ක්‍රියාකර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෙය නිවැරදි කළ බව දක්වමින් විස්තරාත්මක වාර්තාවක් 2019 මැයි මස 08ට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**මෙම කරුණ නිවැරදි කළ බවට සහතික කරමින් අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**<br>**ඒ අනුව, අභියාචනාධිකරණයේ අංක SE/FR/312/14 දරණ නඩුවේ 2014.11.07 දින ලද තීරණයකට අනුව අත්හිටුවන ලද බලපත්‍රය දීර්ඝ කිරීමක් සිදුකර ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| 4. | අංක 1544/17 දරන 2008 අප්‍රේල් 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 27වන කොන්දේසියට පටහැනිව මාතලේ නගරයේ රටබීම හලක් පවත්වාගෙන යාම සඳහා 1996 වසරේ ලබා දී තිබූ බලපත්‍රයක් මත එම රට බීමහල මඩකළපුව දිස්ත්‍රික්කයේ තුනුක්කායි නගරයේ පවත්වාගෙන යාම සඳහා 2010 වසරේ අනුමැතිය ලබාදී තිබීම. | සුරාබදු ආඥා පනත යටතේ මීට අදාළ අනුමැතිය ලබා දීමට මුදල් ඇමතිවරයාට බලතල ඇති හෙයින් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලද ලිපියට අනුව අනුමැතිය ලබා දී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>එම අනුමැතිය සහිත ලිපිය මාසයක් ඇතුළත කාරක සභාවට ලැබීමට සලස්වන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |
| 5. | 2015 මාර්තු මස පෞද්ගලික සමාගමක් විසින් ධාන්‍ය භාවිතා කරමින් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ එතිල් මධ්‍යසාරය නිෂ්පාදනය කිරීම සඳහා ඉදිරිපත් කළ අනුමැතිය ලබා ඇති ව්‍යාපෘති වාර්තාවට පටහැනිව කල්කුඩා ප්‍රදේශයේ නිෂ්පාදනාගාරයක් ආරම්භකර ඇති අතර එම කර්මාන්තය සඳහා යොදාගනු ලබන ධාන්‍ය වර්ග මොනවාද යන්න පිළිබඳ තොරතුරු, ව්‍යාපෘති වාර්තාව තුළ ඇතුළත් නොවීමත්, ඒ සමඟ කාර්මික වාර්තාව, පළාත් පාලන ආයතන අනුමැතිය, පාරිසරික වාර්තා,ඉඩමේ අයිතිය පිළිබඳ වාර්තා, බොයිලේරු සහතික වැනි ලිපි ලේඛන ඉදිරිපත් කර නොතිබියදී මෙම වාර්තාව සඳහා අනුමැතිය ලබා දී තිබීම. | දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කිසිදු අනුමැතියක් හෝ බලපත්‍රයක් නිකුත්කර නොමැති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මීට අදාල ස්ථානීය පරීක්ෂාවක් සිදුකර වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**ස්ථානීය පරීක්ෂාවක් සිදුකිරීම සඳහා පරීක්ෂණ කමිටුවක් පත්කර ඊට අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** |
| 6. | බොරලැස්ගමුව ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක් විසින් ර.බි. 08 යන සුරාබදු බලපත්‍රයක් ඉල්ලුම්කර තිබුණද නියමිත දුර ප්‍රමාණය නොමැතිවීම සහ මහජන විරෝධතා පැවතීම හේතුවෙන් එම බලපත්‍රය ලබා නොදීමට සුරාබදු දෙපාර්තමේන්තුව තීරණයකර | මේ සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් සිදුකර මිනින්දෝරු වාර්තා මත පදනම්ව දුර ප්‍රමාණය නිවැරදියැයි සහතික කළ බවත් ඉන්පසු බලපත්‍රය නිකුත් කළ බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>අදාළ බලපත්‍රය ඉල්ලුම් කළ අවස්ථාවේ නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | තිබුණද පසුව 2016.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි එම බලපත්‍රය නිකුත් කර තිබීම. | මොනවාද යන්න සහ පසුව නිකුත් කිරීමට හේතු වූ කරුණු මොනවාද යන්න සම්බන්ධයෙන් ලිඛිත වාර්තාවක් කඩිනමින් ඉදිරිපත් කරන මෙන් කාරක සභාව නියෝග කළේය.<br><br>**මීට අදාළ පිළිතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව,**<br><br>**මෙම ආයතනය සඳහා නව බලපත්‍ර ලබා දීම සම්බන්ධව මහජන විරෝධතා ඇති බව දන්වමින් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් නිර්දේශ නොකිරීමෙන් 2015 වර්ෂයේදී නව බලපත්‍රයක් ලබා දී නොමැති අතර මෙම විරෝධතා පරීක්ෂා කිරීමට සියලු පාර්ශ්ව දැනුවත් කරමින් පැවැත්වූ පරීක්ෂණය සඳහා කිසිදු විරෝධතාකරුවකු පැමිණ නොමැති බැවින් හා මෙය සංචාරක මණ්ඩලයේ අනුමත ආයතනයක් බැවින් විරෝධතාවක් පැන නැගිය හොත් නැවත පරීක්ෂණයකට යටත්ව ඉදිරි මාස 03කට අදාළව බලපත්‍රය නිකුත් කර ඇති අතර පසුවද විරෝධතා පැන නැගී නොමැති හෙයින් බලපත්‍රය දීර්ඝ කර ඇත.** |
| 7. | 2010 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු අනතුරට ලක් වූ බස්රථයක අළුත්වැඩියා කටයුතු සඳහා රු.590,450ක් වැයකර ඇති අතර මෙහි අලාභය බාහිර පාර්ශවයේ අදාළ රක්ෂණ සමාගමෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. පසුව අදාළ රක්ෂණ සමාගම විසින් රු. 116,120ක් වන්දි ලෙස ගෙවීමට ඉදිරිපත් කරන ලද සමථ යෝජනාවට දෙපාර්තමේන්තුව විසින් එකඟවීම හේතුවෙන් රු.474,330ක අලාභයක් සිදුව තිබීම. | මෙම සිදුවීම ප්‍ර.ග.නි./ග.නි. පිළිගත් අතර මේ සම්බන්ධව තවදුරටත් කටයුතු කිරීමේදී පාඩු සිදුවිය හැකි බැවින් හා මෙම සිදුවීම වසර 9ක් පැරණි බැවින් මෙම අලාභය විසර්ජන ගිණුමේ හානි පාඩු ලේඛණයට ඇතුළත් කර භාණ්ඩාගාරයේ අනුමැතිය මත කපාහැරීමට කටයුතු කරන මෙන් කාරක සභාව නියෝග කළේය.<br><br>**භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා 2019 වර්ෂයේ විසර්ජන ගිණුම මඟින් ගැලපුම් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| 8. | 2002 අප්‍රේල් 18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 4 වැනි පරිච්ඡේදය අනුව විපරිත ස්ප්‍රීතු පාලනය වන රීති යටතේ මධ්‍යසාර සක්‍රීය හා මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට පත්කිරීම සඳහා බ්‍රිටෙක්ස් වැනි විපරිකාරකයන් යෙදිය යුතු වේ. එහෙත් පෞද්ගලික සමාගමක් විසින් 2016 මාර්තු දක්වා කාර්මික කටයුතුවලට ලබාගත් ස්ප්‍රීතු විපරිකරණය කිරීම සඳහා බ්‍රිටෙක්ස් යොදා නොගැනීමත්, 2016.03.01 දින එම සමාගම බ්‍රිටෙක්ස් 500g ලබා ගෙන තිබුණද 2014,2015 වර්ෂවලදී ද එම ආයතනය වෙත සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අදාල විපරිකාරකය නිකුත්කළ බවට සාක්ෂි නොතිබීමත් සම්බන්ධයෙන් කාරක සභාව විමසීය. | මෙයට හේතුව අදාල ලේඛන පවත්වාගෙන යාමේ අඩුපාඩු පැවතීම බවත් මේ වන විට නිවැරදිව ලේඛන පවත්වාගෙන යන බව හා බ්‍රිටෙක්ස් වැනි විපරිකාරකයන් යෙදුවාදැයි තහවුරු කර ගැනීමට රස පරීක්ෂක වාර්තා ලබාගත් පසු පමණක් අදාල නිෂ්පාදන නිකුත්කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මේ සම්බන්ධ වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් නියම කල අතර මෙම තොගවලින් 50%ක් අවසන් වීමේදී නැවත ඇණවුම් කිරීමට කටයුතු කරන ලෙසද කාරක සභාව නියෝග කළේය.<br><br>**2014 හා 2015 වර්ෂ වලදී බ්‍රිටෙක්ස් රසායනිකය අවශ්‍යතාවය මත ඉල්ලුම් කළ ආයතනවලට නිකුත් කර ඇති බවත් අදාළ සියලු වාර්තා සුරාබදු දෙපාර්තමේන්තුව සතුව ඇති බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |
| 9. | 2015 සහ 2016 වර්ෂවලදී බදු ගෙවන ලද ස්ප්‍රීතු ප්‍රමාණයට වඩා වැඩිපුර පිළිවෙලින් ස්ප්‍රීතු ලීටර් 10,604.6 ක් සහ ලීටර් 6,455.7 ක් මෙරටට ගෙන්වා තිබීම හා මෙසේ වැඩිපුර ගෙන්වන ලද ස්ප්‍රීතු ප්‍රමාණයට අදාළව සුරාබදු අයකළ බවට තොරතුරු නොවීම හා අදාළ ස්ප්‍රීතු ප්‍රමාණය දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අධීක්ෂණයට ලක්වූ බවට සාක්ෂි නොතිබීම. | මෙම ක්‍රියාවලිය විධිමත්කර ගැනීම සඳහා වරායෙහි හා ගුවන් තොටුපළෙහි සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යාල ස්ථාපිත කර අවශ්‍ය නිලධාරීන් සේවයේ යෙදවීමට ක්‍රියාකරන ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |
| 10. | සුරාබදු දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි ඉදිකිරීමේ උපදේශක ලෙස ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර විධිමත් ලෙස කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමට පෙර මූලික | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමේ පියවර ලෙස ප්‍රතිපාදන නිකුත්කිරීමෙන් පසු ගිවිසුම් අත්සන්කර නිමකර ඇති කාර්යය අනුව ගෙවීම් කිරීමට කටයුතු කරන බවට ප්‍ර.ග.නි./ග.නි. එකඟ විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | ඇස්තමේන්තුව පදනම් කරගෙන සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන මුදාහැර ඇත. ඒ අනුව ඉදිකිරීම් සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු ප්‍රතිපාදන වෙනත් පාර්ශවයන් අවිධිමත් ලෙස පරිහරණය කිරීම. | |
| 11. | මත්පැන් බෝතල් හා මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහාවන ආරක්ෂිත ස්ටිකර් හා ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතියක් සැපයීම, ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා අවම මිල ඉදිරිපත්කර තිබූ ආයතනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබා ගෙන තිබුණි. එම තීරණය මත තෝරාගත් ලංසුකරු පිළිගත් බද්ධ ව්‍යාපාරයක් ලෙස සැලකීමට අවශ්‍ය නීතිමය අවශ්‍යතා සපුරා නොමැති හෙයින් ඔහු ප්‍රතික්ෂේප කර නැවත ලංසු කැඳවීම මඟින් එම ලංසුකරුම තෝරා ගෙන ඇත. ඒ පිළිබඳව හා එම ලංසුකරුම මුල් අවස්ථාවේදී ස්ටිකර් 1000ක් සඳහා ඉදිරිපත්කර තිබූ මිල ඇමරිකන් ඩොලර් 3.19 වුවද දෙවන වර ලංසු කැඳවීමේදී ඉදිරිපත්කර තිබූ මිල ඇ.ඩො. 5.99ක් විය. මේ හේතුවෙන් පළමු වසර සඳහා ස්ටිකර් මිලියන 384ක් සඳහා දළ වශයෙන් වැඩිපුර රු.මිලියන 166.65ක් දැරීමට සිදුවීම.<br><br>මෙම ස්ටිකරය නොමැතිව මත්පැන් අලෙවිකළ නොහැකි බවට සුරාබදු පනතේ ප්‍රතිපාදන | නැවත වරක් ටෙන්ඩර් කැඳවීමේදී මෙය ජනාධිපති කොමිසම් පරීක්ෂණයෙන්ද අනුමත වූ බවත් එම අවස්ථාවේදී පැවති අවම ලංසු මිලවන ඇ.ඩො. 5.99 ඉදිරිපත්කළ පළමු ලංසුකරුටම ටෙන්ඩරය ලබා දීමට එකඟ වූ බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන මෙම ස්ටිකරයෙහි සම්පූර්ණ භාරකාරත්වය සුරාබදු දෙපාර්තමේන්තුව සතු බව හා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ කේතන ක්‍රමවේදයක් (Encoding System) හරහා නිෂ්පාදකයාගේ ඉල්ලුමට අනුකූලව එය නිකුත් කරන බවත් ඉන් පසුවද එම ස්ටිකරයේ භාරකාරිත්වය සුරාබදු දෙපාර්තමේන්තුව සතු බවට ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. එය වෙළඳපොලට ගිය පසුවද අංශ කිහිපයකින් අධීක්ෂණය කරන බවද ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා ගිවිසුම්ගතව ජංගම යෙදුමක් (Mobile App) හරහා පාරිභෝගිකයාට වුවද එම බෝතල් සත්‍ය හෝ ව්‍යාජ මත්පැන්ද යන්න පිළිබඳව පරීක්ෂාකළ හැකි බවද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>පසුගිය කාලයේදී නීතිවිරෝධී ලෙස නීත්‍යානුකූල මත්පැන් ප්‍රවාහයට එක්වූ දේශීය හා විදේශීය මත්පැන් පැවති බවත්, එයට විකල්පයක් ලෙස නීත්‍යානුකූලව නිෂ්පාදනය කළ මත්පැන් වර්ග නීත්‍යානුකූල නොවන ලෙස නිෂ්පාදනය කළ මත්පැන් වලින් වෙන් කර හඳුනා ගැනීම උදෙසා මෙම ලේබලය හඳුන්වා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | අන්තර්ගතව පවතින්නේද යන්න හා නිෂ්පාදකයින් හා ආනයනකරුවන් මෙය ලබාගන්නේ කෙසේද යන්න පිළිබඳව කාරක සභාව විමසීය. | දුන් බවත් ප්‍ර.ග.නි./ග.නි. පැහැදිලි කළේය. තවද ආරම්භයේදී මේ සඳහා යන්ත්‍ර 500ක් ඇණවුම් කිරීමටත් දිවයින පුරා පිහිටි සුරාබදු ස්ථාන 59ක් අතර මෙම යන්ත්‍ර බෙදා හරින බවත් මෙම ක්‍රමවේදය හඳුන්වාදීමෙන් පසු මාසික පරීක්ෂණ වාර ගණන වැඩි කිරීමට හැකි වීම හරහා සත්‍ය හා ව්‍යාජ මත්පැන් (Genuine and Fake Liquor) හඳුනාගැනීමට හැකි වන බවත් ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් පැවසීය.<br><br>මීට අදාළ නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කර පනත සංශෝධනය කළ බවත් 2019.05.15 දින සිට මෙම ස්ටිකර් ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිත බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. එසේම මෙම ක්‍රියාවලිය සඳහා යම් කාලයක් නිෂ්පාදකයන් ඉල්ලා ඇති බවත් මෙම ස්ටිකරය සහිත මත්පැන් වෙළඳසැල්ද මෘදුකාංගයක් (Software System) හරහා හඳුනාගත හැකි බවත් ප්‍ර.ග.නි/ග.නි. වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය.<br><br>ඉහත ටෙන්ඩරය ලබාදීමේ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් හැකි ඉක්මනින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට හා ඉදිරියේදී සුරාබදු දෙපාර්තමේන්තුව කැඳවීමේදී මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳ පරිගණක ඉදිරිපත් කිරීමක් (Presentation ) කළ යුතු බවට කාරක සභාව නියෝග කළේය.<br>**මේ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත්කර ඇත. ඒ අනුව,**<br><br>**ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතියක් සැපයීම, ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යෑම සඳහා වූ ප්‍රසම්පාදනය දෙපාර්තමේන්තුව විසින් සිදුකර අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද, 2016.12.08 දිනැති අංක 16/2556/719/153/TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තෝරා ගත් ලංසුකරු** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **පිළිගත් බද්ධ ව්‍යාපාරයක් ලෙස සැලකීමට අවශ්‍ය නීතිමය අවශ්‍යතා සපුරා නොමැති හෙයින් ප්‍රතික්ෂේප කර නැවත ලංසු කැඳවීමට අනුමැතිය ලබා දී තිබුණි.**<br>**ඒ අනුව නැවත අමාත්‍යාංශය ලංසු කැඳවීම සිදුකළ අතර එම අවස්ථාවේ ඉදිරිපත් වූ අවම ලංසුකරුට උක්ත ටෙන්ඩරය ප්‍රධානය කළ බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |
| 12. | 2015/05/21 දින ස්කාගාර සමාගමක් සම්බන්ධයෙන් සිදුකරන ලද සුරාබදු පරීක්ෂණයකදී හෙළි වූ වැරදි වෙනුවෙන් 2015.12.31 දිනට ගෙවිය යුතු රු. 50,620,739 ක බදු මුදල ඊට අදාල පරීක්ෂණය සිදුකිරීම සඳහා ස්ථාපිත කළ කමිටුව විසින්ද අයකළ යුතු බවට නිර්දේශකර තිබුණද 2019 ජනවාරි මස වන විටත් අදාල සමාගමෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වීම. | මීට අදාළ සමාගම විසින් මෙම මුදල ගෙවීමට යම් සහන කාලයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටි බවත් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් සහන කාලයක් ලබා දිය නොහැකි බවට දෙපාර්තමේන්තුවට දැන්වූ බවත් අනාවරණය විය. මේ පිළිබඳව අදාල සමාගම දැනුවත් කළද නැවත 2019.03.07 දින මේ සම්බන්ධ අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත් අනාවරණය විය. මෙම මුදල දින 14ක් ඇතුළත ගෙවීමට අපොහොසත් වුව හොත් සුරාබදු ආඥා පනත යටතේ බලපත්‍රය අවලංගු කිරීමට කටයුතු කරන බව ඔවුන්ට දන්වා යවා ඇති බව ප්‍ර.ග.නි/ග.නි. පැවසීය.<br><br>මේ සඳහා නීතිපති උපදෙස් ලබා ගන්නා ලෙසට කැබිනට් අනු කමිටුවක් මඟින් 2018 නොවැම්බර් මාසයේදී දැනුම් දී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර නීති උපදෙස් අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තුවේ නීති නිලධාරියෙකු නොමැති බැවින් අමාත්‍යාංශය වෙත යොමු කරන බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෙම බදු මුදල අයකර ගැනීම පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි/ග.නි. වෙත නියෝග කළ අතර සුරාබදු දෙපාර්තමේන්තුවට නීති නිලධාරියකු පත්කළ යුතු බවද අවධාරණය කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **මෙම ආයතනය විසින් අදාළ ගෙවීම සිදු කිරීම සඳහා සහන කාල සීමාවක් ඉල්ලුම් කර ඇති බැවින් අදාළ ලිපිය ඉදිරිපියවර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බවත් ඒ සඳහා උපදෙස් ලද වහාම වාර්තා කිරීමට කටයුතු කරන බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |
| 13. | 2016 වර්ෂයේදී නීති විරෝධී ලෙස ස්ප්‍රීතු ආනයනය කරන ලද සමාගමක් සම්බන්ධයෙන් රේගු පරීක්ෂණයක් හා දෙපාර්තමේන්තු පරීක්ෂණයක් පවත්වා ඇති අතර 2016 ජනවාරි 13 දිනැති කමිටු වාර්තාවෙන් රු. 588,900,344ක බදු මුදලක් සමාගමෙන් අයකළ යුතුබවට නිර්දේශ කර තිබුණද 2017 ජනවාරි මස වන විටත් එය අයකර ගෙන නොතිබුණි. අමාත්‍යවරයා විසින් මෙම මුදල මාසික වාරිකය රු. 15,391,208.75 බැගින් වාරික 30 කින් අයකර ගැනීමට අනුමැතිය ලබා දී තිබුණද එම තීරණය සුරාබදු ආඥා පනතේ (සංශෝධිත) 22 සහ 32 (2) වගන්තිවලට අනුකූලද ප්‍රශ්නගත කරුණක් විය. | ලීටර් 500,000ක නිරපේක්ෂ මත්පැන් (Absolute Alcohol) ගෙන්වා ඇති බවට රේගුව වාර්තා කර ඇති නමුත් පවතින සම්මතයන් අනුව (Proof ) පරිවර්ථනය කිරීමේදී සුරාබදු දෙපාර්තමේන්තුවේ ගණනය කිරීමට අනුව එය ලීටර් 800,000ක් විය යුතු බව හා ගණනය කිරීමේ සූත්‍රයේ වැරදීමක් මත මිලියන 1045ක අත්හැරීමක් සිදුවී ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය. මේ හා සම්බන්ධ ලිපි ගොනු අස්ථානගතව ඇති බැවින් ඒ පිළිබඳව මූලික පරීක්ෂණයක් සිදුකිරීමට අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කර දෙන ලෙස ඉල්ලා ඇති බවද වැඩිදුරටත් කරුණු දක්වමින් ප්‍ර.ග.නි/ග.නි. පැවසීය.<br><br>මෙම සිදුවීමේ වර්තමාන තත්වය පිළිබඳ වාර්තාවක් 2019 මාර්තු මස 31 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන මෙන් ප්‍ර.ග.නි/ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**මෙම මුදල මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත වාරික ගෙවීම් පදනමට අදාළ ආයතනය විසින් ගෙවීම් සිදු කරනු ලබන බවත් ඒ අනුව 2019.02.28 දින දක්වා නියමිත පරිදි වාරික ගෙවා ඇති බවත් තව දුරටත් රු. 76,956,043.67ක මුදලක් ඉදිරි වාරික 5 ක් තුළ ගෙවිය යුතු බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br>2019 මාර්තු 12** | | |
| 1. | 2012 දෙසැම්බර් 31 සිට 2018 දෙසැම්බර් 31 දක්වා ඉදිරිපත් කර ඇති වාර්ෂික හිඟ ආදායම් වාර්තා අනුව මුළු හිඟ ආදායම, ක්‍රමිකව ඉහළ ගොස් තිබීම. | හිඟ බදු ආදායම් අය කර ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව කිසිසේත්ම සෑහීමකට පත් නොවන බව සඳහන් කළ කාරක සභාව හිඟ බදු ආදායම් අය කර ගැනීම සඳහා සිදු කරගෙන යන ක්‍රියාවලිය, දෙපාර්තමේන්තු මට්ටමෙන් සිදු කරන අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කරන අභියාචනා කමිටුවල ක්‍රියාකාරිත්වය හා අභියාචනා විසඳීම සඳහා ගත යුතු පියවර ගැන ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය.<br>**ඒ අනුව හිඟ බදු අයකර ගැනීම සඳහා පත් කිරීමට නියමිත කමිටුවේ කාර්යභාරයන්, හිඟ බදු නිසි පරිදි එකතු කර නොගැනීමට හේතු හා හිඟ බදු අය කිරීම සඳහා අදාළ යෝජනා ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ලැබී ඇත. (ඇමුණුම 02)** |
| 2. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා හඳුනාගත් අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතන 23ක් සම්බන්ධ වන ඒකාබද්ධ පරිගණක ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය | රේගු දෙපාර්තමේන්තුව පමණක් මේ වන විට පරිගණක ජාලයට ඒකාබද්ධ කිරීමේ කටයුතු අවසන් බව කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>පරිගණක පද්ධතියට සම්බන්ධ කර ගත යුතු ආයතන 23 ඊට ඒකාබද්ධ කර ගැනීමේ වර්තමාන තත්ත්වය සහ අදාළ සියලු ආයතන පරිගණක ජාලය හා සම්බන්ධ වන දින සම්බන්ධයෙන් දින වකවානු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී.<br><br>**දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවට අමතරව මහජන බැංකුව, ලංකා බැංකුව හා මුදල් අමාත්‍යාංශය පරිගණක පද්ධතිය හා සම්බන්ධ කිරීමේ කටයුතු අවසන්ව ඇති අතර, අනෙකුත්** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **ආයතන ඊට සම්බන්ධ කිරීම 2020.03.31ට පෙර අවසන් කිරීමට නියමිතය.** |
| 3. | බදුකරුවන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබා දෙනු ලබන චෙක්පත් අගරු වීමේ ප්‍රවණතාව වාර්ෂිකව ඉහළ යමින් පැවතියද එය නිවැරදි කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ මෙලෙස අගරු වී පැවති චෙක්පත් සංඛ්‍යාව 5, 936ක් වූ අතර ඒවායේ වටිනාකම රු. මිලියන 1, 976ක් බව අනාවරණය විය.. | චෙක්පත්වලින් අදාල බදු ගෙවීම් භාර නොගෙන බැංකු අණකර මඟින් බදු ගෙවීම් භාර ගැනීමට අදාළ නෛතික පසුබිම අධ්‍යයනය කොට නිසි ක්‍රියාවලියක් සකස් කරන ලෙසත් ඒ පිළිබඳ වාර්තා කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය.<br><br>**මේ සඳහා වඩාත් සුදුසු මූලාමය මෙවලම බැංකු අණකර නොව බැංකු ඇපකර බවත්, එකී ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා පනතට සංශෝධනයක් කළ යුතු බවත් දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත.** |
| 4. | ඔට්ටු හා සූදු ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ව්‍යාපාරිකයෙකුගේ බදු ලිපි ගොනුවකට අදාළ 2014/15 තක්සේරු වර්ෂයේ ව්‍යාපාරික ආදායම රු. මිලියන 5, 105 ලෙස අනාවරණය කර ගෙන රු. මි. 2, 995ක අතිරේක බදු හා දඩ මුදලක් ගණනය කර තිබුණි. එහෙත් 2007/2008 තක්සේරු වර්ෂයේ සිට 2011/2012 තක්සේරු වර්ෂය දක්වාම ව්‍යාපාරික ආදායම රු. මිලියන 15ත් 20ත් අතර ප්‍රමාණයක් ලෙස ගණනය කර බදු අය කිරීමට කටයුතු කර තිබුණි. තක්සේරුවට අදාළව බදුකරු ඉදිරිපත් කළ බදු අභියාචනය දෙපාර්තමේන්තුව විසින් විභාග කර රු. මිලියන 500ක් තහවුරු කර තිබුණද එම තහවුරු කිරීම පරීක්ෂා කිරීම සඳහා අදාළ ලිපි ගොනුව 2019 පෙබරවාරි 25 දිනටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. එකම | අමාත්‍යාංශ මට්ටමින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා දිය යුතු යැයි කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**අමාත්‍යාංශය විසින් සිදු කළ පරීක්ෂණ වාර්තාව කාරක සභාවට ඉදිරිපත් කර තිබූ අතර එහි සඳහන් කරුණු සංක්ෂිප්තව මෙසේය.**<br><br>**මෙම ව්‍යාපාරය හිමි බදුකරු 2010 වර්ෂයේදී මිය ගොස් ඇති අතර මෙම ව්‍යාපාරය වෙනුවෙන් පෙනී සිටි ඔහුගේ පුතා තම පියා මිය ගිය බව ප්‍රකාශ කර නැති අතර තක්සේරු වර්ෂ 2014/15 සඳහා ව්‍යාපාරයෙන් ගෙවිය යුතු නියම බද්ද ගණනය කිරීමට පනත ප්‍රකාරව ලබා දිය යුතු සහයෝගය ලබා දී නොමැති බව හෙළි වී ඇත. පසුව සංශෝධනය කරන ලද බැංකු තැන්පතු මත, විවිධාකාරයෙන් අධ්‍යයනය කර ලබාගන්නා ලද දත්ත පදනම් කරගෙන ව්‍යාපාරයේ දළ ලාභය හා ශුද්ධ ලාභය තීරණය කර, ඒ අනුව තක්සේරුව සංශෝධනය කර තිබූ බවත් සඳහන්ය.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | ව්‍යාපාරය උදෙසා මෙලෙස වෙනස් බදු තක්සේරු ඉදිරිපත් කර තිබීම කාරක සභාවේ දැඩි අවධානයට යොමු විය. | **තවද, 2019.02.05 දින සහ නැවත 2019.03.06 දින ද අදාළ ලිපිගොනු රජයේ විගණන අංශය වෙත යවා ඇත.** |
| 5. | Legacy පරිගණක පද්ධතිය යටතේ එකතු කළ අගය මත බද්දට සහ ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව හිඟ බදු සඳහා ස්වයංක්‍රීයව තක්සේරු වාර්තා නිකුත් කිරීම 2012 වසරේදී නතර කර ඇත. ඒ හේතුවෙන් 2012 අප්‍රේල් 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා වූ බදු කාල පරිච්ඡේදය තුළ බදුකරුවන් විසින් ඉදිරිපත් කළ එකතුව රු. මිලියන 15,283ක බදු වාර්තා සඳහා මුදල් ගෙවා නොතිබුණ අතර ඊට අදාළ ව තක්සේරු වාර්තා නිකුත් වී නොතිබුණි. ඒ අනුව මෙම හිඟ බදු මුදල හා ඒ මත ගණනය කළ දඩ මුදල වශයෙන් රු. මිලියන 24,521ක හිඟ ශේෂයක් අය කර ගෙන තිබූ බව විගණනයට තහවුරු නොවූ අතර ඒවා හිඟ බදු ලෙස වාර්තා කිරීමට හෝ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබීම. | මෙම පරිගණක පද්ධතිය මඟින් හිඟ බදු සඳහා ස්වයංක්‍රීය තක්සේරු වාර්තා නිකුත් කිරීම නතර කිරීම උදෙසා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වන්නේ ඉහළ කළමනාකරණ මට්ටමින් වුවද අදාළ තීරණය ගැනීම සම්බන්ධව වගකිවයුත්තන් පිළිබඳ නිසි වාර්තා නොතිබීම සම්බන්ධව කාරක සභාවේ දැඩි අවධානයට යොමු විය.<br><br>**මෙයට අදාළ හේතු සඳහන් කරමින් දෙපාර්තමේන්තුව විසින් කාරක සභාවට සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම 03)** |
| | **සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**<br>**2019 මාර්තු 19** | |
| 1. | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම දින 30 ක ප්‍රමාදයකින් පිළියෙල කර තිබීමත්, 2017 වර්ෂයේ ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීමත් නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කළ යුතු කාර්යයන් හා ඉටු කර නොතිබුණු කාර්යයන් ප්‍රමාණය | ආයතනවල ප්‍රගති වාර්තා පිළියෙල කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශය මඟින් චක්‍රලේඛයක් නිකුත් වී නොමැති බව නිරීක්ෂණය කළ කාරක සභාව වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කිරීමේ ක්‍රමවේදය පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | නිර්ණය කර ගැනීමට නොහැකි වීම | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 මගින් මේ සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කර ඇති අතර එම චක්‍රලේඛ උපදෙස් වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතින බවත්, සංශෝධිත චක්‍රලේඛය කඩිනමින් නිකුත් කිරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු සිදු කරන බවත් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දන්වා ඇත.** |
| 2. | මහනුවර මහ රෝහල හැර අනෙකුත් බොහෝ රෝහල්වල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමේ නිසි ක්‍රමවේදයක් නොමැති අතර එමගින් රෝහල්වල සිදුවන වැරදි අඩුපාඩු නිවැරදි කර ගැනීමේ හැකියාවක් නොමැතිවීම. | මුදල් අමාත්‍යාංශය, විගණකාධිපතිවරයා හා ප්‍ර. ග.නි එක්ව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොමැති රෝහල්වල එම කමිටු පිහිටුවීමටත්, ඒවායේ රැස්වීම් නිසි පරිදි පැවැත්වීම සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩපිළිවෙලක් සකසන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය. යෝජිත වැඩපිළිවෙල සම්බන්ධ වාර්තාවක් 2019.04.01 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසද ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**අමාත්‍යාංශය යටතේ පවතින සියළු රෝහල් සහ ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කිරීමට හා රැස්වීම් පැවැත්වීමට 2019.03.27 දිනැති ලිපිය මගින් විගණකාධිපතිවරයාගේ සහයෝගය ඉල්ලා ඇති අතර එම ආයතනවල නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය උපදෙස් ලබා දීමට චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත උපදෙස් ලබා දී ඇත.** |
| 3. | බිලියන 45ක වාර්ෂික ඇස්තමේන්තුවක් අනුමත කෙරෙන හා 525 ක කාර්ය මණ්ඩලයක් සේවය කරන වෛද්‍ය සැපයීම් අංශය සඳහා වෙනම විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොමැති වීම | මෙම කරුණ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා සමග සාකච්ඡාවක් 2019.04.01 දිනට පෙර පැවැත්වීමට කටයුතු යොදන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළ අතර එම සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ පිළිබඳ වාර්තාවක් 2019.04.05 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසද ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා විගණකාධිපතිවරයා සමග රැස්වීමක් පැවැත්වීමට ඉල්ලා ඇති බව දන්වා ඇත.** |
| 4. | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.1 (ආ) ඡේදයට පටහැනිව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්වීම් බලධාරියාගේ අනුමැතියකින් තොරව ප්‍රධාන නීති නිලධාරී තනතුරේ වැඩ බැලීම සඳහා නීති නිලධාරී II ශ්‍රේණියේ නිලධාරිනියක් පත් කර තිබුණු අතර වසර 05ක් ගතව ඇතත් එම තනතුර පිරවීමට කටයුතු කර නොතිබීම | ප්‍රධාන නීති නිලධාරී තනතුරට පත් කිරීමට I ශ්‍රේණියේ නිලධාරියෙකු සොයා ගැනීමේ අපහසුව නිසා එම තනතුර පිරවීමට නොහැකි වී ඇති බවද, එම නිසා අමාත්‍යාංශයේ සේවය කරන II ශ්‍රේණියට අයත් ජ්‍යෙෂ්ඨතම නිලධාරිනිය තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇති බවද, ඇය I ශ්‍රේණියට උසස් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ඉල්ලා ඇති බවද ප්‍ර..ග.නි/ ග.නි පැවසීය.<br><br>ප්‍රධාන නීති නිලධාරී තනතුර පුරප්පාඩු ව තිබීම මත නීති ලිපිගොනු විශාල ප්‍රමාණයක් එක්රැස් වී ඇති බවද, නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඇතැම් ලිපිගොනු වසා දැමීම නිසා රජයට අය විය යුතුව ඇති විශාල මුදල් ප්‍රමාණයක් අහිමි වී ඇති බවද විගණකාධිපතිවරයා ප්‍රකාශ කළේය. දැනට ප්‍රධාන නීති නිලධාරී තනතුරේ වැඩ බලන නිලධාරිනිය එම තනතුරට පත් කිරීමේ නීතිමය හැකියාව සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු කරන ලෙසද, එම උපදෙස් අනුව එම නිලධාරිනිය එම තනතුරට පත් කිරීමේ හැකියාවක් නොමැති නම් අවශ්‍ය සුදුසුකම් සහිත නිලධාරියෙකු එම තනතුරට පත් කිරීමට කඩිනම් පියවර ගන්නා ලෙසද, ගනු ලබන ක්‍රියාමාර්ගය පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**ඉදිරියේදී ප්‍රධාන නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය ඇතුලත් ගැසට් නිවේදනය නිකුත් වූ වහාම ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා තනතුර පිරවීමට කටයුතු කරන බව දන්වා ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 5. | 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුළ හෙද සිසුන් 471ක් පුහුණුව අතහැර ගොස් තිබූ අතර බඳවා ගැනීමේ ගිවිසුම් ප්‍රකාරව රු.100,000/- ක ඇපකරය හා ගෙවූ දීමනා ආපසු අය කර ගත යුතු නමුත් සිසුන් 196 දෙනෙකුගෙන් මුළු මුදල රු. මිලියන 56.5ක් අය කර ගැනීමට අපොහොසත් වී ඇත. තවත් සිසුන් 207 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල කොපමණද යන්න ගණනය කර නොතිබීම හා පුහුණුව හැර යන සිසුන්ගෙන් මුදල් අය කිරීම සම්බන්ධ විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම | අදාළ ගාස්තු ආපසු අය කර ගැනීමට කටයුතු කරන ලෙසත්, එසේ අය කර ගැනීමට නොහැකි නම් නීත්‍යානුකූලව එම මුදල කපා හැරීමට පියවර ගන්නා ලෙසත් මේ සඳහා නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කරන ලදී.<br><br>**අදාළ ග්‍රාම නිලධාරී මාර්ගයෙන් තොරතුරු ගෙන්වා ගෙන අදාළ අයකිරීම් සිදු කරන ලෙස උපදෙස් දී ඇති බව දන්වා ඇත.** |
| 6. | අමාත්‍යාංශයේ නිලධාරීන් 51 දෙනෙකු පර්යේෂණ ආරම්භ කර මාස 03 සිට මාස 10ක් අතර කාල පරාසයක් තුළ දීමනා ගෙවීමෙන් පසු පර්යේෂණ අතරමග නතර කර තිබූ අතර එසේ අතරමග නතර කරන ලද පර්යේෂණ සඳහා එකතුව රු. 2,278,743/- ක්වූ දීමනා ගෙවීම හේතුවෙන් රජයට සිදු වූ පාඩුව. | මේ සම්බන්ධ වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි /ග.නි. වෙත නියෝග කළේය<br><br>**පර්යේෂණ සඳහා දීමනා ලබා ගෙන යථාවත් පරිදි පර්යේෂණ නිම කර වාර්තා ඉදිරිපත් නොකරන සියළු නිලධාරීන්/ නිලධාරිනියන්ගෙන් මුදල් අය කිරීමට අවශ්‍ය විධිවිධාන සලසන ලෙස දැනුම් දී ඇත.** |
| 7. | 2015.06.08 දින මාසිකව රු. 9,000,000/- ක් ගෙවීමේ පදනම මත කුලියට ගත් ගොඩනැගිල්ල සඳහා එදිනම ගිවිසුම් අත්සන් කළද 2015.05.01 සිට කුලී ගෙවීම ආරම්භ කිරීම හේතුවෙන් මාස 01 දින 08ක් සඳහා රු. 11,539,726/- ක් වැඩිපුර ගෙවා තිබීම | මේ සම්බන්ධ වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**ගිවිසුමේ විධිවිධාන පරිදි මැයි මාසයේ සිට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වා ඇත.** |
| 8. | සුභසාධක සංගම් වෙත ලබා දී තිබූ ඇතැම් ආපනශාලාවලින් රජයට අය විය යුතු කුලී, බදු, ජල බදු, විදුලි ගාස්තු හා දඩ මුදල් අය කර | ප්‍රායෝගික තත්ත්වය සැලකිල්ලට ගෙන මෙවැනි ආපනශාලාවලින් ගාස්තු අය කර ගැනීමට පොදු ප්‍රතිපත්තියක් සකසා කාරක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | නොතිබීම හේතුවෙන් රජයට ලැබිය යුතු වූ රු. 119,755,171/- ක කුලී ආදායමක් අහිමි වී තිබීම | සභාවට වාර්තා කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**ප්‍රායෝගික තත්ත්වය සැලකිල්ලට ගෙන ආපනශාලා පවත්වා ගැනීම සම්බන්ධව පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එහි වාර්තාව ලබා දී ඇති බවත් ඒ අනුව නැවත උපදෙස් අඩංගු චක්‍රලේඛයක් නිකුත් කිරීමට පියවර ගන්නා බවත් දන්වා ඇත.** |
| **9.** | කුරුණෑගල රෝහලේ ආපනශාලාව ලියාපදිංචි සමුපකාර සමිතියකට වසරකට රු. 190,800/- බැගින් කුලියට ලබා දී තිබූ නමුත් අදාළ සමුපකාර සමිතිය විසින් එම වත්කම් වෙනත් පාර්ශවයන්ට වසරකට රු. 6,276,000/- බැගින් කුලියට දී තිබුණි. මේ අනුව වාර්ෂිකව රජයට රු. 6,085,200/- ක් අහිමි වී තිබීම | රජයේ රෝහල්වල පවත්වා ගෙන යනු ලබන ආපනශාලා සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය, එම ආපනශාලා නියාමනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙල, එම ආපනශාලාවල ව්‍යාපාරික කටයුතු කර ගෙන යාම සඳහා ලබා දී ඇති බාහිර පාර්ශවයන් කවුරුන්ද හා ඔවුන් වෙත ආපනශාලා ලබා දී ඇත්තේ කුමන පදනමකින්ද යන කරුණු ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**ප්‍රායෝගික තත්ත්වය සැලකිල්ලට ගෙන ආපනශාලා පවත්වා ගැනීම සම්බන්ධව පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එහි වාර්තාව ලබා දී ඇති බවත් ඒ අනුව නැවත උපදෙස් අඩංගු චක්‍රලේඛයක් නිකුත් කිරීමට පියවර ගන්නා බවත් දන්වා ඇත.** |
| **10.** | රු. 1,792,488/- ක් වැය කරමින් 2013 මැයි 05 සහ 2013 ජූලි 21 දිනවල අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු දුරකථන ක්‍රියාකරු හා උපස්ථායක/ උපස්ථායිකා තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාග ප්‍රතිඵල දුර්වල කළමනාකරණය හේතුවෙන් අවලංගු කිරීමට සිදු වීම | මේ සම්බන්ධයෙන් වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**ඉදිරියේදී මෙවැනි දුර්වලතා සිදු නොවන අයුරින් කටයුතු කිරීමට අදාළ පාර්ශවයන්ට උපදෙස් දී ඇති බව දන්වා ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| **11.** | වෙන්දේසියට ඉදිරිපත් නොකර, වෙන්දේසියේදී අලෙවි නොවූ වාහනයක් ලෙස සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් අංක 51-7229 දරණ මිට්ෂුබිසි වර්ගයේ කැබ් රථයක් රු. 290,000/-ක් වැනි අඩු මුදලකට නිලධාරියෙකුට විකිණීම | මේ සම්බන්ධයෙන් වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**මේ සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීම සඳහා අමාත්‍යාංශයේ හදිසි වැටලීම් අංශය වෙත යොමු කර ඇති බව දන්වා ඇත.** |
| **12.** | අපහරණය සඳහා විධිමත් නිර්දේශයක් ලබා ගැනීමෙන් තොරව, වටිනාකම විධිමත් පරිදි තක්සේරු නොකරන ලද හා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම් නොකරන ලද අංක 32-7409 දරණ මිට්ෂුබිසි වර්ගයේ ජීප් රථයක් රු. 395,000/- ක් වැනි අඩු වටිනාකමකට විකුණා තිබීම | මේ සම්බන්ධයෙන් වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**මේ සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීම සඳහා අමාත්‍යාංශයේ හදිසි වැටලීම් අංශය වෙත යොමු කර ඇති බව දන්වා ඇත.** |
| **13.** | අසාධු ලේඛනගත කර ඇති හා බැංකු සුරක්ෂණ ඉදිරිපත් කර නැති බවට ව්‍යාජ කරුණු දක්වමින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත්කරුවන් දෙදෙනා නුසුදුසු බවට තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව අනුරාධපුර ශික්ෂණ රෝහලේ විදුලි පද්ධතිය නඩත්තු හා සේවා කිරීම සඳහා අවම මිලට වඩා රු. 65,000/ න් වැඩි මාසික ගාස්තුවක් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරු සුදුසු බව නිර්දේශ කර එම කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව පවරා තිබීම | මේ සම්බන්ධයෙන් වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**මෙම කොන්ත්‍රාත්කරු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් තෝරා ගෙන ඇති බවත්, තාක්ෂණ ඇගයීමේ කමිටුවේ සාමාජිකයන් වෙනස් කිරීමට කටයුතු කරන බවත්, ලිඛිත සාක්ෂි මත පමණක් පදනම්ව ටෙන්ඩර් ඇගයීම් කටයුතු කරනු ලබන බවටත් දන්වා ඇත.** |
| **14.** | ගලහ ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ආයතනය යටතට නොවැටෙන අතර වාර්ෂික | මෙම ආයතනයේ නේවාසික භික්ෂූන් සඳහා කෑමබීම වියදම් හා ගොඩනැගිලි නඩත්තු වියදම් දරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් බවද, නේවාසික භික්ෂූන් වහන්සේලා හට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සෞඛ්‍ය අමාත්‍යාංශය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් නොකරන, රජය පිළිගත් නීත්‍යානුකූල ආයතනයක් නොවන බව කාරක සභාව නිරීක්ෂණය කළේය. එමෙන්ම මෙම ආයතනය සඳහා කිසිදු අධිකාරී බලයකින් තොරව 2010 වර්ෂයේ සිට 2018 වර්ෂයේ ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ මහනුවර මහ රෝහල මගින් හා පේරාදෙණිය ශික්ෂණ රෝහල මගින් ප්‍රාග්ධන වියදම් ලෙස රු. 24,148,650/- ක් ද, පුනරාවර්තන වියදම් ලෙස රු. 38,753,630/- ක්ද වශයෙන් රු. 62,902,289/- ක් අමාත්‍යාංශය විසින් වැය කර තිබිණ. | මගින් සිදු කිරීමටත්, එහි පරිපාලන කටයුතු බුද්ධ ශාසන අමාත්‍යාංශය වෙත පවරා දීමටත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>එම ආයතනය මගින් ඉටු කරන සේවය සැලකිල්ලට ගත් කාරක සභාව විසින් බුද්ධ ශාසන හා සමාජ සේවා අමාත්‍යාංශවල ලේකම්වරු කැඳවා මෙම ආයතනය සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර තීරණය කරන ලෙසත්, එතෙක් එහි පරිපාලන කටයුතු හා නඩත්තු කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉටු කරන ලෙසත් ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**බුද්ධ ශාසන හා සමාජසේවා අමාත්‍යාංශය හා එක්ව මෙම ආයතනය සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි පියවර තීරණය කරන තෙක් තවත් එක් වසරක කාලසීමාවක් සඳහා භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ කටයුතු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/19/0884/112/058 සහ 2019.06.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් නියම කර ඇති බව දන්වා ඇත.** |
| | **ශ්‍රී ලංකා ගුවන් හමුදාව**<br>**2019 මාර්තු 21** | |
| 1. | ශ්‍රී ලංකා ගුවන් හමුදාපති සුභසාධක අරමුදලට නිලධාරීන් විසින් මූල්‍යමය දායකත්වය සැපයීම ආරම්භ කරන විට ඔවුන්ට ගෙවීමට පොරොන්දු වූ මුදලට වඩා අඩු මුදලක් සේවයෙන් ඉවත් වීමේදී ගෙවීම | මෙම අරමුදල 2014 වසරේ ඔක්තෝබර් මස සිට ක්‍රියාත්මක වන බවත්, ආරම්භයේදී ගුවන් භටයන්ගෙන් මාසිකව රු. 1750/-ක්ද, නිලධාරීන්ගෙන් මාසිකව රු.2250 /- ක් ද අය කර ගෙන ඇති බවත්, ගුවන් භටයෙකු විශ්‍රාම යාමේදී රුපියල් ලක්ෂ 7.5ක පමණ මුදලක්ද, නිලධාරියෙකු විශ්‍රාම යාමේදී රුපියල් මිලියනයක් පමණ මුදලක්ද ප්‍රතිලාභ ලෙස |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | ගෙවා ඇති බවත් ග.නි ප්‍රකාශ කළේය. එසේම මෙම අරමුදල ක්‍රියාත්මක වූ ක්‍රමවේදයේ පැවති දුර්වලතාව නිසා තවදුරටත් ඒ අයුරින්ම පවත්වා ගෙන යාමේ හැකියාවක් නොමැති බැවින්, 2017 වසරේදී මේ පිළිබඳව නැවත විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ පරිදි ප්‍රතිලාභ සීමා කිරීම සිදු වූ බවද ග.නි පැවසීය. මේ අනුව වර්තමානයේදී ලබා දෙන ප්‍රතිලාභ පෙරට වඩා අඩු වුවද යම් නිලධාරියෙකු විශ්‍රාම යාමේදී ඔහු විසින් දායක වූ ප්‍රමාණයෙන් 216%ක ප්‍රමාණයක් ප්‍රතිලාභ ලෙස ගෙවන බවද ග.නි වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය කිරීම සඳහා අරමුදලේ ආරම්භක ශේෂය, ගෙවන මුදල වැඩි කළ අවස්ථාවේ අරමුදලේ ශේෂය, සාමාජික මුදල් සහ ලැබෙන පොළිය, ප්‍රතිලාභ ලෙස ගෙවන ප්‍රමාණය, අරමුදලේ වර්තමාන තත්ත්වය හා අනාගතයේදී උද්ගත විය හැකි තත්ත්වයන් ඇතුළු සියළු කරුණු ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් 2019 අප්‍රේල් මස 05 වන දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**අරමුදලේ ආරම්භක ශේෂය, ගෙවන මුදල වැඩි කළ අවස්ථාවේ අරමුදලේ ශේෂය, ගෙවන මුදල් ප්‍රමාණය, අරමුවලේ වර්තමාන තත්වය හා අනාගතයේ උද්ගත විය හැකි තත්වයන් යන කරුණු ඇතුලත් වාර්තාව ලැබී ඇත.**<br><br>**එම වාර්තාවට අනුව 2002 මාර්තු මස 01 වන දිනට අරමුදලේ පැවති ශේෂය රු. 853,243.89 ක් වන අතර 2014 ඔක්තෝබර් මස 01 දිනට අරමුදලේ මුළු වත්කම් රු.1,546,235,966.54ක් වේ. 2014 ඔක්තෝබර් 01 වන දින සිට අවුරුදු 20ක් සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ට රු.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **1,000,000.00 ක්, අවුරුදු 15 ක සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරිනියන්ට රු. 750,000.00 ක්, අවුරුදු 22 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ගුවන්භටයෙකුට රු. 750,000.00 ක් හා අවුරුදු 15ක සේවා කාලයක් සම්පූර්ණ කරන ගුවන් කාන්තාවකට රු. 500,000.00 ක විශ්‍රාම ප්‍රතිලාභ මුදලක් ගෙවා ඇත.** |
| 2. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් අළුත්වැඩියා සඳහා යවා ඇති රේඩාර් රිසීවරයක් (LRU 02) සහ ඇන්ටනා ස්කෑනරයක් (LRU 01) අස්ථානගත වීමෙන් සිදු වූ රු. මිලියන 74.46 ක අලාභය | මෙම අලාභයට වග කිව යුතු නිලධාරීන්ට උසස්වීම් ලබා දීම අත්හිටුවා ඇති අතර ඔවුන්ගෙන් යම් මුදලක් අය කර ගනිමින් පවතින බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී තිබූ පරීක්ෂණ කටයුතු අවසන් වී ඇති බැවින් චූදිතයන්ට විරුද්ධව නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බවත්, ග.නි පැවසීය.<br><br>වෙනත් රාජ්‍ය ආයතන සමග මෙම සමාගම ගනුදෙනු කිරීමට නොහැකි වන සේ එය අසාධු ලේඛනගත කිරීමට අවශ්‍ය කටයුතු යොදන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය. |
| 3. | ශ්‍රී ලංකා හෙලිටුවර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධව පවතින නීතිමය තත්ත්වය | රාජ්‍ය ආයතනයක් විසින් පෞද්ගලික සමාගමක් පිහිටුවීමේදී භාණ්ඩාගාර ලේකම්ගේ අයිතිය තහවුරු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. ඒ අනුව මෙම සමාගමේ කොටස් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු භාණ්ඩාගාර ලේකම් වෙත පැවරිය යුතු වේ.<br><br>මේ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සමග පැවති සාකච්ඡාවකදී මෙම සමාගම වෙනුවෙන් ව්‍යාපාර ආකෘතියක් හඳුන්වා දීමට කටයුතු කරන බව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් දැනුම් දුන් බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණකන් දීමේ නිලධාරී/ගණකන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | මෙම සමාගම විසින් ඉටු කරනු ලබන සේවය සැලකිල්ලට ගත් විට එය නීත්‍යානුකූලව පවත්වා ගෙන යාම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැකසීම යෝග්‍ය බවත්, අරමුදල පවත්වා ගෙන යන්නේ නම් ආදායම් උපදවන ක්‍රමද සොයා ගත යුතු බවත් කාරක සභාවේ අදහස විය.<br><br>ඒ අනුව, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා ගුවන් හමුදාපති සමග සාකච්ඡා කර මෙහි ක්‍රියාකාරිත්වයට බාධා නොවන පරිදි සුදුසු වැඩපිළිවෙලක් සකසා මාසයක් තුළ කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමග රැස්වීමක් සඳහා දින නියම කර ගෙන තිබුණද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් එදිනට රැස්වීමට සහභාගී විය නොහැකි බව දන්වා තිබූ බැවින් ඒ සඳහා වෙනත් දිනයක් යොදා ගැනීමට කටයුතු කරමින් පවතින බව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්තා කර තිබුණි.** |
| 4. | 2015 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් සපයන ලද ගුවන් ගමන් වෙනුවෙන් 2018.12.31 දින වන විට ගෙවිය යුතු රු. මිලියන 14.24ක හිඟ මුදල | ඇතැම් අමාත්‍යාංශ විසින් හිඟ මුදල් ගෙවා ඇති නිසා මෙම හිඟ මුදල මිලියන 10 දක්වා අඩු වී ඇති බවත්, ගෙවා ඇති මුදල සම්බන්ධයෙන් තහවුරු කිරීමට ලිපිලේඛන නොමැති බැවින් එම මුදල ගෙවීමේ හැකියාවක් නැතැයි වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය දන්වා ඇති බවත් එබැවින් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන අදාළ මුදල කපා හැරීමට කටයුතු කර ඇති බවත් ග.නි වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 5. | ගුවන් හමුදා ගිනි නිවීමේ ඒකකයේ ක්‍රියාකාරිත්වය, කාලීන අවශ්‍යතාවයන්ට සකස් කිරීම සහ එම ඒකකය කොළඹ ප්‍රදේශයේ ස්ථානගත කිරීම. | මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් ගුවන් හමුදාවට පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති නමුත් ඉඩමට ඇතුළු වීම සඳහා ලිඛිත අවසරය තවම ලැබී නොමැති බවත්, එම ඉඩම ගුවන් හමුදාවට පැවරීම වෙනුවෙන් මිලියන 192ක මුදලක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතුව ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙසත්, මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය. |
| 6. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ MI-17 හෙලිකොප්ටර් එන්ජින් 5ක් කටුනායක ගුවන් තොටුපළේ සිට රුසියාව දක්වා ප්‍රවාහනය කිරීම සඳහා 2017/04/17 දින මිල ගණන් කැඳවා තිබූ අතර පෞද්ගලික සමාගමක් වෙත ලන්සුව පිරිනමා තිබුණි. මෙම ආයතනයෙන් අදාළ සේවාවන් සපයා ගැනීම සඳහා රු. මිලියන 1.66ක මුදලට අමතරව ලන්සු කැඳවීමේ ලේඛනවල අතිරේක මිල වැඩි කිරීම සඳහා වූ ඉල්ලීම් පිළි නොගන්නා බව පැහැදිලිව දක්වා තිබියදී රු. මිලියන 1.15ක අමතර මුදලක් ගෙවා තිබීම | මෙම අතිරේක මුදල ලන්සුවේ මිල ගණන්වලට ඇතුලත් කර නොමැති බවත්, ලන්සුවේ මිල ගණන්වලට ඇතුලත් කළද, එම මුදල මිල ගණන් ඉදිරිපත් කර තිබූ අනෙක් සමාගමේ මිලට වඩා අඩු බැවින් එමගින් රජයට මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැති බවත් ග.නි පැවසීය. කෙසේ වුවද එම මිල ගණන් විශ්ලේෂණයේදී ගෙවිය යුතු අතිරේක මුදල පිළිබඳව දැනුවත් වී නොසිටීම තාක්ෂණික ඇගයුම් කමිටුවෙන් සිදු වී ඇති අත්වැරැද්දක් බවද එම අත්වැරැද්ද සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයුම් කමිටුවට අවවාද කිරීමක් සිදු කරන බවද ග.නි වැඩිදුරටත් පැවසීය. |
| 7. | 2018.12.31 දිනට අයවීම් හිඟහිට තිබූ ශේෂවල එකතුව ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. මිලියන 17.96ක් විය. එම හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම | මෙම ණය ශේෂ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සිවිල් පුද්ගලයන්ට ලබා දුන් ණය මුදල් බවත්, ඇපකරුවන් නොමැතිව ණය ලබා දීම නිසා ස්ථාන මාරු වී ගිය හෝ සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය මුදල් අය කර ගැනීම අපහසු වී ඇති බවත්, මෙම තත්ත්වය ඉදිරියේදී සිදු නොවීම සඳහා සිවිල් සේවකයන්ට වුවද ඇපකරුවන් දෙදෙනෙකු නොමැතිව ණය ලබා නොදෙන බවත් ග.නි පැවසීය. |
| 8. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවට වෛද්‍යවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය | ක්‍රමවේද 2ක් යටතේ වෛද්‍යවරුන් බඳවා ගන්නා බවත්, මෙරට එම්බීබීඑස් උපාධිධාරීන් ද එමෙන්ම විදේශයන්හි වෛද්‍ය උපාධි ලබා ගන්නා උපාධිධාරීන්ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | වෛද්‍යවරුන් ලෙස බඳවා ගන්නා බවත් ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. එසේම විදේශ උපාධි ලබා ගන්නා වෛද්‍ය උපාධිධාරීන් නියමිත කාලය තුළ ACT 16 සමත් වී වෛද්‍ය කවුන්සිලයේ ලියාපදිංචිය ලබා ගත යුතු බවත්, එසේ අසමත් වන්නේ නම් ඔවුන් සේවයෙන් ඉවත් කරන බවත්, සේවයේ යෙදී සිටින කාලය තුළ ඔවුන් ගුවන් හමුදාවට අනන්‍ය විශේෂ සුදුසුකම් ලබා ගත යුතු බවත් ග.නි පැවසීය. |
| **කිරි ගවයින් ආනයන ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව 2019 මාර්තු 21** | | |
| 1. | මෙරටට කිරි ගවයින් ආනයනය පිළිබඳ 2008-08-13 දින ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ වාර්තාව අනුව අඩු පාඩු පෙන්වා දී තිබියදීත් ඒවා නොසලකා හරිමින් මුල් අවස්ථාවේ කිරි ගවයින් ලබා ගත් සැපයුම්කරු වෙතින් නැවතත් කිරි ගවයින් ආනයනය කිරීම | මෙම ව්‍යාපෘතිය පිළිබඳව, අදාළ මෙහෙයුම් කමිටුවේදී සියලුම නිලධාරීන් ගෙන්වා සාකච්ඡා කළ බවත්, කිරි ගවයින් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක නොකිරීමට තීරණය කළ බවත්, ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කර ඇති අතර, ඉදිරි සතියක කාලය තුළ එය ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි පැවසීය. |
| 2. | මෙම ව්‍යාපෘතිය සහ මෙම ව්‍යාපෘතියට අදාල මූල්‍ය ගිවිසුම් | ආර්ථික සංවර්ධන අමාත්‍යංශය විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබූ බවත් අදාල ණය මුදල රජයට දරා ගත හැකි බවට අනුමැතිය ලැබීමෙන් පසු මෙම ණය ගිවිසුම අත්සන් කළ බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>2008.08.13 වන දින ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතියට අදාල ගැටළු පෙන්වා දෙමින් වාර්තාවක් ඉදිරිපත් කර තිබියදීත් 2014.01.13 දින එකී දෙපාර්තමේන්තුව විසින් මුල් වාර්තාවට වඩා වෙනත් කරුණු දක්වමින් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳ විමර්ශනයක් කර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br><br>**මේ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත්කර ඇත.**<br><br>**ඒ අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2008.08.13 සහ 2014.01.13 දිනැති ලිපි සහ ඇගයීම් වාර්තා මගින් නිර්දේශයන් ඉදිරිපත් කර ඇත්තේ 2008 සහ 2013/2014 වර්ෂවලදී ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද වෙනස් ව්‍යාපෘති යෝජනා දෙකක් සඳහා බව සඳහන් කර ඇත.** |
| 3. | 2018 සිට 2020 දක්වා කිරි ගවයින් ආනයනය කිරිම සඳහා 20% ක්වූ අත්තිකාරම් මුදල් ලෙස රුපියල් 1,749,672,697/- ක් 2018 මැයි 08 වන දින ගෙවා තිබිම සහ වර්තමාන තත්වය. | අත්තිකාරම් මුදල ආවරණය කර ගන්නා ආකාරය පිළිබඳව ඉදිරියේ දී අදාළ ආයතන සමඟ සාකච්ඡා පවත්වන බව ප්‍ර.ග.නි පැවසීය. |
| 4. | ගොවිපලවල් සඳහා සතුන් බෙදා හැරීමේ ක්‍රමවේදය, ඒ පිළිබඳව ගත් තීරණ හා ඒ සඳහා වගකිව යුත්තන් පිළිබඳ සහ පවතින දේශගුණික තත්වයන් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කර තිබුණේ ද යන කරුණු | ඒ පිළිබඳ තීරණ අමාත්‍යාංශ මට්ටමින් ගෙන ඇති අතර, එවකට සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ සිටි වෛද්‍යවරයෙකු විසින් මෙහෙයුම් කමිටුවට ලබා දෙන ලද වාර්තාව පදනම් කරගනිමින් රිදියගම ගොවිපලට කිරි ගවයින් ලබා දී ඇති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 5. | රිදියගම ගොවිපල තුළ කෘතිම පාරිසරික තත්වයන් යටතේ මෙම සතුන් ඇති කිරිමේදි දැරිමට සිදුව ඇති අධික වියදම සහ එම වියදම අවම කර ගැනිමට ගත් පියවර | මසකට විදුලිය සඳහා රුපියල් ලක්ෂ 35 කට අධික මුදලක් වැයවන අතර සත්ව ආහාර ලබා දීම සඳහා මසකට රුපියල් මිලියන 32-35 වියදමක් දැරිමට සිදු වන බැවින් කිරි ලීටරයක් සඳහා වැයවන මුදල රුපියල් 85/- ත් රුපියල් 99/- ත් අතර ප්‍රමාණයක් වන බව ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| 6. | ශ්‍රී ලංකාවේ දේශගුණය, සංස්කෘතිය ආදි සියල්ලට සෑම අතින්ම ගැලපෙන ඉන්දියාව වැනි රටකින් කිරි ගවයින් ආනයනය කිරිමේ හැකියාව පිළිබඳ විමසීම. | ඉන්දියාව වැනි රටවල පවතින නීති අනුව එම රටවලින් කිරි ගවයින් ආනයනය කිරිමේ හැකියාවක් නොමැති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 7. | කිරි ගවයින් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීම සහ කිරි නිෂ්පාදනය කිරීමේ ක්‍රම වේද | කිරි ගවයින් ආනයනය පිළිබඳ ව්‍යාපෘතිය අත්හිටුවීමෙන් එකි ව්‍යාපෘතිය සම්බන්ධ ගිවිසුමට අදාල කොන්දේසි අනුව ශ්‍රී ලංකාවට වන බලපෑම සහ ශ්‍රී ලංකාවේ කාලගුණික තත්වයන්, යටිතල පහසුකම්, සංස්කෘතික සහ අනෙකුත් අංග වලට ගැලපෙන ආකාරයෙන් කිරි නිෂ්පාදනය කිරිමේ ක්‍රමවේද යන තොරතුරු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් මාස 2ක් තුළ ඉදිරිපත් කළ යුතු බවට කාරක සභාව ප්‍ර.ග.නි වෙත නියෝග කරන ලදි.<br><br>**මේ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත්කර ඇත.**<br><br>**එම වාර්තාව අනුව කිරි නිෂ්පාදනය කිරීමේ ක්‍රමවේද සම්බන්ධයෙන් පහත සඳහන් නිර්දේශ යෝජනා කර ඇත.**<br><br>• **ඉහළ නිෂ්පාදන විභවයන් සහිත දෙනුන් ද ඇති වාණිජ ගොවිපල ආරම්භ කිරීම**<br>• **පහත රට වියළි කලාපය තුළ යෝග්‍ය තෘණ හා අනෙකුත් සත්ව ආහාර ඵලදායි ලෙසින් වගා කිරීම ඒ අනුව තෘණ හා බඩ ඉරිඟු සෝගම් වගාව සඳහා අතරමැදි කන්නයන් හඳුනා ගැනීම**<br>• **වාණිජ මට්ටමින් ගව පාලනය සිදු කරනු ලබන ගොවිපොළ හා ආහාර නිෂ්පාදනය කරන්නන් අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරිම** |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
| | | • **වඩා හොඳ කිරි නිෂ්පාදනයක් ලබා දෙනු ලබන ප්‍රභේද සඳහා ප්‍රමුඛතාවය ලබා දීම**<br>• **වාණිජ ගොවිපොළ ඇති කරන්නන් සඳහා වඩා සුදුසු හා දිරිමත් කිරිම සඳහා පහසුකම් ලබා දීම**<br>• **මී ගව පාලනය වර්ධනය කිරිමට සහ සංවර්ධනය කිරිම සඳහා වඩා වැඩි අවධානයක් යොමු කිරීම.** |
| **කොළඹ මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව විශේෂ විගණන වාර්තාව<br>2019 මාර්තු 22** | | |
| 1. | කසළ විකිණීමෙන් නගර සභාව උපයන ආදායම. | කසළ එකතු කිරීමෙන් පමණක් දැනට නගර සභාව ආදායම් උපයන බව මෙහිදී අනාවරණය විය. මහානගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය මගින් ලැබුණු ව්‍යාපෘතියක් වන වෙස්ටර්න් පවර් ආයතනය සමග එකඟතාවයක් මත කසළ එකතු කිරීම සිදු කරන බවද පහත් බිම් සංවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද ආදායම් උපයන කොම්පෝස්ට් ව්‍යාපෘතියක් කෙරවලපිටියේ පවතින බවද ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය.<br><br>කසළ ගැටළුවට අදාළ ජනතා විරෝධයන්ට පිළියමක් ලෙස කසළ බැහැර කිරීමට නව ස්ථාන යොදා නොගෙන දැනට පවතින ස්ථානයේම නියමිත පරිදි විද්‍යාත්මක ක්‍රම සහ නව තාක්ෂණය භාවිතා කරමින් කසළ කළමනාකරණ ව්‍යාපෘති ආරම්භ කිරීමේ වැදගත්කම කාරක සභාව අවධාරණය කළේය. |
| 2. | කොළඹ මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | නියමාකාරයෙන් කසළ බැහැර නොකිරීම හා ඒ නිසා සිදුවී ඇති විපත් සම්බන්ධයෙන් ඍජුවම වගකිවයුතු ආයතනයක් ලෙස හඳුනාගෙන ඇති කොළඹ මහනගර සභාවේ ඝන අපද්‍රව්‍ය බැහැර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | කිරීමේ ගැටළුව විසඳීමට අවශ්‍ය අනාගත කෙටිකාලීන හා දිගුකාලීන වැඩසටහන පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් 2019/06/22 දිනට පෙර ලබා දෙන ලෙස කාරක සභාව කොළඹ මහනගර සභාවට නියෝග කළේය.<br><br>**කොළඹ මහනගර සභාවේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළුව විසඳීමට අවශ්‍ය අනාගත කෙටිකාලීන හා දිගුකාලීන වැඩසටහන පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ලබාදී ඇත.**<br><br>**ඒ අනුව කෙටිකාලීන වැඩසටහන් ලෙස මහජනතාව දැනුවත් කිරීම, ගෙයින් ගෙට ගොස් කසළ එකතු කිරීම, කසල බඳුන් සවිකිරීම, සීසීටීවී කැමරා සවිකිරීම, නඩු පැවරීම, නගර සභා අතුරු ව්‍යවස්ථාව යාවත්කාලීන කිරීම, සේවකයන් සඳහා සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම, සේවක අභිප්‍රේරණය ආදිය දක්වා ඇත.**<br><br>**දිගුකාලීන වැඩසටහන ලෙස ඝන අපද්‍රව්‍ය වර්ගීකරණය, හරිත බඳුන් බෙදාදීම, මාසිකව අපද්‍රව්‍ය පොළක් පැවැත්වීම, කොම්පෝස්ට් කම්හල් ඉදිකිරීම, පරිසර පාසැල් ව්‍යාපෘති, මහජන පැමිණිලි සඳහා ජංගම දුරකථන යෙදුම් භාවිතය ආදිය දක්වා ඇත.** |
| 3. | 2007 අංක 1 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, සාදන ලද අංක 1560/6 සහ 2008 ජූලි 30 දිනැති නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති සංග්‍රහයේ 2වන පරිච්ඡේදයේ 1 උපලේඛනය ප්‍රකාරව නාගරික | මීට අදාළව පළාත් පාලන ආයතන සඳහා සැපයිය යුතු යටිතල පහසුකම් සඳහා බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් යෝජනා කළහැකි වැඩපිළිවෙල පිළිබඳ වාර්තාවක් 2019/06/22 දිනට පෙර ලබා දෙන ලෙස බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට කාරක සභාව නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව කාරක සභාවට ඉදිරිපත්කර ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති සංග්‍රහය ක්‍රියාත්මක කිරීම. | **ඒ අනුව ජනනය වන ස්ථානයේදීම අපද්‍රව්‍ය අවම කිරීම හා වෙන් කිරීමට කසළ වෙන් කිරීමේ බඳුන්, කොම්පෝස්ට් බඳුන්, ප්‍රතිචක්‍රීකරණ අපද්‍රව්‍ය වෙන් කිරීමට මළු ලබාදීමද අපද්‍රව්‍ය එකතු කිරීමට හා ප්‍රවාහනයට අදාළ රථ ලබාදීමද පොදු ස්ථාන පිරිසිදු කිරීමට අත් කරත්ත ලබාදීම හා නාමපුවරු හා දැන්වීම් පුවරු සවිකිරීමද දක්වා ඇත. තවද අපද්‍රව්‍ය සම්පතක් ලෙස භාවිත කිරීමට කොම්පෝස්ට් ව්‍යාපෘති, ගබඩා කිරීමේ මධ්‍යස්ථාන, කොම්පෝස්ට් ව්‍යාපෘති සඳහා අවශ්‍ය යන්ත්‍ර, ජීව වායු ඒකක, කරදියාන අපද්‍රව්‍ය බැහැරලන ස්ථානය පාලිත බිම් පිරවීමක් ලෙස පවත්වාගෙන යාම ආදිය දක්වා ඇත.**<br><br>**තවද ධාරිතා සංවර්ධනය හා දැනුවත් කිරීමට නිලධාරී පුහුණුව, අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ඇගයීමද දක්වා ඇත.** |
| 4. | කොළඹ නගර සභා බල ප්‍රදේශයේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාළ වැඩපිළිවෙල | රෝහල්වල සායනික අපද්‍රව්‍ය එකතු කිරීම කොළඹ නගර සභාව විසින් සිදු නොකරන බවද ඒ සඳහා එම රෝහල්වල දහන මධ්‍යස්ථාන (incinerated plants) මගින් එම අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු කරන බවද අදාළ මාර්ගෝපදේශ සැපයීම හා නියාමනය මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදු කරන බවද ඇතැම් අවස්ථාවල පුද්ගලික අංශද සායනික අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා සම්බන්ධවන බවද ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය. |
| 5. | විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් පද්ධති හා පාලන දුර්වලතා, නිර්දේශ හා නිගමන පිළිබඳ වර්තමාන ප්‍රගතිය. | මේ සම්බන්ධ වර්තමාන ප්‍රගතිය හා ක්‍රියාත්මකවන ආකාරය ඇතුලත් දින වකවානු සහිත සවිස්තරාත්මක වාර්තාවක් 2019/06/22ට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව කොළඹ නගර සභාවට නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් අදාළ ඡේදයන් පිළිබඳ වර්තමාන ප්‍රගතිය සඳහන් වාර්තාවක් කාරක සභාවට ලබාදී ඇත.<br>ඒ අනුව දීර්ඝකාලීන විසඳුමක් ලෙස කෙරවලපිටිය **Waste to Energy** ව්‍යාපෘතිය ආරම්භකිරීමට නියමිත බවද මහනගර සහා සීමාව තුළ මහජනතාව හා ආයතන දැනුවත් කිරීම, මහල් නිවාස අළුතින් ඉදිකිරීමේදී ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමේදී කසළ වෙන්කර ලබාදෙන ආකාරය ඇතුලත් සැලසුම් වාර්තාවක් ලබා ගතයුතු වීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම, මහාපරිමාණ කර්මාන්තවලදී ඒ ඒ ආයතනවලට සුදුසු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් හඳුනා ගැනීමට මග පෙන්වීම අදී පියවරයන් සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතින බව දක්වා ඇත. **(ඇමුණුම 04)** |
| **අධ්‍යාපන අමාත්‍යාංශය<br>2019 මාර්තු 22** | | |
| 1. | පහ වසර ශිෂ්‍යත්වධාරීන් වෙත මාර්ගගත ක්‍රමයට ශිෂ්‍යාධාර ගෙවීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර සහ හෝමාගම යන අධ්‍යාපන කලාප දෙකෙහි පාසල් 20 ක් තෝරාගෙන 2018 සැප්තැම්බර් සිට ගෙවීම් සිදුකර 2020 දී දිවයින පුරා ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇති එම ව්‍යාපෘතියේ ප්‍රගතිය. | 2018 සැප්තැම්බර් මාසයේ සිට නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම අධ්‍යාපන කලාප දෙක තුල ක්‍රියාත්මක කර 2019 දී සියලුම ජාතික පාසල්වලත් 2020 දී සියලු පළාත් පාසල්වලත් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි. ව්‍යාපෘති සම්පත් දායකයින් ලෙස සම්බන්ධීකරණ නිලධාරීන් සහ විෂයය ලිපිකරුවන් පුහුණු කිරිම දැනට සිදුකරමින් පවතින බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>2020 දි අවසන් කිරිමට යෝජිත මෙම වැඩ සටහන ක්‍රියාත්මක වන ආකාරය පිලිබඳව දින වකවානු සහිත වාර්තාවක් අප්‍රේල් 5 දිනට පෙර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br><br>**දින වකවානු සහිත වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.**<br>• **2018 සැප්. සිට මේ දක්වා හෝමාගම සහ ජයවර්ධනපුර කලාපවල නියාමන වැඩ සටහන ක්‍රියාත්මක කිරිම**<br>• **2018 සැප්-නොවැ දක්වා කලාප කාර්යාලවල සම්පත්දායකයින් පුහුණු කිරිම**<br>• **2019 ජන-පෙබ.ජාතික සැල්වල විෂය භාර විදුහල්පති-ලිපිකරු පුහුණු කිරිම**<br>• **2019 පෙබ ජාතික පාසැල් සඳහා චක්‍ර ලේඛ නිකුත් කිරිම**<br>• **2019 පෙබ-අප්‍රේල් ජාතික පාසැල්වල ශිෂ්‍ය තොරතුරු ඇතුලත් කිරිම**<br>• **2019 මාර්තු-අප්‍රේල් ප්‍රගති සමාලෝචනය** |
| 2. | පාසල් පද්ධතිය තුල සිදුවන අක්‍රමිකතා සහ විනය විරෝධී ක්‍රියාවන් හේතුවෙන් මතුව ඇති පැමිණිලි සහ ගැටළු නිරාකරණය සඳහා ක්‍රියාත්මක වන යාන්ත්‍රණය සහ එහි වර්තමාන තත්ත්වය. | මූල්‍ය වංචා, විදුහල්පතිවරුන්ගේ අකටයුතුකම්, සිසුන් බඳවා ගැනිමේ දී සිදුව ඇති අක්‍රමිකතා, ළමා අපචාර හා දූෂණ මෙන්ම පරිපාලන ගැටලු පිලිබඳව පසුගිය වසරේ පැමිණිලි 3528 ලැබී ඇති අතර චූදිත නිලධාරීන්ගේ සේවය අත්හිටුවිමට කටයුතු කර ඇත. මෙවැනි තත්ත්වයන් අවම කරලීම සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් මෙන්ම අධික්ෂණ කටයුතු ක්‍රමවත් කිරිමට සැලසුම් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ කාරක සභාව පාසැල්වල විනය කටයුතු වැඩි දියුණු කිරිමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක අවශ්‍යතාවය අවධාරණය කළේය. ජාතික පාසැල් මෙන්ම පළාත් පාසැල් ද ඇතුලත් වන පරිදි මෙතෙක් ලැබී ඇති පැමිණිලි පිලිබඳව පූර්ණ විශ්ලේෂණාත්මක වාර්තාවක් අප්‍රේල් 22 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | දිනට පෙර කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br><br>**2008-2019 කාල පරිච්ඡේදයේ පැමිණිලි සම්බන්ධ සාරාංශ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව**<br>• **අධ්‍යනය සහ අනධ්‍යන නිලධාරින්ගේ අනිසි ක්‍රියා-514**<br>• **පළමු හා අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කිරීම්-146**<br>• **විදුහල්පති හා ගුරුවරුන්ගේ වංචා-25**<br>• **ගුරු විදුහල්පති ගැටලු-51**<br>• **සිසුන්ට පහරදීම් -9**<br>• **මූල්‍ය අක්‍රමිකතා-1070**<br>• **පරිපාලන අක්‍රමිකතා-566**<br>• **පාසල්වල සිදුවූ ළමා අපචාර-20**<br>• **ව්‍යාජ ලේඛන සැකසීම-7**<br>• **මිනි මැරීම්/ස්ත්‍රී දූෂණ-2**<br>• **භෞතික සම්පත්-26**<br>• **ශිෂ්‍ය ගැටලු-194**<br>• **ගුරු හිගය-79**<br>• **වෙනත්-497** |
| 3. | පාසැල් පද්ධතියේ අධිසේවක පදනම යටතේ සිටින නිලධාරීන් සහ විදුහල්පති සේවාවේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරිම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග. | අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සේවා ව්‍යවස්ථා කොන්දේසිවලට පරිබාහිරව 2013 වසරේ විදුහල්පති සේවාවේ දෙවන ශ්‍රේණියේ තනතුරු 1339 සහ තුන්වන ශ්‍රේණියේ තනතුරු 142 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර ඇති බවත් ඔවුන් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහනය නොකර විශ්‍රාම ලබන තෙක් වැටුප් වර්ධක පමණක් ලබාදෙමින් අධි සේවක පදනමේ රඳවා ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br><br>විදුහල්පති සේවාවේ දැනට පවතින 5536 ක් වන මුළු පුරප්පාඩු සංඛ්‍යාව අතර පළමුවන ශ්‍රේණියේ තනතුරු 1750 ක්, දෙවන ශ්‍රේණියේ තනතුරු 1868 ක් සහ තුන්වන ශ්‍රේණියේ තනතුරු 1918 ක් පැවතියත් ව්‍යවස්ථානුකූලව බඳවා ගැනීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | අවසරය හිමි තුන්වන ශ්‍රේණියේ තනතුරු ප්‍රමාණය සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලබා ගැනිමට කටයුතු කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>චක්‍රලේඛ අංක 1/2014 අනුව දෙමළ භාෂා ප්‍රවීනත්වය ලබා නොගැනිම මෙම පුරප්පාඩු පිරවීමට බාධාවක් වි ඇති බැවින් අවුරුදු 50 ඉක්මවූ අය වෙනුවෙන් කිසියම් වූ සහනදායි වැඩපිළිවෙලක් සකස් කර දීම මෙන්ම විශ්‍රාම ලබාගැනීමට ආසන්න අය සඳහා අන්තර් කාල සහනයක් සලසා දිම යුක්ති සහගත බව ප්‍ර.ග.නි./ග.නි. පැවසිය. |
| 4. | සිසු හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුලත් ක්‍රමවත් පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීමට අදාළව කාර්ය සාධන සැලස්මක් දින වකවානු සහිතව සකස් කර ඉදිරිපත් කරන ලෙස ලබා දුන් නියෝගය මේ දක්වා ඉටු නොකිරිම. | 241,591 ක් වන සමස්ත ගුරු සංඛ්‍යාව අතරින් 237,341 ට ආසන්න පිරිසකගේ තොරතුරු පරිගණක පද්ධතියට ඇතුලත් කර ඇති අතර දත්ත පිරිසිදු කිරිමේ කාර්යය දත්ත කළමනාකරණ ශාඛාව මගින් සිදුකරමින් පවති. එම කටයුතු අවසන් කළ වහාම පරික්ෂා කොට සහතික කිරීමේ උපදෙස් චක්‍රලේඛය නිකුත් කිරීමට නියමිත බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මොරටුව විශ්ව විද්‍යාලයේ මගපෙන්වීම යටතේ ආරම්භ කළ මෙම වැඩසටහන අමාත්‍යාංශ නිලධාරීන් විසින් සිදුකර දැන් අවසන් අදියර වෙත ලගා වී ඇති බවත් 2019 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් වූ සිසුන්ගෙන් ආරම්භ කර සමස්ත ශිෂ්‍ය ප්‍රජාවේම තොරතුරු පද්ධතියට ඇතුලත් කිරිමට සැලසුම් කර ඇති බව ඔහු වැඩිදුරටත් පැවසිය.<br><br>ඒ අනුව මෙම වැඩසටහනේ වර්තමාන තත්ත්වය පිලිබඳව වාර්තාවක් කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි. ට නියෝග කළේය.<br><br>**සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව සියලුම ජාතික, පළාත් පාසල් පිරිවෙන් පෞද්ගලික හා** |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
| | | උපකෘත විශේෂ සහ ජාත්‍යන්තර පාසැල්වල සිසු ගුරු තොරතුරු ලබාගැනිමට නියමිතය.<br>• අප්‍රේල් 30 වන විට ඇතුලත් කළ දත්ත පිරිසිදු කිරිමේ කාර්යය අවසන් කිරිම<br>• කලාප අධ්‍යාපන කාර්යාල වෙත ඊට අවශ්‍යප පරිගනක සහ උපාංග ලබාදිම සිදු කිරිම<br>• 2019 පළමුවන ශ්‍රේණියට ඇතුලත්කර ගන්නා සිසුන්ගේ තොරතුරු පද්ධතියට ඇතුලත් කිරිම<br>• ඉන්පසු 13 ශ්‍රේණිය දක්වා සිසුන්ගේ තොරතුරු ඇතුලත් කිරිම<br>• පද්ධතිය භාවිතය විධිමත් කිරිම සඳහා චක්‍ර ලේඛය 2020.01.01 දින නිකුත් කිරිමට අපේක්ෂිතය. |
| **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව පරීක්ෂාව<br>2019 මාර්තු 27** | | |
| 1. | මනා කළමනාකරණ සැලැස්මක් තුළ වනජීවි ජාලයේ කටයුතු විමධ්‍යගත කිරීම, වර්තමාන සංරක්ෂණ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි පරිපාලනය ප්‍රතිව්‍යුහගත කිරීම හා දිගුකාලීන කළමනාකරණ සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාරක සභාව විමසීය. | සියළු කටයුතු ක්‍රමවත් කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල හඳුනාගෙන වනජීවී කළාපවල කාර්යාල පිහිටුවා ඒවාට අදාළ බල ප්‍රදේශ නිර්ණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. එසේම වර්තමාන සංරක්ෂණ අවශ්‍යතාවයන් ලෙස තොරතුරු තාක්ෂණය, ව්‍යෝහාරික වනජීවී විද්‍යාව, ජාන තාක්ෂණය, සමුද්‍ර සංරක්ෂණය හා අන්තර්ජාතික සම්මුතීන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළයුතු බව හඳුනාගෙන ඇති බව ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් පැවසීය. |
| 2. | විගණකාධිපතිවරයා විසින් පිළියෙල කරන ලද කෙටි සටහනහි ඇති විගණකාධිපති නිර්දේශ. | මේ සඳහා ප්‍ර.ග.නි./ ග.නි. ලබාදුන් පිළිතුරු පිළිබඳ කාරක සභාව සෑහීමකට පත් නොවූ බැවින් මෙම නිර්දේශ පිළිබඳ කරුණු දැක්වීමක් සඳහන් සවිස්තරාත්මක වාර්තාවක් අප්‍රේල් මස |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | 27 වැනි දිනට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය.<br>**විගණකාධිපති නිර්දේශ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලබාදී ඇත. (ඇමුණුම 05)** |
| 3. | ශ්‍රී ලංකාවේ ඇති සියළුම වෘක්ෂලතා හා සත්ව විශේෂ සංඛ්‍යාව හා ශ්‍රී ලංකාවට ආවේණික වෘක්ෂලතා හා සත්ව විශේෂ | මේ පිළිබඳව ප්‍ර.ග.නි./ග.නි. සිදුකළ කරුණු දැක්වීම පිළිබඳ කාරක සභාව සෑහීමකට පත් නොවූ බැවින් මේ පිළිබද සංඛ්‍යා දත්ත ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් අප්‍රේල් මස 27 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නියෝග කළේය.<br><br>**අදාළ සංඛ්‍යා දත්ත ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් ලබාදී ඇත.** |
| 4. | ආයතනයේ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ සිය අවධානය යොමු කළේය. | සහකාර අධ්‍යක්ෂක තනතුරු සඳහා බඳවාගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවා ඇති බවද, අඩවි ආරක්ෂක තනතුරු 57ක්, වන සත්ව නියාමකවරු 220ක් ඇති බවද බංගලා භාරකරු තනතුරු 12ක් හා සහකාර බංගලා භාරකරු තනතුරු 06 ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවද ප්‍ර.ග.නි/ග.නි. පැවසීය. ඒ හැරුණුවිට ක්ෂේත්‍ර සහයක තනතුරු 42ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම අවසන් අදියරේ පවතින බවද ඔහු වැඩිදුරටත් පැවසීය. |
| **සිරකරුවන්ට ආරක්ෂාව සහ රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනය කර සමාජ ගතකිරිමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව 2019 මාර්තු 29** | | |
| 1. | බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ 2018 දෙසැම්බර් 31 වන දින වන විට ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 27% ක් හෙවත් සංඛ්‍යාත්මක වශයෙන් 2,138 පැවතීම. | උසස් වීම් ලබා දීම ප්‍රමාද වීම හේතු කොට ගෙන පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් ඇති බවත් මේ වන විට අදාල නිලධාරින් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් ඉදිරි මාස තුන හතර තුළ ද්විතීය හා තෘතීය මට්ටමේ පුරප්පාඩු පිරවීමේ කටයුතු අවසන් කළ හැකි බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | සුදුසු නිලධාරීන් තෝරා, පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන යන්නේ නම් මෙම පුරප්පාඩු පිරවීම කඩිනම් කළ හැකි බව කාරක සභාවේ නිර්දේශය විය. |
| 2. | බන්ධනාගාරය තුළට ඇතුළු වීමේදි පුද්ගලයන් හා භාණ්ඩ පරික්ෂාවට ලක් කිරිමේ දී නවීන තාක්ෂණය උපයෝගි කර ගැනීම හා, විශේෂයෙන් පුහුණු කරන ලද සුනඛයින් යොදා ගැනීම. | දැනට බන්ධනාගාර සතුව ඇති සන්නිවේදක යන්ත්‍ර හරහා සියුම් මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම අපහසු බැවින් මේ සඳහා පුහුණු කරන ලද සුනඛයින් යොදා ගැනීම වැනි අලුත් ක්‍රම වේද යොදා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස කාරක සභාව නිර්දේශ කළේය. |
| 3. | ස්කෑන් යන්ත්‍ර හරහා බන්ධනාගාරය තුළට ගෙන යන ද්‍රව්‍ය පරික්ෂා කළ ද බන්ධනාගාර රැඳවියන් අත ජංගම දුරකථන වැනි උපකරණ පැවතීම. | දැනට බන්ධනාගාරය සතුව පවතින ස්කෑන් යන්ත්‍ර සංවේදිතාවයෙන් අවම මට්ටමක පවතින බවත්, නිලධාරින්ගේ සහ නවීන තාක්ෂණික පරික්ෂක උපකරණ වල පවතින දැඩි හිඟකම මත පරික්ෂා කිරිමේ ගැටළු පවතින බවත් ප්‍ර.ග.නි./ග.නි සඳහන් කළේය.<br><br>මෙවැනි ගැටළුවලට නිලධාරින්ගේ පවතින අධික පුරප්පාඩු ප්‍රමාණය හේතුවන බව නිරික්ෂණය කළ කාරක සභාව හැකිතාක් දුරට මෙම පුරප්පාඩු පුරවා මාස හයක් ඇතුළත පුරප්පාඩු වල තත්වය පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදි.<br><br>**මේ සම්බන්ධයෙන් විස්තරාත්මක පිළිතුරක් ලැබී ඇත.ඒ අනුව දැනට පුරප්පාඩුව පවතින අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන), නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් (ශ්‍රී.ල.පරිපාලන සේවය) ඇතුළු සියලුම පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන ඇති බව දන්වා ඇත.** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| 4. | බන්ධනාගාරවල පවතින වැසිකිලි පහසුකම් වැඩි දියුණු කිරිම. | බන්ධනාගාර තුළ වැසිකිලි පහසුකම් වැඩිදියුණු කිරිම අත්‍යවශ්‍ය කරුණක් බැවින් මේ පිළිබඳ කඩිනම් පියවර ගන්නා ලෙසත්, ඒ සම්බන්ධ ගෙන ඇති ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් මාස 06 ක් තුළ ලබා දීමට ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදි.<br><br>**මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව බන්ධනාගාර තුළ වැසිකිළි ඉදිකිරීම සම්බන්ධයෙන් පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතිය ලෙස රැඳවියන් 25 දෙනෙකු සඳහා 1 වැසිකිලියක් බැගින් තිබිය යුතු බවට ව්‍යාපෘති සේවා සඳහා එක්සත් ජාතීන්ගේ කාර්යාලය මගින් නිකුත් කර ඇති බන්ධනාගාර සැලසුම් සඳහා තාක්ෂණික මහපෙන්වීම යන පොත මගින් දක්වා ඇත.ඒ අනුව දැනට තිබෙන වැසිකිළි අතුරින් අලුත්වැඩියාව සිදු කළ හැකි වැසිකිලි අළුත්වැඩියා කිරීම හා අවශ්‍ය නව වැසිකිලි ඉදිකිරිමට අවශ්‍ය ප්‍රතිපාදන 2020 අයවැය ඇස්තමේන්තුව මගින් ඉල්ලා ඇති බවද නගරාශ්‍රිත බන්ධනාගාර වැඩිදියුණු කර විතැන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ තවදුරටත් අවශ්‍ය වැසිකිලි ඉදිකිරීමට කටයුතු කර ඇති බවද දන්වා ඇත.** |
| 5. | සිදු කරන ලද අපරාධයේ ස්වභාවය අනුව පනතෙහි සඳහන් ආකාරයට සිරකරුවන් වර්ග කිරිම | මේ සඳහා විකල්ප ක්‍රියාමාර්ග යෝජනා වි තිබුණද මෙතෙක් ක්‍රියාත්මක වි නොමැති බවත්, බන්ධනාගාර තුළ පවතින තදබදය නිසා එසේ රැඳවියන් වෙන් කොට රඳවා තබා ගැනීමට අපහසු බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br><br>ප්‍රජා පාදක විශෝධක සේවා සඳහා යෙදවීම හරහා මෙම තදබදය තරමක් දුරට අවම කර ගැනීමට හැකියාවක් ඇති බවත් ඒ අනුව මේ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරු සහ සාමාන්‍ය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | ජනතාව දැනුවත් කිරිම කළ යුතු බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| 6. | සිරකරුවන්ගේ ආහාර සැපයීම පිළිබඳ ටෙන්ඩර කැඳවීමේදි අතාත්වික මිල ගණන් යොදා ටෙන්ඩරය ලබා ගැනීමෙන් අනතුරුව ආහාර වල ප්‍රමිතිය අඩු කිරිම සිදු වන බැවින් එය වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර | ආහාර වල ප්‍රමිතිය හැකිතාක් දුරට උපරිම මට්ටමින් රැක ගැනීම සඳහා අවධානය යොමු කරන බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>අතාත්වික මිල ගනන් යෙදීම වැළැක්වීම සඳහා ටෙන්ඩර කැඳවීමේදි ඉහළ මිලක් මෙන්ම අවම මිලක් ද නියම කර ටෙන්ඩර් කැඳවන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලදි. |
| 7. | බන්ධනාගාර ගත වූවන්ගේ මානසික සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ | සිරකරුවන්ගේ හැකියාව මත වැඩ අංශ වෙත යොමු කර NVQ සහතිකයක් ලබා දෙන බවත් දහම් අධ්‍යාපනය, ඉංග්‍රිසි අධ්‍යාපනය ලබා දීම සහ සිරකරුවන්ගේ නිර්මාණ හැකියාව එළිදැක්විය හැකි වැඩසටහන් වැනි පුනරුත්ථාපන ක්‍රමවේදයන් බන්ධනාගාරය තුළ ක්‍රියාත්මක වන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කරන ලදි. |
| 8. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ විගණන වාර්තාවෙහි සඳහන් නිර්දේශ 28 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ විගණන වාර්තාවෙහි ඇතුළත් නිර්දේශ, එකී නිර්දේශ ක්‍රියාත්මක කිරිම සඳහා ගත වන කාල වකවානුව, ඒ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් යන කරුණු වෙන් වෙන් වශයෙන් ඇතුළත් වාර්තාවක් මාස 03 ක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි.ට නියෝග කරන ලදි.<br><br>එකී කරුණු අන්තර්ගත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 06)** |
| 9. | දඩ ගෙවිමට අපොහොසත්ව බන්ධනාගාර ගත වූවන් සහ ඇප තැබීමට නොහැකිව රක්ෂිත බන්ධාගාරගත පුද්ගලයන් | දඩ ගෙවිමට අපොහොසත්ව බන්ධනාගාර ගත වූවන් සහ ඇප තැබීමට නොහැකිව රක්ෂිත බන්ධාගාර ගත වූවන් සම්බන්ධ ගැටළුව නිරාකරණය කිරිමට යෝජනා කරන විසඳුම් ඇතුළත් වාර්තාවක් මාස 06 ක් තුළ ඉදිරිපත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | කිරීමටද කාරක සභාව විසින් ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදි.<br><br>**ඒ සම්බන්ධයෙන් සවිස්තරාත්මක පිළිතුරක් එවා ඇත. ඒ අනුව,**<br><br>• **පුද්ගලයන් බන්ධනාගාර ගත නොකර නිරතවන රැකියාව තුළින් ආදායම් උපදවා වාරික වශයෙන් දඩ මුදල් ගෙවීමට අවස්ථාව සලසා දීම**<br><br>• **සුළු දඩ මුදල් වලට බන්ධනාගාර ගත වන්නන් ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කිරීමට අවශ්‍ය පියවර ගැනීම**<br><br>• **සිරගත වූ පසුද, එම රැඳවියන්ට දඬුවම් කාලසීමාව තුළ නැවත අධිකරණය වෙත යොමු වෙමින් දඬුවම වෙනස් කරවා ගැනීම සඳහා නීති ප්‍රතිපාදන නොපවතින බැවින් ඒ සඳහා අවශ්‍ය නීති සැකසීම**<br><br>• **ඇප පනත නිසි පරිදි අර්ථවත්ව ක්‍රියාවට නැංවීම**<br><br>• **සුළු වැරදි සඳහා බන්ධනාගාර ගත නොකොට පොලිස් ඇප මත මුදා හැරීම**<br><br>• **පුද්ගලයාට තැබීමට හැකි පහසු ඇප කොන්දේසි මත ඇප ලබා දීම යන නිර්දේශ ඉදිරිපත් කර ඇත.** |
| **ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු අතර ක්‍රියාත්මක කිරීමට යෝජිත ස්වයංක්‍රීය පරිගණක සැසඳුම් පද්ධතියේ කටයුතු ප්‍රමාද වීම පිළිබඳ සොයා බැලීමේ සාකච්ඡාව<br>2019 මැයි 07** | | |
| 1. | ශ්‍රී ලංකා රේගුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර ක්‍රියාත්මක කිරිමට යෝජිත ස්වයංක්‍රීය පරිගනක සැසඳුම් | ස්වයංක්‍රීය සැසඳුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වශයෙන් පරිගනක පද්ධතිවල වැඩි දියුණු කිරිම් සිදුකළ යුතු බව මෙහිදි අනාවරණය විය. ඒ සඳහා ඉන්ෆොමැටික්ස් ඉන්ටනැෂනල් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | වැඩසටහන ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම සඳහා පවතින බාධාවන් | පෞද්ගලික සමාගම සමග ගිවිසුම් ගතව සමස්ත වැඩසටහනේ 80% ක පමණ කටයුතු අවසන් කිරීමට පියවර ගෙන ඇති නමුත් හිඟ මුදල් ගෙවීමක් සම්බන්ධයෙන් පැවති ගැටලුකාරී තත්ත්වය නිසා 20% ක පමණ වැඩ කටයුතු ප්‍රමාද වී ඇති බව හෙළිවිය. පැවති ගැටළු සාකච්ඡා කර විසඳා ගනිමින් 2019 ජුනි 10 වන විට කාර්යය අවසන් කර රේගු දෙපාර්තමේන්තුවේ ස්වයංක්‍රිය පරිගනක පද්ධතිය හා සම්බන්ධවීමට අපේක්ෂා කරන බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නියෝජිතවරයා ප්‍රකාශ කර සිටියේය.<br><br>තම දෙපාර්තමේන්තුව ස්වයංක්‍රීය පරිගනක පද්ධතියේ කටයුතු දැනටමත් අවසන් කර ඇති බැවින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු අවසන් කළ වහාම අත්හදා බැලීමේ පරීක්ෂණයකින් අනතුරුව නිශ්කාශන කටයුතු සිදුකිරීමේ හැකියාව පවතින බව රේගු දෙපාර්තමේන්තු නියෝජිත පැවසීය. |
| 2. | රේගුව මගින් නිශ්කාශනය කරන වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේදි සැලකිල්ලට ගනු ලබන දත්ත | රේගු සටහන්කරයේ පවතින 54 ක් පමණ වූ දත්ත අතුරින් මූලික දත්ත 25 ක් වාහන ලියාපදිංචියේදි සලකා බලන බවත් නිෂ්පාදිත වර්ෂය, වර්ණය, බර, ධාරිතාවය ආදි තොරතුරු එහි ඇතුලත් බැවින් ස්වයංක්‍රිය සැසඳුම් පද්ධතියට එය ප්‍රමාණවත් වන බව අනාවරණය විය. එසේම අතරමැදි පුද්ගල සම්බන්ධතාවයන් නොමැතිව දත්ත ස්වයංක්‍රීයව සම්ප්‍රේෂණය වන බැවින් විනිවිදභාවයක් ඇතිව කටයුතු කිරිමේ හැකියාව ඉන් ලැබෙන බවත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නියෝජිතවරයා පැවසිය. 2003 වර්ෂයේ සිට නිෂ්කාශනය කරනු ලබන වාහනවල තොරතුරු ඇතුලත් ඉලෙක්ට්‍රොනික දත්ත ගොනුවක් දිනපතා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ලබාදෙන බවත්, නිෂ්කාශන කළද මෙතෙක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | ලියාපදිංචි කර නොමැති වාහන පිලිබඳව වාර්තා ලබාගැනිමේ හැකියාව පවතින බවත් මෙහිදී හෙලිවිය. |
| 3. | වාහනයක් ආනයනය කිරිම සඳහා ණයවර ලිපි (Letter of Credit) නිකුත් කළ විගස එය රේගුවට දැනුම් දෙන ක්‍රමවේදයක් පවතින්නේද යන්න කාරක සභාව විමසිය. | 2006 වර්ෂයේ සියලු බැංකු සම්බන්ධ කළ පරිගනක මාදුකාංගයක් හඳුන්වා දී ඇතත් එහි ණයවර ලිපි නිකුත් කළ දිනය ඇතුලත් කර නොතිබීම හේතුවෙන් වංචා සිදුවීමේ ඉඩකඩක් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළේය. ණයවර ලිපිය විවෘත කළ දිනයට අදාළව තීරු ගාස්තු අයකිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති නිසා මෘදුකාංගය යළි සකස් කිරීමට සිදුවන බව රේගු දෙපාර්තමේන්තු නියෝජිතවරයා පැවසීය. වාහනයක් ආනයනය කිරීමේදි ලදුපත, රේගු සටහන්කරය සහ පරීක්ෂණ සහතිකය වැනි අත්‍යාවශ්‍ය ලේඛණ භාවිතයට ගන්නා බැවින් ඒවා ස්කෑන් කර ඉලෙක්ට්‍රොනික ගොනුවක් ලෙස ලබා දිමට කටයුතු කරන බවත්, ලෝක වෙළඳ සංවිධාන ගිවිසුම්වලට අනුකූලව වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ දි කඩදාසි රහිත ලේඛණ සකස් කිරිමේ අවශ්‍යතාවය පවතින බැවින් ඒ අනුව විද්‍යුත් අත්සන හඳුන්වා දීමට කටයුතු කර ඇති බවත් ගරු හර්ෂද සිල්වා ඇමතිතුමාගේ අධික්ෂණයට යටතේ සියලු කටයුතු ක්‍රමවත්ව සිදුවෙමින් බවත් ඔහු වැඩිදුරටත් පැවසිය. |
| 4. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල වාහනයක තොරතුරු රේගු දෙපාර්තමේන්තුවට යළි නිරික්ෂණය කිරිමේ හැකියාවක් පවතින්නේදැයි කාරක සභාව විමසීය. | ලියාපදිංචි කරන ලද වාහනයක වැසි හෝ එන්ජින් අංකවල කිසියම් වෙනසක් සිදුවුවහොත් රේගු දෙපාර්තමේන්තුව හෝ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ස්වයංක්‍රිය පද්ධතිය හරහා දැන්වීමේ පහසුකම් සැලසෙන අතර එකලස් කරන ලද වාහන ලියාපදිංචිය වැලැක්විම සඳහා ලියාපදිංචි සහතිකයට රේගු සටහන්කර අංකය යෙදිම සිදුකළ යුතු බව රේගු දෙපාර්තමේන්තු |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
| | | නියෝජනය කරමින් සහභාගි වූ නිලධාරියා පැවසිය. |
| **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව පරීක්ෂාව**<br>**2019 මැයි 08** | | |
| 1. | 2019.03.27 අලි මංකඩවල් හඳුනා ගැනීම හා හඳුනාගත් අලිමංකඩ 16 ගැසට් කිරීම. | මේ පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇති බවද ජනතාව පරිස්ථානගත කිරීම සඳහා මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින බවද පාර්ශවකාර ආයතන අතර පවතින කළමනාකරණ ගැටළු මගහරවා ගනිමින් ගැසට් කිරීමේ කටයුතු ජුනි මස වනවිට සිදුකරන බවද ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>දැනට යෝජිතව ඇති අලිමංකඩ 09 ගැසට් කිරීමේ ප්‍රගතියද ඉතිරි අලිමංකඩ 07 පිළිබඳ ඉදිරි කටයුතු ද සිදු කිරීමට නිශ්චිත කාල රාමුවක් සහිතව විධිමත් වැඩපිළිවෙලක් තිබීමේ අවශ්‍යතාවය පැහැදිලි කල කාරක සභාව මෙම වසර අවසාන වනවිට දේශපාලන අධිකාරියේද උපකාර ඇතිව මෙම කර්තව්‍ය අවසන් වියයුතු බව අවධාරණය කළේය. |
| 2. | අලින් ගැවසෙන ප්‍රදේශවල කසළ කළමනාකරණ ඒකකවලට වන අලින් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂිත ආරක්ෂිත වැටක් ඉදිකිරීම සහ ඒවා නිසි පරිදි නඩත්තු කිරීම. | මෙතෙක් යොදාගත් විදුලිවැටද මෙම ගැටළුවට ප්‍රමාණවත් නොවීම නිසා කුඩා පරිමාණ කසළ බැහැර කිරීමේ ස්ථානවලට නව ක්‍රමවේදයක් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවද ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>මෙහිදී අලින් ගැවසෙන ප්‍රදේශවල කසළ කළමනාකරණය සඳහා එම කසළ මත සතුන්ට අනතුරක් සිදුනොවන යම් රසායන ද්‍රව්‍යයක් අතුරා අලින් එම කසළ අනුභවයට නොපෙළඹෙන තත්වයක් ඇති කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලන ලෙස හා මෙම ගැටළුව වැළැක්වීම සඳහා කසළ බැහැර කරන පළාත්පාලන ආයතනද සම්බන්ධ කරගනිමින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | විධිමත් ක්‍රමවේදයක් ඇති කිරීමේ වැදගත්කමද කාරක සභාව අවධාරණය කළේය. |
| 3. | ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ හා සංචාරක බංගලා වෙන් කිරීමේ ක්‍රමවේදයේ අවභාවිතයන් පවතින බැවින් එය ප්‍රතිව්‍යුහගතකර නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කිරීම. | මෙම තත්වය ක්‍රමානුකූල කිරීමට අදාළ චක්‍රලේඛ නිකුත් කර අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය මගින් මෙම ක්‍රියාවලිය නිරන්තර පරීක්ෂාවට ලක්කරමින් විධිමත්ව කටයුතු කරගෙන යන බවත්, සංචාරක බංගලා වෙන්කිරීම හා ප්‍රවේශපත් වෙන්කිරීම අන්තර්ජාලය හරහා සිදු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| | **අධ්‍යාපන අමාත්‍යාංශය<br>(කායික හා මානසික සමබරතාවයෙන් යුතු සිසු පරපුරක් බිහිකිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ ඉදිරිපත් කළ පරිගණක දෘශ්‍ය වැඩසටහන)<br>2019 මැයි 09** | |
| 1. | කායික හා මානසික සමබරතාවයෙන් යුතු නිරෝගී සිසු පරපුරක් බිහිකිරීමේ ව්‍යාපෘතියේ මේ දක්වා ඉටුකර තිබෙන කාර්යයන් | සෑම සිසුවෙකුම එක් ක්‍රීඩාවකට හෝ යොමු කිරීම, ක්‍රීඩාව ජාතික මට්ටමට නැංවීම, දක්ෂතා පිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් එකතුකර පුහුණු සංචිත ඇතිකිරීම සහ සිසුන්ගේ ශාරීරික වර්ධනය ඇගයීම අරමුණු කර අධ්‍යාපන, ක්‍රීඩා, සෞඛ්‍ය, උසස් අධ්‍යාපන සහ නිපුනතා සංවර්ධන යන අමාත්‍යාංශ 5 ඒකාබද්ධව 2011 වසරේ මෙය ආරම්භ කරන ලදි. එහෙත් මෙම වැඩසටහනින් අපේක්ෂා කළ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වූ බැවින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ මගපෙන්වීම යටතේ රු.මිලියන 18,384 ක වැය ඇස්තමේන්තුවක් මත පස් අවුරුදු ව්‍යාපෘතියක් ලෙස යළි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 2. | මෙම ව්‍යාපෘතිය තුලින් අරමුණු 9 ක් ඉටුකර ගැනීමට සැලසුම් කළත් එහි මුදල් වැය කර ඇත්තේ සීමිත කාර්යයන් කීපයකට බව නිරීක්ෂණය වීම. | අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් නොපැවතීම මෙන්ම බාහිර ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට ප්‍රමාණවත් කාලයක් නොතිබීම ව්‍යාපෘතියේ අසාර්ථකත්වයට හේතු වූ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | සිසුන්ට බාහිර කටයුතු සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම ගැටලුවක් වී ඇති බැවින් දැනට පවතින පුළුල් විෂය නිර්දේශයන් පිලිබඳව යළි සලකා බැලිමට සිදුවී ඇති බව ප්‍රකාශ කළ ග.නි. ප්‍රමාණවත් ක්‍රිඩා පහසුකම් නොමැති පාසල් සඳහා පළමු අධියරේ ප්‍රධාන ක්‍රිඩා 7 ක් පමණක් හඳුන්වා දීමටත් ක්‍රීඩා කුසලතාවන් සහිත පුද්ගලයින් ව්‍යාපෘතියට සම්බන්ධ කරගැනිමටත් අවධානය යොමු කරන බවත් ක්‍රීඩා සහ අධ්‍යාපන අමාත්‍යාංශ ඒකාබද්ධව සම්පත් බෙදා හැරීම සිදුකළ යුතු බවත් පැවසිය.<br><br>තවද සිසුන්ගේ ශාරිරික යෝග්‍යතාවය සහ ක්‍රියාකාරකම් පිලිබඳව Active Kids නමින් වැඩසටහනක් හඳුන්වා දී ඇති අතර සෑම සිසුවෙකුගේම තොරතුරු වාර්තා පොතක් මගින් යාවත්කාලින කර එයට ලකුණු ලබාදිමේ ක්‍රමවේදයක් හඳුන්වා දිමට කටයුතු කරන බව මෙහිදි ප්‍රකාශ විය. |
| 3. | අධ්‍යක්ෂ (ක්‍රිඩා) ඇතුළු පළමු පන්තියේ තනතුරු 10 ක් පුරප්පාඩුව පැවතිම. | පවතින පුරප්පාඩු කඩිනමින් පිරවිමට කටයුතු කරන අතර පාසල්වල දැනට පවතින ක්‍රීඩා සහ නොපවතින ක්‍රිඩා පිලිබඳව තොරතුරු පළාත් අධ්‍යක්ෂවරු වෙතින් ලබාගෙන ඊට අවශ්‍ය පහසුකම් සලසා දිමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ග.නි. පැවසිය. |
| **විලත්තියිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය සම්බන්ධයෙන් වන විශේෂ විගණන වාර්තාව පිළිබඳ විමර්ශනය<br>2019 මැයි 10** | | |
| 1. | 2012 මැයි 21 දිනැති අංක 1759/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් "විලත්තියිකුලම් රක්ෂිත වනාන්තරය" ලෙස ප්‍රකාශයට පත් කර ඇති වනාන්තරයෙන් අක්කර 650 ක කොටසක් පුද්ගලයන් | යුද්ධය අවසන් වීමෙන් පසු 2011 වසරේ මන්නාරම දිස්ත්‍රික්කයේ රක්ෂිත දෙකක් පමණක් ප්‍රකාශයට පත් කර තිබූ බවද, ඒවායේ මායිම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබූ බවද, අනෙකුත් සියළු ප්‍රදේශ රජයේ කැලෑ ප්‍රදේශ නමින් හැඳින්වෙන අතර ඒවාට මායිම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | පදිංචි කිරීම සඳහා වන රක්ෂක විසින් නිදහස් කර තිබුණද, එය පවතින නීතිය ට පටහැනි බවට කරන ලද නිගමනය | නොතිබුණු බවද මෙහිදී අනාවරණය විය. එමෙන්ම, මෙම ඉඩම්වල බිම් මැනුමක් කිරීමේ අපහසුතාවය නිසා 2008 පිළියෙල කළ වනාන්තර වැස්ම සිතියම ඇසුරින් එම රජයේ කැලෑ ප්‍රදේශ රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කළ බවද, එබැවින් ඒ තුළ පෞද්ගලික ඉඩම්ද ඇතුලත් වීමේ හැකියාව ඇති බවත්, විලත්තියිකුලම් රක්ෂිතයද එයට ඇතුලත් වන බවත්, ඒ වන විටද ජනාධිපති කාර්ය සාධක බලකාය මගින් යම් ඉඩම් ප්‍රමාණයක් එළි කර තිබූ බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>ඒ අනුව 2012 වසරේදී රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කළ විලත්තියිකුලම් වන රක්ෂිතයේ අක්කර 650 ක කොටසක් පුද්ගලයන් පදිංචි කිරීම සඳහා වන රක්ෂක විසින් නිදහස් කිරීම නීතියට පටහැනි නොවන බව කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 2. | “රක්ෂිත වනාන්තරයේ කොටසක් එළිපෙහෙළි කිරීමෙන් සිදු විය හැකි පරිසර හානිය සම්බන්ධයෙන් පවතින නීතියට අනුව පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීමක් ( Environment Impact Assessment) කළ යුතු වුවද, එසේ සිදු කර නොතිබූ හෙයින් වන රක්ෂිතයට සිදු වූ හා ඉදිරියේදී සිදුවන පරිසර හානිය සම්බන්ධයෙන් පියවර ගැනීමට කටයුතු කර නොතිබුණු බවට වූ නිගමනය | ජාතික පාරිසරික පනතට අනුව රක්ෂිත වනාන්තරයක් එළිපෙහෙළි කිරීමේදී පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීමක් සිදු කළ යුතු වුවද, එම ඇගයීම විලත්තියිකුලම් වන රක්ෂිතය එළිපෙහෙළි කිරීමේදී සිදු වී නොමැති බව අනාවරණය විය. |
| 3. | ඉඩම් නොමැති අවතැන් වූ පවුල් සඳහා ඉඩම් ලබා දීමේ ව්‍යාපෘතිය නිසියාකාරව ක්‍රියාත්මක වී නොතිබීම හා යුද්ධයෙන් ඉඩම් අහිමි නොවූ ඔවුන්ගේ දෙවන හා | 1990 වර්ෂයට පසුව අවතැන් වූ අය පිළිබඳ නිවැරදි දත්ත හා ඔවුන් අනාථ කඳවුරුවල සිටියේද යන්න තහවුරු කර ගැනීම සඳහා දත්ත නොතිබීම ආදී කරුණු හේතුවෙන් ඉඩම් ලබා දුන් අය අවතැන් වූ අයද යන්න සනාථ කර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | තුන්වන පරම්පරාවල පවුල්වලට ප්‍රමාණවත් ඉඩම් නොමැති බවට කරුණු දක්වා මෙම වන රක්ෂිතයෙන් ඉඩම් ලබා දී ඇති බවට නිරීක්ෂණය වීම. | ගැනීමට නොහැකි වූ බව විගණකාධිපතිවරයා පැවසීය.<br>1990 කාල වකවානුවේදී මුසලි ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් 85% මුස්ලිම් ජනතාව වූ බවත්, එම කාලයේදී ආසන්න වශයෙන් පවුල් 2500 පමණ එම ප්‍රදේශයෙන් අවතැන්වී ඇති බවත් පසුව 2009 වසරේදී ඔවුන් නැවත පදිංචිවීම සඳහා පැමිණෙන විටදී ආසන්න වශයෙන් පවුල් 6000 ක් පමණ පැමිණි බවත් අනාවරණය විය. එසේම ජනතාවට ඉඩම් නොමැති ප්‍රශ්ණය පිළිබඳව ඉහළ මට්ටමේදී සාකච්ඡාවට ලක් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපිත කළ බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. ඉඩම් දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වන සම්පත් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් සහ දිසාපතිවරයා ජනාධිපති කාර්ය සාධන බලකායේ සාමාජිකයන් වූ අතර ක්ෂේත්‍ර සංචාර සිදුකොට ජනතාවට ඉඩම් ලබාදීම මෙහි පදනම විය. ඒ අනුව වන සම්පත් දෙපාර්තමේන්තුව විසින් අක්කර 650 නිදහස් කරන ලද බවත් ඉල්ලුම්පත් කැඳවා ඒ සඳහා වූ නාම ලේඛනයක් සකස් කොට නිවැරදි ආකාරයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ අවසරය ලබා ගෙන අවතැන්වී නැවත පැමිණි ජන කොට්ඨාශයක් බව තහවුරු කරගැනීමෙන් පසුව පමණක් ඉඩම් ලබාදීමේ කටයුතු සිදු කර ඇත. එලෙස ආසන්න වශයෙන් එම ප්‍රදේශයෙන් 1051 දෙනෙකු තෝරා ගන්නා ලද අතර ඔවුන්ට ඉඩම් කට්ටි 941 බෙදා වෙන් කරන ලද බවත්, ඒ සඳහා නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කොට තිබෙන බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>එමෙන්ම ජනාධිපති කාර්ය සාධක බලකාය මගින් නිකුත් කර තිබූ චක්‍රලේඛයට අනුව අවතැන් වූ අයගේ දෙවන හා තෙවන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | පරම්පරාවන්ටත් ඉඩම් ලබා දිය හැකි බවත්, පුත්තලම ප්‍රදේශයේ පෞද්ගලික ඉඩම් හිමි අවුරුදු 18 ට වැඩි අයටද ඉඩම් ලබා දිය හැකි බවටත් ලද උපදෙස් අනුව ඉඩම් ලබා දී ඇති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>අවතැන් වූ පුද්ගලයන්ට ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් රජය විසින් ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |
| 4. | රක්ෂිත වනාන්තර හෝ පාරිසරික වටිනාකමක් සහිත ප්‍රදේශ එළිපෙහෙළි කර පුද්ගලයන් පදිංචි කිරීම සඳහා යොදා නොගැනිමට කටයුතු කරන ලෙසට වූ විගණන නිර්දේශය. | කාරක සභාව නිර්දේශ කල පරිදි මේ සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීමේ වැදගත්කම පෙන්වා දුන් ප්‍ර.ග.නි/ ග.නි එබඳු ප්‍රතිපත්තියක් රක්ෂිත වනාන්තර රැක ගැනීමට මනා පිටිවහලක් වන බව පැවසීය.<br><br>මේ සම්බන්ධයෙන් නීතිරීති පැවතියද, රජයේ ප්‍රතිපත්ති අනුව සංවර්ධන කාර්යයන් සඳහා ඇතැම් රක්ෂිත වනාන්තර නිදහස් කිරීමට සිදු වන බවද ප්‍ර.ග.නි/ ග.නි පැවසීය |
| 5. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (14) ව්‍යවස්ථාවේ සඳහන් පරිදි "ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කොට වැඩි දියුණු කළ යුතුය" . ඒ සඳහා පවතින නෛතික විධිවිධාන ප්‍රමාණවත් නොවන බැවින් අවශ්‍ය විධිවිධාන පැනවීමට කටයුතු කළ යුතු බව. | මේ සඳහා අදාළ පනත් සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති බව ප්‍ර.ග.නි. /ග.නි පැවසිය.<br><br>මේ සම්බන්ධයෙන් දැනට පවතින විධිවිධාන සහ නව පනත් හඳුන්වා දීම හෝ පවත්නා පනත්වලට සංශෝධන ගෙන ඒම පිළිබඳ නව නීති කෙටුම්පත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම යන කරුණු සම්බන්ධව දින වකවානු ඇතුලත් වාර්තාවක් 2019 ජුනි මස 01 වැනිදාට පෙර කාරක සභාව වෙත යොමු කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **මේ සම්බන්ධයෙන් රජයේ ඉඩම් ආඥා පනතේ හා ඉඩම් සංවර්ධන ආඥා පනතේ ප්‍රමාණවත් විධිවිධාන පවතින බැවින් තවදුරටත් සංශෝධන ගෙන ඒම අවශ්‍ය නොවන බව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා දන්වා ඇත.**<br><br>**මේ සම්බන්ධයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එවා ඇති වාර්තාව අනුව 2009 අංක 65 දරණ පනතින් සංශෝධනය වූ 1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥා පනතේ (451 වන අධිකාරිය) අවශ්‍ය සංශෝධන සිදු කිරීමට කටයුතු කරමින් පවතින බවත්, 2018.08.21 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්, නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමෙන් පසු සකස් කරන ලද මූලික කෙටුම්පතට සිදු කළ යුතු තවත් සංශෝධන පිළිබඳව අධ්‍යනය කොට එම සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.** |
| 6. | විලත්තියිකුලම් රක්ෂිත වනාන්තරයේ ඉදිකර තිබූ නිවාසවල පදිංචි වී නොමැති සහ නිවාස ඉදිකර නොමැති බිම් කට්ටි ප්‍රමාණය, මුළු වෙන්කළ ඉඩම් ප්‍රමාණයෙන් සියයට 80 පමණ වන අතර ස්ථිරව පදිංචි වී ඇති ඉතිරි සියයට 20ක ඉඩම්වල පදිංචි පවුල්වලට වෙනත් සුදුසු ඉඩම් ලබාදී රක්ෂිත වනාන්තරය පෙර පරිදිම පවත්වා ගෙන යාමට කටයුතු යෙදිය යුතු බවට සඳහන් විගණන නිර්දේශය | බලපත්‍ර මගින් ඔවුන්ට ඉඩම් පවරා දී ඇති බවත් නිශ්චිත කාලයක් ඇතුලත මෙම ඉඩම්වල නිවාස සෑදිය යුතු බවට එම බලපත්‍රයේ කොන්දේසියක් ඇති බැවින් එම ඉඩම්වල නිවාස ඉදි නොකළ පුද්ගලයන් මෙම බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය කර ඇති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>ඉඩම්වල සියයට 80 ක ප්‍රමාණයක පදංචි නොවීම හේතුවෙන් එම ඉඩම් තවදුරටත් නිදහස් කර තබා ගත යුතුද යන ප්‍රශ්නය මතු වන බව කාරක සභාවේ අදහස විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | විදුලි හා ජල පහසුකම් ප්‍රමාණවත් පරිදි සපයා නොතිබීම මත ඇතැම් පවුල් මෙම ඉඩම්වල පදිංචි වී නොමැති බව මෙහිදී අනාවරණය විය.<br><br>එසේම මෙම ඉඩම් සඳහා ව්‍යවස්ථාපිත පිඹුරක් සකස් කර නොමැති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>රජයේ ඉඩම් අක්කර 30ක් ද පවුල් අතර බෙදා දී ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව, මෙම ඉඩම් කොටස් හිමිකරුවන්, ඉඩම් කොටස්වල ප්‍රමාණය සහ ඒවායේ මානක සැලසුම පිළියෙල කර ඇත්තේ කවුරුන් විසින්ද යනාදී තොරතුරු ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් 2019 ජුනි මස 01 වැනිදාට පෙර කාරක සභාව වෙත යොමු කරන මෙන් ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**එම අක්කර 30 විලයිත්තිකුලම් රක්ෂිත ප්‍රදේශයට ඇතුලත් නොවන බවත්, ඉහත අක්කර 650 සඳහා පවත්වන ලද ඉඩම් කච්චේරිවලට එම ඉඩම් අදාළ නොවන බව මුසලි ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති බව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාර්තා කර ඇත.**<br><br>අවතැන් වූ පවුල් අතර බෙදා දී ඇති අක්කර 650 ක ඉඩම් ප්‍රමාණයට අදාළව නිශ්චිත තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි/ ග.නි අපොහොසත් වීම පිළිබඳ සිය අප්‍රසාදය පළ කළ කාරක සභාව ඉඩම් කට්ටි පවුල් අතර බෙදා දීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දිනය, සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ අයගේ නාම ලේඛනය, සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දුන් ආකාරය, සම්මුඛ පරීක්ෂණයෙන් ඉඩම් ලාභීන් තෝරා ගත් පදනම, සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ සියළු දෙනා සම්මුඛ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | පරීක්ෂණයෙන් තෝරා නොගැනීමට හේතුව, සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගත් පිරිසෙන් බලපත්‍ර ලබා දී ඇති සංඛ්‍යාව, බලපත්‍රලාභීන්ගෙන් සත්‍ය වශයෙන්ම ඉඩම්වල පදිංචි සංඛ්‍යාව, ඉඩම්වල පදිංචි නොමැති අය සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය, බලපත්‍රලාභීන් අතරින් අක්කර 650 තුළ පදිංචි වී ඇති සංඛ්‍යාව හා අක්කර 30 තුළ පදිංචි වී ඇති සංඛ්‍යාව පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් 2019 ජුනි මස 15 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**අවතැන් වූ මුස්ලිම් ජනතාව පදිංචි කිරීමට විලයිත්තිකුලම් රක්ෂිතයෙන් නිදහස් කළ ඉඩම් සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමට අනුමැතිය ලබා දීම සම්බන්ධ තොරතුරු, ඉඩම් කට්ටි බෙදා දීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දින, ස්ථාන, ලැබූ අයදුම්පත් සංඛ්‍යාව, සහභාගී වූ අයදුම්කරුවන් සංඛ්‍යාව, නොපැමිණි අයදුම්කරුවන් සංඛ්‍යාව, ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව, තේරුණු අයදුම්කරුවන් සංඛ්‍යාව, අයදුම්පත් කැඳවූ ආකාරය, සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ නිලධාරීන්ගේ නාම ලේඛනය, ඉඩම් ලාභීන් තෝරා ගැනීමේ නිර්නායක, සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ පදනම, අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට හේතු, බලපත්‍ර ලබා දී ඇති සංඛ්‍යාව, ඉන් භුක්තිය දරන සංඛ්‍යාව, සත්‍ය වශයෙන්ම පදිංචිව සිටින සංඛ්‍යාව හා තෝරාගත් පුද්ගලයන්ගේ අවසන් තේරීම් ලැයිස්තුව යන තොරතුරු ඇතුලත් එම වාර්තාව ලැබී ඇත.**<br><br>පරිසර ආරක්ෂණය හා සත්‍ය වශයෙන්ම යුද්ධයෙන් අවතැන් වූ ජනතාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෙහි දැක්වෙන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | නිර්දේශවලට හා නිගමනවලට අමතරව වෙනත් යෝජනාද, වන සංරක්ෂක ජනරාල්ට අයත් ඉඩම්වලට අමතරව අවතැන් වූ ජනතාව වෙත ලබා දිය හැකි වෙනත් විකල්ප ඉඩම් පවතීද යන කරුණද මෙම වාර්තාවට ඇතුලත් කළ යුතු බව කාරක සභාව ප්‍ර.ග.නි /ග.නි වෙත නියෝග කළේය.<br><br>**වාර්තාවේ සඳහන් නිර්දේශ 5ක් හා නිගමන 5ක් සඳහා වූ වාර්තාව හා යෝජනා අන්තර්ගත වාර්තාව ලැබී ඇත. (ඇමුණුම 07)**<br><br>ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු එම බලපත්‍රය වෙනත් පුද්ගලයන්ට විකුණා දමන අවස්ථා පවතින බැවින් ඒ පිළිබඳව විශේෂයෙන් සොයා බලන මෙන්ද කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය. |
| **වයඹ පළාත් සභාව<br>2019 මැයි 21** | | |
| 1. | පළාත් සභාව තුළ 7582 ක සේවක පුරප්පාඩු පැවතීම. | ගුරුවරුන් බඳවා ගැනීමට අදාළ විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇති බවත් මසක් ඇතුළත තෝරා ගැනීම් සිදු කිරීම කළ හැකි බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. එසේම මුදල් අමාත්‍යාංශය මගින් වැටුප් සඳහා ප්‍රතිපාදන ලබා දීම වර්තමාන සේවක සංඛ්‍යාව පදනම් කරගෙන සිදු කිරීම, දිගින් දිගටම පුරප්පාඩු පැවතීමට හේතු වී ඇති බවද මෙහිදී හෙළි විය.<br><br>මුදල් අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබා දෙනු ලබන්නේ එම අවස්ථාවේ සේවයේ සිටින සේවක සංඛ්‍යාව පදනම් කරගෙන හෝ පුරප්පාඩු වලින් 25% ක ප්‍රමාණයකට බවත් පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීමක් කළ හොත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | අතිරේක අයවැය ප්‍රතිපාදන මගින් ලබා දිය හැකි බවත් භාණ්ඩාගාර නිලධාරිහු ප්‍රකාශ කළහ.<br><br>මේ අනුව පළාත් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා සේවකයන් බඳවා ගැනීම සම්බන්ධව ප්‍රායෝගික ගැටළුකාරී තත්වයක් ඇති බව පැහැදිලි බැවින් මුදල් කොමිසම හා මුදල් අමාත්‍යාංශය සම්බන්ධ වී මේ සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙළක් සැකසිය යුතු බව කාරක සභාව අවධාරණය කරන ලදි. |
| 2. | ගල්ගමුව මූලික රෝහලේ 2017 වර්ෂය අවසානය වන විට රු. 100, 134, 172/- ක් වටිනා ශල්‍ය වෛද්‍ය උපකරණ සහ රු. 17, 868, 300/- ක් වටිනා වෛද්‍ය වායු පද්ධතිය අභාවිතව පැවතීම | විශේෂඥ වෛද්‍යවරුන්ගේ පවතින හිඟය හේතුවෙන් ශල්‍යාගාරය සහ හදිසි අනතුරු ඒකකය ක්‍රියාත්මක කිරිමේ අඩුපාඩු පවතින බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>විශේෂඥ වෛද්‍යවරුන් මාරු වී යාමේදී ඇතිවන පුරප්පාඩු පිළිබඳ පළාත් අමාත්‍යාංශයේ විශේෂ අවධානය යොමු කර අවශ්‍ය පත්කිරීම් කඩිනම් කිරීමට පියවර ගත යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |
| 3. | ඖෂධ කල් ඉකුත් වීම හේතුවෙන් රජයට විශාල අලාභයක් සිදුවීම | ඇතැම් ඖෂධ, වර්ෂය ආරම්භයේදීම නොව වසර මැද සැපයීම, ඒ ඒ වෛද්‍යවරු එකිනෙකට වෙනස් ඖෂධ ඉල්ලා සිටීම,නියැදි සාම්පල් අසමත් වීම වැනි හේතු ඖෂධ කල් ඉකුත් වීමට බලපාන හේතු වලින් කීපයක් බව අනාවරණය විය. මෙය වැළැක්වීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද සහ මුදල් රෙගුලාසි අනුව කටයුතු කර තිබුණේද යන්න පිළිබඳව පරීක්ෂණයකින් අනාවරණය කර ගත හැකි බවත් ඒ අනුව මේ සඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනා ගත හැකි බවත් කාරක සභාව පෙන්වා දෙන ලදි.<br><br>මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීමට ප්‍ර.ග.නි/ග.නි එකඟ විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරී/ගණකන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **මේ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඖෂධ කල් ඉකුත් වීම අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු සැලැස්ම ඉදිරිපත් කර ඇති අතර ඖෂධ කල් ඉකුත් වීම පාලනය කිරීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත.** |
| 4. | ගිරිඋල්ල කලාපයේ සිදුව ඇති මූල්‍ය වංචාව පිළිබඳ වර්තමාන තත්වය | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මූලික විමර්ශන අවසන් කර කුලියාපිටිය අධිකරණයේ මේ සම්බන්ධව නඩු පවරා ඇති බවත් වංචාව සඳහා චෝදනා ලද චූදිතයා මේ වන විට විදේශගතව ඇති බැවින් නඩුව බහා ඇති බවත් ඒ හා සම්බන්ධ අනෙකුත් නිලධාරීන්ට අදාළව විනය පරීක්ෂණ සිදුකර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි පැවසීය. රු. මිලියන 13.9 ක් බැංකු ගිණුමකට මාරු කිරිම මගින් මෙම වංචාව සිදුවී ඇති බැවින් අදාළ බැංකුවෙන් මෙම මුදල් අයකර ගැනීමට නීතිපති උපදෙස් විමසූ බවත්, අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රාජ්‍ය ආයතන දෙකක් අතර පවතින ගැටළු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නොව සාකච්ජා මගින් විසඳා ගැනීමට කටයුතු කළ යුතු බවට නීතිපතිවරයා දන්වා සිටීමෙන් පසු පැවැත්වූ සාකච්ජා වලදී බැංකුව මේ සඳහා වගකිව යුතු බවට නෛතිකව ඔප්පු වුවහොත් බැංකුව විසින් අදාල මුදල ගෙවීමට එකඟ වූ බවත් ප්‍ර.ග.නි පැවසීය. |
| 5. | වයඹ පළාත් සභාවට අයත් රජයේ ඉඩම් බදු දීමෙන් ලැබෙන ආදායම | රජයේ ඉඩම් පිළිබඳව විධිමත් ලේඛනයක් සකස් කරන ලෙසත්, එම ඉඩම් බදු දීමෙන් ලද ආදායම සහ පවතින හිඟ බදු මුදල් පිළිබඳව වාර්තාවක් 2019.06.30 වන දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් ප්‍ර.ග.නි/ග.නි ට නියෝග කරන ලදි .<br><br>**මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව අදාල තොරතුරු ඇතුළත් විධිමත් ලේඛනයක් සකස් කොට ඇති බව දන්වා ඇත. වයඹ පළාත් ඉඩම් කොමසාරිස්** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **දෙපාර්තමේන්තුව විසින් 2002.01.03 (ඉඩම් හා අනෙකුත් බදු කුලී) හා 2002.01.05 (ඉඩම් ආඥා පනත යටතේ අන්සතු කළ ඉඩම් ගාස්තු) යන ශීර්ෂ යටතේ ආදායම් ඒකරාශි කරන බව දන්වා ඇත.** |
| 6. | පළාත් සභාවට අයත් බස් නැවතුම් පළ දෙකක පළාත් සභා නිලධාරීන්ට රාජකාරී කටයුතු කිරීමට කිසියම් කණ්ඩායමක් විසින් බාධා පැමිණවීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 2 සිට වර්ෂ 17 දක්වා අතර කාලයක සිට ලැබිය යුතු රු.6,125,718/- ක අදායම පළාත් සභාවට නොලැබීම | එම නිලධාරීන්ගේ පැමිණිලි භාරගෙන ඔවුන්ට විධිමත් ලෙස රාජකාරී කිරීමට අවස්ථාව සලසා එකී ගැටළුව නිරාකරණය කිරීමට ගත් පියවර ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කාරක සභාව විසින් පොලිස්පතිට නියෝග කරන ලදි.<br>**මේ සම්බන්ධව තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.**<br>**ඒ අනුව අදාල සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නඩු සියල්ල පැමිණිලිකරුවන් ඉල්ලා අස්කර ගනීම සහ සමථ වීමෙන් පසු අවසන් කර ඇති බවත් පළාත් සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු හා මාසික පිවිසුම් පත්‍ර ගාස්තු ගෙවා ප්‍රවාහන කටයුතු වල යෙදෙන ලෙසත් නැතිනම් ධාවන ගමන් වාර සඳහා ඉඩ ලබා නොදෙන බවත් දන්වා බස් හිමි ධාවන පුද්ගලයන් සඳහා ලිපි යවා ඇත. (කාරක සභාවට පිටපත් සහිතව)** |
| 7. | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු ඖෂධ නිෂ්පාදනාගාරය තුළ නිෂ්පාදනය කළ හැකි ඖෂධ ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනය නොකිරීමේ හේතුවෙන් එම ඖෂධ බාහිරින් මිලදී ගැනීම සඳහා 2015, 2016 සහ 2017 වර්ෂ තුළ රු. 13,356,170/- ක් වැයකර තිබීම | බාහිර ටෙන්ඩරකරුවන් නියමිත වියළි ඖෂධ සපයා දීමට ප්‍රමාද වීම, අරිෂ්ඨ නිෂ්පාදනය කරන බරණි අලුත්වැඩියාව ප්‍රමාද වීම සහ ඖෂධ නිෂ්පාදනාගාරයේ අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වීම වැනි කරුණු මේ සඳහා බලපා ඇති බව දැක්වූ ප්‍ර.ග.නි/ග.නි ඉදිරියේදි එම නිෂ්පාදන කටයුතු විධිමත්ව සිදුකිරිමට පියවර ගන්නා බව ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 8. | කිසිඳු නෛතික ප්‍රතිපාදනයක් නොමැතිව සභාපතිවරයාට, ආණ්ඩුපක්ෂ සංවිධායකට සහ විපක්ෂ සංවිධායකට සංයුක්ත, ඉන්ධන සහ දුරකථන දීමනා, සඳහා රු.1,115,000/ක් ගෙවීම | ආණ්ඩුපක්ෂ සංවිධායකට සහ විපක්ෂ සංවිධායකට ඉන්ධන දීමනා සහ වාහන දීමනා ගෙවීම සඳහා කැබිනට් මණ්ඩලයේ සහ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් වැටුප් දීමනා පනත අනුව සභාපතිවරයා පළාත් අමාත්‍යවරයෙකු හා සමානව සලකන බවත් ඔහුට රු.10,000/ක් දක්වා සංයුක්ත දීමනා ගෙවීමට පනත ප්‍රකාරව හැකි බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 9. | 2017 වර්ෂයට අදාලව පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන 21 කට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ එකතුව රු.49,703,777/- ක් වූ ණය ශේෂ නිරවුල් නොකිරීම | නිරවුල් නොකළ ණය ශේෂය 2018.12.31 වන දිනට මිලියන 21 දක්වා අඩු කිරිමට හැකි වී ඇති බවත් රජයේ ආමාත්‍යාංශ සඳහා රු. මිලියන 16 ක් ද ප්‍රාදේශිය සභා සහ නගර සභා සඳහා රු.මිලියන 1.1 ක් ද පළාත් සභා යටතේ රු.මිලියන 13 ක මුදලක් ද නිරවුල් කිරිමට ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| | **උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය<br>2019 මැයි 22** | |
| 1. | මහවැලි මහ සැලැස්මෙන් බැහැරව උමා ඔය ද්‍රෝණිය තුළ සංවර්ධනය වෙනුවට අන්තර්ද්‍රෝණි සංවර්ධනය සඳහා කටයුතු කර තිබීම. | 1957 වර්ෂයේදී මහවැලි මහ සැලැස්ම සකස්කළ බවත් ,මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ හා කැනඩාවේ උපදේශන ආයතනයක් මගින් කළ ශක්‍යතා අධ්‍යනය හා වෙනත් අධ්‍යනයන් මගින් ශ්‍රී ලංකාවේ ගිණිකොනදිග වියළි ප්‍රදේශයන්ගේ ජල අවශ්‍යතා සපුරාලිය හැක්කේ උමාඔය අන්තර්ද්‍රෝණි සංවර්ධනය හරහා පමණක් බව හා ඊට වෙනත් විකල්පයක් නොමැති බවත් අනාවරණය විය.<br><br>ඒ අනුව මහවැලි මහ සැලැස්මෙන් බැහැරව උමාඔය ද්‍රෝණිය තුළ සංවර්ධනය වෙනුවට අන්තර්ද්‍රෝණි සංවර්ධනය කිරීම 2007 වර්ෂයේදී, රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | තීරණයක් බවත්, මීට අදාළ පරිසර අනුමැතිය කොන්දේසිවලට යටත්ව පරිසර අමාත්‍යාංශය මඟින් 2011.04.12 දින ලබා දී ඇති බවත් ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>මෙම ව්‍යාපෘතියෙන් උද්ගත වූ පාරිසරික ගැටළු පිළිබඳ කාරක සභාව විමසූ අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ මූලික ගැටළු ලෙස උමඟින් ජලය කාන්දු වීම හා භූගත ජල මට්ටම පහළ බැසීම සිදු වූ බව ග.නි. පැවසීය. |
| 2. | මෙම ව්‍යාපෘතියේ වර්තමාන තත්වය | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මතුවූ තාක්ෂණික ගැටළු හා ඉරානයට ආර්ථික සම්බාධක පැනවීම හරහා අනපේක්ෂිත ලෙස මුදල් ප්‍රවාහයේ ගැටළු මතු වීමෙන් මෙම ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි අවසන් කිරීමට නොහැකි වූ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>එසේ වුවද මේ වන විට ව්‍යාපෘතියේ 92%ක් පමණ අවසන්කර ඇති බවත් මෙම වසරේ ඔක්තොම්බර් වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට හා 2020 අප්‍රේල්වන විට ජල විදුලිබලාගාරය ක්‍රියාත්මක කරවීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය<br><br>උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය නිම කිරීම දක්වා වූ කාල රාමුව ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ලබාදීමට කටයුතුකරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියම කළේය.<br><br>**මෙම ව්‍යාපෘතිය නිම කිරීම දක්වා වූ කාල රාමුව ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත. (ඇමුණුම 08)** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 3. | ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු හා සේවා යෝජකයා යන දෙපාර්ශවයේම උපදේශක සහයක සේවා සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) පත්කර ගැනීම තුළ ලබැඳියා ගැටුමක් (Conflict of Interest) උද්ගතව තිබීම. | ව්‍යාපෘති සඳහා උපදේශකයන් තෝරා ගැනීමේදී මෙවැනි තත්වයක් ඇති නොවන අයුරින් ව්‍යාපෘතියට අදාළ පාර්ශව කටයුතු කළ යුතුබව කාරක සභාව අවධාරණය කළේය.<br><br>2013 වර්ෂයේදී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය තෝරා ගැනීමේදී මෙවැනි සබඳතාවක් දැන ගැනීමට නොතිබූ බව ප්‍ර.ග.නි. /ග.නි. පැවසීය. |
| 4. | ලංසුකරුවන් ඇගයීමේදී ප්‍රතික්ෂේප වූ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) සේවායෝජකයාගේ සහයක උපදේශක සේවා සැපයීම සඳහා තෝරාගෙන තිබීම. | මෙම ව්‍යාපෘතියට අදාළ නිර්දේශයන් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ බවත් එහිදී මුදල් අමාත්‍යාංශය විසින් දේශීය ඉංජිනේරුවන්ට මෙවැනි උමං කර්මාන්තයක අත්දැකීම් ලබාගැනීමට ඉඩකඩ ලබා දීම සඳහා නැවත මෙය සලකා බලා තීන්දුවක් ගන්නා ලෙස දැනුම් දුන් බැවින් අමාත්‍යාංශය මෙය නැවත සලකා බැලූ බවත් ප්‍ර.ග.නි. /ග.නි. පැවසීය. |
| 5. | ජල කාන්දුව හේතුවෙන් සිදුවූ ජීවිත හා දේපළ හානි වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 වන විට වන්දි ලෙස රු. 1,517,279,823ක මුදලක් ගෙවා ඇති අතර ඉන් රු.945,360,743ක මුදලක් පමණක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබීම. | මීට අදාළව නීතිපති උපදෙස් ලබා ගෙන ඇති බව හා කොන්ත්‍රාත්කරු විසින් මෙම ව්‍යාපෘතියේ අවධානම භාර ගැනීමේ කොන්දේසි ගිවිසුම තුළ ඇතුලත් බැවින් මෙම සම්පූර්ණ මුදල අදාළ සමාගමෙන් අයකර ගැනීමට අදාල කටයුතු සිදුකරන බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| | **රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව-<br>(පරිගණක දෘශ්‍ය වැඩසටහන)<br>2019 මැයි 23** | |
| 1. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව තුළ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 1, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 3න් 2ක්, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් | 3 වන පන්තියේ සිට ඉදිරියට උසස් වීම් ලබා දීමේ දී ගත වන කාලය අධික වීම නිසා එම තනතුරුවල සිටියදීම විශ්‍රාම යාමට සිදු වීම, එකී තනතුරු සඳහා සුදුසුකම් ලද නිලධාරීන් පහළ ශ්‍රේණිවල නොසිටීම සහ බඳවා ගැනීමේ පටිපාටියේ ඇති දුර්වලතා නිසා මෙම පුරප්පාඩු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකාධිකාරී දීමේ නිලධාරී/ගණකාධිකාරී දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | තනතුරු සහ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 33 න් 22 ක් වශයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විශාල ප්‍රමාණයක පුරප්පාඩු පැවතීම. | දිගින් දිගටම පවතින බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. එසේම සහකාර රෙජිස්ට්‍රාර්වරු 19 දෙනෙක් බඳවා ගැනීම සඳහා අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇති බවද ඒ අනුව 4 දෙනෙකු කුසලතා පදනම මතද ඉතිරි 15 දෙනා සඳහා තරඟ විභාගය එළඹෙන ජූලි මස පවත්වන බවද ප්‍ර.ග.නි/ග.නි වැඩිදුරටත් සඳහන් කළේය. |
| 2. | භාර ලියාපදිංචි කිරීමේ දී ඇති වන අක්‍රමිකතා | භාර ආඥා පනත යටතේ ප්‍රකාශිත භාර ලියාපදිංචි කරන බවත් මේ වන විට භාර 780 ක් පමණ ලියා පදිංචි කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. එසේම භාර ආඥා පනත 2018 අංක 6 දරන සංශෝධන පනත මගින් සංශෝධනය වූ බවත් ඒ අනුව ලියාපදිංචි වූ භාර සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කිරීමේ හැකියාව ඇති බවත් සංශෝධනයට පෙර එවැනි පසු විපරමක් සිදු නොවූ බැවින් භාර මත අක්‍රමිකතා සිදුවී ඇති බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. |
| **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව පරීක්ෂාව. 2019 මැයි 24** | | |
| 1. | ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට අදාළ සමීක්ෂණ හා පර්යේෂණ විධිමත් පරිදි සිදු නොවීම හා සිදු කරනු ලබන සමීක්ෂණ හා පර්යේෂණවල දත්ත බෙදා හැරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවීම මෙන්ම පර්යේෂණවල පවතින අඩුපාඩු හඳුනා නොගැනීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනජීවී පර්යේෂණ කමිටුව මගින් වනජීවී දෙපාර්තමේන්තුවට ලැබෙන පර්යේෂණ යෝජනා, නියාමනය නිර්ණය හා නිර්දේශ කරන බවද එම පර්යේෂණ වලින් ලැබෙන දත්ත වයිල්ඩ් ලංකා සඟරාව හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හරහා ලෝකයට ඉදිරිපත් කරන බවද ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. පර්යේෂණ සඳහා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු විවිධ පාර්ශව ඉල්ලීම් සිදු කරන බවද පර්යේෂණ සඳහා මූල්‍ය හා මානව සම්පත්වල හිඟයක් පවතින බවද මෙම පර්යේෂණ සිදු වියයුතු අංශ පිළිබඳ තීරණය කරනු ලබන්නේ හා අදාළ බලපත්‍ර ලබා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | දෙන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බවද හෙතෙම වැඩිදුරටත් පැවසීය.<br><br>ජෛව විවිධත්වයට අදාළ සමීක්ෂණ හා පර්යේෂණ වලින් ලැබෙන ප්‍රතිපල වනජීවී සංරක්ෂණයට අදාළ සියළුම අංශ අතර යාවත්කාලීනව හුවමාරු කරගැනීමේ දුර්වලතාවය නිරීක්ෂණය කළ කාරක සභාව එය කඩිනමින් නිවැරදි කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. |
| 2. | විවිධ සත්ව හා ශාක විශේෂවලට අදාළ තොරතුරු රැස්නොකිරීම හා එම විශේෂවල සංරක්ෂණ තත්ව හඳුනාගැනීම විධිමත් පරිදි සිදු නොවීම. | දැනට ශාක සංරක්ෂණයට අදාළව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් ජාතික ශාකාගාරය පිහිටුවා වාර්ෂික සමීක්ෂණ පැවැත්වුවද සතුන් සංරක්ෂණයට අදාළව මෙතෙක් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කළද මෑතකදී අභියාචනාධිකරණය විසින් ලබා දුන් නඩු තීන්දුවක් අනුව එම කටයුතු සඳහා එම දෙපාර්තමේන්තුවට තවදුරටත් හැකියාවක් නොමැති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. මෙම නඩුව සම්බන්ධ ගැටළුව ජාතික අවශ්‍යතාවයක් සේ සලකා නීතිපති දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරක සභාව නියෝග කළේය.<br><br>**නඩුවේ තොරතුරු ඇතුලත් වාර්තාව කාරක සභාවට ලබාදී ඇත. නඩුතීන්දුව ප්‍රකාර සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට දේශීය වනාන්තරවලින් සතුන් ලබාගැනීමට නොහැකිවීමෙන් ගැටළු උද්ගත වී ඇත. එය එම දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන ජාතික මෙහෙවරක් වන සත්ව සංරක්ෂණය හා අභිජනනය මෙන්ම දේශීය හා විදේශීය පාසැල් හා විශ්ව විද්‍යාල සිසුන්ගේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාමටද බාධාවී ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| 3. | එක් එක් විශේෂවල පරිසර තර්ජන හඳුනා නොගැනීම. | ජෛව විවිධත්ව අධිසංවේදී කලාපයක් ලෙස ශ්‍රී ලංකාව ලෝකයේ ස්ථානගතව ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව එම තත්වයට එක් හේතුවක් වන ස්වභාවික පරිසර පද්ධතිය ශ්‍රීඝයෙන් අභිමිවී යාම සම්බන්ධව (වන අපහරණයට) වහා පිළියම් කිරීමේ වැදගත්කම අවධාරණය කළේය. එසේම ජෛව විවිධත්වය හා ආවේණික ශාක ඉහළ අගයක් ගැනීම තවදුරටත් ආරක්ෂා කිරීමේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව මේ සඳහා සියළුම ආයතන එක්වී පර්යේෂණ සිදුකර ජාතික වැඩපිළිවෙලක් සකස් කර ඒ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මසක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br>**අදාළ වාර්තාව ලබා දී ඇත. ඒ අනුව මේ පිළිබඳව සියළුම පාර්ශවකරුවන් කැඳවා දෙවරක් රැස්ව සාකච්ඡා කර එහි ගත් තීරණයන් කෙටුම්පත්කර ඉදිරිපත් කර ඇත.** |
| 4. | තර්ජනයට ලක්ව ඇති ශාක හා සත්ව විශේෂවලට අදාළ සංරක්ෂණ කටයුතු විධිමත් පරිදි සිදු නොවීම සහ ජාතික රතු දත්ත පොතට තොරතුරු ඇතුලත් කිරීමේ නීත්‍යානුකූලත්වය පිළිබඳ කාරක සභාව විමසීය. | මේ සඳහා IUCN ආයතනය මගින් අන්තර්ජාතිකව සකස්කර ඇති නිර්ණායක මත පදනම්ව තොරතුරු ඇතුලත් කරන බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. මෙම ක්‍රියාවලිය විධිමත් කිරීමට ජාතික නෛතික රාමුවක් ඇති කිරීමේ වැදගත්කම කාරක සභාව අවධාරණය කළේය. දැඩිලෙස වඳවී යාමේ තර්ජනයට ලක්වී ඇති හා දැනට වඳවී ඇති ශාක ප්‍රතිස්ථාපනය පිළිබඳ සකස් කළ යෝජනාව ඇතුලත් **දිනවකවානු සහිත වාර්තාවක්** මසක් ඇතුලත ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**මේ සඳහා ජාතික උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව සැලසුමක් සකස්කර ඇත. ඉදිරි වසර 5 තුල ව්‍යාප්ත කිරීමට හඳුනා ගෙන** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **ඇති ශාක ප්‍රමාණය 50ක් වන අතර ඒ සඳහා මුළු වියදම රු. මිලියන 30ක් පමණ වේ.** |
| 5. | ජෛව විවිධත්ව සංරක්ෂණයට අදාළ නීතිවල පවතින අඩුපාඩු හඳුනාගෙන ඒ සඳහා නව නීති සකස් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම. | ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ කිහිපයකම පේටන්ට් බලපත්‍ර අයිතිය වෙනත් රටවල් ලබාගෙන එමගින් එම ශාක වලින් වානිජ නිපැයුම් සිදුකර ඉහළ ලාභයක් ලබා ගැනීම නිසා ශ්‍රී ලංකාවට එම ශාක වානිජකරණයට නීතිමය අවකාශය තවදුරටත් නොලැබී යාම කාරක සභාවේ අවධානයට යොමුවිය. ඒ සඳහා වහාම පියවර ගෙන ආවේණික ශාක හා සත්ව විශේෂයන්හි ජාන මංකොල්ලය නැවැත්වීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය කාරක සභාව අවධාරණය කළේය. මේ පිළිබඳ **සංඛ්‍යා දත්ත ඇතුලත් වාර්තාවක් මසක්** තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාවන් ලබාදී ඇත. ඒ අනුව මේ වනවිට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් "ජෛවීය" ද්‍රව්‍ය හා එහි ප්‍රතිලාභ බෙදාහදා ගැනීමට ප්‍රවේශ වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සකස්කර ඇත. මේ සඳහා අවශ්‍ය දෙපාර්තමේන්තු බලගැන්වීම සම්බන්ධීකරණය කළයුතු අතර නියාමන යාන්ත්‍රණයක්ද අවශ්‍ය බව දක්වා ඇත. මේ සඳහා සියළු පාර්ශවකරුවන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ජාතික ප්‍රතිපත්තිය සහ ඒ අනුකූලව අදාළ යාන්ත්‍රණය ක්‍රියාත්මක කළයුතු බව යෝජනා කර ඇත.** |
| 6. | පරිසර අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ අංශ නීතිමය වශයෙන් ශක්තිමත් කිරීමට අදාළ කෙටුම්පත් කිරීම. | වනජීවී සංරක්ෂණයට අවශ්‍ය වන අදාළ මූල්‍ය ඇස්තමේන්තු පිළිබඳ වාර්තාවක් මසක් තුළ ඉදිරිපත් කරන ලෙසද අදාළ පුද්ගලයන් සම්බන්ධීකරණය කරන ක්‍රියාකාරී කමිටුවක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | පත්කරන ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාවන් ලබාදී ඇත.**<br><br>සමුද්‍රජීවීන් සංරක්ෂණය කිරීමට අදාළ ආයතනයන් ඒ සඳහා ක්‍රියාවට නංවන වැඩපිළිවෙල පිළිබඳ වාර්තාවක් මසක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සමපත් සංවර්ධන අමාත්‍යාංශයහි ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**මෙම වාර්තාව ලබාදී ඇත. ඒ අනුව ධීවර කටයුතු කළමනාකරණය, මසුන් අල්ලන විනාශකාරී ක්‍රමවේද භාවිතය තහනම් කිරීම හා හඳුනාගත් සමුද්‍ර ජීවීන් සංරක්ෂණය කිරීම වාර්තාවේ දක්වා ඇත.** |
| **සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය විසින් සිදු කරනු ලබන වෛද්‍ය සැපයීම්, සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණකාධිපති විශේෂ විගණන වාර්තාව 2019 ජුනි 06** | | |
| 1. | ඖෂධ ප්‍රසම්පාදනය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, වාර්ෂිකව පැවැත්විය යුතු වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටු (Formulary Revision Committee) 2011 වර්ෂයෙන් පසු රැස්කර නොතිබුණු අතර 2011-2016 වර්ෂයන්හිදී කමිටු නිර්දේශයන්ගෙන් තොරව පිරිවැය රු. මිලියන 10,193ක්වූ වෛද්‍ය සැපයීම් අයිතම 4,619 ක් | මෙම කමිටු රැස්වීම වාර්ෂිකව පැවැත්වීම ප්‍රායෝගික නොවන බව ප්‍ර.ග.නි. පැවසීය. මෙම කමිටු රැස්වීම අඛණ්ඩව ක්‍රමවත්ව සිදු කර එම කමිටු නිර්දේශ මත පමණක් ඖෂධ මිලදී ගැනීමේ වැදගත්කම කාරක සභාව අවධාරණය කළේය. මේ පිළිබඳ අමාත්‍ය මණ්ඩල තිරණය අනුගමනය කරන ලෙසද නැතහොත් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට අවශ්‍ය ප්‍රායෝගික සංශෝධන යෝජනා කර නව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | මිලදී ගෙන තිබීම කාරක සභාවේ අවධානයට යොමු විය. | |
| 2. | ඒ ඒ රෝහල්වල ඖෂධ චිකිත්සක කමිටු (Therapeutic Committee) රැස්වීම් මාසිකව ක්‍රමානුකූලව පවත්වා නොතිබීම | පෙර අවස්ථාවේ මෙන්ම අමාත්‍ය මණ්ඩල තීරණය පිළිනොපැදීම කාරක සභාවේ දෝෂදර්ශනයට ලක්විය. කෙසේ වෙතත් ජාතික ඖෂධ චිකිත්සක කමිටුව රැස්වන බවත් ඒ ඒ රෝහල්වල ඖෂධ චිකිත්සක කමිටු මාස 2කට වරක් රැස්වන බවත් ප්‍ර.ග.නි පැවසීය. |
| 3. | දිවයින තුළ පරිභෝජනය කරනු ලබන වෛද්‍ය සැපයීම් අයිතම සංඛ්‍යාව 2017 වර්ෂයේදී 19,844 ක් වැනි ඉහළ අගයක් ගැනීමට හේතුවූ කරුණු. | මේ තත්වය ඇති වීමට බලපා ඇති හේතු මගහරවා ගැනීමට ස්වාධීන පිරිවිතර පාලන ඒකකයක් පිහිටුවීම, වැඩි වශයෙන් මිලදී ගනු ලබන වට්ටෝරු ගත නොවන අයිතම වට්ටෝරුවට ඇතුළත් කිරීම හා ස්වාධීන පිරිවිතර පාලන ඒකකයක් ස්ථාපනය කර එමගින් මෙම කාර්යයන් යාවත්කාලීන කිරීම හා ස්ථාවරව පවත්වාගෙන යාම කළ යුතු බව නිර්දේශ විය. |
| 4. | ඇස්තමේන්තුගත නොකළ අයිතම තුළ, ඇස්තමේන්තුගත කළ හැකි මිල අධික අයිතම පැවති නමුත් ඒ පිළිබඳව නොසලකා එම අයිතම ඇස්තමේන්තුගත නොකර තරඟකාරීත්වයෙන් බැහැරව අධික මිලකට දේශීය වශයෙන් මිලදී ගෙන තිබුණි. එම අයිතම 10ක නියැදියකින් 7ක් 2014 වසරේ සිට 2016 ජූනි දක්වා අවස්ථා 243කදී රු.මිලියන 168 ක් වැය කර මිලදී ගෙන තිබුණි. | ඇතැම් ඖෂධ බොහෝ කල් ගබඩා කර ගත නොහැකි වීම, රෝගීන් සඳහා නාමිකව මිලදී ගැනීම, වට්ටෝරු සමාලෝචන කමිටු නිර්දේශය ලැබෙන තෙක් මහා පරිමාණ මිලදී ගැනීම් කල නොහැකි වීම ආදී කරුණු මත ලෝක ව්‍යාප්ත ටෙන්ඩර් කැඳවීමෙන් බැහැරව දේශීයව කුඩා ප්‍රමාණයන්ගෙන් මිලදී ගැනීමට සිදුවීම මත ඇස්තමේන්තුගත නොවීමේ අවස්ථා ඇති වනබව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත් යොදවා මෙවැනි ගැටළු විසඳීමට අවශ්‍ය වෙනම වෛද්‍ය සැපයුම් පර්යේෂණ හා සැලසුම් ඒකකයක් ස්ථාපනය කරන ලෙසත් හැකිතාක් දුරට ඇස්තමේන්තුගත නොකළ අයිතම් ප්‍රමාණය අඩුකිරීම කල යුතු බවත් කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය. මෙම ඇස්තමේන්තුගත නොකළ නියැදියේ ඇති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | අයිතම 07 සම්බන්ධයෙන් කාරක සභාවට වාර්තාවක් ලබා දීමට ප්‍ර.ග.නි. එකඟ විය.<br><br>**අදාළ වාර්තාව ලබාදී ඇත. තවද ඇස්තමේන්තුගත ලැයිස්තුවලට ඇතුලත් නොවූ අයිතමයන් ඉදිරියේදී අනුකමිටු හරහා සමාලෝචන කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශ අනුව කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව දන්වා ඇත.** |
| 5. | ජීවාණුහරිත ශල්‍ය රබර් අත්වැසුම් ප්‍රසම්පාදනය. | 2015 ජූනි 11 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2015 වර්ෂය සඳහා ශල්‍ය අත්වැසුම් හිඟයක් ඇති වුවහොත් අවශ්‍යතාවයෙන් 25% ක් වර්තමාන සැපයුම්කරුවන්ගෙන් මිලට ගැනීමට තීරණය කර තිබුණි. ඉතිරි 75% සඳහා 2015 අවසන් වන තෙක්ම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ නොකිරීම නිසා 2016 ජනවාරි වනවිට ප්‍රධාන රෝහල් 08ක උග්‍ර ශල්‍ය අත්වැසුම් හිඟයට පිලියමක් ලෙස හදිසි මිලදී ගැනීම් ලෙස රු.මිලියන 321ක දේශීය මිලදී ගැනීම් සිදු කර ඇති බව අනාවරණය විය. මුදල් අමාත්‍යාංශ නිරීක්ෂණ මත එම සැපයුම්කරුගේ සම්පූර්ණ ටෙන්ඩරය අවලංගු කිරීම සිදුවූ බවද පසු අවස්ථා වලදී මෙම සැපයුම්කරු අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තේරී පත්වීම හා අදාළ ලිපි ගනුදෙනු වලදී ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් මෙම තත්වය උද්ගත වූ බව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. |
| 6. | තත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සපයනලද සැපයුම්කරු වෙත ආසන්න වර්ෂවලදී නැවත නැවතත් ඇණවුම් ප්‍රදානය කිරීම. | 2014 – 2016 කාලයේදී සිදුවූ මෙම ගැටළුව පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුබව නිර්දේශ කර තිබුණද සපයනු ලබන වෛද්‍ය සැපයීම්වලින් එක් කාණ්ඩයක් පමණක් තත්වයෙන් අසමත්වූ විට සැපයුම්කරුගේ සම්පූර්ණ ලියාපදිංචිය ඉවත් කළ නොහැකි බවද කාණ්ඩ 5ක් අසමත්වූවිට පමණක් ඖෂධයේ ලියාපදිංචිය ඉවත්කළ හැකි බව ප්‍ර.ග.නි./ ග.නි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | පැවසීය. ඖෂධයේ ලියාපදිංචිය සක්‍රීයව පවතින විට ටෙන්ඩරය ඉල්ලා සිටීමට අදාළ සැපයුම්කරුට අයිතිය ඇති බවද මෙහිදී අනාවරණය විය. |
| 7. | මාස 11ක සැපයුම් කාලයක් සහිතව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) වෙත ඇණවුම් නිකුත් කිරීම ප්‍රතිපත්තිය වුවද ප්‍රසම්පාදන කාලසටහනට අනුගත නොවීම නිසා 2016 වර්ෂයට අදාළව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත්කර තිබුණු ඇණවුම් සංඛ්‍යාවෙන් 62% නියමිත කාලය තුලදී ලැබී නොතිබීම වෛද්‍ය සැපයීම් හිඟයක් නිර්මාණය වීමට එක් හේතුවක් වී තිබුණි. එය මගහරවාගැනීමට 2015 හා 2016 වර්ෂවලදී පමණක් දේශීය වෙළඳපලින් මිලදීගෙන තිබුණු වෛද්‍ය සැපයීම්වල මුළු පිරිවැය රු.මිලියන 8,375ක් වීම. | නුදුරේදීම මුදල් අමාත්‍යාංශය හා සම්බන්ධ වීමෙන් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ඇති කිරීමට බලාපොරොත්තුවන බව මෙම ප්‍රමාදය පිළිබඳ විගණකාධිපති නිරීක්ෂණය පිළිගනිමින් ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. |
| 8. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතුවෙන් ඇති වන අතිරේක පිරිවැය සැපයුම්කරුවන්ගෙන් අය කර ගැනීමට ක්‍රමවේදයක් පැවතියද 2007-2016 කාලය තුළදී වෛද්‍ය සැපයුම් හිඟය වලක්වා ගැනීමට දේශීය වෙළඳපලින් ඖෂධ මිලදී ගැනීමට සිදුවීම නිසා වෛද්‍ය සැපයීම් අංශයට රු.මිලියන 5,166 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවීම. | මෙම අතිරේක පිරිවැය සැපයුම්කරුගෙන් අයකර ගැනීම සඳහා සැපයුම්කරුගේ කාර්යසාධන ඇපකර අවලංගුවීමට හෝ ණයවර ලිපි රුඳවුම් මුදල ගෙවීමට පෙර අදාළ තොරතුරු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත අදාළ අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතු වේ. එසේ නොවීම නිසා මෙලෙස වෛද්‍ය සැපයීම් අංශයට වැය බරක් ඇතිබව අනාවරණය විය. තවද තොග ඇණවුම් ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් ඇතිවන අතිරේක පිරිවැය අවම කර ගැනීමට හෝ එහි වගකීම අදාළ වගකිවයුතු නිලධාරීන් වෙත පැවරීමට හෝ ක්‍රමවේදයක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | නොමැති වීමද කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>වර්තමානයේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීමේදී මෙම ක්‍රියාවලිය නිවැරදි කර ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>මේ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් (වර්ෂය, සැපයුම්කරු, ඇපකරය ආදී තොරතුරු ඇතුලත්ව) ජූනි මස 20වන දිනට පෙර කාරක සභාවට ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය.<br><br>**අදාළ සවිස්තරාත්මක වාර්තාව ලබාදී ඇත. ඒ අනුව අදාළ අධිභාර වටිනාකම වූ රු.4,941,308,095ක මුදල අයකිරීම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මගින් සිදු කරන බවද වාර්තාවේ දක්වා ඇත.** |
| 9. | මිලදී ගනු ලබන සියළුම වෛද්‍ය සැපයීම්වල නියැදියක තත්වය පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබීම.<br><br>මේ හේතුවෙන් 2011 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින වනවිට මුළු පිරිවැය රු.මිලියන 3,374 ක්වූ ඖෂධ තත්ත්වයෙන් අසමත්වීම හා 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වනවිට තත්වයෙන් අසමත් ඖෂධ වටිනාකම 158% කින් ඉහළ ගොස් තිබීම. | 2015 හා 2016 වර්ෂ වලදී තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කරන ලෙසට රෝහල්වලට නියෝග ලැබෙන විට රෝගීන් වෙත නිකුත් කර තිබුණු වෛද්‍ය සැපයීම්වල මුළු පිරිවැය රු.මිලියන 689ක් වූ බව අනාවරණය වූ අතර මේ පිළිබඳ කාරක සභාව් අප්‍රසාදය පලවිය.<br><br>මේ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියහි ප්‍රමාණවත් රසායනාගාර ධාරිතාවයක් නොවීම හේතුවී ඇති බව අනාවරණය විය. එසේම කාර්ය මණ්ඩල පහසුකම් නොමැති නිසා ගැටළු උද්ගත වූ විට පමණක් ඒවා තත්ත්ව පරීක්ෂණ රසායනාගාරය වෙත යවන බවද මෙම ගැටළුවට පිළියම් ලෙස විදේශයන්හි ඇති රසායනාගාර වෙත යවා හෝ මෙම ක්‍රියාවලිය විධිමත් කිරීමට කටයුතු සිදුකරමින් පවතින බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය . |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| 10. | තත්ත්වයෙන් අසමත් ඖෂධ පිළිබඳ දැනුම් දීමේ චක්‍රලේඛ නිකුත් කිරීමේ ප්‍රමාදය. | මේ හේතුවෙන් භාවිතය අත්හිටුවන ලෙස නියෝගයක් නිකුත් කිරීමෙන් පසු වැඩිදුර පරීක්ෂණ අවසන් කර වාර්තා නිකුත් කරන අවස්ථාව වනවිට ඇතැම් වෛද්‍ය සැපයීම් කල් ඉකුත්වී තිබීම හා රෝගීන්ට බෙදා අවසන් කර තිබීමද සිදුවන බව අනාවරණය විය. එසේම කෙටි ජීව කාලයක් සහිත පරිභෝජන සීඝ්‍රතාව අඩු තොග බාර ගැනීමේදී විශේෂ ක්‍රමවේදයක් අනුගමනය කර බෙදා නොහැර කල් ඉකුත් වීමට ආසන්න වීමේදී විවිධ අයතා ක්‍රම භාවිතා කර තොග බෙදාහැර අවසන් කිරීමට කටයුතු කිරීම කාරක සභාවේ අප්‍රසාදයට ලක්විය. |
| 11. | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ගර්භණී මව්වරුන්ට ලබාදෙන Calcium lactate 300mg අයිතමය අධි ඇස්තමේන්තු කර ගෙන්වීම නිසා ඇතිවූ කල් ඉකුත් වීමට ආසන්න අතිරික්ත තොගය පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අනුමැතියකින් තොරව අවුරුදු 13ට වැඩි පාසැල් දරුවන්ටත්, සුවනාරි සායනවලට සහභාගිවන්නන්ටත් ලබා දීමටත් කිරිදෙන මව්වරුන්ට වැඩි මාත්‍රාවක් ලබාදී අතිරික්ත තොගය අවසන් කිරීමට 2017/03/21 උපදෙස් ලබාදී තිබීම. | මේ පිළිබඳව කාරක සභාවේ දැඩි අප්‍රසාදය පලවූ අතර මේ පිළිබඳව ජූනි 20ට පෙර කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**2017.03.21 උපදෙස් ලබාදුන් ලිපිය සමග අදාළ වාර්තාව ලබාදී ඇත. ඒ අනුව කල් ඉකුත්වීමේ දිනයට ප්‍රථම භාවිතා කර අපතේ යාම අවම කර ගැනීම සඳහා මෙම අභ්‍යන්තර චක්‍රලේඛය මගින් උපදෙස් දීමට සිදුවී ඇති බව රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පිළිගෙන ඇත. තවද අවුරුදු 11 සිට 24දක්වා දරුවෙකුගේ දෛනික කැල්සියම් ලැක්ටේට් අවශ්‍යතාවය 1200mgක් වුවත් අභ්‍යන්කර චක්‍රලේඛ අංක MCH/CIR/2017 හා 2017.03.21 මගින් සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට උපදෙස් දී ඇත්තේ දිනකට Calcium Lactate tab 1ක් (300mg) ලබාදෙන ලෙසයි.** |
| | **සබරගමුව පළාත් සභාව**<br>**2019 ජූනි 07** | |
| 1. | 2019.06.06 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී | එහි සඳහන් පරිදි 2018 පෙබරවාරි මාසයේ කල් ඉකුත් වීමට නියමිත Cal lactate ක්ෂුද්‍ර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | සාකච්ඡාවට භාජනය කරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත 2017.03.21 දින නිකුත් කළ අංක MCH/CIR/2017/11 දරන අභ්‍යන්තර චක්‍රලේඛය. | පෝෂක අතිරේකය එම තොගය අවසන් වන තුරු මාස 06ට වැඩි දරුවන්ට, කිරිදෙන මව්වරුන්ට සහ අවු.13 වැඩි පාසල් දරුවන්ට හා සුවනාරි සායනයට සහභාගීවන්නන් සඳහා ලබා දී ඇති බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**ඒ අනුව කල් ඉකුත් වීමේ දිනට ප්‍රථම භාවිතා කර අපතේ යාම අවම කර ගැනීමට පියවර ගෙන ඇති බව දන්වා ඇත. අදාළ දින වකවානු ඇතුළත් ලිපි ලේඛන සියල්ල කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** |
| 2. | පළාත් සභාවේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 5466 ක් පැවතීම. | එම පුරප්පාඩු සංඛ්‍යාව තුළ විදුහල්පති තනතුරු 436 ක්, කාර්මික නිලධාරී තනතුරු 87 ක් සහ රියදුරු තනතුරු 70 ක් ඇති බවත් වෛද්‍ය, හෙද, පරිපාලන හා ගණකාධිකාරී සේවයේ පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය දැනුවත් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**2018.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 3898 දක්වා අඩු වී ඇති බව දන්වා ඇති අතර මේ සම්බන්ධ තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** |
| 3. | 2015 වර්ෂයේදී මාවනැල්ල ප්‍රදේශයේ පාසලකට සිසුන් 350ක් ඇතුලත්කර ගැනීම සඳහා විදුහල්පති විසින් ලබා ගෙන තිබුණු රු.1, 525,000/-ක් වෙනුවෙන් ලදුපත් නිකුත් | මූලික විමර්ශනයේ පැවති දෝශ සහගත තත්වය විධිමත් චෝදනා පත්‍ර නිකුත් කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් නැවත මූලික විමර්ශනය සකස්කර ඉදිරිපත් කරන ලෙසට අදාළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | නොකිරීමට අදාළව විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර නොතිබීම. | නිලධාරීන් දැනුවත් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>**මීට අදාළව, කෑ/මාව/අධ්‍යා/පරි/02/1/19/30 හා 2019.08.10 දිනැති ලිපිය මගින් මාවනැල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ මූලික විමර්ශන වාර්තාව මගින් කෙටුම්පත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව අදාළ නිලධාරීන් වෙත චෝදනා පත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමින් පවතින බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |
| 4. | රු. 60,372,500/- ක් වැයකර පරිගණක 589 ක් මිලට ගැනීමේදී තාක්ෂණික පිරිවිතර සැකසීම හා ඇගයීම වංචනික ලෙස සිදුකර සැපයුම්කරු වෙත රු.7,961,515/- ක් වැඩිපුර ගෙවා තිබීමට අදාළ අභ්‍යන්තර පරීක්ෂණයේ වර්තමාන ප්‍රගතිය. | මේ සම්බන්ධ නිලධාරීන් 6 දෙනකුට චෝදනා පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව ඔවුන් විසින් අභියාචනා ඉදිරිපත්කර ඇති බවත් අදාළ විමර්ශනය සිදු වෙමින් පවතින බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>2015 වර්ෂයේ වූ සිදුවීමක් සම්බන්ධව මෙතෙක් නිසි පියවර නොගැනීම සම්බන්ධව කාරක සභාවේ අප්‍රසාදය පලවූ අතර මෙම විමර්ශන ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන ලෙසට ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් දෙන ලදි.<br><br>**මීට අදාළව විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර ඇත.**<br><br>**ඒ අනුව, ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ ව්‍යාජ ටෙන්ඩර් වාර්තාවක් මත පදනම්ව රු. 7,961,515/-ක් වැඩිපුර වැය කර පරිගණක මිලදී ගැනීම සම්බන්ධ මූලික විමර්ශන වාර්තාවේ නම් සඳහන් නිළධාරීන්ට විනයානුකූලව කටයුතු කිරීම නිර්දේශ කරමින් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇත. මේ සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙන් මූලික විමර්ශනයක් සිදුකරන බව එම** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **කොමිෂන් සභාවෙන් එවන ලද අංක පීසීඅයි 659/2015 හා 2016.04 දින රහිත ලිපියකින් දන්වා ඇත.මෙහි මූලික විමර්ශනයේ වාර්තාව අදාළ නිලධාරීන් වෙත විනයානුකූලව කටයුතු කිරීම සඳහා විනය බලධාරීන් වෙත යොමු කර ඇත. මීට සම්බන්ධ නිලධාරීන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති බවත් ඒ පිළිබඳ සලකා බැලීම සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සිදුකරන ලද මූලික විමර්ශනයේ නිර්දේශ ලබා දෙන මෙන් දන්වමින් සීඑස් 02//01/01/01 හා 2019.10.03 දිනැති ලිපිය යොමුකර ඇති බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |
| 5. | ආණ්ඩුකාර කාර්යාලයේ 2014 වර්ෂය තුළ රු.18,549,089/-ක් හා 2015 වර්ෂයේදී රු.4,071,115/-ක් වටිනා භාණ්ඩ තිළිණ ලෙස බෙදා හැර තිබීම. | එවකට සිටි ආණ්ඩුකාරතුමාට පැවති අභිමතානුසාරී බලය මත ක්‍රියාකර ඇති බවත් 2016 ඔක්තොම්බර් මාසයෙන් පසු එවැනි ක්‍රියාවලියක් සිදු වී නොමැති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 6. | සබරගමුවේ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සුබසාධන කටයුතු වෙනුවෙන් ආරම්භ කර තිබූ අරමුදල්වලට ව්‍යවස්ථාවක් හා රීතිමාලාවක් සකස් කර නොතිබීමත් අවසාන ගිණුම් සැකසීම හා අදාළ පුද්ගලයන්ට ගෙවීම් සිදු නොකිරීම හා අධිකාරියේ අරමුණුවලට බැහැරව 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.6,721,443/- ක් හා රු.6,559,719/- ක් වෙන් කර පැවතීම. | 1994 අංක 1 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවා ප්‍රඥප්තියේ 7 (1) පරිච්ඡේදය අනුව 2013, 2014 වර්ෂවල මුදල් වෙන් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>පළාත් සභාව යටතේ ක්‍රියාත්මක මෙවැනි අධිකාරීවල මෙවැනි අරමුදල් පවත්වාගෙන යෑම සම්බන්ධව පවතින නීතිමය තත්වය පිළිබඳව මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් අමාත්‍යාංශවල උපදෙස් මත පොදු චක්‍රලේඛයක් නිකුත් කරන ලෙසටත් එහි පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කරන ලෙසටත් පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් චක්‍රලේඛයක් ලද පසු ඒ අනුව ඉදිරියට** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **කටයුතු කරන බවත් සබරගමුවේ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවක සුබසාධක සංගමය සඳහා සම්පාදනය කළ නව සංශෝධිත ව්‍යවස්ථාවේ පිටපතක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** |
| 7. | ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී පුහුණු හා ධාරිතා සංවර්ධනය සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් රු.6,321,700/-ක් වැය කර ලැප්ටොප් පරිගණක 04, ටැබ් පරිගණක 13 හා ජංගම දුරකථන 27 ක් සභාවේ මන්ත්‍රිවරුන් වෙත නිකුත් කර තිබීම. | මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවලට අනුව පළාත් උපමාන පාදක අරමුදල් භාවිතයෙන් මෙම උපකරණ ලබා ගෙන ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසූ අතර මෙවැනි ක්‍රියාවලීන් විධිමත් ආකාරයෙන් සිදු කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව අවධාරණය කළේය. |
| 8. | පළාත් සභා ලේකම් කාර්යාලයට 2013,2014,2015 වර්ෂවල වෙන් කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදන වලින් රු.4,241,646/- වැයකර මිලදී ගත් විද්‍යුත් සන්නිවේදන උපකරණ සභාපතිවරයාගේ තිළිණ ලෙස පළාත් සභාවේ අමාත්‍යවරුන්ට,මන්ත්‍රීවරුන්ට, සභා ලේකම් කාර්යාලයේ හා ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට හා මාධ්‍ය වේදීන්ට බෙදා හැර තිබීම. | විගණනයෙන් පෙන්වා දුන් පසු 2016,2017 වර්ෂවල දී මෙය නිවැරදි කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>**මෙම කරුණ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඉල්ලා 2019.07.18, 2019.07.26 දිනැති ලිපි යොමු කර ඇති බවත් මේ සම්බන්ධයෙන් කටයුතු මෙතෙක් අවසන් වී නොමැති බව දන්වා ඇති අතර මීට අදාළ ලිපි කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** |
| 9. | 2012 වර්ෂයේදී මිලදී ගත් රු.1,370,000/- වටිනා සංවර්ධන නිර්මාණ යන්ත්‍ර උපකරණ අධිකාරිය සතු ජංගම වේදිකාවක් 2019 අප්‍රේල් 30වන විටත් කිසිදු ආදායමක් ඉපයීමකින් තොරව නිශ්ක්‍රීයව පැවතීම. | 2013 වර්ෂයේ දී වරකාපොළ මූලික රෝහල විවෘත කිරීම උදෙසා රු.40,000/- කට මෙම වේදිකාව ලබා දුන් බවත් අනෙක් සියල්ල පළාත් සභා උත්සව උදෙසා ලබා දුන් බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෙම වේදිකාව වෙන්දේසි කිරීම පිළිබඳ සලකා බැලීම සඳහා කමිටුවක් පත්කර ඇති බවද |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | වැඩිදුරටත් අදහස් දක්වමින් ග.නි. පැවසූ අතර මේ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**2020 වසර අවසන් වීමට පෙර වෙන්දේසි කටයුතු අවසන් කිරීමට කටයුතු කරමින් පවතින බව කාරක සභාව වෙත දන්වා ඇත.** |
| 10. | ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා රු. 239,277/-ක මුදලක් අත්තිකාරම් ලෙස ර/ඇඹි/පනාවල විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිති ගිණුමට බැරකර තිබූ අතර ඉන් රු.200,000/-ක් විදුහල්පතිවරයා විසින් ලබා ගෙන ඇති බවත් 2017 ජනවාරි වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොමැති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. එසේම මෙම මුදල ආපසු ගෙවන ලෙස කලාප අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණද 2019.04.30 දින වන විටද රු.134,236/-ක් තවදුරටත් අයවීමට තිබීම සම්බන්ධයෙන් කාරක සභාව විමසීය. | අදාළ විදුහල්පතිවරයා අනිවාර්ය විශ්‍රාම ගන්වා එම විශ්‍රාම වැටුපෙන් ඉතිරි මුදල අයකර ගැනීමට තීරණය කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. මේ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**මීට අදාළ පිළිතුරු වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, විදුහල්පතිවරයා විසින් ලබාගත් රු.200,000/- ක මුදලින් රු.55,764/- ක වැඩ කොටසක් ඉටු කර ඇති බව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සනාථ කර ඇති බවත් ඉතිරි මුදල වූ රු. 144,236/- ගෙවන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අවස්ථා කිහිපයක ඔහු වෙත දන්වා ඇත. එයට ප්‍රතිචාරයක් නොමැති වූ හෙයින් 2018.08.16 දින අංක C246/93 යටතේ රක්වාන පොලිසියේ පැමිණිල්ලක් සිදුකර ඇත. ඒ අනුව 2018.08.31 දින රු.10,000/-ක මුදලක් කලාප කාර්යාලයට, අදාල විදුහල්පති විසින් ගෙවා ඇති බවත් ඉතිරි මුදල එම විදුහල්පතිගෙන් අයකරමින් සිටින බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |
| 11. | දීර්ඝ කාලයක සිට පෞද්ගලික පාර්ශවයන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබූ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයට අයත් රත්නපුර හා කෑගල්ල පිහිටි රජයේ නිවාස 08ක | පරිපාලනමය වශයෙන් බාධාවක් නොවේ නම් ගරු ආණ්ඩුකාරවරයාගේද උපදෙස් මත මෙම අනවසර පදිංචිකරුවන් නියමානුකූල කිරීමට හෝ එසේ නොමැතිනම් ඉවත් කිරීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | අනවසර පදිංචිකරුවන් මේ දක්වා ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම. | කඩිනමින් ක්‍රියාකරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br>**මීට අදාළ පිළිතුරු වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**<br>**ඒ අනුව මේ වන විට කට්ටි නාම ලේඛන හා ගම් සිතියම් අනුව ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කරමින් පවතින බවත් සියළු තොරතුරු ලද පසු ප්‍රධාන ලේකම්ගේ හා පළාත් ඉඩම් කොමසාරිස්ගේ උපදෙස් පරිදි අනවසර පදිංචිකරුවන් පිළිබඳ ඉදිරි කටයුතු සිදුකරන බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.** |
| 12. | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාත් සභාව වෙත භාරදී තිබුණු රථයක ලියාපදිංචිය සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු පරීක්ෂා කිරීමේදී එම වාහන අංකය සහිත වෙනත් වාහනයක් එම දෙපාර්තමේන්තුවෙන් පැවරුම් ලැබූ පෞද්ගලික හිමිකාරීත්වයක් යටතේ පැවතීම.<br>මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු නොකිරීම හා 2019 අප්‍රේල් වන විටද අදාළ වාහනය නිෂ්කාර්යව පැවතීම | මෙම වාහනය රේඛීය අමාත්‍යාංශයෙන් පළාත් සභාවේ ඉඩම් අංශයට ලබා දී තිබූ බවත් ඉඩම් අංශයේ පැවති වාහනය ගරු පළාත් ඇමතිවරයාගේ භාවිතයට ලබා දුන් බවත් මේ සම්බන්ධව ඉඩම් කොමසාරිස් ජනරාල් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දැනුවත්කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br>මෙම ගැටළුව නිරාකරණයට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් මේ සම්බන්ධයෙන් පොලිසියේ පැමිණිල්ලක් ගොනු කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br>**2019.06.20 දින රත්නපුර පොලීසියේ විශේෂ විමර්ශන ඒකකයේ පැමිණිල්ලක් ගොනුකර ඇති බව කාරක සභාව වෙත දන්වා ඇත.** |
| 13. | බලංගොඩ කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ දෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේදී පිළියෙල කරන ලද ද්විත්ව මිනුම් වාර්තාවට අනුව වැඩ වටිනාකම රු 26,029,799/-ක් වූ පස්වැනි අතුරු බිල්පත බලංගොඩ විධායක ඉංජිනේරු විසින් නිර්දේශකර අනුමැතිය | විගණනයෙන් දැනුම් දුන් පසු මෙය විමර්ශනය සඳහා පත්කළ කමිටුවේ නිර්දේශයන්ට අනුව නිවැරදි මුදල ගෙවා ඇතිබවත් වැඩිපුර මුදලක් ගෙවා නොමැති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br>මේ සම්බන්ධ නිලධාරීන් පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කමිටුවක් පත් කර මෙම නිලධාරීන්ට එරෙහිව ගන්නාවූ ක්‍රියාමාර්ග මාසයක් තුළ කාරක සභාව වෙත |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | සඳහා පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාසල් ගොඩනැඟිලි) වෙත ඉදිරිපත්කර ඇත. ඔහු විසින් එම බිල්පතේ වැඩ විෂයන් 12ක ඒකක මිල රු. 27,467,263/- ක් ලෙස සංශෝධනය කිරීම නිසා රු.1,442,944/- ක් වැඩිපුර ගෙවා තිබීම. | ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**මීට අදාළ පිළිතුරු වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**<br><br>**ඒ අනුව, මෙම දෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කර්මාන්තය සම්බන්ධව කාරක සභාවෙන් දැනුම් දුන් පරිදි අදාළ කාර්යය භාරව කටයුතු කළ අය සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ කටයුතු කිරීම සඳහා 2019.06.24 දින කමිටුවක් පත් කර ඇත. එහි සභාපතිගේ අභියාචනය මත ඔහු කමිටුවෙන් ඉවත් කර නැවත සභාපති හා සාමාජිකයන් 4කගෙන් සමන්විත කමිටුවක් ප්‍රධාන ලේකම්ගේ අංක CS02/01/01 හා 2019.08.01 ලිපියෙන් පත් කළ ඇති අතර 2019.11.01 දිනට පෙර වාර්තාවන්ද ඉල්ලා ඇති අතර 2019.09.23 දින නැවත සාමාජිකයන් 2දෙනකු කමිටුවට පත්කර ඇති බව කාරක සභාව වෙත දන්වා ඇත** |
| 14. | පළාත් සභාවට අයත් විවිධ ආයතනයන්හි වටිනාකම රු.31,867,678/-ක් වූ යන්ත්‍රෝපකරණ 07ක් වර්ෂ 6ක සිටද වටිනාකම හඳුනානොගත් යන්ත්‍රෝපකරණ 11ක් මාස 07 සිට වර්ෂ 06 දක්වා කාල පරාසයක සිටද වටිනාකම රු.2,931,183/-ක් වූ ගොඩනැගිල්ලක් වර්ෂ 02ක සිටද නිෂ්ක්‍රියව පැවතීම. | මෙ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත්කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br>**මීට අදාළ පිළිතුරු වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**<br><br>**ඒ අනුව වටිනාකම රු. 31,867,678/-ක් වූ යන්ත්‍රෝපකරණවලින් රු.112,400/-ක් වටිනා යන්ත්‍රෝපකරණ 06ක් හා වටිනාකම හඳුනා නොගත් යන්ත්‍රෝපකරණ 05ක් පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ ශරීර සුවතා කේන්ද්‍රය තුළ පවතින උපකරණ බව දන්වා ඇත.**<br><br>උඳුගොඩ සත්ත්ව සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයට ප්‍රදානයක් ලෙස ලැබුණු **රු.31,755,278/-ක් වටිනා සත්ත්ව ආහාර සැකසුම් යන්ත්‍ර දෙක මේ වන විට ජාතික පශු** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් <br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග <br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **සම්පත් සංවර්ධන මණ්ඩලයේ මහබේරිය තැන්න ගොවිපළ වෙත ලබා දී ඇති බව දන්වා ඇත.** <br><br> **සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවට අයත් උඩුගොඩ සත්ත්ව සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ රු.2,931,183/-ක් වූ ගොඩනැගිල්ල වර්තමානය වන විට ගවයන් ගාල් කර ගව ගාලක් ලෙස ක්‍රියාත්මක තත්වයේ පවතින බව දන්වා ඇත.** <br><br> **ඇඹිලිපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ රෙදි සෝදන යන්ත්‍රය වැඩිහිටි දන්ත චිකිත්සක සායන හා අනෙකුත් සායන වලට භාවිතා කරන රෙදි සේදීමටද කාර්යාලයේ තිර රෙදි සේදීමටද භාවිතා කරන බව දන්වා ඇත.** <br><br> **පරිවාස ළමා රක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් 62-1708 දරණ බස් රථය 2018 වසරේදී අපහරණය කළ බව කාරක සභාව වෙත දන්වා ඇත.** |
| 15. | 2017 වර්ෂයේ පළාත් සභාවේ මාර්ග අමාත්‍යාංශයේ සමස්ථ ප්‍රතිපාදනය වූ රු. මිලියන 1535.42 න් රු.මිලියන 566.34ක් හෙවත් 37% ක් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත කර්මාන්ත 380ක් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කර තිබීම. <br><br> ඇස්තමේන්තුගත වියදම රු.මි 112.09 ක් වූ ව්‍යාපෘති 57න් 30ක ඇස්තමේන්තුගත වැඩ විෂයන් ඉටු නොකර රු.මි. 17.92ක් සාවද්‍ය ලෙස ගෙවා තිබීමද ව්‍යාපෘති 03ක් සඳහා රු.මි.4.16ක් නිෂ්කාර්ය | මෙය විමර්ශනය සඳහා කමිටු පත්කර විගණන ක්‍රියාවලිය සිදුවන බව හා මෙහි වංචාවක් සිදු වී ඇති බව අනාවරණය වී ඇති බවත් මෙම පරීක්ෂණය අල්ලස් හෝ දූෂණ වංචා විමර්ශන කොමිෂන් සභාව වෙත පැවරීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. මෙවැනි ක්‍රියාවලීන් තවදුරටත් සිදුනොවීම සඳහා උපදෙස් මාලාවක් කෙටුම්පත් කර ඇති බවත් වැඩිදුරටත් අදහස් දක්වමින් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. <br><br> **මේ පිළිබඳව විශේෂ පරීක්ෂණයක් ඉටු කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ වංචා විමර්ශන කොමිෂන් සභාව වෙතද අපරාධ පරීක්ෂණ** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | ලෙස වැයකර තිබීමද ව්‍යාපෘති 04ක රු.මි.6.81ක ගෙවීම් විගණන නිරීක්ෂණ හේතුවෙන් අත්හිටුවා තිබීමද කාරක සභාව නිරීක්ෂණය කළේය. | **දෙපාර්තමේන්තුව වෙතද පැමිණිලි කර ඇති බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.**<br><br>රේඛීය අමාත්‍යාංශයෙන් මීට අදාලව පරීක්ෂණයක් කඩිනමින් ආරම්භ කරන ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළ අතර මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් සති දෙකක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසද නියම කළේය. |
| | **මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය<br>2019 ජුනි 07** | |
| 1. | 2015, 2016 සහ 2018 වර්ෂවල ප්‍රාග්ධන වියදමේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් ඉතිරිය පිළිවෙලින් 60%, 57% ක් හා 48%ක් වීම | මෙම අමාත්‍යාංශය පිහිටවූයේ 2017 වසරේදී බවත්, 2016 වසරේදී අමාත්‍යාංශයට අයත් ව්‍යාපෘති 2ක මූල්‍ය ප්‍රගතිය අඩු වීම හා අරුවක්කාරු කසල කළමනාකරණ ව්‍යාපෘතියට මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 2000ක් වෙන් කළද, එම ව්‍යාපෘතිය 2015 සිට ක්‍රියාත්මක නොවීම මෙන්ම බිලියන 13ක නොගෙවූ බිල්පත් පැවතීමද මෙම ඉතිරියට හේතු වී ඇති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>වසර අවසානයේ බිල්පත් ඉදිරිපත් කළද ඒවා පියවීමට අක්මුදල් නිදහස් කිරීමේ හැකියාවක් මහා භාණ්ඩාගාරයට තිබී නොමැති බවත්, ඉන් කොටසක් ගෙවා දැමීම සඳහා අතිරේක ප්‍රතිපාදන මේ වන විට ලබා දී ඇති බවත්, මෙහිදී අනාවරණය විය. |
| 2. | 2004 වර්ෂයේදී පිළියෙල කර තිබුණු බස්නාහිර කලාපීය මහානගර සැලසුම් ව්‍යාපෘතිය සඳහා 2003 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා රු. මිලියන 79.85ක් වැය කර තිබුණි. එම සැලසුම් මූලධර්ම වර්තමානයට නොගැලපීම නිසා නව සැලසුමක් | 2003 පැවති තත්ත්වයට වඩා වාස්තවික වෙනස්කම් රාශියක් 2015 වසර වන විට සිදු වී තිබුණු බවද, 2003 සැලසුම් මත පදනම්ව “පෝර්ට් සිටි ” ව්‍යාපෘතිය ආරම්භ කළ බවද, 2003 සැලසුම සකස් කිරීම සඳහා යොදා ගත් දත්ත 2015 වසරේ ව්‍යාපෘතිය සඳහාද යොදා ගත් බැවින් හා එහි 2003 වසරේ සකස් කළ මූලික සැලසුම 2015 වසරේ සැලසුම සඳහාද යෙදා ගත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | පිළියෙල කිරීමට කටයුතු කර තිබුණු බැවින් ඒ සඳහා වැය කර තිබුණු රු. මිලියන 79.85ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබීම | බැවින් එම මුදල සම්පූර්ණයෙන්ම නිෂ්ඵල වියදමක් වී නොමැති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 3 | 2016 වර්ෂයේ ව්‍යාපෘති කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා ගිණුම් තැබීමේ හා ව්‍යාපෘති සමාලෝචන පරිගණක මෘදුකාංගයක් ලබා ගැනීම සඳහා අත්තිකාරම් වශයෙන් රු. 1,000,575/- ක් ගෙවීම් කර වසරකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, එකී මෘදුකාංගය ස්ථාපිත කර නොතිබීම | රු. 444,000/- ක අත්තිකාරම් මුදලක් පමණක් මෙම මෘදුකාංගය සඳහා මේ වන විට ගෙවා ඇති බවද, මෙම මෘදුකාංගය නිර්මාණය කළ “ස්ලිට්” ආයතනය හා සම්බන්ධ වී මූල්‍යමය මොඩියුලය (financial module) යාවත්කාලීන කර භාවිතායට ගැනීමට කටයුතු සම්පාදනය කරමින් පවතින බවද ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 4. | කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ උපසංරචක යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී පරිසරයට වන බලපෑම තක්සේරු කිරීමේ වාර්තාවක් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ක්‍රියාකාරී සැලසුමක් පිළියෙල කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර උපදේශන ආයතන සඳහා උපදේශන ගාස්තු ලෙස රු මිලියන 65ට අධික මුදලක් වැය කර තිබුණි. උපදේශන වාර්තාවල සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා උපදේශන ආයතනවලට ගෙවන ලද රු. මිලියන 65ක් නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබීම | කොරියානු උපදේශන ආයතනයක් මෙම ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යන වාර්තාවක් හා ටෙන්ඩර් ලියකියවිලි සකස් කර තිබූ බවද, එම ලියකියවිලිවලට අවශ්‍ය වෙනස්කම් සිදු කර අරුවක්කාරු කසල කළමනාකරණ ව්‍යාපෘතියට යොදා ගත් බවත්, එම ලියකියවිලි මූලික ආකෘතියක් ලෙස යොදා ගන්නා බැවින් එම වියදම නිෂ්කාර්ය වියදමක් නොවන බවද, ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 5. | ගංවතුර අවදානම අවම කිරීම සඳහා බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානය ඉදි කිරීම සිදු කර තිබුණත් ගංවතුර අවදානම හා පාරිසරික බලපෑම් පිළිබඳ ඇගයීම් සිදු කර නොතිබුණි. තවද, නිසි | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ගෙන යන අතරතුරදී ඇතිවූ තෙත්බිම් භූ විෂමතා ලක්ෂණවල වෙනස්කම් හේතුවෙන් මූලික සැලැස්මේ වෙනස්කම් කිරීමට සිදු වූ බවද, එහිදී නව අංග එකතු කිරීමට සිදු වූ බැවින් ඉදි කිරීම් සඳහා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | අධ්‍යනයකින් තොරව ප්‍රමාණ බිල්පත් හා ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර තිබුණු අතර සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම් භාර උපදේශක විසින් සහතික නොකර ව්‍යාපෘතියේ සේවයේ නියුතු විශ්‍රාමික කාර්මික නිලධාරියෙකු විසින් සහතික කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉටු නොකරන ලද වැඩ ප්‍රමාණයන් සහ වැරදි ගණනය කිරීම් හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු මිලියන 92ක් වැඩිපුර ගෙවා තිබුණු අතර ඉන් මිලියන 4.5 පමණක් අය කර ගැනීමට කටයුතු කිරීම | යොදා ගන්නා භාණ්ඩ ප්‍රමාණ හා ඒවායේ මිල ගණන් වැඩි වූ බවද අනාවරණය විය.<br><br>වැඩිපුර ගෙවා ඇති මුදල රු. මිලියන 92 ට ආසන්න විශාල ප්‍රමාණයක් වීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ කාරක සභාව විසින් මේ සම්බන්ධයෙන් නැවත අවධානය යොමු කොට එම මුදල අය කර ගැනීම සඳහා ජාතික විගණන කාර්යාලය සමග සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන කාරක සභාව වෙත වාර්තාවක් එවන ලෙස ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**මෙම වාර්තාව මෙතෙක් කාරක සභාව වෙත ලැබී නොමැත.** |
| 6. | 2011 දෙසැම්බර් 24 දිනැති අංක 46 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ අර්ධ කාලීන ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී ඒ සඳහා අනෙකුත් දීමනා හැර නිලධාරීන්ගේ ව්‍යාපෘති තනතුරට අදාළ මූලික වැටුප පදනම් කර ගත යුතු වේ. එසේ වුවද මූලික වැටුප හා අනෙකුත් දීමනා ඇතුලත්ව 1/3 ක දීමනා ගණනය කිරීමෙන් රු. 10,832,729/-ක මුදලක් 2015 වර්ෂය අවසාන වන විට නිලධාරීන්ට වැඩිපුර ගෙවීම් කර තිබීම | එම දීමනා ගෙවා ඇත්තේ අංක 46 දරණ චක්‍රලේඛය අනුව නොව එම කාලපරිච්ඡේදයට අදාළ පැරණි චක්‍රලේඛය අනුව බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>ඒ සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කරමින් මුදල් අමාත්‍යාංශය විසින් මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ලිපිය දෝෂ සහගත බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.<br><br>ඒ සම්බන්ධයෙන් ගතයුතු නිවැරදි පියවර සඳහන් කරමින් උපදෙස් නිකුත් කරන ලෙස කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය.<br><br>අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කිරීමේදී හා ඇතැම් ව්‍යාපෘති සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී ඔවුන් සේවය කරමින් සිටි තනතුරේ වැටුපට වඩා අඩු වැටුපක් ව්‍යාපෘතිය මගින් ගෙවනු ලබන අවස්ථා පවතින බැවින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය වර්තමාන තත්ත්වයට නොගැලපෙන බව ප්‍ර.ග.නි/ ග.නි කාරක සභාව හමුවේ අවධාරණය කළේය.<br><br>ඇති විය හැකි සියළු ප්‍රායෝගික තත්ත්වයන් හා ව්‍යාපෘතිවල ස්වභාවය සැලකිල්ලට ගෙන සුදුසු උපදෙස් නිකුත් කිරීමට කටයුතු කර කාරක සභාවට වාර්තාවක් එවන ලෙස කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය.<br><br>**මෙම වාර්තාව මෙතෙක් කාරක සභාව වෙත ලැබී නොමැත.** |
| 7. | මහනගර සැලසුම් ව්‍යාපෘතිය සඳහා රු. 40,000/- ක වැටුපකට පුහුණු වන නිලධාරීන් හා පර්යේෂණ සහකාරවරුන් ලෙස උපාධිධාරීන් බඳවා ගෙන ඇති බවත්, අවුරුද්දක් සේවය කිරීමෙන් පසු රු. 375,000/ ක මාසික වැටුපක් ලබා ගෙන ඇති බවත් අනාවරණය විය. ඒ අනුව ව්‍යාපෘතිවල සේවය කරන නිලධාරීන්ට වැටුප් ගෙවීමට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය උල්ලංඝනය කර තිබීම | මෙම නිලධාරීන් රැකියාවට අයදුම් කිරීමේදී මූලික උපාධියට අමතරව පශ්චාත් උපාධියක්ද හිමි කර ගෙන පුහුණුවක් ද ලබා තිබූ බවත්, රු. 40,000/- ක මාසික වැටුපක් ලබා ගෙන වර්ෂයක් ඉකුත් වූ පසු ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම, පුහුණුව හා වෘත්තීය පළපුරුද්දද සැලකිල්ලට ගෙන ඔවුන්ගේ වැටුප වැඩි කළ බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසිය.<br><br>මේ සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රතිපාදන පැවතියදී එම ප්‍රතිපාදන සැලකිල්ලට නොගෙන, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ අනුමැතියකින්ද තොරව මෙලෙස වැටුප් ගෙවීම නීත්‍යානුකූල නොවන බව කාරක සභාවේ මතය විය.<br><br>මෙලෙස වැටුප් ගෙවා ඇති නිලධාරීන් පිළිබඳව හා ඔවුන් සතු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව කාරක සභාව වෙත මසක් තුළ යොමු කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | මේ සම්බන්ධයෙන් ලබා ගත් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ඇති බව ප්‍ර.ග.නි /ග.නි කාරක සභාව හමුවේ ප්‍රකාශ කළ බැවින් එම අනුමැතියේ පිටපතක්ද කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කරන ලදී.<br>**මෙම වාර්තාව හා අනුමැතියේ පිටපතක් මෙතෙක් කාරක සභාව වෙත ලැබී නොමැත.** |
| 8. | කොළඹ අගනගරය වඩාත් පරිසර හිතකාමී හා අලංකාර කිරීම සඳහා කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මගින් බේරේවැව සංවර්ධනය කිරීමේ විවිධ කාර්යයන් සඳහා රු. මිලියන 1,552,07ක්ද, භාණ්ඩාගාර අරමුදල්වලින් තවත් රු. මිලියන 470ක්ද වැය කර තිබුණි. බේරේවැව ආශ්‍රිත නිවාස හා හෝටල්වල අපද්‍රව්‍ය බේරේවැවට මුසුවීම වැලැක්වීමට ක්‍රියාමාර්ග නොගැනීම නිසා බේරේවැව අවට තද දුර්ගන්ධයක් පවතින බවත්, බේරේ වැවේ සංවර්ධන කටයුතු කළද, සංචාරක ව්‍යාපාරයට සහ ශ්‍රී ලාංකිකයන්ට විවේකය ගත කිරීමට සුදුසු පරිසරයක් සකස් වී නොතිබීම | බේරේ වැවට අපද්‍රව්‍ය මුසුවීම වැලැක්වීම හා දුර්ගන්ධය දුරු කිරීම සඳහා වෙනම ව්‍යාපෘතියක් පවතින බවත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබුවේ බේරේවැවේ සංවර්ධන කටයුතු සඳහා බවත්, එම සංවර්ධන කටයුතු හේතුවෙන් එහි දුර්ගන්ධය යම් දුරකට අඩු වී ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 9. | 2016 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර වර්ෂ 4ක පමණ කාලයක් ගත වී තිබුණු අතර භාර අරමුදලේ කටයුතුවල ඌන ප්‍රගතිය හේතුවෙන් 2014 ජනවාරි 31 වන දිනෙන් අවසන් වීමට නියමිතව තිබුණු කාර්යයන් 2017 ජනවාරි 31 දක්වා දීර්ඝ කර තිබුණි. එම කාලය තුළදී භාර | මෙහි ප්‍රධාන සංරචක දෙක අවසන් කළ බවත්, සැලසුම් නිම කර ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. පුහුණුවීම් සඳහා වෙන් කර ඇති මුදලත්, මෙහෙයුම් වැය සම්පූර්ණ මුදලත් ලෝක බැංකුව විසින් පනවන ලද සීමාවන් හේතුවෙන් භාවිතයට ගත නොහැකි වූ බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | අරමුදලේ මුදල් උපයෝජනය කිරීමට අපොහොසත් වීම නිසා ලබා දී තිබූ සමස්ථ ප්‍රදානය වූ ඇමෙරිකානු ඩොලර් 900,000/- ක මුදලින් ඩොලර් 172,926 ක් හෙවත් ශ්‍රී ලංකා රු. 26, 545,959 ක් ලෝක බැංකුව වෙත ආපසු ලබාදීමට සිදු වී තිබීම | |
| 10. | චක්‍රලේඛ නියමයන් වැරදි ලෙස අර්ථකථනය කරමින් සහ මහා භාණ්ඩාගාරයේ උදෙස්වලට පටහැනිව කඩවත, කඩුවෙල, කොට්ටාව නගර සංවර්ධන ව්‍යාපෘතියේ (3K ව්‍යාපෘතිය) කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුට රු. 1,906,200/- ක් හිඟ වැටුප් ලෙස ගෙවා තිබුණු අතර එම මුදල මෙතෙක් අය කිරීමටද කටයුතු කර නොතිබීම. | කඩවත, කඩුවෙල, කොට්ටාව නගර ව්‍යාපෘතිය හා බස්නාහිර කලාපීය මහනගර සැලසුම් ව්‍යාපෘතිය යන ව්‍යාපෘති දෙකම, එක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වී ඇති බවත්, එම ව්‍යාපෘති දෙකම එක ණය ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වුවද සංරචක දෙකක් බැවින් ව්‍යාපෘති දෙකක් ලෙස සැලකිය හැකි බවද ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. එමෙන්ම අමාත්‍යාංශ දෙකක් මගින් ක්‍රියාත්මක වන බැවින් ව්‍යාපෘති කාර්ය මණ්ඩල දෙකක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති බවද ප්‍ර.ග.නි/ ග.නි වැඩිදුරටත් පැවසීය. ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක වීමේ වැය වෙනුවට එක් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වීම නිසා රජයට විශාල ලාභයක් අත්පත් වී ඇති බවද එම ක්‍රියාවලිය නිවැරදි බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අනුව ව්‍යාපෘතියේ වැය අනුව කාර්ය මණ්ඩලයේ වැටුප තීරණය වන බවත්, ව්‍යාපෘති 2ක වැය දක්වමින් ඉහළ වැටුප් තලයක් තීරණය කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලතල නොමැති බවත්, අදාළ ප්‍රායෝගික ගැටළු පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබා ගෙන වැටුප් තීරණය කිරීම වඩාත් යෝග්‍ය පියවර වූ බවත් කාරක සභාවේ මතය විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | ව්‍යාපෘති වැය පදනම් කර ගෙන කාර්ය මණ්ඩල වැටුප් තීරණය කිරීමේ ප්‍රායෝගික ගැටළු පිළිබඳව අවධානය යොමු කරමින් අදාළ චක්‍රලේඛය පිළිබඳ නැවත විශ්ලේෂණයක් සිදු කරන ලෙස හා චක්‍රලේඛ ප්‍රතිපාදන හා ව්‍යාපෘතිවල ප්‍රායෝගික තත්ත්වය අතර පරස්පරතා පවතින්නේ නම් ඒ පිළිබඳව අධ්‍යනය කර ව්‍යාපෘතිවල මනා ක්‍රියාකාරිත්වයට බාධාවක් නොවන පරිදි අළුතින් චක්‍රලේඛ නිකුත් කිරීමට හෝ පවතින චක්‍රලේඛවලට සංශෝධන හඳුන්වා දීමට කටයුතු කරන ලෙස කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය.<br>එමෙන්ම මේ පිළිබඳ වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත එවන මෙන්ද, කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය.<br><br>**මෙම වාර්තාව මෙතෙක් කාරක සභාව වෙත ලැබී නොමැත.** |
| 11. | මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් ලෙස බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර එකී ව්‍යාපෘතිය යටතේ මීගමු වෙරළ තීරයේ සිට කළුතර කැලිඩෝ වෙරළ තිරය දක්වා මුහුදු වෙරළ ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණි. 2017 හා 2018 වර්ෂ තුළ රු. 44,270,907/- ක වියදමක් දරමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළද, ව්‍යාපෘතිය යටතේ සිදු කළ යුතු සංවර්ධන කාර්යයන් හඳුනාගෙන ඒ පිළිබඳ විධිමත් ශක්‍යතා අධ්‍යන | මෙම ව්‍යාපෘතියේ මූලික සැලසුම් සකස් කර අවසන් කර ඇති බවද, ගාළු මුවදොර සිට දෙහිවල දක්වා මුහුද ගොඩ කිරීමේ ව්‍යාපෘතියේ මූලික වාර්තා පදනම් කර ගෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීම සඳහා නාරා ආයතනය වෙත භාර දී ඇති බවද, මේ වසරේ සැප්තැම්බර් මස වන විට එම අධ්‍යනය අවසන් වන බවද, ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | වාර්තාවන් හෝ වෙරළ තීරයට සිදුවන පරිසර බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා මෙතෙක් ලබා නොගෙන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණි. | |
| 12. | ලේකම්වරුන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ (ආ) උපලේඛනයේ 03 ඡේදයට පටහැනිව අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට වැටුප් ගෙවීමේදී ලේකම්වරුන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ අදාළ ප්‍රතිපාදන නොසලකා හරිමින් සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් වැටුප් තීරණය කර ගෙවීම් කිරීමට කටයුතු කිරීමෙන් තොරව මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයෙන් වැටුප සහ එම ආයතනයට පමණක් ආවේනික වූ දීමනා රැසක් 2015 සිට 2018 ඔක්තෝබර් මස දක්වා නොකඩවා ගෙවා තිබුණි. එසේ ලබාගත් රු. 3,676,038/-ක් වටිනාකම වූ දීමනා ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මෙම අමාත්‍යාංශයේ වැඩ භාර ගැනීමට පෙර මහවැලි අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කටයුතු කර ඇති අතර එම අමාත්‍යාංශය විසින් ඔහුට මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය විසින් ගෙවනු ලබන වැටුප් හා දීමනා ප්‍රතිපූරණය කිරීම සඳහා ජනාධිපති ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන තිබූ බවත්, ඒ අනුව මෙම අමාත්‍යාංශය විසින් ඒ අනුවම වැටුප් ගෙවීමට කරන ලද ඉල්ලීමට ජනාධිපති ලේකම්තුමාගේ අනුමැතිය ලැබුණු බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසිය.<br><br>ලේකම්වරුන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයට අනුව මිස ලේකම්වරුන්ගේ වැටුප් තීරණය කිරීමේ නීත්‍යානුකූල බලතල ජනාධිපති ලේකම්වරයාට නොමැති බව කාරක සභාවේ මතය විය. |
| 13. | 2008 ජුනි 26 දිනැති අංක 13/208 දරණ චක්‍රලේඛයේ 04 හා 05 ඡේදවලට පටහැනිව හිටපු අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) විසින් ලබාගත් රු. 340,000/- න් රු. 150,000/-ක් පමණක් ආපසු රජයට ගෙවීම් කළද, තවදුරටත් රු. 190,000/- ක් රජයට ගෙවීම් නොකර පැහැර හැර තිබුණි. | අදාළ නිලධාරියා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙස කටයුතු කරන අතරම අමාත්‍යාංශය යටතේම ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇති බවද, අනාවරණය විය. ඒ අනුව අමාත්‍යාංශයෙන් ලැබෙන තනතුරට හිමි වාහන දීමනාව හා ඉන්ධන දීමනාව ලබා ගන්නා අතර ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර රාජකාරී සඳහාද ඉන්ධන දීමනාවක් ලබා ගෙන ඇති බවද අනාවරණය විය. මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසීමක් කරන ලදුව චක්‍රලේඛයට පටහැනිව කටයුතු කර ඇත්තේ මාස 3ක් පමණක් බව දන්වා ඇති බවද, එම මාස 3ට අදාළ රු. 150,000/-ක් වූ මුදල ආපසු ගෙවා ඇති බවද ප්‍ර.ග.නි/ ග.නි පැවසිය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 14. | 2016 මාර්තු 09 දිනැති අංක 05/2016 දරණ චක්‍රලේඛයේ 2 (iii), (iv) ඡේදවලට පටහැනිව හිටපු අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) විසින් වැයකර තිබුණු ඉන්ධනවල පිරිවැය වූ රු.465,080/- අදාළ නිලධාරියාගෙන් මෙතෙක් අය කර ගෙන නොතිබීම. | හිටපු අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) හා සම්බන්ධ ඡේද අංක 15 හා 16 සම්බන්ධයෙන් සවිස්තරත්මක වාර්තා මාසයක් තුළ කාරක සභාව වෙත යොමු කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**මෙම වාර්තා මෙතෙක් කාරක සභාව වෙත ලැබී නොමැත.** |
| 15. | කළුතර නගරයේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බෙදා දිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලැයිස්තුවක් පිළියෙල කළද, එම ලැයිස්තුවට පරිබාහිරව කඩකාමර බෙදා දී ඇති බවට පැමිණිලි ලැබී තිබීම. | කළුතර වාණිජ සංකීර්ණය ඉවත් කිරීමේදී එහි කඩකාමර හිමිව තිබූ පුද්ගලයන්ටද නව වෙළඳ සංකීර්ණයේ කඩ බෙදා දීමේ අවශ්‍යතාවය පැන නැගුණු බවත්, ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් පත් කරන ලද කමිටුවක නිර්දේශ මත මෙම කඩ කාමර බෙදා දී ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>කඩ බෙදා දීම සම්බන්ධයෙන් තීරණය ගැනීමේ අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය වෙතම රඳවා ගෙන සාධාරණ ලෙස එම කටයුතු සිදු කරන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලදී. |
| **දුම්රිය දෙපාර්තමේන්තුව<br>2019 ජූනි 21** | | |
| 1. | 2013 වර්ෂය වනවිට අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 533ක් පැවතුණු අතර එයින් දුම්රිය හරස් මාර්ග 200ක් සඳහා බෙල් සහ ලයිට් පද්ධති 200ක් ස්ථාපනය කිරීම සඳහා 2013 ජූලි 19 දින මිළ කැඳවා තිබුණු අතර අදාළ කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි 27 දින නිම කර භාරදිය යුතු වුවද 2018 අගෝස්තු වන විට නිම කර භාරදී තිබුණේ පද්ධති 45ක් පමණි. කොන්ත්‍රාත්තුව නිම කිරීමට පමා වීම නිසා රු.181,389,320 ක විදේශ විනිමය අලාභයක් සිදුවී | 2019 ජනවාරි තෙක් අමාත්‍ය මණ්ඩල තීරණ මත කාලය දිගු කර තිබූ කොන්ත්‍රාත්තුව මත බෙල් හා ලයිට් පද්ධති 110 ක් නිමවා පද්ධති 90කට මුදල් ගෙවා ඇති බවද වර්තමානයේදීද මෙය ක්‍රියාත්මක වන බවද මාස 4ක් තුළ වැඩ නිම කිරීමට අපේක්ෂා කරන බවද ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. මෙම ප්‍රමාදයට හේතුව පිළිබඳ විමර්ශනයට අමාත්‍යාංශය මගින් කමිටුවක් පත්කර මෙම කොන්ත්‍රාත්තුව නිම කරන දින වකවානු සහිත සවිස්තරාත්මක වාර්තාවක් හා මේවන තෙක් සවිකල පද්ධතිවල ගුණාත්මක භාවය පිළිබඳ වාර්තාවක් ජූලි 20ට පෙර ඉදිරිපත් කරන ලද මෙතෙක් සවිකර නොමැති බෙල් ඇන්ඩ් ලයිට් පද්ධති සවිකිරීම සඳහා ගෙන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | තිබීම මෙන්ම 2018 වර්ෂයේදී දුම්රිය හරස් මාර්ගවලදී සිදුවූ අනතුරු 651ට මෙම ව්‍යාපෘති ප්‍රමාදය බලපා නැතැයි යන්න විගණනයේදී බැහැර කළ නොහැකි බවට විගණකාධිපති විසින් වාර්තා කර තිබීම. | තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් හා සමස්ත දුම්රිය පද්ධතියට අදාළ ව්‍යාපෘතීන් පිළිබඳ වාර්තාවක් සමග අගෝස්තු 05ට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව කාරක සභාවට ලබාදී ඇත. ඒ අනුව ජූලි 20 දින නියමකර ඇති බෙල් හා ලයිට් 200 ව්‍යාපෘතියට අදාළ වාර්තාව ව්‍යාපෘති පසුබිම, ප්‍රමාදයට හේතු, නිම කරන දින වකවානු හා ස්ථාපිත පද්ධතිවල ගුණාත්මකභාවය ආදිය දක්වා ඇත.** |
| 2. | දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීමට වසර 10කට අධික කාලයක සිටම කටයුතු නොකිරීම, තනතුරු 10ක් සඳහා නිලධාරීන් 48 දෙනෙකු වැඩ ආවරණය කිරීමේ පදනම මත බඳවා ගෙන තිබීම හා විවිධ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර දෙපාර්තමේන්තු සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 405 ක් නැවත සේවයේ යොදවා ගෙන තිබීම. | මේ සඳහා සේවකයන් කණ්ඩායම් විසින් අධිකරණයේ නඩු ගොනු කිරීම, තෘතීය මට්ටමේ බඳවාගැනීමේ පටිපාටි අනුමත නොවීම ආදිය නිසා බඳවා ගැනීම් ප්‍රමාදවී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>ආදේශක හා අනියම් සේවකයින් ස්ථිර කිරීමට ඇති බාධාවන්, ඒ සඳහා අනුමැතිය අවශ්‍ය කුමන ආයතනවලින්ද, එක් එක් ආයතනවලින් අවශ්‍ය අනුමැතීන් වෙන වෙනම දක්වා තෘතීය අංශයේ පුරප්පාඩු 328 සම්පූර්ණ කිරීමට බඳවා ගැනීමේ පටිපාටි අනුව තනතුරු වර්ග කර පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඇති බාධාවන් හා සම්බන්ධ වියයුතු ආයතන, අනුමත කර නොමැති බඳවා ගැනීමේ පටිපාටි මොනවාද ඒ සඳහා අනුමැතිය අවශ්‍ය ආයතන යන තොරතුරු ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් ජූලි 10ට පෙර කාරක සභාවට ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව කාරක සභාවට ලබාදී ඇත. ඒ අනුව අතිරික්ත, ආදේශක හා අනියම් සේවක ගැටළු නිරාකරණයට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය බවද තෘතීයික** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **මට්ටමට අනුමත බඳවා ගැනීම් සිදුකරමින් පවතින බවද අධීක්ෂණ කළමනාකරණ විශේෂ පන්තියේ තනතුරු, සැලසුම් ශිල්පී, ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති, එන්ජින් රියදුරු සඳහා පත්වීම් ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති බවද තවත් තනතුරු පුරප්පාඩු පිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අනුමැතිය සඳහා යවා ඇති බවද දක්වා ඇත.** |
| 3. | දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවක අතිකාල ගෙවීමේ ක්‍රමවේදය ආයතන සංග්‍රහයට පටහැනි බැවින් මේ පිළිබඳ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබා ගතයුතු වුවද එම උපදෙස් ලැබී නොතිබුණු අතර තවදුරටත් ආයතන සංග්‍රහයට පටහැනිව ගෙවීම් කර 2018 වර්ෂයේදී අතිකාල ලෙස රු. 2,211,700, 307/- ක් ගෙවා තිබීම. | මේ සඳහා පෙර පරිදිම ගෙවීම් කටයුතු සිදුකරන ලෙස ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත නියෝගයක් ලැබී ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. මේ නියෝගය ලබාදුන් ලිපියේ පිටපතක් විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව ජූනි 25ට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>**නියෝගය ලබාදුන් ලිපියේ පිටපතක් කාරක සභාවට ලබාදී ඇතෙ.** |
| 4. | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදුදීම සම්බන්ධයෙන් තොරතුරු පරිගණකගත කිරීම සඳහා රු. 900,000ක් ගෙවා තිබුණද එම කාර්යය ඉටුකර ගත නොහැකිවී ඇත. බදු දී ඇති ඉඩම්, බදු ඔප්පු, බදු ගිවිසුම් ආදී ඉඩම් බදුදීම සම්බන්ධ තොරතුරු නොමැතිවීම නිසා ඉඩම් බදුදීමෙන් ලැබුණු ආදායම හා ඉඩම් උපයෝජනය පිළිබඳ තහවුරු කර ගත නොහැකි වී ඇත. | ICTA ආයතනයේ මේ සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගේ හා දැනට මේ සම්බන්ධයෙන් කටයුතු කරන දුම්රිය දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නාමලේඛනයක් ජූනි 25ට පෙර කාරක සභාවට ලබාදෙන ලෙස හා ජූලි 20ට පෙර දුම්රිය දෙපාර්තමේන්තුවේ සමස්ථ ඉඩම් ලේඛනය හා ඉඩම් යාවත්කාලීන කරන වැඩපිළිවෙලක් සකස් කර එම වැඩපිළිවෙල පිළිබඳ දින වකවානු සහිත වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාවන් කාරක සභාවට ලබාදී ඇත. ඒ අනුව මෙමෙ පරිගණක වැඩසටහන දැනට** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **ක්‍රියාත්මක නොවන බවද මෙමගින් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කරන බවද එය ඉටුකිරීමේ ප්‍රගතිය රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම් වෙත හා විගණකාධිපති වෙත කාලානුරූපීව වාර්තා කරන බවද ප්‍ර.ග.නි/ග.නි. දක්වා ඇත.** |
| 5. | 2018 දෙසැම්බර් 31 දින දක්වා සැපයුම්කරුවන්ට අත්තිකාරම් ලෙස රු. 95,428,541ක් ගෙවා තිබුණු අතර එකී වටිනාකමින් රු.14, 146,361 කට භාණ්ඩ නොලැබී ඇත. රු.1,304,364ක් වටිනා භාණ්ඩ වසර 25ක් ඉකුත් වූ භාණ්ඩ වූ අතර 1980 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.80,613,243 ක වටිනාකම වූ භාණ්ඩ, යෝග්‍ය නොවීම, භාණ්ඩ අඩුවෙන් සපයා තිබීම හා හානිවීම යන හේතු නිසා ප්‍රතික්ෂේප කර ඇත. ඒ හේතුවෙන් රජයට සිදුවන රු. 95,428,541 ක පාඩුව සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම. | අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මේ සමබන්ධ කරුණු සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර ඇති බව ග.නි. පැවසීය. එම කමිටුවේ වාර්තාව පරිශීලනය කර එම නිර්දේශ අනුව අමාත්‍යාංශයට ගත හැකි පියවර ඇතුලත් වාර්තාවක් ජූලි 31ට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**මීට අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම රු. 95,428,541ක මුදල වසර 38ක් පුරා එක්රැස්වී ඇති හිඟ ශේෂයක් බැවින් මෙම මුළු මුදලම පියවා ගැනීම ප්‍රායෝගික නොවන බවද, සඳහන් කර ඇති ලිපිගොනු හරහා සිදුවී ඇති භාණ්ඩ අඩුවෙන් ලැබීම වෙනුවෙන් මේවන විට සැපයුම්කරුවන්ගෙන් නැවත අදාළ අයිතමයන් ලබාගැනීමට කටයුතු කර පියවාගත් ප්‍රමාණය රු. 10,275,947.28ක් බවත් දක්වා ඇත.** |
| 6. | දුම්රිය අමතර කොටස් ආනයනය කිරීමේදී නිසි කලට වේලාවට භාණ්ඩ නිශ්කාශනය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2014 සිට 2018 දක්වා සෑම වර්ෂයකම වරාය අධිකාරියට, නැව් සංස්ථාවට හා නැව් සමාගම්වලට රු. 28,786,815 ක මුළු ප්‍රමාද ගාස්තු ගෙවා තිබීම. | මේ සඳහා නිසි ක්‍රමවේදයක් සකස්කරන ලෙසත් දැනට පවතින මෙම හිඟ මුදල භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන කපාහැරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් කාරක සභාව නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 7. | 2011 වර්ෂයේදී රු.5,086,986 කට මිලදී ගත් විද්‍යුත් පාලන ඒකක (Electronic Control Unit) 1,000ක් අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් අදාළ කාර්යය සඳහා භාවිතා කළ නොහැකිව ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතීම. | මෙම අයිතම ප්‍රතිස්ථාපනය කිරීමට සැපයුම්කරු සමග කටයුතු කරමින් පවතින බව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. |
| 8. | දුම්රිය මාර්ගවල සිල්පර හා රේල්පීලි නියමිත කාලයන් වලදී මාරු නොකිරීම, මාර්ග නඩත්තුව නිසි පරිදි සිදු නොවීම හා කාර්ය මණ්ඩල පුරප්පාඩු යන හේතූන් වේග සීමා පැනවීමේ අවස්ථා වැඩිවීමට හේතු වී තිබුණි. වේගය සීමා කිරීම් වැඩිවීම. දුම්රිය ධාවනය ප්‍රමාදවීමට හා ධාවන වාර අවලංගුවීමට සෘජුවම බලපා තිබීම. | අදාළ සේවක හිඟය හේතුවෙන් මෙම තත්වය ඇති වී ඇතිබව ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය. |
| **දිඹුලාගල ප්‍රාදේශීය සභාව<br>2019 ජූලි 11** | | |
| 1. | යම් ප්‍රදේශයක් දියුණුගම ප්‍රදේශයක් ලෙස හඳුනාගැනීමට පැහැදිලි නිර්ණායකයක් නොමැති වීම. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව එක්ව මේ සඳහා පවතින නීතිමය තත්වයන් කවරේද යන්න අධ්‍යනයකර සියළුම ප්‍රාදේශීය සභාවන්ගේද අදහස් සලකා මීට අදාළ නිර්ණායකයන් සකස් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියම කළේය. |
| 2. | දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩල හිඟය හා පුරප්පාඩු පැවතීම. | 2018 වර්ෂයේදී ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව පවතින පුරප්පාඩු පිරවීම පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළ බවත් අළුතින් සංස්ථාපනය වූ පොළොන්නරුව මහ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | නගර සභාවේ සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය හිමි වූ බවත් ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව හමුවේ පැවසීය.<br>2017 වසරේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදුකර අදාළ වාර්තාව අනුමත කිරීම සඳහා වැටුප් කොමිසම වෙත යොමුකර ඇති බව මෙහිදී අනාවරණය විය.<br><br>සමස්ථ දිවයිනේම දියුණුගම නොවූ පළාත් පාලන ආයතන 22ක් පවතින බව හා එයින් අඩක් උතුරු මැද පළාත් සභාව නියෝජනය කරන බවත් මෙහිදී අනාවරණය විය. මෙම පළාත් පාලන ආයතනයන්හි විගණන කමිටු කැඳවීම ඇතුළු විගණන කටයුතු පසුගාමී තත්වයක පවතින බැවින් දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩල සමාලෝචනය කඩිනමින් අනුමත කිරීම සම්බන්ධව අවධානය යොමුකරන ලෙස දක්වමින් වැටුප් කොමිසමට පිටපතක් සහිතව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ලිපියක් යොමුකරන ලෙස කාරක සභාව විසින් කාරක සභාවේ ලේකම්තුමිය වෙත නියෝග කළේය. |
| 3. | හිඟ ආදායම් ගිණුම් තැබීමේදී එම හිඟ ආදායම් හඳුනාගත හැකි පරිදි ලේඛන පවත්වා නොතිබීම. | ආදායම් ප්‍රභවයන් නිවැරදිව හඳුනා නොගැනීම හා කාර්ය මණ්ඩලයේ නොදැනුවත්භාවය මේ සඳහා හේතු වූ බව පැවසූ ප්‍ර.ග.නි./ග.නි. , 2019 වසර වන විට මෙම තත්වය අවමකර ගෙන ඇති බවත් ඉදිරියේදී නිවැරදිව ලේඛන පවත්වා ගැනීමට කටයුතු කරන බවත් කාරක සභාව හමුවේ පැවසීය. |
| 4. | 2018/12/31 දිනට රු.9,709,245/-ක හිඟ ජල ගාස්තු පැවතීම. | කාර්ය මණ්ඩලයේ නුපුහුණුභාවය මේ සඳහා හේතු වී ඇති බව ග.නි. සඳහන් කළ අතර ඉදිරියේදී මෙම තත්වය නිවැරදි කර ගැනීමට ක්‍රියාකරන බවට එකඟ විය. |
| 5. | සභාවේ ආදායම් පරිපාලක තමන්කඩුව ප්‍රාදේශීය සභාව වෙත | මූලික විමර්ෂනයේදී රු. ලක්ෂ 16ක් වටිනා ක්ෂේත්‍ර බිල්පොත් 22ක් පැවති බව අනාවරණය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | ස්ථාන මාරු වී යාමේදී එම නිලධාරියා භාරයේ තිබුණු ක්ෂේත්‍ර බිල්පොත් 16ක් 2015 අගෝස්තු 31 වන විටද ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබීම. | වී ඇති අතර මේවන විට රු.344,000/-ක මුදල් ප්‍රමාණයක් එම නිලධාරියා විසින් සභාවට ගෙවා ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. මේ වන විට ඔහුට විරුද්ධව පොලිස් පැමිණිල්ලක් ගොනු කර ඇති බවත් ඉදිරියේදී අධිභාර පනවා එම මුදල අයකර ගැනීමට කටයුතු කරන බවත් දැනටමත් ඔහුගේ වැඩ තහනම් කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව හමුවේ පැවසීය. |
| 6. | රු.398,520/-ක් වටිනා ගැල්වනයිස් කොඩි කණු 360ක් 2014.12.16 දින ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා සභාපතිවරයා විසින් රැගෙන ගොස් තිබුණු නමුත් 2015.08.30 දින වන විටත් එම ගැල්වනයිස් බට ආපසු ලබාගැනීමට කටයුතුකර නොතිබීම | මෙම කොඩි කණු නැවත ලබා දෙන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව හා විශේෂ මහ සභා රැස්වීමක් පවත්වා මේ පිළිබඳ සාකච්ඡා කළ බවත් ජූලි මස 18 වනදාට පෙර එම කොඩි කණු නැවත ලබා දෙන බව දැනුම් දී ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. මෙම කොඩි කණු ආපසු ගෙන්වා ගැනීමට නොහැකි නම් අදාළ පුද්ගලයන්ගේ වැටුපෙන් අය කරන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි. |
| 7. | ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීමෙන් පසුව, සභාපතිවරයා විසින් පාවිච්චි කරන ලද කැබ් රථයේ ඉන්ධන සීමාව මසකට ඉන්ධන ලීටර 10කට සීමා විය යුතු බවට උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මැයි 18 දිනැති එන්සීපී/එල්ජී/ඒසී/4/1/2 දරන ලිපියෙන් උපදෙස් ලබා දී තිබුණද, 2015 ජුනි සිට 2015 නොවැම්බර් දක්වා ඉහත ඉන්ධන සීමාව ඉක්මවා වටිනාකම රු. 148,680/-ක් වූ ඉන්ධන ලීටර් 1,652ක් භාවිතාකර තිබීම. | මේ පිළිබඳව සැලකිලිමත්ව ක්‍රියා කරන ලෙසත් මේ පිළිබඳව සොයාබලා අවශ්‍ය පියවර ගත යුතු බවටත් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් දෙන ලදි. |
| 8. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තියට පටහැනිව 2015.02.20 දින | මෙවැනි උපකරණ ලබා දීමේදී යම් ණයයෝජනා ක්‍රමවේදයක් හරහා උපකරණ බෙදා හැරීම පිළිබඳ අවධානය යොමුකරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | රු.1,299,880/-ක් වැයකර මිලදී ගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 10ක්, අයි පෑඩ් 2ක් ද ඒ සඳහා ලැබුණු ජංගම දුරකථන 10ක් ද සභාවේ වත්කමක් ලෙස ඉන්වෙන්ට්‍රි ගතකර නොතිබුණු අතර 2015.05.02 දින සභාව විසුරුවා හැරීමේදී මන්ත්‍රීවරුන් විසින් එම උපකරණ රැගෙන ගොස් තිබීම. | ලෙස කාරක සභාව අවධාරණය කරන ලද අතර එවැනි උපකරණ බෙදාහැරීමේ ක්‍රමවේද විධිමත් කරන ලෙසත් ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් දෙන ලදි. |
| | **අධ්‍යාපන අමාත්‍යාංශය (යළි කැඳවීම)<br>2019 අගෝස්තු 08** | |
| 1 | වර්ෂ 2020 දී දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට නියමිත පහ වසර ශිෂ්‍යත්ව ආධාර මුදල් ගෙවීමේ පරිගනක මාර්ග ගත වැඩසටහනේ වර්තමාන ප්‍රගතිය. | භාණ්ඩාගාරයෙන් නිකුත් කරන අක්මුදල් කලාප කාර්යාල හරහා ජාතික පාසැල් ශිෂ්‍යත්වලාභීන්ගේ ගිණුම්වලට බැර කරන අතර 13 වසරේ ශිෂ්‍යත්ව ආධාර මුදල් ගෙවීම පමණක් ඉසුරුපාය ලංකා බැංකු ශාඛාව මගින් සිදුකරන බව ප්‍ර.ග.නි./ග.නි පැවසීය.<br><br>වසර 2020 දී පළාත් පාසල් ද මෙම ක්‍රමයට අනුගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු දැනට සිදුකරමින් පවතින අතර එම කටයුතු අවසන් කළ වහාම සියළුම ආධාර මුදල් පරිගනක පද්ධතිය මගින් පමණක් ගෙවීමට නියමිත බව අනාවරණය විය.<br><br>2012 වර්ෂයේ සිට මෙම ගැටලුව විසඳීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ගන්නා ලෙස කාරක සභාව උපදෙස් ලබාදී ඇතත් ඒ සඳහා වැඩපිලිවෙලක් සකස් කර ගැනිමට මේ දක්වා අසමත්වීම පිලිබඳව සිය අප්‍රසාදය පළකල කාරක සභාව අතිරේක ලේකම්වරයෙකු පත්කර එම වගකීම් පවරා කඩිනමින් අවසන් කරන ලෙස නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | ශිෂ්‍යත්ව ආධාර මුදල් ගෙවීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර වාර්තාවක් ලබාදෙන ලෙස විගණකාධිපතිවරයාට උපදෙස් ලබාදුන් කාරක සභාව අමාත්‍යාංශය විසින් ඊට අවශ්‍ය සහය ලබාදෙන ලෙස ද ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br><br>එසේම ශිෂ්‍යත්ව ආධාර මුදල් ගෙවීම සඳහා මාසිකව අවශ්‍ය වන රුපියල් මිලියන 75 ක පමණ මුදල භාණ්ඩාගාරයෙන් නිශ්චිත දිනයක මුදාහැරීමේ හැකියාව සොයා බලා වැඩපිළිවෙලක් සකස් කරන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාට දන්වා යවන ලෙස සහා ලේකම්වරියට උපදෙස් ලබාදුන්නේය.<br><br>ඉදිරියේදි සියලුම කලාප අධ්‍යක්ෂවරු කැඳවා ආධාර මුදල් ගෙවීම් කළ යුතු ආකාරය පිලිබඳව දැනුවත් කර කාරක සභාවට වාර්තාවක් ලබාදීමට ප්‍ර.ග.නි./ග.නි. එකඟ විය.<br><br>**මේ පිලිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරමින් 2020 ජනවාරි මස සිට දිවයින පුරාම මාර්ගගත වැඩසටහන ශිෂ්‍යාධාර මුදල් ගෙවීම සියලු කටයුතු අවසන් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි. දන්වා ඇත.**<br><br>**2020 වසර සඳහා ශිෂ්‍යත්ව ආධාර මුදල් ගෙවීමට රු.මිලියන 1012.5 ක් අවශ්‍ය වන බව අධ්‍යාපන අමාත්‍යාංශය දන්වා ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ ශිෂ්‍යත්ව ආධාර මුදල සෑම මසකම නිශ්චිත දිනයක දී ගෙවීමට එකඟ වී ඇත. ඒ අනුව අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරය අතර සම්බන්ධීකරණය තුලින් එය ඉටුකර ගැනීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය වී ඇත.** |
| 2 | පාසල්වල පවතින අක්‍රමිකතා සහ විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ලැබී ඇති | දැනට නිරාකරණය නොවූ ගැටළු 231 ක් අතරින් විධිමත් විනය පරීක්ෂණ 27 ක්, චෝදනා පත්‍ර නිකුත් කිරීම් 23 ක්, චෝදනා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | පැමිණිලි හා ගැටළු නිරාකරණය සඳහා සතුටුදායක යාන්ත්‍රණයක් නොමැති බව සහ 2019 මැයි 31 දිනට විසඳා අවසන් නොකළ ගැටළු 333 ක් පැවතිම | කෙටුම්පත් කිරීම් 03 ක්, නියෝග නිකුත් කිරීම් 30 ක්, අභියාචනා ඉදිරිපත් කිරීම් 11 ක්, මූලික නිර්දේශ ක්‍රියාත්මක කිරීම් 102 ක්, සහ උසාවි නඩු 45 ක් පවතින බව අනාවරණය විය.<br><br>පවතින බොහෝ නඩු වසර 5 ඉක්මවූ ඒවා බැවින් රැකවරණ සහ පරීක්ෂණ නිලධාරී සහය ලබාගැනිමේ අපහසුතාවය සහ සාක්ෂි සපයා ගැනිමේ පවතින ගැටළුකාරි තත්වය පරීක්ෂණ ප්‍රමාදයට හේතු වී තිබුණත් පරික්ෂණ අවසන් කිරිම සඳහා ගත යුතු සියළු ක්‍රියා මාර්ග ගන්නා බව ග.නි. පැවසිය. |
| 3 | පාසැල් පද්ධතියේ අධිසේවක පදනම යටතේ සිටින නිලධාරීන් සහ විදුහල්පති පුරප්පාඩු සම්පූර්ණ කිරිමට ක්‍රියාමාර්ග නොගැනිම, විදුහල්පති පුරප්පාඩු 3,618 ක් සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදයක් ඉදිරිපත් කර නොතිබීම, සහ ජාතික පාසැල් 258 ක පවතින විදුහල්පති පුරප්පාඩු පිරවිමට පියවර නොගැනිම. | අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව සේවා ව්‍යවස්ථා කොන්දේසිවලට බාහිරව 2013 වසරේ විදුහල්පති සේවයේ දෙවන ශ්‍රේණියේ තනතුරු 1339 ක් සහ තුන්වන ශ්‍රේණියේ තනතුරු 142 ක් සඳහා අධිසේවක පදනම මත බඳවා ගැනිම් සිදුකර ඇති බව අනාවරණය විය. එහෙත් ඔවුනට උසස්වීම් සඳහා හිමිකමක් නොමැති බැවින් බඳවා ගත් ශ්‍රේණියට අදාළ වැටුප සහ වැටුප් වර්ධකය පමණක් ගෙවමින් දැනට සේවයේ යොදවා ඇතිබව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>විදුහල්පති සේවාවේ පවතින ශ්‍රේණි පුරප්පාඩු සහ පරිපාලන සේවාවේ පුරප්පාඩු පිරවීම සඳහා මාස 2ක් තුල බඳවා ගැනීම් සිදුකර අවසන් කළ හැකිබව ග.නි. ප්‍රකාශ කළේය. |
| 4 | පළමුවන ශ්‍රේණියේ ජාතික පාසල් 64 ක විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ දි සලකා බලන ලද සුදුසුකම්. | මේ සඳහා අධ්‍යාපන පරිපාලන සේවයේ පළමුවන පන්තියේ නිලධාරියෙකු විම මූලික සුදුසුකම වුවත් දැනට එම සේවයේ පුරප්පාඩු 86 ක් පවතින බැවින් පූර්ව සේවා ව්‍යවස්ථාවට අනුව නිලධාරින් 48 දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණ කැඳවා මාසයක් තුල බඳවා ගැනීමට නියමිත බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>පළමු පන්තියේ සුදුසුකම් ඇති අය ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් නිලධාරි හිඟයට පිළියමක් ලෙස දෙවන පන්තියේ අයගෙන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | තෝරා ගැනිමට රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලබා දී ඇති බව ද අනාවරණය විය. |
| 5 | සිසු හා ගුරු තොරතුරු ඇතුලත් පරිගණක දත්ත පද්ධතිය ක්‍රමවත් කර ප්‍රායෝගිකව භාවිතයට ගැනිමට හැකිවන පරිදි සකස් කර නොතිබීම. | 244,825 ක් වන සමස්ත පාසල් ගුරුවරුන්ගේ පෞද්ගලික හා සේවා තොරතුරු මෙම පද්ධතියට ඇතුලත් කර ඇති අතර ඒවායේ නිවැරදිභාවය පරික්ෂා කර සහතික කිරිමේ වගකිම ගුරුවරුන් හට පවරා ඇත.සියලුම ගුරු තොරතුරු ක්ෂණිකව ලබාගැනීමේ හැකියාව සැලසෙන බැවින් පරිපාලන හා ආයතනික කටයුතුවලට එය විශාල පහසුවක් බව ප්‍ර.ග.නි./ග.නි.පැවසිය.<br><br>සුරක්ෂා සිසු රක්ෂණාවරණය, පෙළ පොත් නිකුත් කිරිම සහ විභාග කටයුතු වලදි මෙම පද්ධතිය යොදා ගැනිමට නියමිත බවත් වර්ෂ 2020 ජනවාරි සිට පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් වැඩසටහන් අධ්‍යක්ෂවරයා පැවසීය. |
| 6 | 2017 වසරේ ස්ථාපිත කළ සුරක්ෂා සිසු රක්ෂණාවරණයේ ප්‍රතිලාභ ලබාදී ඇති ආකාරයත් ගෙවීම් සඳහා සරල ක්‍රමවේදයක් හඳුන්වා දීමේ අවශ්‍යතාවයත් පිළිබඳව සකස් කළ විශ්ලේෂණාත්මක වාර්තාව | 2017 වර්ෂය තුල දෙමව්පිය මරණ සඳහා රු. මිලියන 55 ක් දරුවන් අභිමිවීම් සඳහා රු. මිලියන 34 ක් රජයේ රෝහල් ප්‍රතිකාර සඳහා රු. මිලියන 210 ක් පෞද්ගලික රෝහල් ප්‍රතිකාර සඳහා රු. මිලියන 76 ක්, පෞද්ගලික අනතුරු සඳහා රු.ලක්ෂ 3 ක් සහ රෝහල් ගතවීමකින් තොරව තදබල අසනිප සඳහා රු.මිලියන 3 ක් ලෙස ප්‍රතිලාභීන් 19,142 වෙනුවෙන් රු.මිලියන 992 ගෙවා ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>සුරක්ෂා සිසු රක්ෂණාවරණය පිළිබඳව දැනුවත් කිරිමේ අරමුණින් චක්‍රලේඛ නිකුත් කිරිම, දැන්වීම් පළකිරිම, අන්තර්ජාලයට අතිරේකව වට්ස්ඇප් මුහුණු පොත වැනි සමාජ මාධ්‍ය යොදා ගැනිම, කලාප මට්ටමින් නිලධාරින් දැනුවත් කිරිම, පෞද්ගලික රෝහල් දැනුවත් කිරිම සහ රෝහල් 62 ක් සඳහා සෘජු ගෙවීම් අනුමත කිරිම, පෝස්ටර්, සුරක්ෂා කාඩ්පත් නිකුත් කිරිම සහ අත්පත්‍රිකා මගින් දැනුවත් කිරිම් ආදිය සිදුකර ඇති බව ද ග.නි. පැවසිය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | මේ පිලිබඳව මාසික ප්‍රගති සමාලෝචනයක් සිදුකරන අතර මතුවන ගැටළු නිරාකරණය සඳහා රක්ෂණ සංස්ථාව සහ අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ සෘජු දුරකථන අංක 2 ක් හඳුන්වා දීමටද කටයුතු කර ඇති බව මෙහිදී අනාවරණය විය. |
| 7 | පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ සිදුකිරිමට යෝජිත වෙනස් කම් හා එම වැඩපිළිවෙලේ වර්තමාන තත්ත්වය. | පසුගිය වසර 2 තුල විභාග ප්‍රශ්ණ පත්‍රයේ වෙනසක් සිදුකළ අතර විභාග ප්‍රතිඵල අනුව ලබාගන්නා ස්ථානය නොසලකා ලකුණු පමණක් ලබාදිම කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>සිසු පරිගනක තොරතුරු වැඩසටහන ක්‍රියාත්මක කිරිමෙන් පසු පළමු වසරේ සිට පහවසර දක්වා සිසුන් ලබාගන්නා ලකුණුවල සාමාන්‍ය අගය (Grade Point Average) ඉහළ ප්‍රගතියක් පෙන්වා ඇති සිසුන් වෙත ආධාර මුදල් හෝ පාසල් ලබාදිම කෙරෙහි අවධානය යොමු කළ හැකි බව ඔහු පැවසිය. |
| 8 | කායික හා මානසික සමබරතාවයෙන් යුතු නිරෝගී සිසු පරපුරක් දැයට දයාද කිරීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂය සඳහා රු. මිලියන 150 ක් වෙන් කර තිබුණත් පාසැල් තුල ශාරිරික යෝග්‍යතා වැඩසටහන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර නොතිබිම සහ මෑතක දි බඳවා ගත් 3888 ක් වන ක්‍රීඩා උපදේශකයින් සඳහා රාජකාරි ලැයිස්තුවක් සකස්කර නොතිබිම. | ප්‍රධාන ක්‍රිඩා 7 ක් සඳහා ගුරු අත් පොත් සහ DVD සකස් කිරීමේ අවසන් අදියරට පැමිණ ඇති බවත් තුන්වන පාසල් වාරය ආරම්භ කළ සැනින් පුහුණුවීම් කටයුතු සිදුකිරිමට නියමිත බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසිය. අනධ්‍යන කාර්යය මණ්ඩලයට බඳවාගත් 3888 ක් වන මුළු ක්‍රීඩා උපදේශකයින් අතරින් 3868 දෙනෙකු රජයේ පාසල්වලටත් 20 දෙනෙකු විද්‍යා පීඨවලටත් අනුයුක්ත කර ඇති බවත් ඔවුන්ගේ කාර්යභාරය ඇතුලත් උපදෙස් මාලාවක් සියළුම විදුහල්පතිවරුන් වෙත යැවීමට කටයුතු කරන බවත් පැවසීය.<br><br>පැවති ප්‍රජා සෞඛ්‍ය ගුරු තනතුරු සංඛ්‍යාවක් යටපත් කර ක්‍රිඩා උපදේශකයින් 3888 බඳවා ගැනිමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදී ඇතත් සේවක සංඛ්‍යාව වැඩිකිරිම සඳහා නිල වශයෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී නොමැති බැවින් අයවැය දෙපාර්තමේන්තු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | නිරික්ෂණ ලැබීමෙන් පසුව ඉදිරි කටයුතු සිදුකිරිමට නියමිත බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා පැවසීය. |
| 9 | රු.මිලියන 7274 වැය කර උසස් පෙළ සිසුන් සහ ගුරුවරුන් සඳහා පරිගණක ටැබ් ලබාදීම සම්බන්ධව ගුරු අමාත්‍යතුමා පත්කළ විශේෂ කමිටු වාර්තාවෙන් ලබා දි ඇති නියෝග සහ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය. | මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කිපයක් ඉදිරිපත් කර තිබූ අතර පළමුව නියාමන වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කර සිසු ආරක්ෂාව සහතික කිරිමට එහි නිර්දේශ ඉදිරිපත්කර තිබුණි. මෙහිදි සිසුන් වෙත ලබාදෙන පරිගණකයේ  කැමරාව සහ USB Port පද්ධතිය ඉවත්කිරිම, ප්‍රවේශ විය හැකි වෙබ් අඩවි සීමාකිරිම සහ ගුරුවරයෙකුගේ අධික්ෂණය යටතේ ඒවා ක්‍රියාත්මක කර පාසල තුලම තබා ගැනිම පිළිබඳව  අවධානය යොමු කර තිබුණි. ව්‍යාපෘතිය පළමු අදියරේ දි ජාතික පාසල් 60 ක ගුරු හා  සිසු 97,000 ට පරිගනක ටැබ් ලබාදීමේ කටයුතු සැප්තැම්බර් මාසයේ සිට ආරම්භ කිරිමට නියමිත බව ප්‍ර.ග.නි./ග.නි. පැවසිය. |
| 10 | රජයේ පාසැල්වල උසස් පෙළ සිසුන්ගේ පැමිණිම අවම මට්ටමක පැවතීම පිලිබඳ අධ්‍යනය කර වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ලබාදුන් නියෝගයට අනුව ඊට පිළියම් ලෙස ගෙන ඇති ක්‍රියාමාර්ග. | 2016 වසරේ ජාතික අධ්‍යාපන ආයතනය විසින් අධ්‍යාපන කලාප 93 ක පාසැල් 279 ක් ඇසුරෙන් සිදුකළ සමීක්ෂණයක ප්‍රතිඵලයට අනුව 13 වසරේ සිසුන්ගේ පාසල් නොපැමිණිමේ සාමාන්‍යය 72.4% වන අතර බස්නාහිර පළාතේ එය  88.5% ක් ද උතුරු මැද පළාතේ 88.2%  ක් ද ලෙස ඉහල අගයක් වාර්තා වී ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>**උසස් පෙළ සිසුන්ගේ පාසල් පැමිණිමේ 80% මට්ටම ප්‍රවර්ධනය සඳහා විදුහල්පතිවරු දැනුවත් කිරිමට කටයුතු කරන බව දන්වා ඇත.** |
| **රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව<br>2019 අගෝස්තු 21** | | |
| 1. | ජ්‍යොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් ඇතුළුව දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 754 ක් පැවතීම | බඳවා ගැනීමේ පටිපාටියේ පවතින දුර්වලතා මේ සඳහා හේතු වී ඇති බවත් එම දුර්වලතා හඳුනාගෙන බඳවා ගැනීමේ පටිපාටියට අවශ්‍ය සංශෝධන ගෙන ඒම සඳහා අමාත්‍යාංශය විසින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | කමිටුවක් පත් කර ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කරන ලදි.<br><br>2019-09-01 වන දිනට පෙර බඳවා ගැනීමේ පටිපාටියට අවශ්‍ය සංශෝධන ගෙන ඒම සඳහා පත් කළ කමිටුවෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ කාල සටහනක් සහිත වාර්තාවක් සහ 2019-09-30 වන දිනට පෙර බඳවා ගැනීමේ පටිපාටියෙහි පැවති දුර්වලතා සංශෝධනය කර ගැනීම සඳහා අදාල සියලු පාර්ශව සමඟ සාකච්ජා කොට අවසන් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දීමට නියෝග කරන ලදි.<br><br>**අදාල තනතුරු පුරවා ගැනීම සම්බන්ධයෙන් කාලරාමුවක් සහිත සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 2. | සමුපකාර සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන මුද්‍රණාලීය භෝජනාගාරය සඳහා දෙපාර්තමේන්තුවේ සේවකයින් 29 දෙනෙකු 2018 වර්ෂයේදී යොදා ගැනීම සහ දෙපාර්තමේන්තුව විසින් එම වර්ෂය තුළ ඔවුන්ට වැටුප් වලට අමතරව දීමනා ලෙස රු.10,953,631/- ක් ගෙවා තිබීම | එකී සමූපකාර සමිතියෙහි සාමාජිකයන් දෙපාර්තමේන්තුවේ සේවකයන් වන බවත් දෙපාර්තමේන්තුවේ සේවකයන්ට සලසන සුබ සාධනයන් ලෙස අඩු මිලට තත්වයෙන් උසස් ආහාර ලබා දීම මේ හරහා සිදු වන බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br><br>මේ සඳහා දැරීමට සිදුවන අතිකාල ඇතුළු වියදම සලකා බැලූ කල මෙය දෙපාර්තමේන්තුවෙන් පිටට දීම ලාභ දායක විය හැකි බව කාරක සභාව ප්‍රකාශ කළේය.<br><br>කෙසේ නමුත් භෝජනාගාරය පවත්වා ගෙන යාම සඳහා දැරීමට සිදුවන සම්පූර්ණ වියදම සහ මෙම භෝජනාගාරය පවත්වාගෙන යාම සාධාරණීකරණය කළ හැකි කරුණු ඇතුළත් වාර්තාවක් සති 02 ක් ඇතුළත ලබා දීමට කාරක සභාව නියෝග කළ අතර කිසිඳු ලාභයක් නොලබා දෙපාර්තමේන්තුව විසින් අධික වියදමක් දරා මෙම භෝජනාගාරය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලෙසත් දන්වා සිටින ලදි.<br><br>**අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව භෝජනාගාරය සඳහා දැරීමට සිදුවන වියදම, 2018 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම රු. 25,312,365.69 ක්ද ප්‍රාග්ධන වියදම රු. 29,775,230.69 ක් වන බව දක්වා ඇත.(ජලය සහ විදුලි වියදම හැර) එසේම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයේ ස්වභාවය අනුව සේවකයින්ට පැය 24 පුරාවට සේවය කිරීමට සිදුවීම, ආරක්ෂිත හේතු මත පිටතට ගොස් ආහාර ගැනීමේ ගැටළු සහ රාජකාරී ස්වරූපය අනුව සහන මිලට සෞඛ්‍යාරක්ෂිතව අවම වේලාවක් ඇතුළත පෝෂ්‍යදායි ආහාර වේලක් ලබා දීමේ අවශ්‍යතාවය වැනි හේතු මත එම භෝජනාගාරය පවත්වාගෙන යෑම සාධාරණීකරණය කර ඇත.** |
| 3. | හිඟ ආදායම් රැස්කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ කාරක සභාව 2019-06-30 වන විට රු.425,259,154/- ක හිඟ ණය ශේෂයක් පවතින බව නිරීක්ෂණය කළේය. එසේම 2011 හා ඊට පෙර වර්ෂ වලට අදාළ හිඟ ශේෂය වූ රු.181,520,331 ක මුදල ද මෙම අයවිය යුතු මුදලෙහි අන්තර්ගතව ඇති බවද අනාවරණය විය. පෞද්ගලික අංශයෙන් අය විය යුතු රු.10,174,643/ක හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට පෞද්ගලික අංශ සඳහා ණයට ලබා නොදෙන බවත්, පෞද්ගලික ආයතනවලින් ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාකර ඇති බවත් ග.නි ප්‍රකාශ කරන ලදි.<br><br>පෞද්ගලික අංශ යටතේ ඇති ණය ශේෂ අතරින් දහම් පාසැල් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරිම වෙනුවෙන් අයවිය යුතු ණය ශේෂයක් ඇති බව අනාවරණ වූ අතර එම ණය ශේෂය භාණ්ඩාගාර අනුමැතිය ඇතිව කපා හරින ලෙසත් ඉතිරි ණය ශේෂ අයකර ගැනීමට නීතිමය ක්‍රියා මාර්ග ගන්නා ලෙසත් කාරක සභාව නියෝග කරන ලදි.<br><br>රාජ්‍ය ආයතන වලින් ණය අයකර ගැනීමේදී නිසි දත්ත නොතිබීම සහ එම ආයතනවල ප්‍රතිපාදන නොමැති බව දන්වා සිටින බැවින් ණය ශේෂ අයකර ගැනීමේ ගැටළු පවතින බව ග.නි ප්‍රකාශ කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | රාජ්‍ය ආයතන සඳහා අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කිරිමේ දි "වෙනත්"යන ශීර්ෂය යටතේ ද ප්‍රතිපාදන වෙන් කරන බවත් වෙනත් ආයතන සඳහා අය විය යුතු මුදල් එම ප්‍රතිපාදන වලින් ලබා දිය යුතු බවත් මෙහිදී අනාවරණය විය. මේ අනුව යම් හෙයකින් ප්‍රතිපාදන නොමැති නම් ආදාළ ආයතනය මුදල් අමාත්‍යාංශය දැනුවත් කළ යුතු බවත් මුදල් අයකර ගැනීමේ වගකීම රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව සතුවන බවත් කාරක සභාව ප්‍රකාශ කරන ලදි.<br><br>හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් අදාල ආයතන සමඟ සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍ර.ග.නි එකඟ විය. |
| 4. | දෙපාර්තමේන්තුවේ එක් වායු සමීකරණ යන්ත්‍රයක් ගිනිගෙන විනාශ වීම මත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ), 8.9.1 (ආ) සහ මුදල් රෙගුලාසි 41(2) ට පටහැනිව වායු සමීකරණ යන්ත්‍ර 45 ක් ඉවත් කර රු. 7,008,073/- කට නව යන්ත්‍ර 48 ක් මිලදී ගැනීම. | මේ සම්බන්ධයෙන් අපහරණ කමිටුවක් පත් කළ බවත් එහි නිර්දේශ මත පැරණි යන්ත්‍ර විකුණා නව වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගත් බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කරන ලදි.<br><br>මේ සම්බන්ධයෙන් නැවත පරීක්ෂණයක් කර වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාව වෙත ලබා දෙන ලෙස නියෝග කරන ලදි. |
| 5. | 1997.12.10 දිනැති අංක අමප/97/5232/17/35 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව 1998.02.26 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දි එළඹි තීරණය පරිදි වාර්ෂික වානිජ නිෂ්පාදන වටිනාකම මත පදනම්ව වාණිජ මුද්‍රණ දීමනාව ගෙවිය යුතු වුවද 2017 වර්ෂයේ එකතුව රු.78,909,638 ක්වූ වානිජ නොවන නිෂ්පාදන ආදායම් ද | වානිජ මුද්‍රණ දීමනා ගෙවීම සම්බන්ධයෙන් දැනට නිකුත් කර ඇති චක්‍රලේඛය සම්බන්ධයෙන් විගණකාධිපති නිර්දේශ ද ලබා ගෙන මුදල් ආමාත්‍යාංශය සමඟ සාකච්ජා කොට අවශ්‍ය නිවැරදි කිරීම් ඇත්නම් ඒවා ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස කාරක සභාව නියෝග කළේය. ඒ පිළිබඳ වාර්තාවක් 2019-09-10 වන දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නියෝග කළ අතර එම චක්‍රලේඛයට පටහැනිව වානිජ මුද්‍රණ දීමනා ගෙවීම් සිදු කළ හොත් අදාල නිලධාරීන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | වානිජ මුද්‍රණ දීමනා ගණනය කිරීමේදී ඇතුළත් කර තිබීම | සහ ආයතන ප්‍රධානීන් වගකීමට බැඳෙන බව කාරක සභාව අවධාරණය කරන ලදි.<br><br>**මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව වානිජ මුද්‍රණ දීමනා ගෙවීමේදී වානිජ නොවන නිෂ්පාදන අදායම එකතු කර ගැනීම සම්පූර්ණයෙන්ම අත්හිටුවා ඇති බව දක්වා ඇත. තවද මෙම දීමනා ගෙවීම සම්බන්ධයෙන් නව ක්‍රමයක් යෝජනා කර ඇති අතර එය ක්‍රියාත්මක කිරිමෙන් මේ සම්බන්ධව ඇති අනෙකුත් දුර්වලතා සඳහා ද පිළියම් ලැබෙන බව දක්වා ඇත.** |
| 6. | 2013 වර්ෂයේ සංශෝධිත මුද්‍රණ ව්‍යවස්ථාවේ 10.03.04 පරිච්ඡේදය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2015.08.06 දිනැති අංක PC/6/5/094/3R දරන ලිපියේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ආධුනිකයන්ට දෛනිකව ගෙවිය යුතු රු.580/- ක දීමනාවට අමතරව වෙනත් දීමනා සහ අතිකාල දීමනා ලෙස 2018 වර්ෂයේදී රු.17,405,011/- ක් ගෙවා තිබීම | දෙපාර්තමේන්තුවට ආධුනික ධාරාව යටතේ සේවකයින් බඳවා ගැනීමේදී ආධුනිකත්ව මණ්ඩලය සම්බන්ධ වන බවත් මුද්‍රණ සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීම් සිදු කරන බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. එසේම ඔවුන් බඳවා ගනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ඇතුළත් වන ලෙස බව ද මෙහිදී අනාවරණය විය.<br><br>කෙසේ නමුත් දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලබන ආධුනිකයන් සඳහා දෛනික දීමනා වලට අමතරව වෙනත් දීමනා ගෙවීමට නොහැකි බව අවධාරණය කළ කාරක සභාව ආධුනිකයින් බඳවා ගැනීමේ විධිමත් බවක් නොමැති බව ද නිරීක්ෂණය කරන ලදි. විවෘත, අභ්‍යන්තර සහ ආධුනික අංශ යටතේ දෙපාර්තමේන්තුවට සේවකයින් බඳවා ගැනීමේ පටිපාටිය සේවා ව්‍යවස්ථාවට සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල ක්‍රියාවලින්ට සාපේක්ෂව විෂමකාරී බැවින් අමාත්‍යාංශ ලේකම් විසින් ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට ඒ පිළිබඳ වාර්තාවක් 2019-09-15 වන දිනට පෙර ලබා දීමට කාරක සභාව නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර මුද්‍රණ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරිමෙන් මෙම ගැටළුව විසඳා ගත හැකි බවත් ඒ සමබන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදි ගනු ලබන බවත් දක්වා ඇත.** |
| 7. | 2017 වර්ෂයේ දී රු.109,380,234 ක්වූ කඩදාසි මෙට්‍රික් ටොන් 1626 ක් ආනයනය කිරීමේදී ඇති වූ ප්‍රමාද වීම සඳහා ලන්සු ලේඛන අනුව කඩදාසි සැපයීමේදී ප්‍රමාද ගාස්තු ලෙස රු.19,238,222/ක් අය විය යුතු වුවද එම ගාස්තු අයකර ගැනීමට ක්‍රියා නොකිරීම | ලන්සු ලේඛන වල භාණ්ඩ ලබා දීමේ දිනයක් සඳහන් නොකර ණය වර ලිපිය විවෘත කළ වහාම භාණ්ඩ සැපයිය යුතුය යනුවෙන් සඳහන් කිරිම මත එකී මුදල් අයකර ගැනීමට නොහැකි වි ඇති බවත් කෙසේ නමුත් ලන්සු ලේඛන වල එම දෝෂය මේ වන විට නිවැරදි කර ඇති අතර ඉන් පසුව සිදු කර ඇති ගනු දෙනු වලදී ප්‍රමාද ගාස්තු ලෙස ලක්ෂ හැටක මුදලක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට හැකි වි ඇති බවත් ග.නි ප්‍රකාශ කරන ලදි.<br><br>කඩදාසි මිලදි ගැනීමේදි ලේඛන වල ඇති අවධිමත් භාවය සහ ගිවිසුමකින් තොරව මිලදී ගැනීම් සම්බන්ධයෙන් කාරක සභාව සිය අප්‍රසාදය පල කළ අතර මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන ක්‍රමවේදය පිළිබඳව වාර්තාවක් ලබා ගෙන මුදල් අමාත්‍යාංශයේ මඟපෙන්වීම් මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කර ඒ පිළිබඳ වාර්තාවක් 2019.09.15 දිනට පෙර ලබා දීමට කාරක සභාව විසින් අමාත්‍යාංශ ලේකම් වෙත නියෝග කරන ලදි.<br><br>**මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව මෙම ගැටළුව මඟහරවා ගැනීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගන්නා බව දක්වා ඇත.** |
| 8. | 2019 ජනවාරි - මැයි කාලය තුළ අස්කොන් කඩදාසි විකිණීමෙන් | අස්කොන් කඩදාසි විකිණීමේ දි ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරන බවත් මේ වන විට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | අයවිය යුතු රු.5,028,244 ක් 2019 ජූලි 20 වන දින විටත් අයකර නොගැනීම | අදාල ආයතනය නිසි පරිදි මුදල් ගෙවමින් එම කඩදාසි මිලදී ගන්නා බවත් ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කරන ලදි. ඉහත කී රු.5,028,244 ක මුදලින් මේ වන විට මිලියන 1ක මුදලක් අය කර ගත හැකි මට්ටමේ පවතින බවත් ඉතිරි මුදල් ගැණුම්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් එම මුදල් ලබා දීමට ඔවුන් ලිඛිතව එකඟ වී ඇති බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදි.<br><br>එම රු. මිලියන 1 ක මුදල අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙස දැන් වූ කාරක සභාව සම්ප්‍රදායිකව ආයතනය තුළ සිදු වී ඇති වැරදි නිවැරදි කර ගැනීමට පියවර ගන්නා ලෙසට උපදෙස් දෙන ලදි. |
| **බස්නාහිර පළාත් සභාව<br>2019 අගෝස්තු 22** | | |
| 01. | කොළඹ අධ්‍යාපන කලාපයේ ගුරුවරුන්ගේ හා නිලධාරින්ගේ 2015 වර්ෂය අවසාන වන විට පැවති වැටුප් රහිත නිවාඩු සඳහා අයවිය යුතු මුදල රු. මිලියන 7.7ක් වීම. | මෙම මුදලින් රු. මිලියන 5.8ක් අයකරගෙන අවසන් බවත්, රු. මිලියන 1.9ක මුදලක් තවමත් අයවෙමින් පවතින බවත් ග.නි. පැවසීය. |
| 02. | 2007 වර්ෂයේදී බෙටන්ස් ගෘප් සමාගම වෙත වර්ෂ 50කට බදු දී ඇති, මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩමේ ව්‍යාපාර කටයුතු ආරම්භ නොකිරීම නිසා වර්ෂයකට රු. 144,000/-ක් බැගින් අවුරුදු 12කට ලැබිය යුතු බදු ආදායම නොලැබීම හා බද්ද අවලංගු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. | අදාල සමාගම විසින් මෙම ඉඩමේ කර්මාන්ත ආරම්භ කර නොතිබූ හෙයින් එයට බදු අනුමත වී නොතිබුණු බවත්, දිගින් දිගටම කර්මාන්ත කටයුතු ඇරඹීම ප්‍රමාද කළ හෙයින් ප්‍රාදේශීය ලේකම් විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඉඩම නැවත පවරා ගෙන ඇති බවත්, සුදුසු ආයෝජකයෙකු සොයා ඉඩම නැවත බදු දීමට ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් දී ඇති බවත් ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 03. | මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෙට්ල්වුඩ් ඉන්ඩස්ට්‍රීස් හා සන්වෙල් ඉංජිනියරින් (පුද්) සමාගම් දෙක වෙත 2007 වර්ෂයේ සිට දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී තිබූ ඉඩම් සඳහා 2017 දෙසැම්බර් වන විට පිළිවෙළින් රු. 2,994,750/-ක හා රු. 3,872,000/-ක බදු මුදල් ගෙවා නොතිබීම. | මෙම සමාගම්හි හිඟ හිටි බදු මුදල් කොටස් වශයෙන් ගෙවීමට ඔවුන් එකඟතාවයකට පැමිණි බවත්, නමුත් මෙම වසරේ දෙසැම්බර් මස සිට එම එකඟතාවය කඩ කරමින් බදු මුදල් ගෙවීම පැහැර හැරීම නිසා සිහි කැඳවීම් කර ඇති බවත්, අනතුරුව බදු අනුමැතිය අවලංගු කිරීමට සඳහා ඉදිරි කටයුතු සිදු කරන බවත් ග.නි. පැවසීය. |
| 04. | දොඩම්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 11 පර්චස් 26ක ගල්ලෙනයාලන්ද නමැති ඉඩම බදුකරු විසින් ව්‍යාජ ඔප්පු සකස්කර පුද්ගලයන් 20 දෙනෙකුට විකුණා තිබීම. | ඉඩම නැවත පවරාගැනීමටත්, කච්චේරි ක්‍රමයට අනුකූලව පදිංචිකරුවන් විධිමත්ව ඉන් බැහැර කිරීමට කටයුතු කරන ලෙස ඉඩම් කොමසාරිස් ජෙනරාල් විසින් ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් දී ඇති බවත්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු වන බවත් අනාවරණය විය. |
| 05. | බස්නාහිර පළාතේ දහම් පාසැල් සඳහා පොදු පහසුකම් සැලසීමේ “සරුදම් අරුණැල්ල” ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා රු. 261,114,300/-ක මුදලක් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට ලැබී තිබුණ අතර, එයින් ප්‍රචාරණ හා සංග්‍රහ කටයුතු සඳහා රු. මිලියන 16ක වියදමක් දරා තිබීම. | මෙවැනි ව්‍යාපෘතියක් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ විෂය පථය යටතට වැටුණේ කෙසේද යන්න ප්‍රශ්නකාරී වූ අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ බලතල තම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට පැවරීමේ හැකියාව ඇති බව පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්තුමිය පැවසීය. ආයතනයක විෂය පථය යටතට නොවැටෙන ව්‍යාපෘති මෙයාකාරයෙන් පැවරීමේ හැකියාව ඇති බව සහතික කරමින් ලිපියක් සතියක් තුළ (2019.08.29) ඉදිරිපත් කරන ලෙස කාරක සභාව පළාත් ප්‍රධාන අමාත්‍යාංශයීය ලේකම්ට නියෝග කළේය.<br><br>**ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට මෙවැනි සමාජයීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති කිරීම සඳහා වූ විධිවිධාන ප්‍රඥප්තියේ අන්තර්ගත බව සඳහන් කරමින් මෙම ව්‍යාපෘතිය ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලීය** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරී/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **අනුමැතිය ලත් සංදේශයද සහිත පිළිතුරක් කාරක සභාවට යොමුකර තිබුණි.** |
| 06. | 2010 වර්ෂයේ ඉදිකිරීම අරඹා තිබූ මීගමුව ඡත්තුකාල වෙරළ උද්‍යානය වෙනුවෙන් 2015 වසර අවසන් වන විට රු. 165,921,430/-ක වියදමක් දරා තිබුණි. එහි ජල ක්‍රීඩාංගනය 2017 වසරේ බදු දී තිබූ නමුත් ගිවිසුම් ප්‍රකාරව බදුකරු බදු මුදල් නොගෙවීම හේතුවෙන් බදු ගිවිසුම අවලංගු කළද බදුකරු විසින් 2018 අගෝස්තු වන විටද එහි ආදායම් උපදවමින් සිටීම. | බදුකරු බදු මුදල් නොගෙවීම හේතුවෙන් බදු ගිවිසුම අවලංගු කර මේ වන විට වෙරළ උද්‍යානය මීගමුව මහ නගර සභාවට භාරදී තිබුණි. එසේම විධිමත්ව ගිවිසුම්ගත වීම සඳහා ගිවිසුම් කෙටුම්පත මීගමුව මහ නගර සභාවට භාර දී ඇති බවත්, ඉන් ලැබෙන ආදායමෙන් 20%ක් සංචාරක මණ්ඩලයට ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් ග.නි. සඳහන් කළේය. |
| 07. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2012 වසරේදී රු. මිලියන 158ක් වියදම් කර මිලට ගත් කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර දෙකක් සහ රු. මිලියන 6ක් වටිනා කර්බ් යන්ත්‍රයක් මේ වනවිටත් නිෂ්ක්‍රීයව පැවතීම. | පසුගිය කාරක සභාවේ ලබා දුන් නියෝගය පරිදි මෙම යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීම සඳහා දැනටමත් කටයුතු අරඹා ඇති බවත්, මෙම වසර සඳහා රු. මිලියන 32ක ව්‍යාපෘති අනුමත වී ඇති බැවින් එම ව්‍යාපෘති සඳහා මෙම යන්ත්‍ර යොදාගැනෙන බවත් ග.නි. පැවසීය. |
| 08. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට භුක්තිය පමණක් හිමි අක්කර 10ක පමණ භූමි ප්‍රදේශයක නෛතික හිමිකාරිත්වයක් නොමැති පිරිස් දීර්ඝකාලීනව පදිංචිව සිටීම. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල සේවය කළ කම්කරුවන් එම ඉඩම්වල පදිංචිව සිටින බවත්, මෙම තත්ත්වය නිරවුල් කර අධිකාරිය සතු භූමි ප්‍රදේශය හැර ඉතිරි ඉඩම් කොටස් පවරා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ඇති බවත් ග.නි. පැවසීය. |
| 09. | පළාත් සභාවට අයත් මාර්ග ගැසට් කිරීම. | මේ වන විට පළාත් සභාවට අයත් මාර්ග ගැසට් කිරීම සඳහා සැළැස්මක් සකසා පළාත් පාලන ආයතනවලින් තොරතුරු කැඳවීමද සිදු කර ඇති බවත්, ඊට පළාත් සභාවෙන්ද මූල්‍යමය දායකත්වයක් ලබා දීම සඳහා 2020 මූල්‍ය ප්‍රකාශනයෙන් රු. මිලියන 100ක මුදලක් වෙන් කිරීමට නියමිත බවත් ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 10. | වත්තල මාබෝල නගර සභාව සතු පිඹුරුපත් අංක 1377C ලොට් අංක 1A2 පර්චස් 79ක් වූ විශාල ඉඩම විකිණීම, ටෙන්ඩර් පටිපාටියට බාහිරව ක්‍රියා කිරීම හා බදු ගිවිසුමට පටහැනිව ක්‍රියා කිරීම. | නීතිපති උපදෙස්ද ලබාගනිමින් මෙම ගිවිසුම අවලංගු කොට මෙම ඉඩම නැවත රජයට පවරාගැනීමට ක්‍රියා කරන ලෙස ප්‍ර.ග.නි. / ග.නි.ට නියෝග කළ කාරක සභාව මේ වන තෙක් ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග, පත් කරන ලද කමිටු, නිර්දේශ, ප්‍රගතිය ගැන සඳහන් කරමින් වාර්තාවක් 2019 සැප්තැම්බර් 10ට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය.<br><br>**2019.10.01 දින මෙම ඉඩම වත්තල මාබෝල නගර සභාවට පවරාගෙන 2019.10.02 දින ඔප්පුව ලියාපදිංචි කර ඇති බව සඳහන් කරමින් අදාළ ලිපිලේඛන කාරක සභාවට ඉදිරිපත් කර තිබුණි.** |
| 11. | දෙල්ගොඩ බස් නැවතුම්පල හා කඩ කාමර 13ක් 2013 වර්ෂයේ රු. 32,292,635/-ක් වැයකර ඉදිකිරීම් අවසන් කර තිබුණද 2018 පෙබරවාරි වනවිටත් එම කඩකාමර කුලියට දී නොතිබුණි. | මෙම කඩ බදු දීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කර ඇතත්, කඩ කාමර දෙකක් සඳහා පමණක් ගැණුම්කරුවන් ඉදිරිපත් වී ඇති බව ග.නි. පැවසීය. |
| 12. | වර්ෂ 5කට අධික කාලයක සිට අය නොවී පවතින රු. 36,015,848/-ක් වටිනා ණය ගැති ශේෂයන් 14ක් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ අතර එම ශේෂයන් අයකර ගැනීමට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ක්‍රියාකර නොතිබුණි. මෙම මුදලින් රු. 962,192/-ක මුදලක් පමණක් මේ වන විට අය වී තිබුණි. | කරදියාන අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගනයට අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා දෙහිවල හා මොරටුව පළාත් පාලන ආයතනවලින් ගෙවිය යුතු මුදල් මෙලෙස අය කර ගැනීමට ඇති අතර, එම මුදල් අය කරගැනීම සඳහා කමිටුවක් පත් කර, කමිටු නිර්දේශ අනුව ක්‍රියාකිරීමට නියමිත බව ග.නි. පැවසීය.<br><br>තවද, 2020 වර්ෂයේ අග භාගය වන විට කරදියාන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයත්, 2020 වර්ෂයේ මාර්තු මස වන විට කෙරවලපිටිය අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයත් විවෘත කිරීමට නියමිත බවත් ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| **ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය 2019 අගෝස්තු 23** | | |
| 1 | උසස් අධ්‍යාපනය සඳහා වූ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් වෙන්කරන ලද ආසන්න ලෙස රු. 175,000,000/-ක ප්‍රතිපාදන වලින් රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය ඇතිව සී/ස උසස් තාක්ෂණවේද ඇප සුරැකුම් ආයතනය සංස්ථාගත කිරීම. | මෙම උසස් තාක්ෂණවේද ඇප සුරැකුම් ආයතනයෙහි ව්‍යාපෘති වාර්තාව පිළිබඳ වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කරන ලදි.<br><br>**උසස් තාක්ෂණවේද ඇප සුරැකුම් ආයතනයෙහි ව්‍යාපෘති වාර්තාව හා ඊට අදාළ තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත.** |
| 2. | ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි නොවූ මූල්‍ය ආයතන පැවතීම. | පසුගිය වසර 20ක කාලය තුළ ශ්‍රී ලංකා මහා බැංකුවේ පවතින නීතිරීතිවලට පටහැනිව තැන්පතු පවත්වාගෙන ගොස් මහා බැංකුවේ අධීක්ෂණයට ලක්ව නීතිමය පියවර ගත් ආයතන, ඊට සම්බන්ධ අධ්‍යක්ෂවරු හා ලබා දුන් දඬුවම් කවරේද යන්න පිළිබඳ වාර්තාවක් 2019.09.10 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි.<br><br>**අවසර නොලත් තැන්පතු භාර ගන්නා ආයතනවලට එරෙහිව ගත් නීතිමය පියවර ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත. (ඇමුණුම 09)**<br><br>පසුගිය වසර 5 තුළ ශ්‍රී ලංකා මහා බැංකුව විසින් පුවත්පත් හරහා මෙවැනි මූල්‍ය සමාගම් පිළිබඳ ජනතාව දැනුවත් කළ අවස්ථා ඇතුළත් වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි.<br>**මීට අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත. ඒ අනුව 2014 වර්ෂයේ සිට දළ වශයෙන් දසවතාවක් පුවත්පත් හරහා** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **ජනතාව දැනුවත් කර ඇති බව අනාවරනය කර ඇත.**<br><br>අද වන විට ශ්‍රී ලංකා මහා බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනවලට අමතරව අවසරයකින් තොරව තැන්පතු භාර ගන්නාවූ ආයතන පවතී නම් ඒ පිළිබඳ වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි.<br>**මීට අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත. (ඇමුණුම 10)** |
| .3 | අමාත්‍යාංශ කාර්යභාරයට අයත් නොවූ ක්‍රියාකාරකම් දෙකක් වෙනුවෙන් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය දැන්වීම් පළකිරීම වෙනුවෙන් පිළිවෙලින් රු 12,853,800/-ක් හා රු.26,862,775/-ක් 2016 වර්ෂයේදී වැයකර තිබීම. | එම ප්‍රචාරණ වියදම් දැරීම සඳහා නීත්‍යානුකූලව විශේෂ අවසරය ලබා දී ඇති ලිපිය මසක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි.<br>**මීට අදාළ ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත.** |
| .4 | උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ක්‍රියාවලිය . | උපාධිධාරීන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දීම වෙනුවෙන් වැඩසටහනක් දින වකවානු සහිතව සකස් කර 2019.09.15 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි.<br>**මීට අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත.** |
| .5 | මෙම අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යයන්. | මෙම අමාත්‍යාංශයේ අරමුණුවල අන්තර්ගත “දිළිඳුකම පිටු දැකීම” යන අරමුණ සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි.<br>**මේ පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත්කර ඇත. ඒ අනුව පහත සඳහන් අංශ සහ ආයතන මෙම** |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
| | | **වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දායකවන බව දන්වා ඇත.**<br>**(සැලසුම් අංශය, සංවර්ධන අංශය, නැවත පදිංචි කිරීම්, පුනුරුත්ථාපන හා උතුරු පළාත් සංවර්ධන අංශය, තල් සංවර්ධන මණ්ඩලය, හානිපූරණය සඳහා වන කාර්යාලය,ජාතික යොවුන් සේනාංකය, සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සංගමය, ශ්‍රී ලංකා මහ බැංකු, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව)** |
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**<br>**2019 සැප්තැම්බර් 04** | | |
| 01. | රියදුරු බලපත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු නොකර BOO පදනම යටතේ නව ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරමින් පැවතීම. | මේ සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලයෙන් සකස් කළ වාර්තාව පදනම් කරගනිමින්, මුදල් අමාත්‍යාංශයේ සහයෝගයද ලබා ගනිමින්, රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා නියමිත දින වකවානුවලදී ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක නොවුණු කරුණු හා ඒවාට හේතු සඳහන් කරමින් 2019.09.15ට පෙර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./.ග.නි.ට නියෝග කළේය.<br><br>රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය රජයට පවරා ගැනීමට කටයුතු කළ යුතු බවට නැවතත් නියෝග කළ කාරක සභාව රියදුරු බලපත්‍රයක ගාස්තුව අඩු කිරීමට ක්‍රියා කළ යුතු බවද, රියදුරු බලපත් මුද්‍රණ උපකරණ හා තාක්ෂණය වර්තමානයට අනුකූලව යාවත්කාලීන කොට රජයට පවරා ගත යුතු බවද, රියදුරු බලපත්‍ර මුද්‍රණ ක්‍රියාවලිය ආයතනයේ ව්‍යාපෘතියක් ලෙස නම් කර නිලධාරින් බඳවාගෙන, පුහුණු කර, වෙනමම ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු බවද නිර්දේශ කරන ලදී. එසේ ව්‍යාපෘතිය යටතේ සිදු කළ නොහැකි ක්‍රියාවලි සඳහා අවශ්‍යතාවයක් තිබේ නම් සේවා ගිවිසුමකට යොමු වීමට හැකි බවද කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | ඉහත කාරක සභා නියෝග පිළිබඳව අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කොට ගත් තීරණ පිළිබඳ වාර්තාවක් 2019.09.15ට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br><br>**මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යවරයා සමඟ කළ සාකච්ඡා සටහන් කාරක සභාවට ඉදිරිපත් කර තිබුණු අතර එහිදී මෙම කර්තව්‍යය රජයට පවරා ගැනීමේදී රජය සතු ව්‍යාපෘති කාර්යාලයක් පිහිටුවීම හා මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම රජයට අමතර බරක් නිර්මාණය වනු ඇතැයි පෙන්වා දී තිබුණි. එසේම BOT ගිවිසුම් ප්‍රකාරව “පැවරීම” කොටස යටතේ රියදුරු බලපත්‍ර පද්ධතියේ සියලු වත්කම් පවතින කොන්ත්‍රාත් කාලසීමාව අවසන් වන විට රජයට පවරා ගැනීම සහ රියදුරු බලපත්‍රයක් සඳහා දැනට ගෙවනු ලබන මිල අඩු කරන මෙන් වත්මන් සැපයුම්කරු සමඟ සාකච්ඡා කිරීම සුදුසු බවද දක්වා තිබුණි.** |
| 02. | ඉ-මෝටරින් ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය | අදාළ ගිවිසුම ගිවිසුම්ගත කිරීමේදී තිබූ අඩුපාඩු සහ ගිවිසුමට අළුතින් ගිවිසුම් අවශ්‍යතාවයන් එකතු කිරීම සඳහා යම් කාලයක් ගත වූ බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිනය 2020 මාර්තු දක්වා දිගු වූ බවත් එය සමාගමේ ප්‍රමාදයක් හේතුවෙන් සිදුවූවක් නොවන බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br><br>ඉ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව මෝටර් රථ ප්‍රවාහන පනතේ ඊට අදාළ නීති දැනට සම්පාදනය කර නොමැති බව කාරක සභාව කළ විමසීම හමුවේ ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. ව්‍යාපෘතියට අදාළ ගොඩනැගිලි අවශ්‍යතා හා නීතිමය අවශ්‍යතා සපුරාගෙන අවසන් කළ හැකි දින වකවානු ඇතුළත් වාර්තාවක් 2019.09.15ට පෙර ඉදිරිපත් කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරී/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම 11 )** |
| 03. | දෙපාර්තමේන්තුගත තනතුරු දරණ නිලධාරින් අනුරූප ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහනය කිරීම. | දෙපාර්තමේන්තු සේවයට බඳවා ගත් නිලධාරීන් ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය කිරීම ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමේ අධිකරණ නියෝගයක් 2019 සැප්තැම්බර් 23 දක්වා පවතින බවත්, ඒ සම්බන්ධයෙන් රජය වෙනුවෙන් නීතිපතිවරයා පෙනී සිටින බවත්, එහිදී කාරක සභාව පෙර දුන් නියෝග සහ අමාත්‍යාංශයේ ස්ථාවරය නීතිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබෙන බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ආයතනගත තනතුරු මින් ඉදිරියට ඒකාබද්ධ සේවයෙන්ම බඳවා ගත යුතු බවත් කාරක සභාව අවධාරණය කරන ලදී. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ පටිපාටිය හා අනුමිත සේවක සංඛ්‍යාව අනුව ඒකාබද්ධ සේවයේ නිලධාරීන් බඳවා ගත නොහැකි තනතුරු තිබේ නම් ඒ මොනවාද යන්න හා ඊට හේතු සඳහන් කරමින් වාර්තාවක් 2019.09.15ට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේද නිර්දේශයද 2019.09.15ට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නියෝග කරන ලදී.<br><br>**මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ හා මුදල් අමාත්‍යාංශයේ වාර්තා ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම 12 )** |
| **මධ්‍යම පළාත් සභාව<br>2019 සැප්තැම්බර් 05** | | |
| 1. | මධ්‍යම පළාතේ අධ්‍යාපන කලාප 8ක ගුරු පුරප්පාඩු 701 ක් පවතින | පුරප්පාඩු පවතින්නේ දුෂ්කර කලාපවල වන අතර පළාත තුළ ගුරු මාරු ප්‍රතිපත්තිය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | අතර අධ්‍යාපන කලාප 7ක ගුරු අතිරික්ත 901 ක් පැවතීම | ක්‍රියාත්මක කරමින් ගුරු තුලනය සඳහා කටයුතු කරන බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>පළාත් සභාව යටතේ මහනුවර කලාපයේ සිටින ගුරුවරු 3777 සම්බන්ධයෙන් ගුරුවරයාගේ නම, ගුරුවරයා සේවය කරන පාසැල, සේවා කාලය, විශ්‍රාම යාම සඳහා ඉතිරි වී ඇති සේවා කාලය, නුවර කලාපයේ පළමු පත්වීමේ දිනය, එම ගුරුවරුන් දිනකට සේවය කරන කාල පරිච්ඡේද ගණන, එම ගුරුවරුන් ඉගැන්වීමේ කටයුතුවලට අමතරව පරිපාලන කටයුතු සඳහා යොදවා ඇත්නම් එම තොරතුරු ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් 2019.09.25 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**පිළිතුරු වාර්තාව ලැබී ඇත.** |
| 2. | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, සමූපකාර දෙපාර්තමේන්තුව, සමූපකාර සේවා කොමිෂන් සභාව, මාතලේ, උකුවෙල හා යටවත්ත ප්‍රාදේශීය සභා නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබීම | පළාත් සභාව යටතේ පවතින ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු නිසි පරිදි පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් සභාව විසින් අධීක්ෂණය කළ යුතු බව අවධාරණය කළ කාරක සභාව 2019 වසර සඳහා පළාත් සභාවට අයත් සෑම ආයතනයකම වෙන් වෙන් වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විම සම්බන්ධයෙන් වාර්තාවක් මාසයක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව ලැබී ඇත.** |
| 3. | 2009 වසරේ සිට 2011 වර්ෂය දක්වා විදුලි ව්‍යාපෘති 62 ක් සඳහා රු. මිලියන 15ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවා තිබුණද, මේ වන විටත් මෙම ව්‍යාපෘති සම්පූර්ණ කර නොමැති වීම සම්බන්ධයෙන් එම ව්‍යාපෘති පිළිබඳව වාර්තාවක් 2017.03.25 | එම ව්‍යාපෘති මේ වන විට සම්පූර්ණ කර ඇති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>ව්‍යාපෘති සම්පූර්ණ කිරීම පිළිබඳ වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ ග.නි වෙත කාරක සභාව නියෝග කරන ලදි.<br>**එම වාර්තාව ලැබී ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | දිනට පෙර ඉදිරිපත් කරන ලෙස නියෝග කර තිබුණද, එම නියෝගය පරිදි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබීම | **එම වාර්තාවට අනුව විදුලි දිගු 53ක් සම්පූර්ණයෙන් නිම කර ඇති අතර ඉතිරි 9 සබරගමුව පළාත් සභාවට අයත් බැවින් එම විස්තර ගෙන්වා ගැනීමට ලිපි යොමු කර ඇති බව දන්වා ඇත.** |
| 4. | මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පවතින අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු ඒකකයේ රු. 15,200,000/- ක ඉන්ධන අවභාවිතාව පිළිබඳ විගණන ඡේදවලට අදාළ විමර්ශන කටයුතු 2008 වර්ෂයේ සිට මන්දගාමීව පැවතීම | 1994 වසරේ සිට පැවත එන මෙම සිදුවීමට අදාළ අලාභය වාරික වශයෙන් හෝ අය කර ගැනීමට කටයුතු කර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව ලැබී ඇත.<br>ඒ අනුව, ඇතැම් පරීක්ෂණ තවමත් සිදු වෙමින් පවතින බවත්, පරීක්ෂණ අවසන් කටයුතු සම්බන්ධයෙන් අදාළ අය කර ගැනීම් සිදු වෙමින් පවතින බවත් සඳහන් කර ඇත.** |
| 5. | පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ලිපිගොනු විනාශ කිරීම සම්බන්ධ සිදුවීමක් 2019 මාර්තු මස 19 වන දින සිදු වී ඇති බව අනාවරණය වී ඇත. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කර වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති බවද, සාමාන්‍යාධිකාරිවරයාගේ වැඩ තහනම් කර ඇති බවද ප්‍ර.ග.නි/ග.නි පැවසිය. ඊට අමතරව ජනාධිපති කාර්යාලය මගින්ද, මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන බව මෙහිදී අනාවරණය විය. | අමාත්‍යාංශ මට්ටමින් සිදු කරන ලද විමර්ශනයේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති බැවින් ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මෙම කරුණ යොමු කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**2019.09.20 දින පැවති මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇති බවද, ඒ අනුව, ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලය විසින් සිදු කළ විමර්ශනය හා ජනාධිපති විමර්ශන ඒකකය මගින් සිදු කරන ලද විමර්ශනය මගින් අනාවරණය වූ කරුණු අනුව ජනාධිපති ලේකම්තුමාගේ නියෝගය තීරණයක් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති බවද දන්වා ඇත.** |
| 6. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ නේවාසික සැපයුම් ඒකකයේ | අත්තිකාරම් මුදලේ හිඟය හා කාර්යසාධන ඇපකරයේ වටිනාකම අය කර ගැනීමට සෙලින්කෝ ඉන්ෂුවරන්ස් ආයතනයට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | ඉදිකිරීම් භාර කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 8.5ක මුදලක් ගෙවා ඇතත් ඉදිකිරීම් කටයුතු සිදු කර නොතිබීම | විරුද්ධව නඩු පවරා ඇති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. කොන්ත්‍රාත්කරුට විරුද්ධව කිසිදු පියවරක් ගෙන නොමැති බවත්, මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් කිසිදු පරීක්ෂණයක් සිදු කර නොමැති බවත් කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් ප්‍ර.ග.නි/ ග.නි පැවසිය.<br><br>මෙම සිදුවීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර, අවශ්‍ය කටයුතු සිදු කර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය. |
| 7. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ රු.41,461,389/ -ක ප්‍රතිපාදන මත ඉදි කර 2017 මාර්තු මාසයෙහි මහජන අයිතියට පත් කරන ලද විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වකුගඩු රෝගී සායන රෝහල වෛද්‍යවරුන් නොමැතිකමින් ගොඩනැගිල්ල හා උපකරණ නිශ්කාර්යව පැවතීම. | මේ රෝහලේ වැඩ කටයුතු 10%ක් නිම කිරීමට ඇති බවද, මෙහි මේ වන විටත් වකුගඩු සායන පවත්වා ගෙන යන බවද, රෝහලේ වැඩ සම්පූර්ණ කිරීමට අමාත්‍යාංශය වෙත දන්වා ඇති බවද ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. |
| 8. | ප්‍රමිතියෙන් තොර වීම නිසා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ඉවත් කරන ලද කල් ඉකුත් නොවූ ඖෂධවල වටිනාකම දළ වශයෙන් රු.3,028,815/- කි. එසේම, සමාලෝචිත වර්ෂයේදී මහනුවර දිස්ත්‍රික්කයට අයත් රෝහල් සඳහා ඉල්ලුම් කළ ඖෂධ වර්ග 76ට අයත් ඖෂධ කිසිවක් ලැබී නොතිබිණි. | ඖෂධවල ප්‍රමිතිය අඩුවීම නිසා හා එම ඖෂධ ලැබෙන අවස්ථාවේදී කල් ඉකුත්වීමට ආසන්න තත්ත්වයේ පැවතීම හෝ කල් ඉකුත් වී තිබීම නිසා අපපහරණය කිරීමට සිදු වූ බවද, එමෙන්ම ප්‍රසම්පාදන කටයුතුවලට විශාල කාලයක් ගතවීම නිසා ඖෂධ ලැබීමේ ප්‍රමාදයක් පැවතීම මෙයට හේතු වී ඇති බව ද ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 9. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන් 09 දෙනෙකු සඳහා | පිළිගත් සේවාවන්ගේ සුදුසුකම් ලත් ඉංජිනේරුවරුන්ට වෘත්තීය දීමනා ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගෙන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය රහිතව රු.2,295,000/ - ක්ද, සුදුසුකම් සපුරා නොමැති ඉංජිනේරුවරු 06 දෙනෙකු සඳහා රු. 2,460,000/- ක් ද වශයෙන් වෘත්තීය දීමනා ගෙවා තිබුණි. ඉංජිනේරුවරුන් 08 දෙනෙකුට එකම කාල පරිච්ඡේදයක් සඳහා වෘත්තීය දීමනාව හා ඉංජිනේරු දීමනාව වශයෙන් දීමනා 02ක් ගෙවීම හේතුවෙන් රු. 930,000/ - ක් වැඩිපුර ගෙවා තිබීම | ඇති බවද, සුදුසුකම් නොලත් ඉංජිනේරුවරුන්ට මෙම දීමනා ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇති බවද, ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. එමෙන්ම, එකම කාල පරිච්ඡේදයක් සඳහා ගෙවූ වෘත්තීය දීමනාව හා ඉංජිනේරු දීමනාව ගෙවා ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බවද, විගණනයේදී කරුණු පෙන්වා දිම මත එම දීමනා ගෙවීම මේ වන විට නවත්වා ඇති බවද ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 10. | ප්‍රධාන තක්සේරුකරුගේ 2014.07.16 දිනැති ලිපිය අනුව නුවරඑළිය යුනික්වීව් නමැති රජයේ නිවස සහිත ඉඩම 2005 වර්ෂයේදී රු. 14,000,000/- ලෙස හා 2014 වර්ෂයේදී රු. 23,000,000/-ක් ලෙස තක්සේරු කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අයවිය යුතු බදු කුලිය රු.5,600,000/- ක් වුවද, ඒ සඳහා අයකර තිබුණේ රු.162,000/- ක් වූ ආර්ථික කුලියක් පමණි. නිසි පදනමකින් තොරව අය කර තිබූ මෙම ආර්ථික කුලිය හේතුවෙන් මධ්‍යම පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවට රු.5,438,000/ ක පාඩුවක් සිදු වීම | 2008 සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මෙම ගොඩනැගිල්ල භාවිතා කරන බවත් 2015.09.01 දින සිට වාර්ෂික අවසර පත්‍රයක් මත බදු දීමට කටයුතු කර එදින සිට වාර්ෂික බදු මුදල් අය කරන බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසීය. |
| 11. | විල්ගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් හෙට්ටිපොල නව ව්‍යාපාරිකයන් හා පදිංචිකරුවන් 17ට ලබා දී තිබූ ඉඩම්වලින් කිසිදු බදු මුදලක් අයවී නොතිබුණි. 2001 වර්ෂයේ මෙම ඉඩම් තක්සේරු කර ඇතත් වර්ෂ 15ක කාලයක් තුළ ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම | ඉඩම් කච්චේරියක් පවත්වා කටයුතු නියමානුකූල කර, බදු නිසි පරිදි අය කර වාර්තාවක් කාරක සභාව වෙත එවන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව ලැබී ඇති අතර ඒ අනුව අදාළ බදුකරුවන් බදු ගෙවීමේ අපහසුතාවය ප්‍රකාශ කර ඇත. එබැවින්, විල්ගමුව ප්‍රාදේශීය ලේකම්** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | **විසින් ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබා ගැනීමට ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්, මාතලේ දිස්ත්‍රික් ලේකම් හා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවන ලද ලිපියක් ඉදිරිපත් කර ඇත.** |
| 12. | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කුඩා ජල විදුලි බලාගාර 06න් අයවිය යුතු රු. 7,718,600/ -ක බදු මුදල් හා රජයේ ඉඩම්වලින් දීර්ඝ කාලීන බදු ලෙස අයවිය යුතු රු. 909,154/ ක් අය කර නොතිබීම | ජල විදුලිබල නිෂ්පාදනය වෙනුවෙන් බද්දක් අය කර ගැනීමේ හැකියාව සොයා බලන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය. මෙම කරුණ දැනටමත් නීතිපති වෙත යොමු කර ඇති බව ප්‍ර.ග.නි/ ග.නි පැවසීය.<br><br>නීතිපති මතය අනුව කටයුතු කර කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම කරුණ නීතිපති වෙත යොමු කර නොමැති බව අනාවරණය වී ඇත. වතු සමාගම්වලට අයත් ඉඩම් තුල බලාගාර ඉදිකර ජල විදුලිය නිෂ්පාදනය කර ඇති බැවින් ජල හැරවුම් බද්ද අය කර ගැනීමට බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ කටයුතු කර නොමැති බවද හෙළි වී ඇත. ජල මූලාශ්‍රයේ අයිතිය තහවුරු කර ගැනීමෙන් පසු බලපත්‍ර ලබාදී හිඟ මුදල් සමග ජල හැරවුම් බදු අය කර ගැනීමට කටයුතු කරන බව අදාළ වාර්තාවේ සඳහන් කර ඇත.**<br><br>එමෙන්ම, මධ්‍යම පළාත තුල පිහිටුවා ඇති විදුලි බලාගාර 38 නම් හා ලිපිනයන්, මේ අතරින් රජයේ ඉඩම්වල ස්ථාපිත කර ඇති විදුලි බලාගාර, පෞද්ගලික ඉඩම්වල ස්ථාපිත කර ඇති විදුලි බලාගාර, පෞද්ගලික ඉඩම්වලින් ගන්නා බදු ආදායම කොපමණද/ බදු අය කිරීමේ පදනම, දෛනික, මාසික හා වාර්ෂික ජල විදුලි නිෂ්පාදනය, මෙම බලාගාර සඳහා රජයේ ඉඩම් ලබා දී ඇති පදනම, බදු අය කිරීමේ පදනම, බදු අය කිරීමේ තක්සේරුව යන තොරතුරු ඇතුලත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | වාර්තාවක් මාසයක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**මෙම වාර්තාව ලැබී ඇත.**<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) හා පළාත් ආදායම් කොමසාරිස් ප්‍රමුඛ කමිටුවක් පත් කර පළාත් තුළ ආදායම වැඩි කර ගැනීම සඳහා ගනු ලබන පියවර සම්බන්ධ වාර්තාවක් සති 2ක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**යෝජනා 3ක් ඇතුලත් වාර්තාව ලැබී ඇත.** |
| 13. | වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මානෙල්වල හයිඩ්‍රොපවර් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා භාවිතා කර තිබූ රජයේ ඉඩම සඳහා 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වාර්ෂික බලපත්‍ර වෙනුවෙන් අයවිය යුතු රු. 1,042,340/ -ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබීම | වලපනේ ප්‍රාදේශීය ලේකම්ගේ 2019.07.24 දිනැති ලිපියෙන් බලපත්‍ර ගාස්තු ගෙවන ලෙස දන්වා ඇතත් මෙතෙක් එම මුදල් ගෙවා නොමැති බව විගණකාධිපතිවරයා විසින් වාර්තා කර තිබුණි.<br><br>මෙම ගාස්තු අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.<br><br>**ප්‍රාදේශීය ලේකම් විසින් අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා පියවර ගෙන ඇති බව වාර්තා කර ඇත.** |
| 14. | මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා 2017.07.23 දින පැවති තරඟ විභාගයෙන් බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් නියමිත ලකුණු මට්ටමට වඩා අඩුවෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් 27 දෙනෙකු සඳහා පත්වීම් ලබා දී තිබීම | ගරු ආණ්ඩුකාරවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මෙම බඳවා ගැනීම් සිදු කර ඇති බව ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 15. | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කටුකිතුල ගිමන් හල බදු ගැනීමේදී එකඟ වූ බදු කොන්දේසි උල්ලංඝනය කරමින් තෙවන පාර්ශවයකට අවස්ථා දෙකකදී වර්ෂ 3 බැගින් උපබදු දී තිබුණු අතර ඔවුන් විසින් රු. මිලියන 6ක් වැය කර ස්ථාවර ඉදිකිරීම් සිදු කර ආකෘතිමය වෙනස්කම්ද සිදු කර තිබුණි. 2018.06.30 දින වන විට තෙවන පාර්ශවයෙන් රු. 1,274,890/- ක උප බදු මුදලක් අයවීමට තිබියදී නැවත වරක් එම ආයතනයටම උප බදු දී තිබීම | මේ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත එවන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කරන ලදී.<br><br>**අදාළ වාර්තාව ලැබී ඇත.**<br><br>**එම වාර්තාවට අනුව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අදාළ ස්ථානය පවත්වා ගෙන යන ලද ග්‍රීන් පාක් හෝල්ඩින්ග්ස් ආයතනය එම ස්ථානය අතහැර ගොස් ඇති බව නිරීක්ෂණය වී ඇති බවත්, එම ගොඩනැගිල්ල විධිමත් පරිදි භාරදී නොමැති බැවින් විධිමත් පරිදි භාර දෙන ලෙස දන්වා යවා ඇති නමුත් මේ වන විටත් මෙම දේපොළ විධිමත් පරිදි භාරදී නොමැති බවත් දන්වා ඇත.** |
| 16. | (අ) මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් හඟුරන්කෙත ගෝනගන්තැන්න ප්‍රාදේශීය රෝහලේ මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානයේ වර්ග අඩි 2000ක පමණ වන බිම් මහල 2003 වර්ෂයේදී රු. 2,000,000/-ක් වැය කර ඉදි කර 2004.02.15 දින විවෘත කර තිබුණු නමුත් සායන ආරම්භ කර නොතිබුණි. 2016 හා 2017 වර්ෂවලදී රු. 6,916,173/- ක් වැය කර පළමු මහල ඉදිකර වහල සවිකොට නිමකර තිබුණු නමුත් 2019 අගෝස්තු වන විටත් භාවිතයට නොගෙන වල් වැදී තිබුණි.<br><br>(ආ) හඟුරන්කෙත නගරයේ නව දෙමහල් ආයුර්වේද රෝහලක් ඉදි කිරීම සඳහා 2005 වර්ෂයේදී සැලසුම් සකස් කර රු. ලක්ෂ 25ක් පමණ වැය කර වර්ග අඩි 1500ක් පමණ වන බිම් මහල පමණක් ඉදිකර කොන්ක්‍රීට් තට්ටුව දමා තිබුණු නමුත් ඉතිරි වැඩ නිම | මේ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කරන ලදී.<br><br>**එම වාර්තාව ලැබී ඇත. (ඇමුණුම 13)** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | නොකර මේ දක්වා අවභාවිතව තිබුණි.<br><br>(ඇ) මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බලපෑමට ලක්වන රජයේ ආයතනයක් ලෙස දැනුවත්ව තිබූ කෝන්ගහවෙල ප්‍රාදේශීය රෝහලේ 2016 වර්ෂයේ රු. 2,738,410/ ක් වැය කර හදිසි අනතුරු ඒකකයක් ඉදිකර තිබුණු නමුත් එම රෝහල මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතියට යටවූ බැවින් එම ඉදිකිරීම සඳහා වැය වූ මුදල නිෂ්ඵල වී තිබුණි<br><br>(ඈ) පල්ලෙපොල ප්‍රාදේශීය රෝහලේ 2004 වර්ෂයේදී රු. 5,000,000/- ක් වැය කර ඉදි කළ නව සායන ගොඩනැගිල්ල ගිලා බැසීමට ලක්ව තිබෙන බැවින් එම ගොඩනැගිල්ල විවෘත කිරීමට නොහැකිව පැවතුණි. | |
| 17. | 2011 සිට 2019 ජූලි දක්වා කාලයට අදාළව මාතලේ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 03ට අදාළව නීතියට පටහැනිව කළ ගෙවීම් හා නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදු වූ පාඩු හේතුවෙන් රු. 2,600,213/- ක අධිභාර සහතික 08 ක් නිකුත් කර තිබුණු නමුත් ඒ පිළිබඳ කටයුතු නිරාකරණය වී නොතිබීම | මේ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කරන ලදී.<br><br>**අදාළ වාර්තාව ලැබී ඇත.**<br><br>**එම වාර්තාවට අනුව රත්තොට ප්‍රාදේශීය සභාවේ අධිභාර සහතික 4ක් සඳහා මේ වන විට සියළුම මුදල් අයකර අවසන් බවත්, මාතලේ ප්‍රදේශීය සභාවේ අධිභාර සහතික 2ක නඩු පැවරීම සඳහා කටයුතු කර ඇති බව හා මාතලේ නගර සභාවේ අධිභාර සහතික 2 ක් අභියාචනා තත්ත්වයේ පවතී.** |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
| **ආබාධිත පුද්ගලයන් අධ්‍යාපනික හා වෘත්තීය වශයෙන් සවිබල ගැන්වීම වෙනුවෙන් රාජ්‍ය ආයතනවල මැදිහත් වීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 06** | | |
| 1. | ආබාධිත සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත අවුරුදු 10 කට අධික කාලයක සිට සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් තිබුණ ද මේ වන විටත් එම සංශෝධිත පනත සම්මත වී නොතිබීම | මේ වන විට අවශ්‍ය සංශෝධන සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>සංශෝධන කෙටුම්පත සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කිරිම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට දන්වන මෙන් කාරක සභාව නියෝග කරන ලදි. |
| 2. | සංඥා භාෂා පනත සම්බන්ධ වර්තමාන තත්වය | දීර්ඝ කාලයක් තිස්සේ මේ පිළිබඳ සාකච්ජා කර ඇති බවත් අවශ්‍ය සංශෝධන සහිතව කෙටුම්පත සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් මෙහිදී අනාවරණය විය.<br><br>කෙටුම්පත පිළිබඳ සාකච්ජා 2019-09-20 වන දිනට අවසන් කර අදහස් ලබා ගැනීම සඳහා ශ්‍රවණාබාධිත නියෝජිතයන් වෙත ලබා දීමට කටයුතු කරන මෙන් කාරක සභාව නියෝග කරන ලදි. |
| 3. | ආබාධිත සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මගින් පත් කර ඇති ආබාධිත සහිත තැනැත්තන් පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරිත්වය | ජාතික සභාවේ සමාජිකයන් පත් කර ඇත්තේ පනතට අනුකූලව නොවන බවත් අබාධිත ප්‍රජාව නියෝජනය කිරීම සඳහා 11 දෙනෙකු පත් කළ යුතු වුවත් දැනට සිටිනුයේ සමාජිකයින් 06 දෙනෙකු බවත් මෙහිදී අනාවරණය විය.<br><br>ආබාධිත සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත අනුව ජාතික සභාවේ සංයුතිය, සභාව කැඳවිය යුතු දින වකවානු, වර්තමානයේ සිටින සාමාජික නාමලේඛනය, ඔවුන් නියෝජනය කරනු ලබන්නේ කවුරුන්ද යන වග, පසුගිය වර්ෂ 02 තුළ සභාව රැස්වූ අවස්ථා ගණන, එම අවස්ථාවල අදාල |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | සමාජිකයන්ගේ පැමිණීම යන කරුණු ඇතුළත් වාර්තාවක් 2019-09-15 වන දිනට පෙර ලබා දෙන ලෙස කාරක සභාව විසින් ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීමේ ආමාත්‍යාංශ ලේකම් වෙත නියෝග කරන ලදි.<br><br>**අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.ඒ අනුව ආබාධ සහිත තැනැත්තන් නියෝජනය කිරීම පිණිස සහ ආබාධ සහිත තැනැත්තන්ට ස්වයං රැකියා සපයන සංවිධාන ඇතුළුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා සේවා සැපයීමේ නිරතව සිටින සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩල නියෝජනය කිරීම පිණිස අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 11 දෙනෙකු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හෝ පළාත් සභා මන්ත්‍රීවරයන් හෝ පළාත් පාලන ආයතන වල සභිකයන් හෝ වෘත්තික, නිලධර පුද්ගල මණ්ඩලවල සමාජිකයන් හෝ රජයේ නිලධරයන් අතුරින් අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 10 දෙනෙකු මෙම සභාවේ සංයුතිය වන බව දක්වා ඇත.එසේම අවම වශයෙන් මසකට වරක්වක්වත් සභාව රැස්විය යුතු බව සඳහන් කර ඇති අතර අනෙකුත් තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 4. | විශේෂ අධ්‍යාපන ගුරු පුරප්පාඩු | දෙමළ භාෂා ගුරුවරු 198 ක් ඇතුළුව 597 ක විශේෂ අධ්‍යාපන ගුරු පුරප්පාඩු පවතින බව ප්‍ර.ග.නි/ග.නි පැවසීය. ජාතික භාෂා අධ්‍යාපන ආයතනයේ විශේෂ අධ්‍යාපන, සංඥා භාෂා හෝ බ්‍රේල් පාඨමාලා හැදෑරූ උසස් පෙළ සමත් වයස අවුරුදු 45 දක්වා වන අයදුම්කරුවන්ගෙන් එම පුරප්පාඩු පුරවා ගැනිම සඳහා කැබිනට් අනුමැතිය සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය මේ වන විට ලබා ගෙන ඇති බවත් රාජ්‍ය සේවා කොමිෂන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | සභාවේ අවසන් අනුමැතිය ලැබුණු වහාම අදාල පුරප්පාඩු පිරවිය හැකි බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| 5. | සංඥා භාෂාව ඒකාකාරී නොවීම හේතුවෙන් උද්ගත වන ගැටළු සහ ඔවුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග | ජාතික අධ්‍යාපන ආයතනය මගින් බුද්ධ ධර්මය, ක්‍රිස්තු ධර්මය, භූගෝල විද්‍යාව, සිංහල, ගණිතය වැනි විෂයන් සඳහා සංඥා හඳුන්වා දී ඇති බවත් නව සංඥා හඳුන්වා දීමේදි ශ්‍රවණාබාධිත පුද්ගලයන්ගේ සහභාගිත්වය ඇතිව පර්යේෂණ කරමින් සිදු කළ යුතු බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br><br>දෘෂ්‍යාබාධිත පුද්ගලයන් සඳහා පවතින බ්‍රේල් පොත් වල හිඟයක් ඇති බව මෙහිදී අනාවරණය වූ අතර ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පොත් බ්‍රේල් වලට පරිවර්ථනය කළ හැකි මෘදුකාංගයක් දැනටමත් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හඳුන්වා දී ඇති බවත් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් පර්යේෂණ කරමින් පවතින බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| 6. | දෙමාපියන්ගේ නොදැනුවත්කම නිසා ආබාධිත දරුවන් පාසැල් අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණු සඳහා යොමු වීමේ පසුබෑමක් ඇති ව තිබීම | පාසැල් අධ්‍යාපනයට සහ වෘත්තීය පුහුණු සඳහා යොමු කළ හැකි ආබාධිත දරුවන් දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ඒ සඳහා යොමු කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන ලෙස අදාල අමාත්‍යාංශයට දන්වන ලෙසත් ඒ සඳහා එම දරුවන් පිළිබඳ තොරතුරු රැස්කර ගැනීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ දැනගැනීම සඳහා අවශ්‍ය උපදෙස් පත්‍රිකාවක් රත්මලාන අන්ධ බිහිරි විදුහලේ විදුහල්පතිතුමියගෙන් ලබා ගෙන අදාළ අංශ වෙත ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාවේ ලේකම්තුමිය වෙත උපදෙස් ලබා දෙන ලදි. |
| 7. | ප්‍රාථමික සහ විශේෂ අධ්‍යාපන පාඨමාලාව හදාරා පසුව විශේෂ අධ්‍යාපනය අතහැර ප්‍රාථමික ගුරුවරු ලෙස සේවය කිරීම මගින් විශේෂ අධ්‍යාපනය හිමිවිය යුතු | ඉදිරියේදි එම පාඨමාලාවේ ප්‍රාථමික අධ්‍යාපනය යන්න ඉවත් කර විශේෂ අධ්‍යාපනය පමණක් ලබා දෙන බවත් මීට අමතරව විෂය මාලා සංශෝධනය කර අවශ්‍ය ගුරු පුහුණුව ලබා දීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | දරුවන්ට අසාධාරණයක් සිදු වන බව පෙන්වා දුන් කාරක සභාව එය වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර | සඳහා කටයුතු කරමින් සිටින බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| 8. | විගණකාධිපති වාර්තාව අනුව 2013 වර්ෂයේ සිට මේ දක්වා රැකියා විරහිත දෘෂ්‍යාබාධිත උපාධිධාරීන් 45 දෙනෙකු සිටින බව පෙන්වා දුන් කාරක සභාව ඔවුන්ට රැකියා ලබා දීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතු බව අවධාරණය කළේය. | එම දෘෂ්‍යාබාධිත උපාධිධාරීන්ට ප්‍රමුඛතාවය ලබා දීමේ අරමුණින් තරඟ විභාගයට මුහුණ දීම පමණක් ප්‍රමාණවත් බව සඳහන් කැබිනට් තීරණයක් ඇති බවත් එය සියලු පළාත් ලේකම්වරුන්ට ලබා දිය හැකි බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br><br>එම උපාධිධාරීන්ගේ නාම ලේඛනයක් සියලුම පළාත් සභා සහ රේඛීය අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කරන ලදි. |
| 9. | ඔටිසම් දරුවන් මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු වූ අතර මේ සම්බන්ධයෙන් ගෙන ඇති වැඩපිළිවෙළ පිළිබඳ කාරක සභාව විමසීය. | දැනට විශේෂ අවශ්‍යතා ඇති දරුවන් පාසැල් ගත කරනු ලබන්නේ අවුරුදු 4 මාස 9 න් බවත් ඉදිරියේදී එම වයස් සීමාව අවුරුදු 3 දක්වා අඩු කරන බවත් මෙම දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා දැනට ප්‍රාථමික ගුරුවරු 28,000 ක් විෂය මාලා අනුවර්තනය යටතේ පුහුණු කර ඇති බවත් ප්‍ර.ග.නි/.ග.නි පැවසීය. එසේම තවදුරටත් ගුරුවරුන් පුහුණු කිරිමේ ආරම්භයක් ලෙස විදුහල්පතිවරු පුහුණු කිරිමේ කටයුතු සිදු කරගෙන යන බව ද මෙහිදි අනාවරණය විය.<br><br>ඔටිසම් දරුවන් සාමාන්‍ය දරුවන් සමඟ එක් වී කටයුතු කිරිමෙන් ඔවුන් ඔටිසම් තත්වයෙන් මඟහරවා ගැනීමට හැකියාවක් ඇති බව මෙහිදී අනාවරණය වු අතර ඔටිසම් දරුවන්ට සාමාන්‍ය දරුවන්ගේ පන්ති කාමර තුළ අධ්‍යාපනය ලබා දීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලෙස කාරක සභාව පෙන්වා දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 10. | අබාධිත පුද්ගලයන් සඳහා ඇති වෘත්තීය පුහුණු අවස්ථා | සමාජ සේවා දෙපාර්තමේන්තුව සතුව සියලු පහසුකම් සහිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 08 ක් ඇති බවත් ජනතාවගේ නොදැනුවත් භාවය නිසා වෘත්තීය පුහුණුව සඳහා යොමු නොවන බවත් අදාල දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ අතර අන්තර් සම්බන්ධීකරණය නොමැති නිසා මෙම ආයතන හරහා ඉහළ ප්‍රතිලාභයක් අත්කර ගැනීමට නොහැකි වී ඇති බවත් ප්‍ර.ග.නි/.ග.නි පැවසීය. |
| | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**<br>**(මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 302 කාණ්ඩය යටතේ පසුකාලීනව ලියාපදිංචි කරන ලද වාහන 10 පිළිබඳ විමර්ශනයේ වර්තමාන තත්ත්වය විමසීමට)**<br>**2019 සැප්තැම්බර් 06** | |
| 01. | ඉලක්ක කාණ්ඩ යටතේ වාහනවලට හඳුනාගැනීමේ අංක ලබා දීම වෙනුවට ඉංග්‍රිසි අකුරු කාණ්ඩ යටතේ වාහනවලට හඳුනාගැනීමේ අංක ලබාදීම 2000 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණි. නමුත් 302-0001 සිට 302-2108 දක්වා වූ වාහන අංක කාණ්ඩය තුළ පැවති වාහන ලියාපදිංචි අංක 45ක් යටතේ වාහන ලියාපදිංචිය මඟහැරී තිබුණි. කෙසේ වෙතත්, 2017.12.26 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී එසේ මඟහැරී තිබුණු අංක 10ක් සඳහා නව වාහන ලියාපදිංචි කර ඇති බව නිරීක්ෂණය වීම. | පරිගණකගත ලියාපදිංචි කිරීම් සිදු කිරීමට පෙර මෙම වාහන ලියාපදිංචි කර ඇති බවත්, පරිගණක පද්ධතිය හඳුන්වා දුන් පසු අදාළ ලිපිගොනු තිබේ නම් පසුව ඒවා පරිගණකගත කිරීම සිදු කර ඇති බවත් අනාවරණය විය. එසේ නොමැති වාහන නැවත පැවරීම් සඳහා පැමිණි විට ඒවා පරිගණකගත කිරීම සිදු කරන බැවින් මෙම අවස්ථාවේ සිදුවී ඇත්තේ එවැන්නක් බව ග.නි. පැවසීය. තවද, මෙම වාහන 10හි මුල් ලියාපදිංචි ලිපිගොනු දැනට අස්ථානගත වී ඇති බවද අනාවරණය විය.<br><br>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචිය සඳහා භාවිතා වන තොරතුරු තාක්ෂණ පද්ධතියේ ගැටළු පවතින බව නිරීක්ෂණය කළ කාරක සභාව මෙම තොරතුරු පද්ධතිය සඳහා පද්ධති විගණනයක් මොරටුව විශ්ව විද්‍යාලය හෝ කොළඹ විශ්ව විද්‍යාලය මඟින් සිදු කරගන්නා ලෙස ප්‍ර.ග.නි./ග.නි. ට නියෝග කළේය. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ මැදිහත්වීම අත්‍යාවශ්‍ය බවත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | ජාතික විගණන කාර්යාලයේ සහයෝගය මේ සඳහා ලබාදෙන ලෙසත් නියෝග කළේය. |
| **උතුරු මැද පළාත් සභාව<br>2019 සැප්තැම්බර් 18** | | |
| 01. | අනුරාධපුර නව බස් නැවතුම්පලේ හා දුරසේවා බස් නැවතුම්පලේ ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගෙන ධාවන තොරතුරු ප්‍රදර්ශනය කිරීම හා කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය 2012 වසරේදී රු. 3,157,700/-ක මුදලක් වැය කර ඇත. එනමුත් එකී ඩිජිටල් තාක්ෂණික උපකරණ නිසි පරිදි සවිකිරීමට අසමත්වීමට හේතු හා උපකරණවල වර්තමාන තත්ත්වය විමසීමේදී අදාල උපකරණ ගබඩා කර ඇති බව දන්වා තිබුණි. | මේ වන විට යම්තාක් දුරකට ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇති බවද, බස් නැවතුම්පළ ද්විත්වයෙහිම ධාවන තොරතුරු ප්‍රදර්ශනය කිරීම සිදු වන බවද හෙළි විය. |
| 02. | 2014 නොවැම්බර් 12 දිනැති අංක 24/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරුන් 33 දෙනෙකුගේ හා ධුරධාරීන් 04 දෙනෙකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය වෙත 2014 නොවැම්බර් සිට 2017 සැප්තැම්බර් දක්වා කාලය සඳහා අන්තර් දීමනා ලෙස රු. 27,244,074/-ක් ගෙවා තිබීම. | පළාත් අමාත්‍ය මණ්ඩල තීරණයට ආණ්ඩුකාරවරයාගේ අවසරය හිමි වී ඇති හෙයින් තමන්ට එම දීමනා ගෙවීම හැර වෙනත් විකල්පයක් නැතැයි ග.නි. පැවසීය. නමුත් අමාත්‍ය මණ්ඩල තීරණ සකස් කරනු ලබන්නේ හා නිර්දේශ ලබා දෙනු ලබන්නේ නිලධාරින් වන හෙයින් නීත්‍යානුකූල නොවන තීරණ පිළිබඳව නිවැරදි නිර්දේශ ලබා දීම නිලධාරින්ගේ වගකීමක් බව කාරක සභාව අවධාරණය කරන ලදී. |
| 03. | උතුරු මැද පළාත් සභාව උදෙසා පැවැත්වූ පූර්ව කාරක සභා | ඒ අනුව මේ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් කමිටුවක් පත් කර ඇති බවත්, පළාත් සභා ඇමති සහ මන්ත්‍රීවරුන්ගේ ධුර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | රැස්වීමේදී සාකච්ඡාවට භාජනය වුණු කරුණු -<br><br>පළාත් සභා පනතේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන තනතුරු ඇති කර පළාත් සභා මන්ත්‍රීවරයකුට හිමි වරප්‍රසාද ඉක්මවා 2013, 2014 හා 2015 වර්ෂ 3 තුළදී රු. 11,056,750/-ක් අතිරේක වරප්‍රසාද වෙනුවෙන් ගෙවා තිබීම පිළිබඳ ගැටළුව විසඳීමට පොදු ක්‍රමවේදයක් ඇති කිරීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි.ට කළ නියෝගය | සම්බන්ධයෙන් සියලු පළාත් සභාවලට පොදු ක්‍රමවේදයක් ඇති කිරීම උදෙසා පළාත් 09 ප්‍රධාන ලේකම්වරුන්ගෙන් ලබාගත් නිරීක්ෂණද තම නිර්දේශයන්ද එම කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බවත්, කමිටුව විසින් සකස් කළ චක්‍රලේඛයක් ජනාධිපති ලේකම්ට ලබා දීමට නියමිත බවත් ප්‍ර.ග.නි. පැවසීය.<br><br>එම චක්‍රලේඛය නිකුත් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කර එය සියලු පළාත් සභාවලට යොමු කරන ලෙසත්, විගණකාධිපතිට සහ කාරක සභාවටද පිටපත් යොමු කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදී.<br><br>**ඒ අනුව, සංශෝධිත රාජ්‍ය වියදම් කළමනාකරණයේ කෙටුම්පත් චක්‍රලේඛයේ සංශෝධන පවතී නම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දන්වා සියලුම ප්‍රධාන ලේකම්වරුන් වෙත 2019.05.02 දිනැතිව යොමු කර ඇති අතර සියලු පළාත් වෙතින් යොමු කර ඇති සංශෝධනයන් අවශ්‍ය ඉදිරි කටයුතු කරන ලෙස දන්වා 2019.07.29 දිනැතිව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමුකර ඇති බව දන්වා ඇත.** |
| 04. | උතුරු මැද පළාත් සභාව උදෙසා පැවැත්වූ පූර්ව කාරක සභා රැස්වීමේදී සාකච්ඡාවට ගැනුණු කරුණු -<br><br>ප්‍රධාන අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය 15කට සීමා විය යුතු වුවත් 2013 වසරේ වැඩිපුර සේවයේ යොදවා තිබූ නිලධාරීන් 30දෙනෙකු වෙනුවෙන් වැටුප්, දීමනා සහ ගමන් වියදම් ලෙස රු. 8,652,550/-ක් හා 2016 වසරේ | මෙය පැරණි සිදුවීමක් බැවින් මේ වන විට මෙම සභාව විසුරුවා ඇති බවත්, මෙම ධුරධාරීන් කිසිවෙක් මේ වන විට සේවයේ නියුතු නොවන බවත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට වග බලා ගන්නා බවට සහතික විය හැකි බවත් ග.නි. සඳහන් කළේය.<br><br>කෙසේ වෙතත්, චක්‍රලේඛවලට පටහැනිව සිදු කරන මෙවැනි ක්‍රියාවල වගකීම්වලින් බැහැරවිය නොහැකි බව සඳහන් කළ කාරක සභාව අවිධිමත් දීමනා ගෙවීම් සම්බන්ධයෙන් අනෙක් පළාත් සභාවලට සාපේක්ෂව මෙම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග <br> - අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | වැඩිපුර සේවයේ යොදවා තිබූ නිලධාරින් 10දෙනෙකු වෙනුවෙන් රු. 2,884,285/-ක් ගෙවීම් සිදු කර තිබීම | පළාත් සභාවේ තත්ත්වය අයහපත් බව දක්වමින් සිය අප්‍රසාදය පළ කළේය. |
| 05. | 2013 නොවැම්බර් 14 දින සිට 2015 මාර්තු 19 දින දක්වා මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ සේවය කළ කළමනාකාර අධ්‍යක්ෂවරයා 2014 ඔක්තෝබර් මස ගුරු දීමනා සඳහා වූ රු.900,000/-ක් ගුරුවරුන්ට නොගෙවා වංචා කර තිබිම. | මේ සම්බන්ධයෙන් නඩු කටයුතු අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ සිදුවෙමින් පවතින බව ග.නි. පැවසීය. |
| 06. | 2006 වර්ෂයේදී රු.47,297,258/-ක් වැය කර ඉදිකර තිබුණු මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානය 2017 වර්ෂයේදී විවෘත කර තිබුණද විවෘත කළ කඩකාමර 28න් 20ක්ම වැසී තිබීම හා මේ වසර වන විටත් ආර්ථික මධ්‍යස්ථානය ඌණ උපයෝජිතව පැවතීම. | මේ තත්ත්වය සත්‍ය බව පිළිගත් ග.නි. මේ වන විට කඩකාමර නැවත ටෙන්ඩර් කර සුදුසු ගැණුම්කරුවන්ට ලබා දීමට කටයුතු යොදා ඇති බව පැවසීය. |
| 07. | තඹුත්තේගම කළාප අධ්‍යාපන කාර්යාලයේ පාසලකට අනුයුක්තව සේවය කළ ගුරු හිමි නමක් සඳහා 2005 සිට 2010 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රී හිමි නමකගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කල බව දක්වමින් වැටුප් හා දීමනා ලෙස රු. 1,039,357/-ක් ගෙවා තිබුණි. එනමුත් එවන් රාජකාරියක හෝ | මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතින බවත්, ස්වාමීන් වහන්සේගෙන් අයවිය යුතු මුදලින් කොටසක් අයකර ගෙන ඇති බවත්, ඉදිරි නඩු වාර තුනේදී ඉතිරි මුදල ගෙවීමට ස්වාමීන් වහන්සේ එකඟ වී ඇති බවත් ග.නි. පැවසීය. මේ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට ග.නි. එකඟ විය. <br><br> **ඒ අනුව, මෙම හිමිනම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12.2 යටතේ විශ්‍රාම ගන්වන ලෙස පළාත් අධ්‍යක්ෂ විසින් තඹුත්තේගම කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඇතත් අදාළ** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | ඉගැන්වීම් කටයුතුවල නිරත වී නොමැති බව අනාවරණය වීම. | **කළාප අධ්‍යක්ෂවරිය එය නොසළකා අදාළ හිමිනම සාමාන්‍ය පරිදි විශ්‍රාම ගන්වා ඇත. ඒ අනුව තඹුත්තේගම කළාප අධ්‍යාපන අධයක්ෂවරියට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති බවත් හිමිනමට විරුද්ධව අනුරාධපුර මහ අධිකරණයේ නඩු පවරා ඇති බවත් දන්වා ඇත.** |
| 08. | උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා තාක්ෂණික ප්‍රමිතියෙන් යුතු වාර්තාමය වීඩියෝ වැඩ සටහනක් සකස් කිරීම, ආකර්ශනීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොතක් නිර්මාණය කිරීම හා විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් විසින් සැපයුම්කරුවෙකු සමඟ රු.15,797,500/-ක මුදලකට 2016 වසරේදී ගිවිසුමකට එළැඹ තිබුණි. ගිවිසුම්ගත මුදලින් 77%ක් ගෙවා අවසන් කර තිබුණු නමුත් 2019 සැප්තැම්බර් වන විටත් ව්‍යාපෘතිය අවසන් කර පළාත් සභාවට භාර දී නොතිබීම. | තම සේවා කාලයට පෙර සිදුවූ ගිවිසුම්ගතවීමක් වන මෙහි සැපයුම්කරු පිළිබඳ දිගින් දිගටම කළ සොයා බැලීම අවසානයේ ඔහු විසින් මුද්‍රිත පොතක් හා rajarataholiday.lk යනුවෙන් නිර්මිත වෙබ් අඩවියක් සකසා ඉදිරිපත් කර ඇති බවත්, එම කාර්යයන් ඔහුට ගෙවා ඇති මුදලට සාපේක්ෂව කොතරම් වටිනාකමකින් යුක්තද යන්න ප්‍රශ්නකාරී බවත් ග.නි. සඳහන් කළේය. |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br>2019 සැප්තැම්බර් 19** | | |
| 1. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ කොමසාරිස් ජනරාල්වරයාට, ප්‍රධාන මූල්‍ය නිලධාරියාට හා අභ්‍යන්තර විගණකට සමස්ථ දෙපාර්තමේන්තු ක්‍රියාවලියේම අභ්‍යන්තර විගණන වගකීම පැවරිය යුතු බවද එය එසේ නොවන්නේනම් එයට හේතුද ඒ සම්බන්ධ බලතල පැවරූ ආකාරයද පිළිබඳ 2019.09.26 දිනට පෙර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය.<br><br>**දෙපාර්තමේන්තුවේ සමස්ත අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමට දේශීය ආදායම් පනතේ 100 (1) (අ) යටතේ අභ්‍යන්තර විගණකට පැවරීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට හැකියාව ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස දැන්වීමට ක්‍රියාකරන බව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා කාරක සභාවට දන්වා ඇත.** |
| 2. | ඔට්ටු හා සූදු ව්‍යාපාරවල බදු අයකර ගැනීමේ දුර්වලතා ලෙස 2015 ඔක්තෝබර් 30 දිනැති අංක 10 දරන මුදල් පනත අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2015 නොවැම්බර් 15 දින හෝ ඊට පෙර එක් ආයතනයකින් රු.මිලියන 1,000ක් අයකළ යුතුව ඇත. ඒ අනුව කැසිනෝ ව්‍යාපාර 04කින් එකතුව රු.මිලියන 4,000ක අයබදු රැස් කළයුතු වුවත් 2019 මැයි 31 දිනට රු.මිලියන 1,170 ක් පමණක් රැස් කරගෙන තිබීම. | මෙම ආයතන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාකර එකවර මුදල් ප්‍රමාණය ගෙවීමට අපහසු බව පවසා කාර්තුමය වශයෙන් ගෙවන බවද මෙහි හිඟ මුදල අයකර ගැනීම සම්බන්ධව නීතිපති උපදෙස් පතා ඇති බවද වර්තමානයේදී රු.මිලියන 2,670ක් පමණක් ගෙවීමට ඇති බවද ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>දැනට පවතින කැසිනෝ ව්‍යාපාර ප්‍රමාණය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් 2019/09/26 දිනට පෙර කාරක සභාවට ලබාදියයුතු බවද මුදල් අමාත්‍යාංශය මෙම මුදල අයකර ගැනීම පිළිබඳ වාර්තාවක් 2019/09/26ට පෙර කාරක සභාවට ලබාදියයුතු බවද කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය.<br><br>**කැසිනෝ ව්‍යාපාර ප්‍රමාණය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ලබාදී ඇත.**<br>**කැසිනෝ ව්‍යාපාර පිළිබඳ හිඟ මුදල අය කර ගැනීමට ගත් පියවර කාරක සභාවට දන්වා ඇති අතර නීතිපති උපදෙස් ලද වහාම නීතිමය පියවර ගෙන අදාල මුදල කඩිනමින් අයකර ගන්නා බව දන්වා ඇත.** |
| 3. | දෙපාර්තමේන්තුවේ මුළු හිඟ ආදායම දෙපාර්තමේන්තුවේ මුළු ආදායමින් 3%ක් ඉක්මවිය | විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් යොමුකළ විගණන විමසුමකට අනුව මුදල් අමාත්‍යාංශය මැදිහත් වී පත්කළ නව අංශය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | නොහැකි බව අනාවරණය විය. එහෙත් Legacy පද්ධතියට අනුව 2012 දෙසැම්බර් 31 සිට 2018 දෙසැම්බර් 31 දක්වා ඉදිරිපත් කර ඇති වාර්ෂික හිඟ ආදායම් වාර්තා අනුව, මුළු හිඟ ආදායම ක්‍රමිකව ඉහළ ගොස් ඇත. එම හිඟ ආදායම් වලින් අය කිරීම තාවකාලිකව අත්හිටවූ ආදායමින් අයකළ හැකි ආදායම 2017/12/31ට සහ 2018/12/31ට පිළිවෙලින් රු. 32,070,000,623/- සිට රු. 121, 423, 223, 463/- ක් දක්වා ඉහළ ගොස් ඇත. | මගින් දිරිදීමනා කමිටුවට ලබාදුන් නියෝග අනුව ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම වැඩිවීම සිදුවී ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. කෙසේවුවද මෙම ක්‍රමය වර්තමානයේදී අත්හැර ඇති බව අනාවරණය විය. මෙසේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී අදාළ චක්‍රලේඛ හෝ මගපෙන්වීම් අනුව පමණක් ක්‍රියාකල යුතු බව අවධාරණයකල කාරක සභාව ආයතනයේ මෙම අදූරදර්ශී ක්‍රියාව පිළිබඳ සිය අප්‍රසාදය පළ කළේය.<br><br>හිඟ ආදායම්වලට එක් හේතුවක් වන චෙක්පත් අගරුවීම වර්ගීකරණයක් කර එමගින් අසාධු ලේඛනයක් පිළියෙල කිරීම සිදුවිය යුතු බව කාරක සභාවේ නිර්දේශය විය. ලැබෙන චෙක්පත් වලින් 0.47%ක් අගරුවන බවද මේ චෙක්පත් සඳහා 10%ක දඩමුදලක් සමග නැවත අයකර ගන්නා බවද, RAMIS පද්ධතිය හරහා මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කරගෙන යන බවද ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. |
| 4. | RAMIS ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය හා එමගින් බාහිර ආයතන මෙම පද්ධතියට සම්බන්ධ වන ආකාරය. | මෙම ව්‍යාපෘතිය 90%ක් පමණ ක්‍රියාත්මක වන බවද මුද්දර බදු හා ආර්ථික සේවා බදු (Economic Service Charge) දැනට පද්ධතිගත කෙරෙමින් පවතින බවද ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. මුදල් අමාත්‍යාංශය මැදිහත්වී සති 2ක් තුළ පරිගණක පද්ධතියට සම්බන්ධ කිරීමට හඳුනා ගෙන ඇති ආයතන 29හි ප්‍රධානීන් කැඳවා මූලික සාකච්ඡාවක් පවත්වා පසුව මාසික ප්‍රගති රැස්වීම් පවත්වා 2019.10.19ට පෙර වාර්තාවක් කාරක සභාවට ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br><br>**පරිගණක පද්ධතියට සම්බන්ධ කිරීමට හඳුනා ගෙන ඇති ආයතන 29හි ප්‍රධානීන් කැඳවා පැවැත්වූ සාකච්ඡාවේ කාර්ය සටහන් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.** |
| 5. | 2014/2015 තක්සේරු වර්ෂයට සාපේක්ෂව බදු වාර්තා කාලීනව | නියමිත දිනට වාර්තා ඉදිරිපත් කර නොමැති ගොනු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවද මෙම පද්ධතිය හඳුන්වාදුන් පසු බදු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | ගෙන්වා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් 2019 අගෝස්තු 15 වනවිට බදුකරුවන් වෙත නිකුත් කර ඇති බදු වාර්තා 2,251,140ක් අතරින් බදු වාර්තා 766,634ක් බදු කරුවන් විසින් ආපසු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබීම. | ලියාපදිංචිය 36%කින් ඉහළ ගොස් ඇති බවද ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>තවද 2014 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂය වනවිට නියමිත දිනට බදු වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය ක්‍රමානුකූලව පහල වැටීම ප්‍ර.ග.නි./ග.නි. විසින් නිවැරදි බවට පිළිගන්නා ලදී. |
| 6. | RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ සේවා ගිවිසුම. | සේවා ගිවිසුම වර්ෂ 2020 ඔක්තෝබර් මස නිමවීමට ඇතත් පද්ධතියේ නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට දෙපාර්තමේන්තුවට පූර්ව සැලසුමක් මේ දක්වා නොමැති වීම කාරක සභාවේ දෝෂ දර්ශණයට ලක්විය. අදාළ විශේෂඥ දැනුම ඇති සේවකයන්ගේ හිඟය හා බඳවා ගැනීමේ ප්‍රායෝගික අපහසුතා මීට හේතුවී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>තවද මේ සඳහා උපදේශකවරයෙකු බඳවාගෙන ඇති බවද 2020 වනවිට පද්ධතියේ හැකි ප්‍රමාණය බාරගෙන අනෙක් ප්‍රමාණය MCS වෙත ලබාදීමට සැලසුම්කර ඇති බව මෙහිදී අනාවරණය විය. කෙසේවුවද ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා දෙපාර්තමේන්තුවේ නවීන තාක්ෂණය යාවත්කාලීන කර ගැනීමේ අවශ්‍යතාවය කාරක සභාව තරයේ අවධාරණය කළේය. මුදල් අමාත්‍යාංශය මැදිහත්වී මොරටුව විශ්වවිද්‍යාලයට ලිපියක් යොමුකර RAMIS පද්ධතියහි වර්තමාන තත්වය පිළිබඳ **වාර්තාවක්** ලබාගෙන කාරක සභාවට 2019.10.03ට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br>**RAMIS පද්ධතියෙහි වර්තමාන තත්වය පිළිබඳ මොරටුව විශ්වවිද්‍යාලය විසින් එවූ ලිපියේ පිටපතක් කාරක සභාවට ලබාදී ඇත. (ඇමුණුම 14)** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| 7. | බදු අභියාචනා කොමිෂන් සභාව විසින් නිශ්වය ලබාදී ඇති බදු අභියාචනාවලට අදාල තක්සේරු වාර්තාවල දැක්වෙන බදු හා දඩ මුදල් අය කිරීම සම්බන්ධව Legacy පද්ධතිය ආශ්‍රයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී, බදු ලිපිගොනු 53කට අදාළව රු.මිලියන 9,334ක බදු මුදලක් නිරවුල් කිරීමට හෝ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කඩිනම් පියවර ගෙන නොතිබීම. | පැහැදිලිව බදු අයකරගත හැකි අවස්ථා 10ක් පමණක් තිබූ බවද එම 10 අය කරගෙන අවසන් බවද අනෙක් සියළුම ගොනු අභියාචනාධිකරණයට යොමු කර ඇති බවද ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. |
| **ශ්‍රී ලංකා රේගුව<br>2019 සැප්තැම්බර් 20** | | |
| 1 | ශ්‍රී ලංකා රේගුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර ක්‍රියාත්මක ස්වයංක්‍රීය පරිගණක සැසඳුම් පද්ධතියේ කටයුතු කඩිනම් නොකිරිම, එකලස් කරන ලද වාහන ලියාපදිංචියේදි සිදුවන අක්‍රමිකතා වැලැක්විමට කටයුතු නොකිරිම සහ ණයවර ලිපි නිකුත් කළ වහාම එම තොරතුරු පද්ධතියට ඇතුලත් නොකිරිම | ස්වයංක්‍රීය පරිගණක සැසඳුම් පද්ධතිය ක්‍රියාත්මක කිරිම සඳහා රේගු දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු කාර්යයන් සියල්ල අවසන් කර එයට ප්‍රවේශවිමේ අවසරය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලබා දි ඇත. වාහන ලියාපදිංචි කිරිමෙන් පසු දත්ත සැසඳුම් කිරිම සඳහා පද්ධතියේ සිදුකළ යුතු නවිකරණ කටයුතු සඳහා මාස 2 1/2 ක අතිරේක කාලයක් අවශ්‍ය වී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 2 | පසුගිය කාරක සභාවේදි ලබාදුන් නියෝගයට අනුව සේවයට පැමිණිම හා පිටවිම සටහන් කිරිම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර හඳුන්වා දිමට මේ දක්වා කටයුතු නොකිරීම. | මාසයක් ඇතුලත ඇඟිලි සලකුණු යන්ත්‍ර හඳුන්වා දිමට කටයුතු කරන බවට ප්‍ර.ග.නි./ග.නි. පොරොන්දු විය. |
| 3 | ඉකුත් වර්ෂ 03 ක කාලයක් තුල තීරුබදු නිදහස් පදනම මත භාණ්ඩ අලෙවි කරන වෙළඳසැල් මගින් | 2017 සහ 2018 යන වර්ෂවල නිකුත් කරන ලද භාණ්ඩ වල මුලු වටිනාකම රුපියල් බිලියන 56 ක් බව ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | නිකුත් කළ භාණ්ඩවල වටිනාකම සහ ඒ සඳහා ලබා දී තිබූ බදු සහනවල වටිනාකම මාසයක් තුල කාරක සභාවට වාර්තා නොකිරිම. | කෙසේ වෙතත්, නියමිත බදු සහනය පාරිභෝගිකයා වෙත නොලැබෙන බව නිරීක්ෂණය වී ඇති බව සඳහන් කළ කාරක සභාව, ඒ සඳහා සුදුසු පරිගනක වැඩසටහනක් සකස් කරන ලෙසත් සියළුම ගණුදෙනු වලදී ගමන් බලපත්‍රයේ අංකය යෙදීම අනිවාර්ය කළ යුතු බවත් ප්‍රකාශ කළේය. ඒ පිලිබඳ සවිස්තර වාර්තාවක් ලබාදෙන ලෙසද ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 4 | රේගුවේ තොරතුරු ව්‍යාජ ලෙස වෙනස් කර වාහන 07 ක් ලියාපදිංචි කිරිම සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයේ වාර්තාවක් කාරක සභාවට ලබාදීමට ප්‍රධාන ගණන්දිමේ නිලධාරි කටයුතු නොකිරිම සහ ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තර පරික්ෂණයක් සිදුකර නොතිබීම සහ ඉතා අඩු රේගු බද්දක් ගෙවා ආනයනය කළ විශේෂිත කාර්යය වාහන ඉහල බදු ගෙවිය යුතු වාහන කාණ්ඩ යටතේ ලියාපදිංචි කර පරිහරනය කිරිමෙන් 2010 - 2014 කාලය තුල රජයට රු. මිලියන 243 පමණ ආදායම් අහිමි විම. | 2013 වර්ෂයේ සිදුවී ඇති මෙම වංචනික ක්‍රියාව පිළිබඳව අභ්‍යන්තර විමර්ශන ඒකකය පරික්ෂණ ආරම්භ කර ඇති බවත් වාහන ලියාපදිංචියේදි දෙපාර්තමේන්තුව සම්බන්ධයක් නොමැති වුවත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත වැරදි තොරතුරු ලබාදීමට රේගුවෙන් කිසියම් අනුග්‍රහයක් ලබා දි තිබුණේද යන්න සොයා බලන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෑතකදි නිවාරණ අංශය විසින් රාජසන්තක කර පසුව නියමිත දඩ මුදල් ගෙවා නිදහස් කර තිබූ වාහන 2 ත් මෙම ප්‍රශ්ණගත වාහන 7 ත් අතර කිසියම් සම්බන්ධතාවයක් පවතින්නේ දැයි සොයා බලන බව ග.නි. පැවසීය.<br><br>මේ පිලිබඳව සියළු තොරතුරු ඇතුලත් වාර්තාවක් මාස 3 ඇතුලත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br>**පිළිතුරු වාර්තා ලැබී ඇත (ඇමුණුම 15)** |
| 5 | 2018 වසරේ ආනයනකරුවෙකු විසින් විශේෂිත කාර්යය වාහන සඳහා අනුමත බදු සහනය මත වාහන 92 ක් ආනයනය කර ද්විත්ව කාර්යය වාහන පන්තියේ ලියාපදිංචි කර තිබූ බවත් පසුව රේගුව විසින් ඉන් වාහන 14 ක් රේගු භාරයට (Seized) ගැනිමට කටයුතු කර තිබූ බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. | ඒ පිළිබඳව විමර්ශන සිදුකරන රේගු සංයුක්ත නාමාවලි කමිටුව (NC) නියමිත කාලය තුල තම නිර්දේශ ලබා නොදිමත්,ඇතැම් නිලධාරින් පක්ෂග්‍රාහී ලෙස පරික්ෂණ ප්‍රමාද කිරිමත් නිසා රජයට විශාල බදු ආදායමක් අහිමිවන බව පිලිගත් ග.නි. ආනයනකරුවන්ට තම වංචනික ක්‍රියා අඛණ්ඩව කරගෙන යාමට ඉන් රුකුලක් ලැබි ඇති බවද පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | කිසියම් අනුකූලතා කේතයක් (HS Code) යටතේ ආනයනය කළ වාහනයක් ලියාපදිංචියට ඉදිරිපත් කරන විට එහි කේතයේ වෙනසක් සිදුකර තිබෙන බව සනාථ වුවහොත් ලියාපදිංචිය අත්හිටුවීමටත් විශේෂිත කර්මාන්ත වෙනුවෙන් වාහන ආනයනය කරන පුද්ගලයින් සහ ආයතන හඳුනාගෙන එම වරප්‍රසාදය ඔවුනට පමණක් හිමිවන ආකාරයට ක්‍රමවේදයක් සකස් කිරීම තුළින් අක්‍රමිකතා අවම කළ හැකි බවත් අනාවරණය විය.<br><br>විධිමත් අයුරින් බදු මුදල් අය නොකර රේගු භාරයට ගෙන දඩ ලෙස මුදල් අයකිරීමක් සිදුවන බව නිරීක්ෂණය කළ කාරක සභාව එම තත්ත්වය වැළැක්වීම සඳහා බදු මුදලට සාපේක්ෂව ඉහල දණ්ඩන පැනවීමේ අවශ්‍යතාවය ද අවධාරණය කළේය.<br><br>එමෙන්ම ඉහළ ආදායම් උපයන දෙපාර්තමේන්තු පවතින නීතිරීති අභිබවා සම්ප්‍රදායන්ට අනුගතව කටයුතු කරන බැවින් පවතින චක්‍රලේඛ, උපදෙස් සහ නියෝග ආදිය යාවත්කාලීන විය යුතු බවද කාරක සභාව අවධාරණය කළේය.<br><br>තවද දෙපාර්තමේන්තුවේ කිසියම් අංශයක් විසින් භාරයට ගන්නා ලද (seized) වාහනයක් තවත් අංශයක භාරයට ගැනීම වැළැක්වීම සඳහා අභ්‍යන්තරව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක අවශ්‍යතාවය ද කාරක සභාව අවධාරණය කරනු ලැබීය.<br><br>කෙසේවෙතත්, දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්ය සාධනය පිළිබඳව කාරක සභාවට සෑහීමකට පත්විය නොහැකි බැවින් රේගු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය එක්ව පිහිටුවා ගත් කමිටුවක් මගින් පවතින ගැටළු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | හඳුනාගෙන ඒවා නිරාකරණයට වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු බවත් එම කමිටුවේ සාමාජිකයින් 2019.10.09 දින පැවැත්වෙන කාරක සභාව හමුවට පැමිණ එහි ප්‍රගතිය වාර්තා කරන ලෙසත් නියෝග කළේය.<br><br>**වර්තමාන තත්වය-**<br>**අදාළ කමිටුව පත්කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති බව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් දන්වා ඇත.** |
| 6 | දෙපාර්තමේන්තු නීති අංශය සඳහා නීතිවේදියෙකු බඳවා ගැනිමේ අවශ්‍යතාවය පසුගිය කාරක සභාවේදි අවධාරණය කරමින් එවැනි තනතුරක් ඇති කිරිමට කටයුතු කරන ලෙස ලබාදි තිබූ නියෝගය මේ දක්වා ඉටුකර නොතිබිම පිලිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. | අනුමත සේවක සංඛ්‍යාව තුල නීති නිලධාරියෙකු බඳවා ගැනිමට ප්‍රතිපාදන නොමැති නිසා නීතිය හදාරණ ලද නිලධාරින් එම අංශයට අනුයුක්ත කර එම කටයුතු සිදුකරන බැවින් එවැනි තනතුරක අවශ්‍යතාවයක් මතු නොවූ බව ග.නි. පැවසිය.<br><br>මෙය සාර්ථක ක්‍රමයක් නොවන බව පැවසූ කාරක සභාව නීති අංශය සඳහා නිතිවේදියෙකු වෘත්තිය මට්ටමින් බඳවා ගැනිමට කටයුතු කරන ලෙස අවධාරණය කර ඊට අවශ්‍ය අනුමැතිය ලබාදිමට කටයුතු කරන ලෙස මුදල් අමාත්‍යාංශයට දැන්විය. |
| 7 | භාණ්ඩ පරික්ෂාව සඳහා ස්කෑනර් යන්ත්‍ර සවිකිරිමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය වාර්තා කරන ලෙස පූර්ව කාරක සභාව ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරිමට කටයුතු කර නොතිබිම පිලිබඳව කාරක සභාවේ අප්‍රසාදය පළවිය. | ස්කෑන් යන්ත්‍ර සවිකිරිමේ වැඩ කටයුතු අවසන් වෙමින් පවතින බවත් ආනයන සහ අපනයන යන අංශ දෙක ආවරණය වන පරිදි ස්කෑනර් යන්ත්‍ර 4 ක් සවිකිරිම සහ නිරික්ෂණ නිලධාරින් පුහුණු කිරිම මේ වන විට අවසන් කර ඇති බවත් දෙපාර්තමේන්තු පරිගනක අංශය හා අවධානම් කළමනාකරණ අංශය එක්ව ඔක්තෝබර් 01 දින සිට එහි කටයුතු පරික්ෂණ මට්ටමින් ආරම්භ කිරිමට නියමිත බවත් ග.නි. පැවසිය. |
| 8 | තොග ලෙස පාම් ඔයිල් ආනයනය කරනු ලබන ප්‍රධාන පෙලේ සමාගම් 2 ක් විසින් 2013-2016 කාල පරිච්ඡේදය තුල ආනයනය කළ ඉහල සම්මත පිරිවිතරයන් සහිත පාම් ඔලේන් නැමති තෙල් | රේගු විමර්ශනවලදි HS සංකේතය මගින් ඉහල තාක්ෂණික විෂය පථයක් නිරූපනය වන බැවින් මෙහි ආරම්භක පියවර ලෙස අදාළ ද්‍රව්‍ය පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණ අංශයකට යොමුකර ඒ පිලිබඳව විමසිමක් සිදුකළ යුතුව තිබුණි. එහෙත් නිලධාරින් තම මතයට අනුව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | වර්ගය නිවැරදි භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංකයක් යටතේ නිශ්කාශනය නොකිරීම නිසා රු. මිලියන 6,130 ක බදු ආදායමක් අහිමිව තිබීම පිලිබඳව කාරක සභාව විමසිය. | කටයුතු කරමින් රේගු සංයුක්ත නාමාවලි කමිටුව (NC කමිටුව) වෙත එය යොමු කර තිබුණි. එහිදී එම කමිටුව ලබාදුන් නිර්දේශයෙන් සෑහිමකට පත් නොවී ලෝක රේගු සංවිධානයේ අවධානයට එය යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටලුකාරී තත්ත්වය මතු වූ බවත් මෙය රේගු කටයුතු වලදී සාමාන්‍ය සිදුවීමක් බැවින් පාඩුව අයකර ගැනිම සඳහා ක්‍රියාමාර්ග ගැනිමට අනුමැතිය ලබාදී ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි.පැවසීය.<br>එහෙත් මෙම භාණ්ඩ සඳහා බැඳුම්කරයක් නොමැති බැවින් නිවැරදි බදු මුදල අයකර ගැනිම ගැටළු සහගත බව මෙහිදී අනාවරණය විය.<br>නිලධාරින්ගේ නොසැලකිලිමත්භාවය නිසා මෙම පාඩුව සිදුවි ඇති බව නිරික්ෂණය වන බැවින් ඒ පිලිබඳ පැහැදිලි කර ගැනීමට එම කාල පරිච්ඡේදයේ කමිටු සාමාජිකයින් (NC) ලෙස කටයුතු කළ නිලධාරින් හා විශ්‍රාමිකයින්ද වර්තමාන NC කමිටු සාමාජිකයින් ද 2019.10.09 දින පැවැත්වෙන කාරක සභාවට කැඳවන ලෙස නියෝග කළ කාරක සභාව එම කාලය තුල සිදුකර ඇති විමර්ශන සංඛ්‍යාව, සලකා බලන ලද කරුණු සහ ලබා දුන් නිර්දේශ ඇතුලත් සවිස්තර වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට දැන්වීය. |
| 9 | ඩබල් කැබ් මාදිලියේ වාහන ස්වරූපයට සමාන අයුරින් නිෂ්පාදනය කර තිබුණු ටොයෝටා හයිලක්ස් ස්මාට් කැබ් මාදිලියේ වාහන ආනයනය කිරිමේදි සිංගල් කැබ් වාහන සඳහා අයකරනු ලබන රේගු බදු පරිමාණ අයකිරිම හේතුවෙන් එක් වාහනයකින් රු.මිලියනය බැගින් වාහන 3000 න් රු. බිලියන 3 ක පාඩුවක් සිදුවි තිබීම. | මෙම මතය සමග එකඟවිය නොහැකි බව පැවසූ ප්‍ර.ග.නි. බොහෝ අවස්ථාවල HS සංකේත වල සිදුවන වෙනස්කම් දැනුම් දීමේදි සිදුවන ප්‍රමාදය හේතුවෙන් බදු අයකිරිමේ දී මෙවැනි පාඩු සිදුව ඇති බවත්, සාවද්‍ය රේගු ලේඛන මත ලියාපදිංචි කර ඇති වාහන පිළිබඳව විමර්ශනයක් කිරිම සඳහා මධ්‍යම විමර්ශන ඒකකය වෙත යොමු කර ඇති බවත් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන සියළුම විමසුම් අදාළ අංශ වෙත ඉදිරිපත් කර පසුවිපරම් සිදුකරන බවත් සෑම මාස දෙකකට වරක් කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පවත්වා ගැටලුවලට විසඳුම් ලබාදිමට ක්‍රියාකර ඇති බව වැඩිදුරටත් පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් <br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග <br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | රේගු සටහන්කර ව්‍යාජ ලෙස භාවිතාකර නීති විරෝධී අයුරින් රේගු බදු නොගෙවා ආනයනය කරන ලද හෝ සකස් කරන ලද වාහන 10 ක් ලියාපදිංචි කිරීමෙන් රු.මිලියන 60 ක පමණ බදු අහිමිවීම සහ එවැනි අවස්ථා විශාල සංඛ්‍යාවක් කාරක සභාව හමුවේ නිරීක්ෂණය වූ බැවින් මෙම කරුණු පිළිබඳව අමාත්‍යාංශය නිසි අවධානයක් යොමු කර නොමැති බව කාරක සභාවේ මතය විය. | |
| **උතුරු මැද පළාත් සභාව**<br>**(උතුරු මැද පළාත් සභාවේ වකුගඩු රෝගී ගැටළුව හා R.O. පද්ධති පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා)**<br>**2019 සැප්තැම්බර් 24** | | |
| 01. | වකුගඩු රෝගීන් සඳහා ස්ථාපිත රුධිර කාන්දුකරන ඒකක සඳහා අවශ්‍ය වන R.O. යන්ත්‍ර (ජල පෙරණ යන්ත්‍ර) මිලදී ගැනීමේදී රෝගීය අමාත්‍යාංශයෙන් සම්මත පිරිවිතරයන් හා මාර්ගසූචක නිකුත් කර තිබේද යන්න පිළිබඳව කාරක සභාව විමසීය. | අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් අදාළ තාක්ෂණික පිරිවිතරයන් සකසා නිකුත් කිරීම සිදු කරන බවත්, ඇතැම් අවස්ථාවල පළාත් සභාවල තාක්ෂණික ඇගයීම් කමිටුවලට අනුයුක්ත ජීව වෛද්‍ය ඉංජිනේරුවන් විසින් අවශ්‍යතාවයන් අනුව සුළු වශයෙන් පිරිවිතරයන්හි වෙනස්කම් සිදු කරන බවත් ප්‍ර.ග.නි. සඳහන් කළේය.<br>මේ වන විට වෛද්‍ය උපකරණ බොහොමයක් සඳහා සම්මත පිරිවිතරයන් සකසා අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර ඇති බවත්, එම පිරිවිතරයන්ගෙන් බැහැර වන්නේ නම් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතු බවත් පැවසූ ප්‍ර.ග.නි. ඉතිරි වෛද්‍ය උපකරණ සඳහාද පිරිවිතරයන් සැකසීම සිදු කරන බව පැවසීය. |
| 02. | උතුරු මැද පළාතේ රෝහල් සඳහා මිලදී ගත් R.O. යන්ත්‍ර 05 පිළිබඳ | 2015 වසරේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අරඹා මිලදී ගත් R.O. යන්ත්‍ර 05 උතුරු මැද පළාතේ රෝහල් 05ක ස්ථාපිත කළ බවත් ඉන් මැදවච්චිය රෝහලේ ස්ථාපිත යන්ත්‍රය වසරක් තුළ 11 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | වර්තමාන තත්ත්වය හා ප්‍රසම්පාදන පටිපාටිය | වතාවක් බිඳ වැටීමට ලක් වූ බවත්, හිඟුරක්ගොඩ රෝහලේ හා මැදිරිගිරිය රෝහලේ ස්ථාපිත යන්ත්‍ර පිළිවෙළින් දෙවතාවක් හා සය වතාවක් බිඳ වැටීමට ලක් වූ බව අනාවරණය වීම. එසේම විදුලි බල සැපයුම නැති හෙයින් කැබිතිගොල්ලෑව හා තඹුත්තේගම රෝහල්වල යන්ත්‍ර තවම ක්‍රියාත්මක කර නොමැති බවද හෙළිවිය. මෙම යන්ත්‍ර බිඳවැටීම්වලින් පසු ඒවා පිළිසකර කිරීමේ හා නිසි පරිදි නඩත්තු කිරීමේ හැකියාව සැපයුම්කාර සමාගම්වලට නොමැති බව අනාවරණය වූ බැවින් ජල සම්පාදන මණ්ඩලය මඟින් නඩත්තු කටයුතු සිදු කරගැනීමට සිදු වූ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 03. | පළාත් සභාවලට මුදල් නිදහස් කළ පසු මෙවැනි තත්ත්වයන් පිළිබඳ රේඛීය අමාත්‍යාංශය විසින් පසු විපරම් කටයුතු සිදු කිරීම. | මෙම සිද්ධිය පිළිබඳ නිර්දේශයන් සහිතව මූලික වාර්තාවක් 2019 ඔක්තොම්බර් 10 දින වන විට ලැබීමට සළස්වන ලෙස ප්‍ර.ග.නි.හට නියෝග කළ කාරක සභාව හැකි ඉක්මනින් මෙම යන්ත්‍ර යථා තත්ත්වයට පත් කර රෝගීන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රයෝජන ගැනීමට පියවර ගත යුතු බවද, මෙවන් පරිපාලන වශයෙන් දුර්වල තීන්දු ගත් නිලධාරින්ට මෙහි වගකීමෙන් මිදිය නොහැකි බවද ඉදිරියේදී මෙවන් දෑ සිදු නොවීමට වගබලා ගත යුතු බවද ප්‍රකාශ කළේය. රේඛීය අමාත්‍යාංශයේ පසු විපරම හා මාර්ග සූචක සැපයීම මීට වඩා ඉහළ විය යුතු බවද කාරක සභාව අවධාරණය කළේය.<br><br>R.O. යන්ත්‍ර වැනි වෛද්‍ය උපකරණ ගණයට නොවැටෙන නමුත් වෛද්‍ය උපකරණවල ක්‍රියාකාරිත්වයට අවශ්‍ය වන වෙනත් උපකරණ තිබේද යන්නද සොයා බලා එම යන්ත්‍ර මිලදී ගැනීම්ද බලයලත් අධිකාරියක සහතිකය යටතේ නියාමනය කිරීමට පියවර ගන්නා ලෙස කාරක සභාව ප්‍ර.ග.නි.ට නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව ඉදිරිපත් කර තිබුණි.**<br>**(ඇමුණුම 16)** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| 04. | ආහාරවල හා ජලයේ අඩංගු බැර ලෝහ සංයුතිය පරීක්ෂා කිරීම සඳහා රු. මිලියන 28ක වියදමක් දරා ඇති අනුරාධපුර තත්ත්ව පාලන ඒකකයේ ICPMMS පද්ධතිය මේ වන විට ඌණ උපයෝජිතව පැවතීම. | ඒ පිළිබඳව වාර්තාවක්ද 2019 ඔක්තෝබර් 10ට පෙර එවන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි.ට නියෝග කළේය.<br><br>**අදාළ වාර්තාව ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම 17)** |
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br>2019 ඔක්තෝම්බර් 23** | | |
| 01. | 2012 වසරේ විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තාවේ සඳහන් වූ කරුණු අනුව වෙනත් මෝටර් රථවලට හෝ යතුරුපැදිවලට අදාළ රේගු සටහන්කර භාවිතා කර ලෑන්ඩ් කෲසර්, ප්‍රාඩෝ වැනි සුඛෝපභෝගී වාහන ආනයනය කර තිබූ අවස්ථා විශාල වශයෙන් සිදුවී තිබීම.<br><br>ආනයනික මෝටර් රථවල නිෂ්පාදන වර්ෂය, නිෂ්පාදිත රට සහ සිලින්ඩර ධාරිතාවය ඇතුළු වැදගත් තොරතුරු රේගු පරිගණක ජාලය හා සම්බන්ධ කර නොතිබීමෙන් ඉහත කරුණු වෙනස්කර මෝටර් වාහන ලියාපදිංචි කර තිබෙන අවස්ථා කාරක සභාව හමුවේ අනාවරණය වීම. | ශ්‍රී ලංකා රේගු පරිගණක පද්ධතිය සමඟ සම්බන්ධ වූ පසු මෙවන් සිදුවීම් සිදුවීමේ අවකාශයක් නොමැති බවත්, පරිගණක පද්ධති භාවිතා නොවූ පෙර වකවානුවල මෙවැනි සිදුවීම් සිදුවන්නට ඇති බවත් පැවසූ ග.නි. පැවති අඩුපාඩු නිරාකරණය කරගනිමින් සිටින බව පැවසීය.<br><br>විධිමත් ලෙස රේගු පරිගණක පද්ධතිය සමඟ දෙපාර්තමේන්තුව සම්බන්ධ වුණේ කවදාද, මේ වන විට රේගු පරිගණක ජාලය හා සම්බන්ධ වී තිබෙන්නේ කුමන වාහන කාණ්ඩ සඳහාද, තවමත් රේගු පරිගණක ජාලය හා සම්බන්ධ නොවුණු වාහන කාණ්ඩ ඇතිනම් ඒ මොනවාද, හා එම වාහන කාණ්ඩ රේගු පරිගණක පද්ධතිය සමඟ සම්බන්ධ වීමට අපේක්ෂිත කවදාද යන කරුණු පිළිබඳ වාර්තාවක් 2019 නොවැම්බර් 10 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කරන ලදී.<br>**ඒ අනුව, 2014.01.01 දින සිට සියළුම වාහන කාණ්ඩවලට අදාළව රේගු නිෂ්කාශන තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. දැනට අවසාන අදියරේ පවතින ශ්‍රී ලංකා රේගුව හා මෙම දෙපාර්තමේන්තුව අතර ඇති කර ගන්නා මාර්ගගත රේගු අන්තර් සම්බන්ධතා ක්‍රියාවලිය හා 2020 ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරීගේ කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | **මෙම ක්‍රියාවලිය හා නව ඉ-මෝටරින් ව්‍යාපෘතියේ ක්‍රියාවලි ස්වභාවය අනුව අක්‍රමිකතා කිරීමේ සියලු අවස්ථා වැළකෙනු ඇති බව ප්‍ර.ග.නි./ග.නි.ගේ පිළිතුරේ සඳහන් වී ඇත.** |
| 02. | ඉ-මෝටරින් ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය | 2020 මාර්තු මස අවසන් වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කරන බවද ඒ සඳහා ගොඩනැඟිලි ඇතුළු අනෙකුත් පහසුකම් සැපයීම තවමත් සිදු කරමින් පවතින බවද ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. එනමුත් බාහිර සමාගම්වලින් ඉටුකරගනු ලබන කටයුතු ඉදිරිපත් කරනු ලැබූ කාලරාමුව තුළ සිදු වේ යැයි තමන්ට සහතික විය නොහැකි බව තවදුරටත් පැවසීය.<br><br>මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලබා දී තිබූ කාල රාමුවලට අනුව නිසි කාලයේදී මෙම ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන්ද කාරක සභාවේ දැඩි අප්‍රසාදය පළ විය.<br><br>මෙම ව්‍යාපෘතියේ කාලරාමු ඉදිරිපත් කිරීමේදී මෙහෙයුම් කමිටුවල නිලධාරීන්ගේ සහතික කිරීම් සමඟම එය ඉදිරිපත් කරන ලෙසට නියෝග කළ කාරක සභාව මෙම ව්‍යාපාතියේ වර්තමාන තත්ත්වය හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට නියමිත දින වකවානු පිළිබඳ වාර්තාවක් සතියක් තුළ (2019.10.30) ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය.<br>**ඒ අනුව අදාළ වාර්තා ඉදිරිපත් කර ඇත.**<br><br>**ව්‍යාපෘති කාලරාමු වෙනස් කරන්නේ නම් එය මුලින්ම ව්‍යාපෘති කළමනාකරණ කමිටුවට යොමු කොට එකඟතාවය ලබාගෙන ඉන් අනතුරුව අමාත්‍යාංශ ලේකම්ගේ හෝ කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් රැස්වෙන ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|---|
| | | අනුමැතියට යොමු කර අනුමැතිය ලබාගන්නා බව සඳහන් කර ඇත.<br><br>දැනට ක්‍රියාත්මක කාලරාමුව අනුව මෙම ව්‍යාපෘතිය 2020 මාර්තු මාසයේදී ක්‍රියාවට නැංවීමට නියමිතය. (ඇමුණුම 18)<br><br>ව්‍යාපෘතියට සම්බන්ධිත තෙවන පාර්ශ්ව, පද්ධතිය හා සම්බන්ධවීම් මෙන්ම යටිතල පහසුකම් සපයාගැනීම සඳහා කටයුතු කිරීමේදී දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැරවන අවස්ථා බොහෝ බවත් සඳහන් කර ඇත. |
| 03. | රියදුරු බලපත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු නොකර BOO පදනම යටතේ නව ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරමින් පැවතීම. | මේ සම්බන්ධයෙන් කාරක සභා නිර්දේශය වූයේ, රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය රජයට පවරා ගැනීම, බලපත්‍ර ගාස්තුව අඩු කිරීම, රජයට හිමි බලපත්‍ර මුද්‍රණ උපකරණ යාවත්කාලීන කොට රජයට පවරා ගැනීම, මෙම ක්‍රියාවලිය රජයට අයත් ව්‍යාපෘතියක් ලෙස නම් කර වෙනම ඒකකයක් ස්ථාපිත කිරීම හා අවශ්‍ය නම් සේවා ගිවිසුමකට යොමු වීම යන කරුණු වේ.<br><br>රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය රජයට පවරාගෙන සිදු කිරීමට අපහසුතාවයක් පවතින්නේනම් ඒ බව සඳහන් කිරීමට හේතු දක්වමින් වාර්තාවක් සතියක් තුළ (2019.10.30) ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය.<br><br>අමාත්‍යාංශය විසින් පත් කළ ස්වාධීන කමිටුව නිකුත් කළ වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසද, රියදුරු බලපත්‍රයක මිල අඩු කිරීම කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන ලෙසද ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළ කාරක සභාව තමන් විසින් පෙර කාරක සභාවේ සඳහන් කළ නිර්දේශයන්හි වෙනසක් සිදු නොවන බව වැඩිදුරටත් පැවසීය. |

| | | |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු |
| | | ඒ අනුව පිළිතුරු වාර්තා ඉදිරිපත් කර ඇත. රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන ප්‍රසම්පාදනය නව සැලසුමක් නොවන බවත්, **2017.10.11** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමත කරන ලද්දක් බවත්, ඒ සඳහා ලංසු භාර ගැනීම **2018.08.31** දිනෙන් අවසන් වූ බවත්, එනමුත් **2019.04.09** රැස්වූ අමාත්‍ය මණ්ඩලය ලබා දුන් තීරණයක් අනුව මෙම **BOO** ප්‍රසම්පාදනය අවලංගු කිරීමටත්, නැවතත් ප්‍රසම්පාදන කටයුත්ත මුල සිට ආරම්භ කිරීමට තීරණය කරන ලද බවත් සඳහන් කර ඇති අතර අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා තීරණවල පිටපත් අමුණා ඇත.<br><br>ඒ අනුව **BOO** ක්‍රමය යටතේ නව ප්‍රසම්පාදනයකින් සුදුසු සේවාදායකයෙකු තෝරා ගන්නා තුරු වර්තමාන පද්ධතියේ අයිතිය හා පරිපාලනය දෙපාර්තමේන්තුව වෙත තබාගෙන වර්තමාන සේවාදායකයා සමඟ සේවා හා නඩත්තු ගිවිසුමකට එළඹීමට **2019.10.01** දිනැතිව ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තමන් කටයුතු කරමින් පවතින බව ප්‍ර.ග.නි./ග.නි. දන්වා ඇත. |
| **වත්තල මාබෝල නගර සභාවේ පර්චස් 79ක ඉඩම විකිණීම සම්බන්ධව විශේෂ කාරක සභා රැස්වීම<br>2019 නොවැම්බර් 07** | | |
| 01. | නගර සභාව සතු මෙම ඉඩම් බදු දීමේදී සිදුවූ අක්‍රමිකතාවයන්ට එරෙහිව පියවර ගැනීම. | 2012 වසරේදී වත්තල මාබෝල නගර සභාවේ සිදුවූ මෙවන් අවිධිමත් ඉඩම් බදු දීම්වලට එරෙහිව විශ්‍රාමික විනිසුරුවරයෙකු යටතේ පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කර චෝදනා ගොනු කර වර්තමාන සභාපතිවරයා එම චෝදනාවලට වරදකරු බව ඔප්පු කළත් ඒ වන විට ඔහුගේ ධූර කාලය අවසන් වීමත් සමඟ ඇතිවූ නෛතික තත්ත්වය මත ඉදිරි පියවර ගත නොහැකි වූ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග<br>- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | නගර සභාවේ මෙම අක්‍රමිකතාවයන්ට හවුල් වූ සියලුම නිලධාරින්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කළ යුතු බව කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කරන ලදී. මේ සම්බන්ධයෙන් නැවත විමර්ශනයක් සිදු කොට වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කිරීම සඳහා විශ්‍රාමික විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතු කොමිෂන් සභාවක් පත් කර මාස 3ක් තුළ නිර්දේශ ලබා ගන්නා ලෙස ආණ්ඩුකාරතුමාට දැන්වීමටද කාරක සභාව තිරණය කළේය.<br><br>**කාරක සභාව විසින් ඉහත සඳහන් කාරක සභා නිර්දේශය ආණ්ඩුකාරතුමාට දන්වා ලිපියක් යොමු කරන ලදී.** |
| 02. | පළාත් පාලන ආයතන සතු ඉඩම් හා වත්කම්වලින් ආදායම් ජනනය කිරීමේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව මෙවැනි ඉඩම් නිසි පරිදි බදු දීම හරහා විශාල ලෙස ආදායම් ජනනය කළ හැකි බව පැවසීය. | මෙම සිද්ධිය උදාහරණයක් ලෙස ගෙන සමස්ත පළාත් සභාවේම පළාත් පාලන ආයතන සතු ඉඩම් හා වත්කම්වලින් ආදායම් ජනනය කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා දිස්ත්‍රික්කයකට එක බැගින් දිස්ත්‍රික්ක 3 සඳහා කමිටු 3ක් පත් කරන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලදී. එම කමිටුවේ සංයුතිය හා කාර්යභාරය පිළිබඳ සති 2ක් තුළ (2019.11.21) කාරක සභාවට වාර්තා කරන ලෙසද එම කමිටුවල නිර්දේශ ඇතුළත් මූලික වාර්තාවක් මාස 2ක් තුළ (2020.01.07) කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 03. | ඉඩම සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර | මෙම ඉඩම නගර සභාවට පවරාගත් පසු නැවත අවුරුදු 30කට බදු දීමට මහ සභා රැස්වීමේදී එකඟතාවය පළ වූ බවත්, අවුරුදු 10කට වඩා බදු දෙන්නේ නම් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ යුතු බවට ආණ්ඩුකාරවරයා දැනුම් දී ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෙම ප්‍රදේශයේ වැසියන්ගේ පොදු කටයුතු වෙනුවෙන් ඉඩම් හිඟ බවත්, ප්‍රදේශවාසීන් ඉඩම නැවත පෙර සමාගමටම බදු දීමට විරෝධය පළ කරන බවත් කාරක සභාවේදී අනාවරණය වූ හෙයින් ප්‍රදේශවාසීන්ගේ පොදු පහසුකම් ඉටු |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග**<br>**- අදාළ ආයතනය විසින් ලබා දෙන ලද පිළිතුරු** |
|---|---|---|
| | | කිරීමෙන් අනතුරුව නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මෙම ඉඩම බදු දිය හැකි බවට කාරක සභාව නිර්දේශ කළේය. |
| 04. | තවමත් මෙම ඉඩම ලියාපදිංචි වී ඇත්තේ ''වගුරු ඉඩමක්'' ලෙසින් වීම නිසා ඉඩමේ තක්සේරු වටිනාකම විශාල වශයෙන් අඩු වීම | මෙම ඉඩම ''ගොඩ ඉඩමක්'' ලෙස ලියාපදිංචි කිරීම සඳහා පළාත් පාලන ආයතනය විසින් ප්‍රථමයෙන් කඩිනම් පියවර ගත යුතු බවට නියෝග කළ කාරක සභාව මේ සම්බන්ධයෙන් අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට හා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට දැන්වීමට තීරණය කළේය.<br><br>ඉහත පරිදි මෙම ඉඩම ''ගොඩ ඉඩමක්'' ලෙස ලියාපදිංචිය වෙනස් කිරීමෙන් අනතුරුව පමණක් නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් එය නැවත බදු දීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |

**ඇමුණුම 01**

**ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාර්යසාධන විගණන වාර්තාව**

**නිර්දේශ**

i. ශ්‍රී ලංකාවට ගෙන්වනු ලබන ලෙක්ස් මාර්ක් ටෝනර් උපකරණයේ ශ්‍රී ලාංකික නියෝජිත ලෙස ඊවිස් පෙරිපරල්ස් ආයතනය ක්‍රියාත්මකවන අතර ඔවුන් සාමාජීය වගකීම සංකල්පය යටතේ (CSR) උත්පාදකයා වගකීමේ ක්‍රමවේදය අනුගමනය කොට භාවිතයෙන් පසු ඉවත් කරනු ලබන ටෝනර් ඇසුරුම් අපනයනය කරනු ලබයි. එම ආයතනය ප්‍රායෝගිකව උත්පාදකයා වගකීමේ සංකල්පය ක්‍රියාත්මක කරන අතර අනෙකුත් අදාල ආයතන විසින් ද මෙම සංකල්පය ක්‍රියාත්මක කරවීමට කටයුතු කිරීම.

ii. අපද්‍රව්‍ය එකතු කරන ආයතනවල සේවකයින්ට ක්ෂේත්‍රයට උචිත ආරක්ෂිත පරිසරයක් සේවය සඳහා ඇති කිරීම.

iii. රජයේ හෝ පෞද්ගලික ආයතනයනවලින් බැහැර කරන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය දැනට වෙන්දේසි මාර්ගයෙන් ඉවත් කිරීම සිදුකරන අතර එහිදී නැවත පාවිච්චිකළ නොහැකි භාණ්ඩ මෙන්ම නැවත පාවිච්චිකළ හැකි භාණ්ඩද එකවර ඉවත් කරනු ලැබේ. එම භාණ්ඩ ආයු කාලය අවසන් වූ හා නොවූ ලෙස වෙන්කර ඉවත් කිරීම සිදුකළ යුතු අතර එහිදී ජීව කාලය අවසන් වූ භාණ්ඩ බලපත්‍ර ලාභී අපද්‍රව්‍ය එකතු කරන්නන්ට ලබා දිය යුතුය. ජීව කාලය අවසන් නොවූ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නැවත භාවිතය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය වැනි ආයතන වෙත යොමු කිරීමට කටයුතු කිරීම.

iv. රාජ්‍ය ආයතන වලින් බැහැර කරන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය තවදුරටත් ප්‍රයෝජනයට ගත හැකි නම් එම අපද්‍රව්‍ය පැහැදිලිව හඳුනාගෙන වෙන්දේසි කිරීමට සහ අනෙකුත් ඉවතලන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය විනාශ කිරීමට නිර්දේශ නොකොට එම අපද්‍රව්‍ය කළමනාකරණය කරන බලපත්‍ර ලාභී ආයතනය වලට ලබාදීමට කටයුතු කිරීම සඳහා චක්‍රලේඛ නිකුත් කිරීම හා මෙම අපද්‍රව්‍ය එකතු කරන්නන්ගේ නාම ලේඛනය එම චක්‍රලේඛය සමග සියලු රාජ්‍ය ආයතනවලට දැනගැනීමට සැලැස්වීම.

v. රාජ්‍ය ආයතනවල භාණ්ඩ සමීක්ෂණයෙහි ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය විනාශ කිරීම සඳහා නිර්දේශ නොකළ යුතු අතර ඒ සඳහා පළාත් මට්ටමින් හෝ දිස්ත්‍රික් හෝ වෙනත් පහසු ලෙස මට්ටමින් එම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට එකතු කිරීමට ක්‍රියා කළ යුතුය. ඒ සඳහා පළාත් පාලන ආයතන සම්බන්ධ කරගත හැකි අතර එම එකතු කරන අපද්‍රව්‍ය බලපත්‍රලාභී අපද්‍රව්‍ය එකතු කරන ආයතනවලට, කාර්මික පුහුණු ආයතනවලට සහ පාසල් වලට ලබා දීම මගින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වලට මෙන්ම නැවත ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා යොදාගත හැකි වීම.

vi. දැනට භාවිතා කරන භාණ්ඩ සමීක්ෂණ ආකෘති සුදුසු පරිදි සංශෝධනය, අදාල මුදල් රෙගුලාසි සංශෝධනය.

vii. කොළඹ දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවල ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීම කාර්යක්ෂමව සිදුකිරීම සඳහා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ අවස්ථාවන් හා ස්ථාන (Drop off events and places) ගණන වැඩි කිරීම.

viii. ඝන අපද්‍රව්‍ය, උපද්‍රවකාරී අපද්‍රව්‍ය, විද්‍යුත් අපද්‍රව්‍ය, රෝහල් අපද්‍රව්‍ය සඳහා පොදු ධූරාවලිය වෙනුවෙන් ඒ සඳහා විශේෂිත වෙනම ධූරාවලියක් නිර්මාණය කළ යුතුවීම.

ix. පාසල් විෂය මාලාවට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පාඩම් මාලා ඇතුලත් කිරීම.

x. පරිගණක හා ජංගම දුරකථන මගින් නිපදවෙන විද්‍යුත් අපද්‍රව්‍ය උපද්‍රවකාරී අපද්‍රව්‍යයන් ලෙස සලකා ඒවා ජනනය, ගබඩා කිරීමේදී, ප්‍රවාහනය කිරීමේදී ආදී අවස්ථාවන් හිදී අනුගමනය කළයුතු ක්‍රමවේදය මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකසා 2008 අංක 01 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) ඇතුලත් කර ඇතත් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසා එවා ප්‍රායෝගිකව තහවුරු කිරීම සඳහා පරිසර අධිකාරියේ අධීක්ෂණ වාර ගණන වැඩි කිරීම මෙන්ම බලපත්‍ර අළුත් කරන අවස්ථාවේදී හෝ පැමිණිල්ලක් ලද විට සිදුකරන පරීක්ෂා කිරීම ක්‍රියාවලිය ඉහළ නැංවීමෙන් විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කරන්නන් අදාළ ක්‍රමවේදයන්ට ක්‍රමානුකූලව අනුගත කර ගැනීම.

xi. විද්‍යුත් අපද්‍රව්‍ය එකතුකරන්නන් වෙත බලපත්‍ර නිකුත් කිරීමේදී සහ අළුත්කිරීමට 2008 අංක 01 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) නියෝගයන්හී 15 (අ), 16 වගන්තිය ප්‍රකාරව සෑම බලපත්‍ර ඉල්ලුම් කරන්නෙක් වෙතින්ම පිළිගත හැකි වලංගු රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට කටයුතු කිරීම.

xii. නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත වන යෙදවුම් ද්‍රව්‍ය හා තාක්ෂණය වෙනස් කිරීම හා යහපත් නිෂ්පාදන පුරුදු යොදාගැනීම මගින් අපද්‍රව්‍ය ජනනය වන මූලාශ්‍ර පාලනය.

xiii. අපද්‍රව්‍ය ශූන්‍ය සංකල්පය (Zero Waste Concept) එනම් අපද්‍රව්‍යක් වෙනත් නිෂ්පාදන ක්‍රියාවලියකට අවශ්‍ය වන්නා වූ තවත් යෙදවුමක් ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.

xiv. අදාල පහසුකම් පවතීනම් උපකොන්ත්‍රාත් ක්‍රමය අනුව ප්‍රාදේශීයව පිහිටි ආයතනයන්ටද ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස්කිරීම සඳහා බලපත්‍ර ලබාදීම මගින් ප්‍රදේශයෙන් ජනනයවන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ හැකියාව ගොඩනගා ගැනීමට කටයුතු කිරීම.

xv. වැඩියෙන් පාරිභෝජනය කරන භාණ්ඩ ආනයනය කිරීමේදී ඒවායේ ගුණත්වය සම්බන්ධව ප්‍රමිති තීරණය කර ක්‍රියාත්මක කිරීම.

xvi. වැඩි ආයු කාලයක් සහිත විද්‍යුත් උපකරණ ආනයනය කිරීමට පෙළඹවීම.

xvii. සිළුල්ළුල් විදුලි බුබුළු ආනයනය කිරීමේදී ප්‍රතිචක්‍රීයකරණය සිදු නොකරන ආයතනවලට ආනයනය කිරීමට අවසර ලබානොදීම.

ආයතනයේ අදහස් දැක්වීම

3.3.1, 3.3.2, 3.3.4, 3.3.5, 3.3.6 ඡේද සඳහා ආයතනය අදහස් දක්වා නැත.

**නිගමනය**

i. ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු සිදුකරන ප්‍රධාන ආයතනය මධ්‍යම පරිසර අධිකාරිය වන අතර දැනට බලපවත්නා නීති, රීති ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් වන සිය කාර්යභාරය ඉටු කිරීම පසුගාමී තත්ත්වයක පවතී. එබැවින් පවත්නා නීති රාමුව ශක්තිමත් කිරීම හදිසි කටයුත්තක් බව නිගමනය කරනු ලැබේ.

ii. පාරිභෝගිකයා දැනුවත් කිරීම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ප්‍රධානතම අංගයක් ලෙස පෙන්වා දිය හැකි අතර එසේ දැනුවත් කිරීම සඳහා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග ඵලදායිකව ක්‍රියාත්මක වී නොමැතිවීම හේතුවෙන් ඒ සඳහා කඩිනමින් පියවර ගැනීම අත්‍යවශ්‍ය බව නිගමනය කරනු ලැබේ. මේ සඳහා නිෂ්පාදකයා විසින්ම එය කළමනාකරණය කිරීමේ වගකීම දැරීම (EPR සංකල්පය) ඉතා ඉක්මනින් හඳුන්වාදීම අවධාරණය කරනු ලැබේ.

iii. කල්පවත්නා හා ගුණත්වයෙන් යුත් විද්‍යුත් හා විදුලි උපකරණ සහ භාණ්ඩ පමණක් ආනයනය කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස නිගමනය කරනු ලැබේ.

### iv. මෙම ගැටළුව නිරාකරණය උදෙසා කෙටි කාලීනව, මධ්‍යකාලීනව හා දිගුකාලීනව ගතයුතු ක්‍රියාමාර්ග, විසඳුම්, අවශ්‍ය නීතිරීති සහ යෝජනා

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය යනු විශේෂ අවධානය යොමු කළ යුතු ගැටළුවක් ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව, පසුගිය දශකයක පමණ කාලය තුළ අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන මට්ටමින් මෙන්ම, පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයන්ද දායක කරගනිමින් විවිධ ක්‍රියාමාර්ගයන් ගන්නාලද නමුත්, මේ දක්වා ගැටළුවට පරිපූර්ණ සාර්ථක විසඳුමක් ලබාගත නොහැකි වී ඇත. එබැවින් මෙම ගැටළුව තව දුරටත් අවම කිරීම සඳහා මතු දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම යෝජිත අතර, ඉන් සමහරක් මේ වන විටද අරඹා ඇත. මෙහිදී මූලික වශයෙන් අවශ්‍ය ප්‍රතිපත්ති, අණපනත් හා රෙගුලාසි පරීක්ෂාකර බලා, සුදුසු පරිදි යාවත්කාලීන කිරීම මූලික වේ.

අ. වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ජාතික පරිසර ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ කාර්යය මේ වන විට ආරම්භ කර ඇත. ඊට සමගාමීව ජාතික පරිසර පනතද යාවත්කාලීන කරනු ලබන අතර වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි රෙගුලාසි සැකසීම හා සංශෝධනය සිදුකරනු ලබයි.

ආ. ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම දැනට අවසන් අදියරට ලංව ඇත. මෙම පනත් කෙටුම්පතෙහි විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව වෙනම පරිච්ඡේදයක් ඇතුළත් කොට ඇත.

ඇ. සියළුම වර්ගවල විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ආනයනය සහ භාවිතා කරන ලද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික භාණ්ඩ වාණිජ කටයුතු සඳහා මෙරටට ගෙන්වීම සපුරා තහනම් කිරීමට යෝජනා කෙරේ. එසේ වුවද මෙහිදී විදේශීය සේවයේ නියැලී පෙරලා පැමිනෙන පුද්ගලයන් සඳහා යම් සීමාවන්ට යටත්ව සහන ලබාදීම සුදුසු බව ද යෝජනා කෙරේ.

ඈ. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ හා අමතර කොටස් නිෂ්පාදනය සහ ආනයනයේදී සුදුසු ප්‍රමිතීන් හඳුන්වා දීමට කටයුතු කරනු ඇත. දැනට භාණ්ඩ වර්ග 82ක් පමණ සඳහා ආනයන ප්‍රමිතීන් සකස් කොට ඇති අතර, ඉදිරියේදී සියළුම විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ ආවරණය වන පරිදි පුළුල් කරනු ඇත. මෙයට සමගාමීව භාණ්ඩයක් පූර්ණ ජීවන චක්‍රය හා මෙහෙයුම් පිරිවැය සැළකිල්ලට ගනිමින් භාණ්ඩ මිළදී ගැනීම දිරිගන්වන හරිත ප්‍රසම්පාදන පනත් කෙටුම්පතද මේ වන විට සම්පාදනය කරමින් පවතී.

ඉ. විවිධ මාර්ගයන් හරහා රට තුළට ඇතුළුවන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ හා අමතර කොටස් පිළිබඳ දත්ත පද්ධතියක් මධ්‍යම පරිසර අධිකාරිය තුළ ස්ථාපනය කොට, යාවත්කාලීන කරමින් පවත්වාගෙනයෑමට කටයුතු කරනු ඇත.

ඊ. වඩා පරිසර හිතකාමී මෙන්ම තමන් අත ඇති මුදලට දැරිය හැකි වන පරිභෝජන රටාවක් කරා ජනතාව යොමු කිරීම සඳහා තිරසර පරිභෝජනය හා නිෂපාදනය පිළිබඳ පනත් කෙටුම්පත සම්පාදනය කොට මහජන අදහස් අදහස් ලබාගෙන ඇති අතර, ඉදිරියේදී අනුමැතිය සඳහා අමාත්‍යමණ්ඩලය වෙත යොමු කිරීමට නියමිතය.

උ. දැනට දිවයින පුරා විසිරී සිටින අවිධිමත් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරන්නන් නිසි නියාමනයකට ලක් කර, ඔවුන් සහ මෙම ක්ෂේත්‍රයේ විවිධ ක්‍රියාකාරී කොටස් ඉලක්ක කරගනිමින්, අපරීක්ෂාකාරී ලෙස එම කටයුතු වල නියැලීම හේතුවෙන් කෙටි හා දිගුකාලීනව ඇතිවිය හැකි සෞඛ්‍ය හා පාරිසරික ගැටළු පිළිබඳ නිසි දැනුවත් කිරීම් අඛණ්ඩව සිදු කරනු ඇත.

**<u>විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා යෝජිත සැලැස්මේ හඳුනාගත් ප්‍රධාන ක්‍රියාකාරකම්</u>**

**2019 - 2022**

| ප්‍රධාන සංරචක | ක්‍රියාකාරකම් | වගකීම් දරන ආයතනය | සහය දක්වන ආයතනය | කාල රාමුව |
|---|---|---|---|---|
| **1.** දැනුවත් කිරීම හා ධාරිතා වර්ධනය | 1.1 රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන දැනුවත් කිරීම | පරිසර විෂය භාර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය | 2019 අගෝස්තු 01 – 2022 මැයි 31 |
| | 1.2 ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණ ආනයනය කරන ආයතන දැනුවත් කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය | සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 2020 ජනවාරි 01 – 2022 දෙසැම්බර් 31 |
| | 1.3 විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරනු ලබන ආයතන හා පළාත් පාලන ආයතන අතර සෘජු සම්බන්ධීකරණයක් ඇති කිරීම, මේ සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය | බ.ප. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් පාලන අයතන | 2020 ජනවාරි 1 - 2022 දෙසැම්බර් 31 |
| | 1.4 පරිසර නියමු වැඩසටහන යටතේ පාසල් දරුවන් දැනුවත් කර ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දෙමව්පියන්ගේ සහයෝගය ලබා ගැනීම | මධ්‍යම පරිසර අධිකාරිය | අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 2019 අගෝස්තු 01 - 2022 දෙසැම්බර් 31 |
| | 1.5 ජාතික විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ සතියක් ප්‍රකාශයට පත් කිරීම (වාර්ෂිකව) | මධ්‍යම පරිසර අධිකාරිය | ජනාධිපති කාර්යාලය, පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය, බ.ප. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය | 2020 ජනවාරි 01 - 2022 දෙසැම්බර් 31 |
| | 1.6 ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හේතුවෙන් ඇතිවන සෞඛ්‍ය හා ආර්ථික තර්ජන පිළිබඳව පොදු මහජනතාව සියලු ශ්‍රව්‍ය දෘශ්‍ය හා මුද්‍රිත මාධ්‍ය භාවිතයෙන් දැනුවත් කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශය | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, මාධ්‍ය ආයතන | 2020 ජනවාරි 01 - 2022 දෙසැම්බර් 31 |
| | 1.7 ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හේතුවෙන් ඇති වන පාරිසරික ගැටළු පිළිබඳව පොදු මහජනතාව සියලු ශ්‍රව්‍ය දෘශ්‍ය හා මුද්‍රිත මාධ්‍ය භාවිතයෙන් දැනුවත් කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, මාධ්‍ය ආයතන | 2020 ජනවාරි 01 - 2022 දෙසැම්බර් 31 |

| | | | | |
|---|---|---|---|---|
| | .1.8 ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් අපද්‍රව්‍ය මහජනතාවට භාර දිය හැකි ස්ථානආයතන පිළිබඳ , ය මඟින් ජාතික තොරතුරු කේන්ද්‍ර ලබාදීම | ජාතික තොරතුරු කේන්ද්‍රය | මධ්‍යම පරිසර අධිකාරිය | 2019 අගෝස්තු 01 - 2022 දෙසැම්බර් 31 |
| | 1.9ධාරිතා වර්ධනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් පරිසර නිලධාරීන් පුහුණු කිරීම හා ඔවුන් මගින් වෙළෙන්දන් දැනුවත් කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය | පරිසර විෂය භාර අමාත්‍යාංශය | 2020 ජනවාරි 10, - 2022 දෙසැම්බර් 31 |
| **2.** විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සඳහා දත්ත පද්ධතියක් සැකසීම සහ පවත්වාගෙන යාම | 2.1 ජාතික තලයේ මූලික සමීක්ෂණයක් සිදු කිරීම | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | පරිසර විෂය භාර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය<br>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව<br>විශ්වවිද්‍යාල | 2020 ජනවාරි 01 – 2020 ජූනි 30, |
| | 2.2 ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංගණනය මඟින් ලබා ගන්නා තොරතුරු මඟින් ශ්‍රී ලංකාව තුළ ගෘහස්ථ හා ආයතන මට්ටමින් පවතින විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ ප්‍රමාණයන් හා වර්ග පිළිබඳ වෙන වෙනම තොරතුරු ලබා ගැනීම | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | පරිසර විෂය භාර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය | 2021 ජනවාරි 10 – 2021 දෙසැම්බර් 10, |
| | 2.3 විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ රට තුළට ආනයනය කළ පසු එම භාණ්ඩ වල බෙදාහැරීම හා භාවිතය පිළිබඳ තොරතුරු ලබා ගැනීම තොග ) වෙළෙන්දාගේ සිට සිල්ලර වෙළෙන්දා දක්වා( | ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා රේගුව, ආනයනකරුවන් හා වෙළෙන්දන් | 2019 සැප්තැම්බර් 1- 2022 දෙසැම්බර් 31 |
| | 2.4 විදුලි සංදේශ උපකරණ රටතුළට ආනයනය කළ පසු එම භාණ්ඩ වල බෙදාහැරීම හා භාවිතය පිළිබඳ තොරතුරු ලබා ගැනීම (තොග වෙළෙන්දාගේ සිට සිල්ලර වෙළෙන්දා දක්වා) | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | ශ්‍රී ලංකා රේගුව, ආනයනකරුවන් හා වෙළෙන්දන් | 2019 සැප්තැම්බර් 1- 2022 දෙසැම්බර් 31 |
| **3.** මෙරටට ගෙන්වන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ නියාමනය කිරීම | 3.1 මෙරටට ගෙන්වන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණවලට ප්‍රමිත සැකසීමේදී අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම | මධ්‍යම පරිසර අධිකාරිය | පාරිභොගික කටයුතු පිළිබඳ අධිකාරිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 2019 සැප්තැම්බර් 01, - 2020 අගෝස්තු 31, |
| | 3.2 විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණවලට ප්‍රමිත සැකසීම | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | | 2019 ඔක්තෝම්බර් 01, – 2020 දෙසැම්බර් 15 |

| | | | | |
|---|---|---|---|---|
| | 3.3 භාවිතා කරන ලද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ හා උපකරණ කොටස් මෙරටට ගෙන්වීම වැලැක්වීම සඳහා නීති සැකසීම හා නීති විරෝධී ලෙස ගෙන්වන අපද්‍රව්‍ය නැවත ප්‍රති නැව්ගත කිරීම සඳහා නිර්දේශ ලබා දීම | මධ්‍යම පරිසර අධිකාරිය | ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව | 2019 අගෝස්තු 01 – 2020 ජූනි 30, |
| | 3.4 මෙරටට ගෙන්වන භාවිතා කරන ලද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ නියාමනය කිරීම සඳහා බාසල් සම්මුතිය යටතේ පවතින ක්‍රමවේද භාවිතා කරමින් රටකුලට පැමිණෙන භාවිතා කරන ලද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ හා උපාංග තහනම් කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය | ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 2019 අගෝස්තු 01 -, 2019 නොවැම්බර් 30 |
| | 3.5 ඉලෙක්ට්‍රොනික භාණ්ඩ සඳහා අගය මත බල පැවැත්වෙන ලෙස තීරු බදු අයකිරීමේ ක්‍රමවේදය වෙනස් කොට සමාන අගයන් ඇති කිරීම තුළින් ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ භාවිතයට පාරිභෝගිකයා පෙළඹවීම | මුදල් අමාතයාංශය | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය | 2019 සැප්තැම්බර් 1- 2019 දෙසැම්බර් 31 |
| | 3.6 භාවිතා කළ භාණ්ඩ හඳුනාගත හැකි වන පරිදි HS codes සැකසීම | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | පරිසර විෂය භාර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව | 2019 සැප්තැම්බර් 1- 2020 දෙසැම්බර් 31, |
| 4 . විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ ක්‍රමවේදයක් සැකසීම | 4.1 පළාත් පාලන ආයතන මගින් ගෘහස්ථ මට්ටමින් විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීම ,ගබඩා කිරීම හා ආරක්ෂිතව බැහැර කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම | පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය | ඝ.ප. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය | 2020 ජනවාරි 1 – 2022 මැයි 31 |
| | 4.2 පළාත් මට්ටමින් විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කරන්නන් උනන්දු කරවීම හා ලියාපදිංචි කොට අවශ්‍ය උපලේඛණගත බලපත්‍ර ලබා දීමට කටයුතු කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය | පෞද්ගලික අංශය | 2019 නොවැම්බර් 01, – 2020 මාර්තු 31, |
| | 4.3 රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන හා අධ්‍යාපන ආයතනවල ජනනය වන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස අපහරනය කිරීමේ ක්‍රමෙවේදයක් සකස් කිරීම. මේ සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීම | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාතයාංශය | පරිසර විෂය භාර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ලියාපදිංචි ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන | 2019 සැප්තැම්බර් 01, – 2020 නොවැම්බර් 30 |

| | | | | |
|---|---|---|---|---|
| | 4.4 පෞද්ගලික අංශය සඳහා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් සැකසීම | මධ්‍යම පරිසර අධිකාරිය | පරිසර විෂය භාර අමාත්‍යාංශය | 2019 සැප්තැම්බර් 01- 2020 ජූනි 30, |
| .5 විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කරන කර්මාන්ත වැඩිදියුණු කිරීම | 5.1 විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන ලියාපදිංචි කිරීම , නියාමනය අඛණ්ඩව සිදුකිරීම හා ඔවුන්ගේ රැකියා තත්වය උසස් කිරීමට කටයුතු කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය | කුඩා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය, කම්කරු විෂය භාර අමාත්‍යාංශය | වාර්ෂිකව |
| 6. අවිධිමත් ආකාරයෙන් අපද්‍රව්‍ය එකතු කිරීමේ යෙදී සිටින්නන් (Informal Waste Collectors) ගැටළු අවම කිරීම | 6.1විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ යෙදී සිටින අවිධිමත් අංශ හඳුනා ගැනීම හා ඔවුන් දැනුවත් කිරීම් හා පුහුණු කිරීමේ වැඩසටහන් මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් පළාත් කාර්යාල මට්ටමින් සිදුකර විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියකට ඇතුළත් කර ගැනීම | මධ්‍යම පරිසර අධිකාරිය | කම්කරු විෂය භාර අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන අධිකාරිය, පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය, කුඩා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය | 2020 ජනවාරි 1 – 2020 දෙසැම්බර් 31, |
| | 6.2 ඉහත අංශය නගා සිටුවීම සඳහා කුඩා කර්මාන්ත පිහිටුවීම | කර්මාන්ත සංවර්ධන අධිකාරිය | මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන ආයතන | 2020 ජනවාරි 1 – 2020 දෙසැම්බර් 31, |
| 7. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිෂ්පාදකයාගේ/ වෙළෙන්දාගේ/ පාරිභෝගිකයාගේ විස්තීරණය වූ වගකීම (EPR) ක්‍රියාවට නැංවීම | 7.1 මෙම සංකල්පයට (EPR) අදාළ නීති රෙගුලාසි සැකසීම සඳහා ජාතික පාරිසරික පනතට සංශෝධන සිදුකිරීම | පරිසර විෂය භාර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය, කර්මාන්ත අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය | 2019 ජනවාරි 01, - 2020 පෙබරවාරි 29, |
| | 7.2 මෙම සංකල්පයට (EPR) අදාළ නීති රෙගුලාසි ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම අනෙකුත් පාර්ශව ආයතන සමඟ කටයුතු කිරීම | පරිසර විෂය භාර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය | 2019 සැප්තැම්බර් 01, - 2020 අප්‍රේල් 30 |
| | 7.3 භාවිතයෙන් පසු ඉවතලන ටෝනර්,කාට්‍රිජ්, ඔරලෝසු බැටරි ආදිය එකතුකර ප්‍රතිචක්‍රීයකරණයට යොමු කිරීම සඳහා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් මාලාවක් ලබා දීම | පරිසර විෂය භාර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය | 2019 සැප්තැම්බර් 01, - 2020 පෙබරවාරි 29 |
| | 7.4 විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවක් ක්‍රියාත්මක කිරීම | පරිසර විෂය භාර අමාත්‍යාංශය | අනෙකුත් සියලුම පාර්ශවකාර ආයතන | 2019 ඔක්තෝම්බර් 01 දින සිට |

| | | | | |
|---|---|---|---|---|
| **8** ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි **විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා උපද්‍රවකාරී අපද්‍රව්‍ය පිරියම් කිරීමේ හා ආරක්ෂිත** බැහැර **කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම** | 8.1 අදාළ මූලික අනුමැතීන් ලබා ගැනීම | පරිසර විෂය භාර අමාත්‍යාංශය | පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය, මහනගර සංවර්ධන විෂය භාර අමාතයාංශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 2020 ජනවාරි 15, - 2020 අප්‍රේල් 30, |
| | 8.2 ආයෝජකයකු හඳුනා ගැනීම | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | පරිසර විෂය භාර අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, පුද්ගලික ආයතන | 2020 මැයි 15, - 2020 නොවැම්බර් 30, |
| | 8.3 සුදුසු ඉඩම් හඳුනා ගැනීම | පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය | ඉඩම් විෂය භාර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන අයතන, මහවැලි අධිකාරිය | 2020 මැයි 15, - 2020 නොවැම්බර් 30, |
| | 8.4 පරිසර බලපෑම හා ඇගයීමේ ක්‍රියාවලිය | මධ්‍යම පරිසර අධිකාරිය | පිළිගත් විශ්වවිද්‍යාල හා ලියාපදිංචි සේවා සපයන ආයතන | 2021 ජනවාරි 15, - 2021 අප්‍රේල් 30, |
| | 8.5 මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සිදුකිරීම | තෝරාගත් ආයෝජකයා | මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර විෂය භාර අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය, විද්‍යා හා තාක්ෂණ අමාතයාංශය | 2021 මැයි 15, -, 2022 දෙසැම්බර් 15 |
| **9.** ආපදා අවස්ථාවන්හිදී එකතුවන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම | 9.1 ආපදා අවස්ථාවන්හිදී එකතුවන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා උපායමාර්ගික සැළැස්මක් සකස් කිරීම | ආපදා කළමනාකරණය විෂය භාර අමාත්‍යාංශය | ආරක්ෂක අමාතයාංශය, පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය | 2020 ජනවාරි 15, - 2020 ජූනි 30, |
| | 9.2 එවැනි විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය තාවකාලිකව රැස්කර තබාගැනීමට සුදුසු පරිශ්‍රයන් ඇතුළත් ලේඛණයක් සකස් කොට ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන වෙත ලබා දීම | මධ්‍යම පරිසර අධිකාරිය | පළාත් පාලන අයතන, පෞද්ගලික අංශය | 2020 ජනවාරි 15, - 2020 ජූනි 30, |

<u>ඇමුණුම 02</u>

<u>**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**</u>

**හිඟ බදු අයකර ගැනීමේ කමිටුව පත්කිරීම**

**කමිටුවේ කාර්යභාරය**

**පහත සඳහන් ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම හා උපදෙස් ලබාදීම**

1. පවතින හිඟබදුවල ඇති අය කළ යුතු බදු කඩිනමින් අය කිරීමට හා අතිහිටවූ ප්‍රමාණය කඩිනමින් සමථයකට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
2. අය කළ නොහැකි හිඟ බදු හඳුනාගෙන ඒ පිළිබඳ ලේඛනයක් පිළියෙල කිරීම හා එය කපා හැරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
3. අභියාචනා සමථයකට පත්කිරීමෙන් පසු කඩිනමින් හිඟ බදු අය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
4. පරිගණක දෝෂ නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
5. අගරු චෙක්පත් අධීක්ෂණය, සමාලෝචනය, අය ක්‍රියා මාර්ග ගැනීම සහ නිවැරදි ලේඛන යාථාවත් කිරීම.
6. නඩු අවසන් කිරීම කාර්යක්ෂම කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට වැඩපිළිවෙලක් සකස් කිරීම.
7. අභියාචනා කොමිසම සඳහා කමිටු 3ක් පත් කර ගැනීමට කටයුතු කිරීම.
8. බදු උපදේශන කමිටුව යළි පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
9. හිඟ බදු  ශේෂය අවම කිරීම සඳහා උචිත යැයි හැඟෙන ක්‍රියාමාර්ග ගැනීමට අදාල අංශ වෙත උපදෙස් දීම.

**හිඟබදු ආදායම් නිසි පරිදි එකතු කර නොගැනීම සහ ඊට හේතු:-**

හිඟ බදුවල අඩංගු වී ඇති අත්හිටවූ හිඟ බදු ප්‍රමාණය 2015 සිට 2018 දක්වා වැඩි වී ඇති අතර, එයට සාපේක්ෂව දෙපාර්තමේන්තුවේ ආදායමද වැඩි වී ඇත.

දෙපාර්තමේන්තු කාර්ය පටිපාටිය අනුව, හිඟ බදු අයකර ගැනීම් කටයුතු පහත පරිදි වේ.

1) බදු ගෙවන්නන් වෙත ලිපියක් නිකුත් කොට අභියාචනා, විරෝධතා සලකා බැලීම.
2) බදු ගෙවන්නා කැඳවා සාකච්ඡා කොට බදු ගෙවන්නාගේ ගෙවීම් හැකියාවද සැලකිල්ලට ගෙන එකවර හෝ වාරික වශයෙන් අය කිරීමට කටයුතු කිරීම.
3) හිඟ බදු ගෙවීම සඳහා අනුකූලතාවයක් නොදක්වන අවස්ථාවක
    i. බැංකු ගිණුම් තහනම් නියෝග නිකුත් කිරීම.
    ii. තුන්වන පාර්ශ්වයකට නියෝග නිකුත් කිරීම (බදු ගෙවන ණය ගැතියන් වෙත)
    iii. ඉහත පරිදි අයකර ගත නොහැකි නම් නඩු පැවරීමට කටයුතු කිරීම.

**හිඟ බදු අය කිරීම කඩිනම් කිරීම සඳහා අදාළ යෝජනා පහත පරිදි දැක්විය හැකිය.**

1) අභියාචනා විසඳීම සඳහා බදු අභියාචනා කොමිෂන් සභාව යටතේ  අවම වශයෙන් කමිටු 3ක් කඩිනමින් පත් කිරීම. ඒ අනුව දැනට මෙන් 3 ගුණයක වේගයෙන් අභියාචනා විසඳනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2) බදු පිළිබඳ නඩු විසඳීම සඳහා වෙනම අධිකරණ ධූරාවලියක් පිහිටුවීම හා නීතිපති දෙපාර්තමේන්තුව හා එක්ව නඩු විසඳීම කඩිනම් කිරීමේ ක්‍රියාමාර්ගයක් ගැනීම, පහළ අධිකරණ මෙන්ම ඉහළ අධිකරණ (බදු අභියාචනාධිකරණයක්) ස්ථාපිත කිරීම.

3) අභියාචනයක් සිදු කරන අවස්ථාවේ එම අදාල තක්සේරු වටිනාකමින් 50% ගෙවීමට අනිවාර්ය කිරීම, මෙම ගෙවීම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ගිණුමට බැර කළ යුතු අතර, අභියාචනා කටයුතු අවසානයේදී වැඩිපුර ගෙවීමක් වේ නම් නොපමාව ආපසු ගෙවිය හැක. (වෙනත් දියුණු රටවල මෙම ක්‍රමය භාවිතා කෙරේ.)

4) හඳුනා ගත් අය කළ නොහැකි හිඟ බදු (පරීක්ෂා කිරීමට යටත්ව) කපා හැරීම සඳහා විධි විධාන සැලසීම.

5) පැරණි හිඟ බදු කපා හැරීම සඳහා බදු උපදේශන කමිටුව කඩිනමින් පත් කිරීම.

හිඟ බදු අය කිරීමේදී, සුදුසු පරිදි වාරික ලබා දීම මෙන්ම දඩ පිළිබඳ උචිත තීරණ ගෙන කටයුතු කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වඩාත් බලවත් කිරීම.

ඇමුණුම 03

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**Legacy පරිගණක පද්ධතිය යටතේ සිදුකල වැඩපිළිවෙල අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම හා ඊට හේතු**

1. දෙපාර්තමේන්තුවේ Legacy පද්ධතිය1992 දී ආරම්භ කරන ලද අතර, වරින්වර කරන ලද වැඩි දියුණු කිරීම් සහිතව දැනට ක්‍රියාත්මක වන්නේ IBM පරිගණක පද්ධතියකිනි. ඒ යටතේ AIX මෙහෙයුම් පද්ධතිය හා Informix මෘදුකාංගය ක්‍රියාත්මක වේ. පරිගණක වැඩසටහන් සම්පූර්ණයෙන්ම නිර්මාණය කරන ලද්දේ 1985 දී දෙපාර්තමේන්තුවට බඳවා ගත් පරිගණක මෘදුකාංග සම්පාදක නිලධාරීන් තිදෙනෙකු විසිනි. පද්ධතියේ නඩත්තු කටයුතු පමණක් IBM සමාගම සහ Cyber Soft සමාගම මගින් සිදු කරන ලදී. ඉහත නිලධාරීන් දෙදෙනෙකු 2011 දී විශ්‍රාම ගිය අතර, බඳවා ගැනීම් සඳහා 2008 සිට ඉල්ලීම් කලද, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය ආරම්භ කිරීම ප්‍රමාද වීම නිසා බඳවා ගැනීම් සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුනේ 2012 දීය.

2. මේ වන විට පහලොස් වතාවක් පමණ සංශෝධනය කර ඇති එකතු කල අගය මත බදු පනතේ සෑම සංශෝධනයක් සඳහාම ඉහත කී මෘදුකාංගය නැවත නිර්මාණය කල යුතු වූ අතර, ඒ අනුව ආකෘති පත්‍ර ද (අභ්‍යන්තර හා බාහිර) වෙනස් කල යුතු විය. එම ක්‍රියාවලිය සංකීර්ණ වන විට කෙලින්ම VAT වාර්තා පරිගණකයෙන් සකසා තක්සේරු නිකුත් කිරීමේදී (Version 0) නිවැරදි නොවන තක්සේරු නිකුත්වීම ගැටළුවක් විය.මේ පිළිබඳ වරින් වර විගණකාධිපති විසින් විමසීම් සිදු කරන ලද අතර, දෙපාර්තමේන්තුවේ හිඟ බදු ප්‍රමාණය අතාත්වික ලෙස ඉහලයාමක්ද සිදුවිය. එසේම 2010 අංක 16 දරණ ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන )පනත අනුව හිඟ බදු ප්‍රමාණය 3% කට සීමා කල යුතු බවට විධිවිධානයක් පැනවුනු බැවින් හිඟ බදු හැකිතාක් දුරට නිවැරදි කිරීමේ සහ සීමා කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුණි.

3. ඉහත කරුණ විධිමත් කිරීමට එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (තොරතුරු තාක්ෂණ) විසින් 2010.11.02 දින දෙපාර්තමේන්තුවේ සියළුම තක්සේරු අංශ වලට චක්‍රලේඛයක් නිකුත් කරන ලද අතර එතෙක් සිදු කළ පරිගණක ක්‍රියාවලිය වෙනස් කරන බවත්, තක්සේරු අංශ වල නිලධාරීන්ට තමා වෙත ඇති පරිගණකයෙන් VAT වාර්තාවල ප්‍රතිබිම්භය (Image) නැරඹීමට පහසුකම් සැලසෙන බවත්, ඒ අනුව කඩිනම් විගණනයක් සිදු කොට නිවැරදි ගැලපීම් සිදු කර VAT 31 ආකෘති පත්‍ර දත්ත සැකසුම් අංශය හරහා පරිගණක අංශයට භාර දිය යුත් බවත් මේ පිළිබඳ ප්‍රගති වාර්තා සකස් කල යුතු බවත් සඳහන් කර ඇත.තවද ආරවුල් සහගත, එසේම අය කර ගැනීමට නොහැකි තක්සේරු නිකුත්වීම පාලනය කිරීම මෙහි අරමුණ බව සඳහන් කර ඇත. මෙම චක්‍රලේඛය කොමසාරිස් ජනරාල්, සියළුම නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්, සියළුම ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්ගේ එකඟත්වය ඇතිව නිකුත් කර ඇති අතර, රජයේ විගණන දෙපාර්තමේන්තුවටද පිටපතක් යවා ඇත.

4. ඉහත ක්‍රියාවලිය ආරම්භ කිරීමෙන් පසුව VAT පනතට සිදු කල 2011 අංක 09 සහ 2012 අංක 07 සංශෝධිත පනත් වලින් සිදු වූ සංශෝධන සැලකිල්ලට ගෙන නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (වක්‍ර බදු) විසින් උක්ත කරුණ සඳහාම 2013.02.07 දින නැවත චක්‍රලේඛයක් නිකුත් කර ඇත.මෙයද කොමසාරිස් ජනරාල් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරු ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරු සහ කොමසාරිස් (අභ්‍යන්තර විගණන) ගේ එකඟත්වය ඇතිව නිකුත් කර ඇත.

5. ඉහත නියෝග අනුව කටයුතු කර පරිගණක අංශයට එවා ඇති VAT 31 ආකෘතිය අනුව Version 01 තක්සේරු නිකුත් කර ඇත.

**ඇමුණුම 04**

## කොළඹ මහ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව විශේෂ විගණන වාර්තාව

06. පද්ධති හා පාලන දූර්වලතා

6.1 ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා යෝජිත ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබූ අතර, ඒ සඳහා ආයතනයක් ද තෝරාගෙන තිබුණත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි. ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන සඳහා ඉඩමක් මිලදී ගැනීමට 2014 වර්ෂයේදී රු. මිලියන 100 ක් ද 2016 වර්ෂයේදී රු.මිලියන 75 ක්ද ප්‍රතිපාදන සලසාගෙන තිබුණත් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

6.2 බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් කොළඹ මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

6.3 අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු ජාතික පළාත් සහ ප්‍රදේශීය මට්ටමේ පාලන අධිකාරීන් විසින් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති 2008 ජුලි 30 දිනැති අංක 1560/6 දරන අපද්‍රව්‍ය කළමනාකරණ රීති කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

6.4 නීතියෙහි සහ නියාමනයෙහි පැවති ව්‍යාකූලත්වය හා අදාල ආයතන සමග පවත්වා ගතයුතු සම්බන්ධීකරණය දූර්වල වී තිබුණි. (උදා:- ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මීතොටමුල්ල ප්‍රදේශයට කසළ බැහැර කිරීම සඳහා ලබාදුන් තාවකාලික අවසරය වසර 08 ක් දක්වා දීර්ඝ කිරීම පිළිබඳ අවධානය යොමු නොකිරීම.)

6.5 කසළ කළමනාකරණය පිළිබඳ වගකිව යුතු ආයතනවල අධීක්ෂණය හා නිතිරීති ක්‍රියාත්මක කිරීම දූර්වලව පැවතුණි.

6.6 කොළඹ මහා නගර සභාවේ කළමනාකරණ අධිකාරිය විසින් අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා තාක්ෂණික යටිතල පහසුකම් හා අවශ්‍ය මාර්ගෝපදේශණ ලබා දී නොතිබුණු අතර ප්‍රමුඛතාවයේ සැලකිය යුතු වියදම් දැරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. (උදාහරණ ලෙස 2015 වර්ෂයේදී වසර 150 සංවත්සරය සඳහා රු.126,872,501 ක් වැය කිරීම.)

## 07. නිර්දේශ

---------

7.1 පනවා ඇති චක්‍රලේඛ නීතිරීති ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම පිළිබඳ නිරන්තර සුපරීක්ෂණයක් සිදු විය යුතු බව නිර්දේශ කෙරේ.

7.2 කසළ බැහැර කිරීම, වෙන් කිරීම හා කසළ කළමනාකරණය පිළිබඳ සමාජයේ විවිධ පාර්ශව දැනුවත් කිරීමේ වැඩසටහන් ජන මාධ්‍ය මඟින් ක්‍රියාත්මක කල යුතු බව නිර්දේශ කෙරේ.

7.3 කොළඹ මහා නගර සභාව විසින් නිවාස යෝජනා ක්‍රම හා මහා පරිමාණ කර්මාන්ත සඳහා සැලසුම් අනුමත කිරීමේදී ඒවායෙන් එකතු වන කසළ ප්‍රමාණයන් අවම කර ගැනීම හා වෙන් කර බැහැර කිරීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදයන් පිළිබඳ අවධානය යොමු කළ යුතු බව නිර්දේශ කෙරේ.

7.4 යල්පැන ගිය අදාල නීති රීති වලට අවශ්‍ය පරිදි සංශෝධනයක් සිදු කල යුතු බව නිර්දේශ කෙරේ.
උදාහරණ:- මහා නගර සභා ආඥා පනතේ 55 වගන්තිය **(ඇමුණුම - 13)**

7.5 කසළ, භූමියකට බැහැර කිරීම හැර, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම හා දීර්ඝකාලීන විසඳුමකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව නිර්දේශ කෙරේ.

7.6 කසළ කළමනාකරණය සඳහා කුලී පදනම මත වාහන හා යන්ත්‍රෝපකරණ ලබා ගැනීමට වැය වන මුදල අවම කර ගැනීම සඳහා සභාව සතු අරමුදල් උපයෝගී කරගෙන එම වාහන මිලදී ගැනීම කෙරෙහි නොපමාව අවධානය යොමු කිරීම සුදුසු බව නිර්දේශ කෙරේ.

7.7 රැස් කරගනු ලබන කසළ සභාවේ දේපලක් ලෙස සලකා එමඟින් ආදායමක් ජනිත කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව නිර්දේශ කෙරේ.

7.8 ජපන් විශේෂඥ විසින් ලබා දී තිබූ වාර්තාවේ කරුණු සලකා බලා දී ඇති නිර්දේශ වහාම ක්‍රියාත්මක කල යුතු බව නිර්දේශ කෙරේ.

## 08. නිගමන

**8.1** මීතොටමුල්ල කසළ අංගනය නායයාම නිසා මිනිස් ජීවිත 32 ක් ඇතුළුව සිදුවූ ජීවි සහ අජීවි හානි සම්බන්ධයෙන් කොළඹ මහා නගර සභාව වගකිව යුතු බව නිගමනය කරමි.

**8.2** එකතු කරනු ලබන කසළ, සභාවේ දේපළක් වුවද මහා නගර සභාව විසින් දිගින් දිගටම එය දේපලක් ලෙස හඳුනා නොගෙන නිසි අයුරින් කළමනාකරණය නොකිරීම හේතුවෙන් සභාවට සිදුවූ අලාභයට නාගරික කොමසාරිස් ඇතුළු අදාල නිළධාරීන් වගකිව යුතු බව නිගමනය කරමි.

**8.3** අගතියට පත් පුද්ගලයින් වෙත වන්දි මුදල් ප්‍රදානය කිරීම සඳහා විද්‍යාත්මක හා පිළිගත් ක්‍රමවේදයන් භාවිතා කර නොතිබීම හේතුවෙන් රජයට දැරීමට සිදුවිය හැකි අමතර වැය බර පිළිබඳ අදාල නිළධාරීන් වගකිව යුතු බව නිගමනය කරමි.

**8.4** කසළ ජනනය අඩු කිරීම, කසළ නැවත භාවිතයට ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රතිචක්‍රීකරණය සඳහා විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙලක් පිළිබඳව ප්‍රමාණවත් පරිදි අවධානය යොමු නොකිරීම නිසා කසළ ප්‍රශ්ණය දැවෙන සංවේදී ප්‍රශ්ණයක් බවට පරිවර්ථනය වීමත් එමඟින් සභාවට වී ඇති අලාභය සහ අගතිය සම්බන්ධයෙන් අදාල නිළධාරීන් වගකිව යුතු බව නිගමනය කරමි.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
2018 මාර්තු 16 දින

| | වර්තමාන ප්‍රගතිය හා ක්‍රියාත්මක වන ආකාරය | සැළසුම්ගත කාල වකවානුව |
|---|---|---|
| **06** | පද්ධති හා පාලන දුර්වලතා | |
| **6.1** | කසළ කළමනාකරණ ව්‍යාපෘතීන් සඳහා ඉඩමක් කොළඹ මහා නගර සභාව විසින් මිලදී ගැනීමක් සිදු කර ඉන් අනතුරුව පැන නැගෙන මහජන විරෝධතා හේතුවෙන් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවහොත් එය නගර සභාවට විශාල අලාභයක් වීමට හේතුවක් වේ.<br><br>එබැවින් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා ජාඇල ප්‍රදේශයේ ඉඩමක් 2016 වසරේ කුලී පදනම මත තෝරා ගෙන අදාල ඉංජිනේරුමය කාර්යයන් ඉටු කරමින් පැවති අදියරේදී ඊට විරුද්ධව පැන නැගුණු දැඩි දේශපාලන හා මහජන විරෝධතා හේතුවෙන් එම ව්‍යාපෘතිය අතරමග නවතා දමන ලදි.<br><br>තවද කොළඹ මහා නගර සභාව සතු කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා සැලසුම් පිළියෙල කර ඊට අදාල ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් පිරිනමන අවස්ථාවේදී එම ව්‍යාපෘතියට ද එරෙහිව පැන නැගුණු විරෝධය හමුවේ මේ වන විට සියලු කටයුතු නවතා දමා ඇත.<br><br>කසළ කළමනාකරණ කටයුතු සඳහා මධ්‍යම රජයේද සහයෝගය ඇතිව දීර්ඝ කාලීන විසඳුමක් ලෙස කෙරවලපිටිය Waste to Energy ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන බැවින් කොළඹ මහා නගර සභාව සඳහා ඉඩමක් මිලදී ගැනීම තවදුරටත් අවශ්‍ය නොවේ. | කෙරවලපිටිය Waste to Energy ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු මෙම වසරේ ඔක්තෝබර් මස වන විට ආරම්භ කිරීමට නියමිතය. |
| **6.2** | බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් කොළඹ මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා වරින්වර ලබාදුන් පහසුකම් පහත දක්වා ඇත. | |
| | • වොක්ෂෝල් වීදියේ ඇති කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියට රුපියල් මිලියනයක මුදලක් 2017 ලබා දීම. | කටයුතු නිම කර ඇත. |
| | • 2018 වසරේදී ලීටර 15ක ධාරිතාවකින් යුක්ත කොළ පැහැති කසළ බඳුන් 2350 ක් සහස්පුර, මෙත්සර උයන, සිරිසර උයන හා සිංහපුර මහල් නිවාස සඳහා බෙදා දීම. | කටයුතු නිම කර ඇත. |
| | • 2017 වසරේදී සර්පන්ටයින් මහල් නිවාස සඳහා වර්ණ සහිත විශාල කසළ බඳුන් 70 ක් ලබා දීම. | කටයුතු නිම කර ඇත. |
| | • 2016 වර්ෂයේදී ඇල්විටිගල මහල් නිවාස සඳහා වර්ණ සහිත විශාල කසළ බඳුන් 25 ක් ලබාදීම. | කටයුතු නිම කර ඇත. |
| | • කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ මහල් නිවාස සඳහා ලබා දීමට ලීටර 15ක ධාරිතාවයකින් යුක්ත කොළ පැහැති කසළ බඳුන් 6400 ක් 2019 වර්ෂය සඳහා ඉල්ලුම් කර ඇත. | බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. |

3

| | | |
|---|---|---|
| | • 2016 වසරේදී මීතොටමුල්ල ප්‍රදේශයේ ඇතිවූ ගංවතුර හා හදිසි ආපදා තත්ත්වය සමග කොළඹ නගරයේ කසළ බැහැර කිරීමේ කටයුතු වලට දැඩි බාධා එල්ල වූ අතර එම කාල වකවානුවේදී දින 05කුත් 2017 වසරේදී මීතොටමුල්ල කසළ කන්ද නායයාමත් සමග මෙට්‍රික් ටොන් 350 ක උපරිමයකට යටත්ව අධිකරණ අනුමැතියට අනුව දින 12ක කාලයක් සඳහා බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට අයත් කරදියාන කසළ අංගනයට කසළ බැහැර කිරීමට ඉඩපහසුකම් ලබා දෙන ලදි. | කටයුතු නිම කර ඇත. |
| **6.3** | අංක 1560/6 හා 2008.07.30 දිනැති අපද්‍රව්‍ය කළමනාකරණ රීති සංග්‍රහයට අනුව පළවන පරිච්ඡේදය යටතේ නාගරික ඝන අපද්‍රව්‍ය විධිමත්ව වෙන් කිරීම, දෙවන පරිච්ඡේදය යටතේ නිකුත් කරනු ලබන මධ්‍යස්ථාන හෝ ජනනය වන ස්ථාන වලදී ඝන අපද්‍රව්‍ය විධිමත් ලෙස එකතු කිරීම හෝ භාර ගැනීම, තුන්වන පරිච්ඡේදය යටතේ මාර්ග හා ප්‍රසිද්ධ ස්ථාන පිරිසිදු කිරීම, හතරවන පරිච්ඡේදය යටතේ විවෘත කසළ ගබඩා බහාලු භාවිතයෙන් ඉවත් කිරීම, පස්වන පරිච්ඡේදය යටතේ නාගරික ඝන අපද්‍රව්‍ය ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම හා හයවන පරිච්ඡේදය යටතේ එකතු කරන ලද නාගරික ඝන අපද්‍රව්‍ය සම්පතක් ලෙස සලකා භාවිතා කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම හා නීති ප්‍රතිපාදන සලසා ඇත. කොළඹ මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණය අදාල ප්‍රතිපාදනයන්හි අවම අවශ්‍යතාවයන් ඉක්මවා යමින් ඉතාමත් කාර්යක්ෂම මට්ටමකට පත්ව ඇත.<br><br>මෙහිදී හත් වන පරිච්ඡේදය යටතේ නාගරික ඝන අපද්‍රව්‍ය අවසාන වශයෙන් බැහැර කිරීමේ වැඩිදියුණු පහසුකමක් හඳුන්වා දීමේ වගකීම අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප) සතු වන බව සඳහන් කර ඇත. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.<br><br>අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප) මගින් ඉටු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| 6.4 | මීතොටමුල්ල කසළ අංගනයේ පැවති තත්ත්වය හමුවේ ඊට විකල්ප ලෙස යෝජනා වූ ඉංජිනේරුමය ව්‍යාපෘතීන් සියල්ලක්ම පාහේ ඊට එරෙහිව ගොඩනැගුනු දේශපාලන, ආගමික හා සමාජීය විරෝධතා හේතුවෙන් අත්හැර දැමීමට සිදු වූ පසුබිමක, දෛනිකව කොළඹ නගරයේ එකතු වන කසළ මීතොටමුල්ල කසළ අංගනයටම බැහැර කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබුණි.<br><br>ඉහත ගැටලු හේතුවෙන් කොළඹ නගරයේ කසළ කළමනාකරණ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොවී අකර්මන්‍ය වූයේ නම් වාණිජ අගනගරයෙහි කසළ විශාල වශයෙන් ගොඩගැසී සෞඛ්‍ය, සමාජීය හා සංචාරක ව්‍යාපාරය හරහා ආර්ථිකමය වශයෙන් දැඩි බලපෑමක් ඇතිවීමට හේතු වේ. | කොළඹ නගරයේ කසළ කළමනාකරණය සඳහා දීර්ඝ කාලීන විසඳුමක් ලෙස කෙරවලපිටිය Waste to Energy ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර එහි මෙහෙයුම් කටයුතු මෙම වසරේ ඔක්තෝබර් මස ආරම්භ කිරීමට නියමිතය. |
| 6.5 | කොළඹ මහා නගර සභාව සඳහා අදාල නොවේ. | |
| 6.6 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය සෑම විටකම මුදල් ප්‍රතිපාදන ලබාදීම සභාව විසින් කිසිදු අවස්ථාවක ප්‍රතික්ෂේප කර නොමැත. සෑම පුද්ගලයෙක්ම තම ප්‍රදේශවල කසළ සම්බන්ධයෙන් ව්‍යාපෘති ආරම්භ කිරීමට ඉතාමත් දැඩි විරෝධතාවයක් දක්වන බැවින් අදාල ව්‍යාපෘති සඳහා සුදුසු ඉඩම් සෙවීම අති දුෂ්කර කටයුත්තකි. | කොළඹ නගරයේ කසළ කළමනාකරණය සඳහා දීර්ඝ කාලීන විසඳුමක් ලෙස කෙරවලපිටිය Waste to Energy ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර එහි මෙහෙයුම් කටයුතු මෙම වසරේ ඔක්තෝබර් මස ආරම්භ කිරීමට නියමිතය. |
| 7 | නිර්දේශ | |
| 7.1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව නිකුත් කර ඇති චක්‍රලේඛ හා නීතිරීති වලට අනුව අදාල කටයුතු සිදු කරමින් පවතින අතර ඊට අදාල පසුවිපරම් කටයුතු ද ඉටු කරනු ලබයි. ඒ පිළිබඳව පැහැදිලි කිරීම අංක 6.3 යටතේ සිදු කර ඇත. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 7.2 | කොළඹ මහා නගර සභා සීමාව තුළ මහජනතාව, හා ආයතන දැනුවත් කිරීමේ කටයුතු ඉතාමත් සාර්ථකව හා අඛණ්ඩව සිදු කරනු ලබන අතර එහිදී අත්පත්‍රිකා මගින්, ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ,වීදි නාට්‍ය මගින්, පුවත්පත් දැන්වීම් මගින්, සමාජජාලා වෙබ් අඩවි මගින්, ස්වේච්ඡා JICA නිලධාරීන් මගින්, පාසල් මට්ටමින් හා පොලිස් පරිසර ආරක්ෂ කොට්ඨාශයේ නිලධාරීන් සමග කරනු ලබන කටයුතු ප්‍රධාන වේ.<br><br>නමුත් විද්‍යුත් ජනමාධ්‍ය මගින් කුඩා විකාශන කාලයක් සඳහා විශාල මුදලක් අයකිරීම අදාල දැනුවත් කිරීම් සඳහා විශාල බාධාවක් වන අතර ඒ සඳහා ජාතික මට්ටමින් ක්‍රමවේදයක් ඇති කිරීම ඉතා වැදගත් වේ. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 7.3 | කොළඹ මහා නගර සභා සීමාව තුළ අළුතින් ඉදිකරනු ලබනු ලබන මහල් නිවාස සඳහා ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමේදී ඔවුන්ගේ කසළ වෙන් කර ලබා දෙන ආකාරය සඳහන් සැලසුම් වාර්තාවක් ලබා දිය යුතු අතර එම වාර්තාව අනුමත කර ගතයුතුවේ. එසේ අනුමත කර ගන්නා ආයතන වෙත නිෂ්කාශන සහතික ලබා දෙනු ලබයි. අනුකූලතා සහතිකය ලබා දීමේදී එම වාර්තාවට අනුව | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |

5

| | | |
|---|---|---|
| | කටයුතු කරනු ලබන්නේදැයි ක්ෂේත්‍ර මට්ටමින් පරීක්ෂා කිරීම් සිදු කරයි. එසේ නොකෙරෙන තට්ටු නිවාස සංකීර්ණ සඳහා අනුකූලතා සහතිකය ලබා නොදෙන අතර අනුකූලතා සහතිකය ලබා දීමෙන් පසුව ද එම ආකාරයට කටයුතු කරනු ලබන්නේදැයි පසු විපරම් කෙරෙයි. (තනි කවුළු සේවාව (Single Window Counter) යටතේ කාර්යාලීය දින 05ක් තුළදී එම කටයුතු ඉටු කරනු ලැබේ)<br><br>ගෘහස්ත මට්ටමින් ජනනය වන දිරන කසළ කළමනාකරණය සඳහා කොම්පෝස්ට් බඳුන් ලබා දීම සිදු කරනු ලබන අතර, අලුතින් ඉදිකරනු ලබන නිවාස සංකීර්ණ සඳහා නව තාක්ෂණය සහිත කොම්පෝස්ට් යන්ත්‍ර හඳුන්වාදීමට යෝජනා වී ඇත. එමගින් අදාල නිවාස වලින් කොළඹ මහා නගර සභාව වෙත ලබා දෙන කසළ ප්‍රමාණය අඩු කිරීමට හැකි වනු ඇත.<br><br>මහා පරිමාණ කර්මාන්තවලදී ඒ ඒ ආයතනයන්ට වඩාත් සුදුසු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් හඳුනාගැනීම සඳහා මග පෙන්වීම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය මගින් සිදු කරනු ලබන අතර එහිදී අදාල කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ප්‍රතිචක්‍රීකරණ ආයතන සමග සෘජු සම්බන්ධීකරණය කිරීම මගින් අවසාන වශයෙන් කොළඹ මහා නගර සභාව හරහා අවසන් බැහැර කිරීම වෙත යොමු කරනු ලබන කසළ ප්‍රමාණය අවම කිරීම සිදු කරනු ලබයි. (උදා. මහා පරිමාණ හෝටල් සඳහා ඔවුන් ඉවත දමන ආහාර සෘජුවම සත්ව ගොවිපොලවල් වෙත ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම)<br><br>එමෙන්ම වාණිජමය ආයතනයන් මගින් කසළ ඉවත් කිරීම සඳහා අදාල ආයතන මගින් ලබා දෙනු ලබන කසළ ප්‍රමාණයට සමානුපාතිකව කසළ ඉවත් කිරීමේ ගාස්තුවක් අය කරන අතර එමගින් ද ඒ ඒ ආයතන මගින් කොළඹ මහා නගර සභාව වෙත ලබා දෙන කසළ ප්‍රමාණය හැකිතාක් දුරට අවම කිරීමට පෙළඹී ඇත. | <br><br><br><br><br><br><br><br>සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.<br><br><br><br><br><br><br>සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.<br><br><br><br><br><br><br><br><br><br><br>සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 7.4 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම නීති අංශය සමග මේ වන විට ආරම්භ කර ඇත. | වසරක් තුළ නිම කිරීමට අපේක්ෂිතය. |
| 7.5 | • කසළ කළමනාකරණයේදී ප්‍රතිචක්‍රීකරණය කළහැකි කසළ වන ගුණාත්මකභාවය ඉහළ මට්ටමක රඳවා ගැනීමටත් ඒ ඒ කසළ වලට ලබාදිය හැකි නිසි ඉංජිනේරුමය අවසන් විසඳුම ලබා දීම සඳහත් ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේදී අනුගමනය කරනු ලබන සම්මත ක්‍රමවේදයට අනුව කසළ ජනනය වන ස්ථානයේදීම වෙන් කළ යුතු වන අතර (Source Segregation), ඒ අනුව කොළඹ මහා නගර සභාව සීමාව සඳහා දිරන කසළ, නොදිරන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හා නොදිරන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කසළ ලෙස වර්ග තුනකට කසළ වෙන් කිරීම හඳුන්වා දී ඇති අතර ඒ සඳහා ජනතාව දැනුවත් කිරීම ද අඛණ්ඩව සිදු කරමින් පවතී. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |

| | | |
|---|---|---|
| | • කසළ එකතු කිරීමේදී මෙසේ වෙන් කර ඇති කසළ පමණක් එකතු කරන අතර, වෙන් නොකරන ලද කසළ කිසිදු අවස්ථාවක කොළඹ මහා නගර සභාව විසින් ඉවත් කිරීමක් සිදු නොකරයි. එමෙන්ම කසළ වර්ගීකරණය දුර්වල වන අවස්ථාවන්හීදි අදාළ නිවාස / ආයතන තවදුරටත් වෙන් කිරීම සම්බන්ධයෙන් දැනුවත් කරනු ලැබේ. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | • මෙමගින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍යයන් අනෙකුත් කසළ සමග මිශ්‍රවී කසළ අංගනය වෙත යැවීම සම්පූර්ණ වශයෙන්ම වලක්වා ඇත. නගර සභාව කම්කරුවන් සහ අනෙකුත් කොන්ත්‍රාත් සමාගම් වලට අයත් කම්කරුවන් ආදී ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයද මේ සඳහා හොඳින්ම දැනුවත් කර ඇති අතර ඔවුන් ඒ සඳහා පුහුණු කොට ඇත. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | • සෑම දිසා කාර්යාලයක් සතුවම ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන (Eko kiosk centre) එකකට වඩා වැඩි සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලබන අතර ජනතාවට ද පැමිණ අදාල ස්ථානයන්ට ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය සෘජුව භාරදිය හැක. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | • දිසා කාර්යාල මගින් සතියේ වෙන් කර ගත් දින වලදී අදාල ධාවන කාල සටහනට අනුව මෙම ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ එකතු කිරීම සඳහා අදාල රථ වාහන යොදනු ලබන අතර මෙසේ එකතු කරන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන වල ගබඩා කර ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරනු ලැබේ. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | • මාසිකව එක් එක් දිසා කාර්යාල මගින් කසළ පොළවල් පවත්වන අතර එමගින් ජනතාවට තමාගේ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ මුදල් බවට හරවා ගැනීමේ අවස්ථාව සලසා මහජනතාව ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ වෙන් කිරීම සඳහා උනන්දු කර ඇත. මෙම කසළ පොළවල් පවත්වන ප්‍රමාණය ඉදිරියේදි වැඩි කිරීමට ද කටයුතු සිදු කරමින් පවතී. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | • ප්‍රතිචක්‍රීකරණය සඳහා කසළ එකතු කරන ආයතන සමග සම්බන්ධීකරණය කරමින් තවදුරටත් ප්‍රතිචක්‍රීකරණයට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | • කසළ ප්‍රතිචක්‍රීකරණය හා එහි වැදගත්කම පිළිබඳව පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා පාසල් මට්ටමින් විශාල සහයෝගයක් ලබා දෙනු ලබයි. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |

| | | |
|---|---|---|
| | • ඉහත සමස්ත ක්‍රියාදාමයෙන් අනතුරුව අවසාන බැහැර කිරීම සඳහා යොමු වන කසළ සඳහා දීර්ඝ කාලීන විසඳුමක් ලෙස කෙරවලපිටිය Waste to Energy ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. | කෙරවලපිටිය Waste to Energy ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු මෙම වසරේ ඔක්තෝබර් මාසය වන විට ආරම්භ කිරීමට නියමිතය. |
| 7.6 | 2018.03.01 දින සිට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව කෙරවලපිටිය කසළ අංගනයේ සමස්ත මෙහෙයුම් කටයුතු ඔවුන් වෙත පවරා ගත් අතර එදින සිට අදාල ස්ථානයේ කොළඹ මහා නගර සභාව විසින් කිසිදු එක්ස්කැවේටර් යන්ත්‍රයක් හෝ ඩෝසර් යන්ත්‍රයක් මෙහෙයුම සඳහා යොදවා නැත. එමෙන්ම දිසා කාර්යාල මට්ටමෙන් කසළ ප්‍රවාහනය සඳහා අවශ්‍ය රථ කොළඹ මහා නගර සභාව විසින් මිලදී ගත් අතර ඒ අනුව 2018 අගෝස්තු මස සිට කිසිදු ටිපර් රථයක් දිසා කාර්යාල සඳහා කුලී පදනම මත සේවා සඳහා යොදවා නොමැත. ඒ අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය මගින් මේ වන විට කිසිදු වාහනයක් කුලී පදනම මත සේවා සඳහා යොදවා නොමැති අතර ඒ අනුව ඊට අදාලව කිසිදු වියදමක් ද සිදු නොකරයි. | මේ වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු වලට අදාලව කුලී වාහන සඳහා කිසිදු වියදමක් සිදු නොකරයි. |
| 7.7 | කොළඹ මහා නගර සභාවේ කසළ එක්රැස් කිරීමේදී හඳුනාගනු ලබන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ අදාල කසළ එකතු කිරීමේ කම්කරුවන් විසින් මුදල් බවට පරිවර්තනය කරනු ලබන අතර එය ඔවුන් හට වඩාත් උනන්දුවකින් කසළ වර්ගීකරණය සිදු කිරීමට අමතර පහසුකමක් වේ. එමගින් කසළ වර්ගීකරණය කිරීමේ වැඩපිළිවෙල ද කාර්යක්ෂම වන අතර අවසාන වශයෙන් අවසන් බැහැර කිරීම සඳහා යොමු කරනු ලබන කසළ ප්‍රමාණය අඩු වන අතර එමගින් පරිසරයට සිදු වන හානිය වැලැක්වීම ගණනය කළ නොහැකි වාසියකි.<br><br>එමගින් අවසන් බැහැර කිරීමට යොමු වන කසළ ප්‍රමාණය අඩු වීම, එම කසළ අවසන් බැහැර කිරීම සඳහා සිදු කරනු ලබන ප්‍රවාහන වියදම් අඩුවනවා මෙන්ම චක්‍රාකාරයෙන් ඊට අදාලව කරනු ලබන ගෙවීම් වලදී කොළඹ මහා නගර සභාව වෙත මූල්‍යමය ඉතිරියකි. | සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 7.8 | අදාල වාර්තාව හා එහි නිර්දේශ මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. | |
| 8 | නිගමන | |
| 8.1 | දක්වා ඇති කරුණු පිළිබඳව එකග නොවේ. මීතොටමුල්ල කසළ කන්ද නායයෑමේ වගකීම කොළඹ මහා නගර සභාව වෙත භාර ගැනීමට නොහැක. මෙම නායයෑම සිදු වීමට ප්‍රථම එය කොළඹ මහා නගර සභාව විසින් කල්වේලා ඇතිව හඳුනාගත් අතර ඒ බව අතිගරු ජනාධිපති තුමාට හා ගරු අගමැතිතුමාට දන්වා ඔවුන් විසින් ද මීට විසඳුම් සෙවීම සඳහා විශාල උත්සහයක් දරමින් සිටියේය. | |
| 8.2 | දක්වා ඇති කරුණු පිළිනොගනී. මේ සඳහා දීර්ඝ කාලීන විසඳුමක අවශ්‍යතාවය කොළඹ මහා නගර සභාව විසින් | |

8

| | | |
|---|---|---|
| | පෙන්වා දී එය ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ උත්සහයන් ගන්නා ලද අතර ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමා, අතිගරු අගමැතිතුමා ඇතුලු කැබිනට් මණ්ඩලයේද සහයෝගය ලැබුණි. එහෙත් පැනනැගුණු ජනතා විරෝධතා හමුවේ දේශපාලන අධිකාරියට හා කොළඹ මහා නගර සභාවට අදාල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | |
| **8.3** | අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා ඇතුලු කැබිනට් මණ්ඩලය මේ සඳහා සෘජුවම මැදිහත් විය. කොළඹ මහා නගර සභාව විසින් රුපියල් මිලියන 908 ක මුදලක් වන්දි වශයෙන් ප්‍රදානය කර ඇති අතර ඒ සඳහා අනෙකුත් ආයතන සම්බන්ධ වී නොමැත. | |
| **8.4** | අවශ්‍ය වැඩපිළිවෙලවල් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. | |

**<u>විශේෂ සටහන</u>**

ඉහත පැහැදිලි කිරීම් වලට අමතරව කොළඹ නගරයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ප්‍රධාන වශයෙන් 3R (Reduce, Reuse, Recycling) ක්‍රමවේදය මූලික කරගෙන ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී දේශීය හා විදේශීය රටවල විවිධ ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයන් පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කරමින් මේ වන විට ක්‍රියාත්මක වන වැඩපිළිවෙල ඇමුණුම II මගින් දක්වා ඇත.

**10** - මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන අරුවක්කාලු කසළ රඳවන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මේ වන විට ක්‍රියාත්මකව පවතී. ඊට අමතරව කොළඹ නගරයේ කසළ සඳහා වන කෙරවලපිටිය Waste To Energy ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ද මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඊට අදාල මෙහෙයුම් කටයුතු මෙම වසරේ ඔක්තෝබර් මාසයේදී ආරම්භ කිරීමට නියමිත වේ. ඒ අනුව අදාල මෙහෙයුම් ආරම්භ කිරීමෙන් අනතුරුව කොළඹ නගරයේ දෛනිකව එක්රැස් වන කසළ කෙරවලපිටිය Waste To Energy ව්‍යාපෘතිය සඳහා ලබා දීමට නියමිතය.

**ඇමුණුම 05**

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව පරීක්ෂාව

**6 නිර්දේශ**

6.1 මනා කළමනාකරණ සැලැස්මක් තුළ වනජීවී ජාලයේ කටයුතු විමධ්‍යගත කිරීම හා වර්තමාන සංරක්ෂණ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි පරිපාලනය ප්‍රතිව්‍යුහගත කිරීම සුදුසු බව නිර්දේශ කෙරේ.

6.2 වනජීවී රක්ෂිත සඳහා දිගුකාලීන කළමනාකරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමෙන් එම කළමනාකරණය විධිමත් කළ යුතු බව නිර්දේශ කෙරේ.

6.3 වනජීවී සම්පත සුරැකීම ප්‍රධාන අරමුණ ලෙස සලකා ඒ සඳහා වැඩි අවධානයක් යොමු කිරීම සහ සංචාරකයන්ගෙන් ලැබෙන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් වනජීවී සුපෝෂණය සඳහා වැය කිරීම සුදුසු බව නිර්දේශ කෙරේ.

6.4 සංචාරක බංගලා ඉදිකිරීමට පෙර සතුන්ගේ පැවැත්මට හානියක් නොවන ආකාරයට නිසි අධ්‍යනයකින් පසුව පමණක් සංචාරක බංගලා ඉදි කිරීමත්, සතුන්ට නිදහසේ හැසිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තහවුරු කිරීමත් සුදුසු බව නිර්දේශ කෙරේ.

6.5 අලි මංකඩවල් හඳුනාගැනීමට කටයුතු කිරීම හා හඳුනාගෙන ඇති අලි මංකඩ 16 ගැසට් කිරීමට නිර්දේශ කෙරේ.

6.6 අලින් ගැවසෙන ප්‍රදේශවල කසළ ගොඩවල් කළමනාකරණ ඒකකවලට වනඅලින් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂිත ආරක්ෂිත වැටක් ඉදිකිරීම සහ ඒවා නිසි පරිදි නඩත්තු කිරීමට නිර්දේශ කෙරේ.

6.7 ආයතනයේ ඇති සමස්ත පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සහ සේවස්ථ ගැටළුව නිරාකරණය කිරීමට සුදුසු හා ඉක්මන් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.

6.8 වනජීවී සංරක්ෂණයට මුල් තැනදී සංචාරක ව්‍යාපාරය හා සෆාරි සේවාවට දෙවෙනි තැනදී සෆාරි සඳහා නීතිරීති පද්ධතියක් හා පාලනයක් ඇති කිරීම හා යාල ජාතික වනෝද්‍යානයට දිනකට ඇතුළු කරන වාහන සංඛ්‍යාව සීමා කළ යුතු අතර වනසතුන්ගේ නිදහස් හැසිරීම් රටාවට බාධාවක් නොවන ආකාරයෙන් සංචාරකයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් විධිමත් නීතිරීති මාලාවක් හඳුන්වාදිය යුතු බව නිර්දේශ කෙරේ.

6.9 අලි මිනිස් ගැටුමට පිළියමක් වශයෙන් උඩවලව, ලුණුගම්වෙහෙර හා බූන්දල ජාතික වනෝද්‍යාන සම්බන්ධ කරමින් අලි ඇතුන්ගේ සංක්‍රමණික රටාවන් හඳුනාගෙන වනාන්තර ප්‍රදේශ ජාලගත කිරීම අරමුණු කරගෙන දැනටමත් හඳුනාගෙන ඇති මත්තල වන අලි කළමනාකරණ රක්ෂිතය කඩිනමින් වනජීවී කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට නිර්දේශ කෙරේ.

6.10 වන සතුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට සුදුසු කමිටුවක් පත්කිරීම හා වනජීවී පාලන ඒකක පිහිටුවීමට නිර්දේශ කෙරේ.

6.11 විදුලිවැට ඉදි කිරීම වෙනුවට ඒ සම්බන්ධයෙන් වෙනත් විකල්ප ක්‍රමවේදයන් හඳුන්වාදීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතු බව නිර්දේශ කෙරේ.

6.12 ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ හා සංචාරක බංගලා වෙන් කිරීමේ ක්‍රමවේදයේ අවභාවිතයන් පවතින බව නිරීක්ෂණය වී ඇති බැවින් එය ප්‍රතිව්‍යුහගත කර නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව නිර්දේශ කෙරේ.

6.13 හඳුනාගත් සෑම වටිනා ඇතකු වෙනුවෙන් වගකිව යුතු එක් ක්ෂේත්‍ර නිලධාරියෙක් පත් කළ යුතු අතර එම ඇතාගේ තොරතුරු හා ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන්ට වගකීම පැවරෙන අතර ඒ සම්බන්ධයෙන් පැහැදිලි අධීක්ෂණයක් ඉහළ කළමනාකරණ මඟින් සිදු කළ යුතු බව නිර්දේශ කෙරේ.

6.14 වනජීවී ප්‍රාදේශීය කාර්යාල සඳහා සන්නිවේදනය සම්බන්ධ වගකීම් පවරන ලද නිලධාරියෙකු හා රියදුරන් සෑම අවස්ථාවකදීම කටයුතු කිරීමට හැකිවන පරිදි සේවයේ යෙදවීම නිර්දේශ කෙරේ.

## 7 නිගමන

7.1 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැනට පවතින අකාර්යක්ෂමතාවයට හේතුවී ඇති සේවාස්ථ අර්බුදය විසඳීම පිණිස ආයතනය ප්‍රතිව්‍යුහ ගතකර සුදුසු නව තනතුරු සංඛ්‍යාවක් හඳුන්වාදීම තුළින් ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩිකළ යුතු බව නිගමනය කෙරේ.

7.2 අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති හඳුනාගත් අලි මංකඩ 16 නීත්‍යානුකූලව නිදහස් කර නිසි අලිමංකඩවල් ලෙස පවත්වාගෙන නොයෑම අලිමිනිස් ගැටුම

වර්ධනයවීමටත්, අලි සහ මිනිස් මරණ සංඛ්‍යාව ඉහළ යාමටත් හේතුවී ඇති බව නිගමනය කෙරේ.

7.3 අලි මිනිස් ගැටුම පාලනයට පැහැදිලි වැඩපිළිවෙලක් වහාම ක්‍රියාත්මක නොකළහොත් ඉදිරි වසර කිහිපය ඇතුළත අලි සම්පත ශ්‍රී ලංකාවෙන් වඳවී යාම නොවැළක්විය හැකි බව නිගමනය කෙරේ.

7.4 අලි මරණ සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයක පැවතියද ඒවා වළක්වා ගැනීමට, අවම කර ගැනීමට හෝ අලි ඇතුන්ගේ මරණ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයින්ට දඬුවම් කිරීමට නීත්‍යානුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් පැහැදිලි පිළිවෙත් තිබුණද ආයතනයේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් ඒවා නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වගකිව යුතු බව නිගමනය කෙරේ.

7.5 විදුලිවැට ඉදිකිරීම සඳහා වන මානව සහ මූල්‍ය සම්පත් ප්‍රමාණවත්ව සපයා තිබුණද අපේක්ෂිත ඉදිකිරීම් කාර්යසාධනය අත්පත් කර ගැනීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අපොහොසත් වීම හේතුවෙන් අලි මිනිස් ගැටළුව අවම කිරීමට නොහැකිවීම සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වගකිව යුතු බව නිගමනය කෙරේ.

7.6 හම්බන්තොට වනඅලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත් නොකිරීම හේතුවෙන් එම ප්‍රදේශවල සිදුවෙමින් පවතින වේගවත් සංවර්ධන ව්‍යාපෘති සමඟ වනඅලි ඇතුළු වනජීවීන්ගේ වාසස්ථාන හා සංක්‍රමණ මාර්ගවලට දැඩි ලෙස බලපෑම් ඇතිවීම හේතුවෙන් එම ප්‍රදේශවල වනඅලි මිනිස් ගැටුම දිනෙන් දින උග්‍රවිය හැකි බව නිගමනය කෙරේ.

එච්. එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

2018 මාර්තු 23 දින

විගණකාධිපති නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර

**3.1 මනා කළමනාකරණ සැලැස්මක් තුළ වනජීවී ජාලයේ කටයුතු විමධ්‍යගත කිරීම හා වර්තමාන සංරක්ෂණ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි පරිපාලනය ප්‍රතිව්‍යුහගත කිරීම සුදුසු බව නිර්දේශ කෙරේ.**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු ඒකාබද්ධ සැලැස්මක් (Cooperate Plan) පිළියෙළ කරන ලදී. එහි සැලසුම් කාලය 2013 සිට 2017 දක්වා වූ අතර, 2014 වර්ෂයේ දී රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමටද ඉදිරිපත් කරන ලදී. මෙම ඒකාබද්ධ සැලැස්මේ හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද අතර එම ක්‍රියාවලියේ ප්‍රගතිය ඇමුණුම I මගින් ඉදිරිපත් කරනු ලැබේ.

ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සංරක්ෂණ ක්‍රියාවලිය සැලසුම් සහගතව ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලසුමක අවශ්‍යතාවය 2018 වර්ෂයේ සිට ඇති වූ අතර ඒ සඳහා පිළියමක් ලෙස මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ විවිධ තරාතිරම්වල නියෝජිතයින්ගෙන් සමන්විත කණ්ඩායමක සහභාගීත්වය ඇතිව 2018.12.14 සහ 15 දිනයන්හි දී ගිරිතලේ පිහිටි වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේ දී පවත්වන ලද වැඩමුළුවකදී 2019 සිට 2024 දක්වා කාලයට අදාළව සැලසුමක් පිළියෙළ කරන ලදී. එකී ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම මගින් වනජීවී සංරක්ෂණයේ නව ප්‍රවනතා හා වර්තමාන සංරක්ෂණ ගැටළු මෙන්ම වර්තමාන සමාජ ආර්ථික රටාව මඟින් ඉදිරියේ දී ඇතිවිය හැකි සංරක්ෂණ ගැටළු සම්බන්ධයෙන් ද අවධානය යොමු කරන ලදී. එසේ පිළියෙල කර ඇති ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මේ පිටපතක් ඇමුණුම II ලෙස යා කර ඇත.

තවද, එකී ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම මගින් වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලයේ කටයුතු විධිමත්ව කළමනාකරණය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලිය වඩා ඵලදායී ලෙස විමධ්‍යගත කිරීමටත් පරිපාලන ව්‍යුහය උපාය මාර්ගික ලෙස සංශෝධනය කිරීමටත් එම ක්‍රියාවලිය 2019 වර්ෂයේ දී නිම කිරීමටත් හඳුනාගෙන ඇත.ඒ යටතේ දැනටමත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විවිධ පාර්ශ්වවල සහභාගීත්වය ඇතිව හා එකී පාර්ශ්ව මගින් ඉදිරිපත් වී ඇති යෝජනා හා සැළසුම් සළකා බලා ප්‍රධාන කාර්යාලයේ හා ක්ෂේත්‍ර කාර්යාල පද්ධතියේ සංශෝධන සහිත සැලසුමක් පිළියෙළ කර ඇත. එම සැලැස්මේ පිටපතක් ඇමුණුම III ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

**3.2 වනජීවී රක්ෂිත සඳහා දිගුකාලීන කළමනාකරණ සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමෙන් එම කළමනාකරණය විධිමත් කලයුතු බව නිර්දේශ කෙරේ.**

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේප්‍රතිපාදන යටතේ ප්‍රකාශයට පත්කර ඇති වනජීවී රක්ෂිත සඳහා විවිධ අවස්ථාවල කළමනාකරණ සැලැසුම් පිළියෙල කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වී ඇත. ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුවේ සංරක්ෂණ කටයුතු සඳහා මූල්‍යාධාර ලබාදුන් විවිධ ව්‍යාපෘති යටතේ මෙන්ම විවිධ ආයතනවල මැදිහත්වීම යටතේද කළමණාකරන සැලැසුම් පිළියෙල කර ඇත. එසේ 2018 වසරට පෙර කළමණාකරන සැලැසුම් පිළියෙල කිරීමට ගන්නා ලද ප්‍රවේශයන් සම්බන්ධ සංෂිප්ත තොරතුරු ඇමුණුම IV මගින් දක්වා ඇත.

2009 අංක 22 දරණ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වගන්තිය ඉවත්කොට ප්‍රතියෝජනය කිරීම මගින් වනජීවී රක්ෂිත සඳහා කළමණාකරන සැලැසුම් පිළියෙල කිරීම නීතිමය අවශ්‍යතාවයක් බවට පත්කර ඇත.

මෙම නීතිමය අවශ්‍යතාවය සලකා බලමින්ද මෙතෙක් වනජීවී රක්ෂිත සඳහා පිළියෙල කරන ලද කළමණාකරන සැලැසුම් ආශ්‍රයෙන් ඒකී සැලැසුම් ක්‍රියාත්මක කිරීමට පැනනැගී තිබුණු ගැටළු සහගත තත්වයන් සලකා බලමින්ද වනජීවී රක්ෂිත සඳහාකළමණාකරන සැලැසුම් පිළියෙල කිරීමේ නව වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. මෙම ක්‍රියාවලිය මගින් පහත සඳහන් වාසිදායක තත්වයන් වනජීවීසංරක්ෂණදෙපාර්තමේන්තුවට නිර්මාණය කරගැනීමට හැකිවී ඇත.

1. වනජීවී සංරක්ෂණ ක්‍රියාවලියේ තිරසර බව රැකෙන ආකාරයට දායකත්වය දියහැකි පරිදි තම දැනුම,කුසලතා හා ආකල්ප වර්ධනය කරගෙන සිටින පලපුරුදු වනජීවී නිලධාරීන් විසින්ම කළමණාකරන සැලැසුම් පිළියෙල කිරීම මගින් වඩා ප්‍රායෝගික හා තිරසර ලෙස භාවිතා කලහැකි සැලසුම් නිර්මාණය කරගැනීමට හැකිවීම.
2. භාවිතාකරන ආකෘතිය අනුව සැලැසුම් කරන ක්‍රියාවලිය සාපේක්ෂව කෙටිකලකදී අවසන් කිරීමට හැකිවීමෙන් දෙපාර්තමේන්තුව සඳහා පිළියෙල කරඇති ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැසුම සමග රක්ෂිත ප්‍රදේශ සැලැසුම් ගැලපීමට හැකිවීමත් වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් සඳහා භාවිතා කිරීමට වාර්ෂික සැලසුම් රක්ෂිත ප්‍රදේශ සැලසුම්වල අන්තර්ගතව තිබීමත් නිසා සමස්ථ සංරක්ෂණක්‍රියාවලිය විධිමත් කරගැනීමට වැඩි අවස්ථාවක් ලැබීම.
3. වනජීවී සංරක්ෂණදෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදුකල පර්යේෂණ හා දෙපාර්තමේන්තුවේ අවසරය සහිතව බාහිර ආයතන හා පුද්ගලයින් විසින් සිදුකල පර්යේෂණ සැලැසුම්ක්‍රියාවලිය සඳහා උපයෝගි කරගැනීම මගින් එකී ආයෝජනවල ඵලදායිත්වය ඉහල නැංවීම.

4. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු ආශ්‍රිතව එක්රැස්වෙන දත්ත හා තොරතුරු කළමනාකරණ සැලසුම් සඳහා යොදාගැනීම මගින් එකී සැලසුම්වල ගුණාත්මක බව ඉහල නැංවීමට හැකිවීම.

5. වනජීවී සංරක්ෂණ නිලධාරින් විසින්ම දායකත්වයක් ලබාදෙන බැවින් මෙකී සැලැසුම් සංශෝධනය හෝ යාවත්කාලීන කරගැනීමට හැකිවන පරිදි ආයතනික ධාරිතාවය ඉහලයාම.

6. වනජීවී සංරක්ෂණ නිලධාරින් විසින් සැලසුම්කරණ කටයුතු ඉටුකිරීම නිසා උපදේශක ආයතනවල උපයෝගිතාවයට වඩා අඩු පිරිවැයකින් සමස්ථ කාර්යය ඉටුකරගැනීමට හැකිවීම.

7. නිලධාරීන්ගේ අත්දැකීම් සහ දැනුම සැලසුම් කරණය සඳහා සෘජුවම දායක කරගන්නා බැවින් වඩා ප්‍රායෝගික සැලසුම් සකස් කරගත හැකිවීම.

මේ අනුව 2018 වර්ෂයේ සිට වනජීවී රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීමේ වැඩසටහන නව ප්‍රවේශයක් සහිතව ආරම්භ කරන ලද අතර මේ වනවිට ඇමුණුම V හි ප්‍රකාරව ප්‍රගතියක් අත්කර ගෙන ඇත. දැනට අරඹා ඇති සියලුම කළමණාකරන සැලැසුම් 2019 වර්ෂයේ පිළියෙල කර අවසන් කිරීමට නියමිතය.

**3.3 වනජීවී සම්පත සුරැකීම ප්‍රධාන අරමුණ ලෙස සලකා ඒ සඳහා වැඩි අවධානයක් යොමු කිරීම සහ සංචාරකයන්ගෙන් ලැබෙන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් වනජීවී සුපෝෂණය සඳහා වැය කිරීම සුදුසු බව නිර්දේශ කෙරේ.**

වනජීවී සංරක්ෂණ විෂයෙහිලා වාසස්ථාන කළමනාකරණයේදී අනුගමනය කරන එක් මූලික පිළිවෙතක් වන්නේ පවත්නා වනජීවී වාසස්ථානවල ගුණාත්මක බව නොවෙනස්ව පවත්වා ගැනීම සඳහා එකී වාසස්ථාන සන්තතික ක්‍රියාවලිය ඔස්සේ ඉදිරියට යාම බාධා කරමින් පවත්වාගෙන යාමය.

ඒ අනුව සන්තතික ක්‍රියාවලියට බාධා කරමින් වාසස්ථාන කළමනාකරණය කිරීමේදී අනුගමනය කරන ක්‍රියාවන් පහත පරිදි වේ.

1. වාසස්ථාන වල පැතිරෙන ආක්‍රමණශීලි ශාක විශේෂ ඉවත් කිරීම.(ජලජ හෝ භෞමික වෘක්ෂලතා)

2. තෘණ බිම්වල පැතිරෙන කාෂ්ඨීය ශාක ඉවත් කිරීම.

3. ආක්‍රමණශීලි නොවන නමුත් වනසතුන්ට ආහාර ලෙස භාවිතා කළ නොහැකි තෘණ වර්ග හෝ වෙනත් කාෂ්ඨීය ශාක පැතිරීම වැලැක්වීම.

ඊට අමතරව වාසස්ථානයක ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා ද ක්‍රියා මාර්ග ගත හැක. ඒවානම්,

1. එක් එක් සත්ත්ව විශේෂ ප්‍රිය කරන ආවරණ වර්ග ස්ථාපිත කිරීම හෝ තිබෙන ආවරණ වර්ග හානි වීම වැලැක්වීම.

2. සතුන් ප්‍රියකරන තෘණ හෝ වෙනත් ශාක වර්ගවල ව්‍යාප්තිය වෙනස් කළ හැකි ආකාරයේ ක්‍රියා මාර්ග ගැනීම.

3. වන සතුන්ට අවශ්‍ය ජලය ප්‍රශස්ත ප්‍රමාණයකින් සැපයීම සඳහා රක්ෂිත තුළ වාසය කරන වනසත්ව විශේෂ වලට ගැලපෙන පිහිටීමක් තහවුරු වන ආකාරයට ජල ප්‍රභවයන් ස්ථාපිත කිරීම.

4. ස්ථානීයව ගන්නා තීරණ මත පදනම්ව පාලිත ගිනි තැබීම් සිදු කිරීම මගින් වාසස්ථානයේ ශාක ප්‍රජාවේ සංයුතිය ප්‍රදේශයේ වාසය කරන වනසතුන්ට ගැලපෙන ආකාරයට පාලනය කිරීම.

තවද වනජීවී වාසස්ථාන වල කැලෑ ගිනි නිසා ඇති වන හානිය අවම කිරීමට සැලසුම් සහගතව ගිනිපටි ස්ථාපිත කරනු ලැබේ. මෙමගින් එක් එක් වාසස්ථාන වල ශාක ප්‍රජාවට ගිනි නිසා ඇතිවන හානි වලක්වා ගත හැක.

ඉහත දක්වන ලද ක්‍රමවේද සැලසුම් සහගතව අනුගමනය කිරීම මගින් වාසස්ථානයක ගුණාත්මක භාවය රඳවා තබා ගැනීමට හැකිවන අතර, එකම ක්‍රමවේදයන් එක් වාසස්ථානයක් සඳහා අඛණ්ඩව වසර කිපයක් භාවිතා කිරීම ද නුසුදුසුය.

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැනට භාවිතා කරන වාසස්ථාන කළමනාකරණ ක්‍රමවේදයක් ලෙස පාලිත ගිනි තැබීම් භාවිතා නොකරන අතර, වඩාත්ම බහුලව භාවිතා වන්නේ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමය. මෙයට හේතු වී ඇත්තේ වනජීවි රක්ෂිත ලෙස වර්තමානයේ භාවිතා වන බොහෝ ප්‍රදේශ මීත් පෙර සම්ප්‍රදායික හේන් ගොවිතැන සඳහා භාවිතා කරමින් තිබියදී වනජීවි රක්ෂිත බවට පත් කරන ලදුව සන්තතික ක්‍රියාවලියට බඳුන්වී තිබීමය.

වනජීවි රක්ෂිත තුළ වාසස්ථාන සුපෝෂණ කටයුතු එක් එක් වනජීවී විශේෂ වල ගහන ගනත්වය හා පැතිරීම වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව ක්‍රියාත්මක කළ යුතුය.

මෙම තත්ත්වයන් යටතේ වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව වාසස්ථාන කළමනාකරණය සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් කරන නමුත් වනජීවි රක්ෂිත වලින් ලබන ආදායමින් වැඩි ප්‍රතිශතයක් වාසස්ථාන සුපෝෂණ කටයුතු සඳහා ආයෝජනය කිරීම වෙනුවට ප්‍රශස්ත ප්‍රමාණයක් ආයෝජනය කිරීම තෝරාගෙන ඇත. තවද වාසස්ථාන කළමනාකරණ කටයුතු වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මෙහෙයුමක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ඒ සඳහා උපදෙස් වනජීවි සංරක්ෂණ නිලධාරින් සඳහා නිකුත් කර ඇති කාර්ය සංග්‍රහයේ III කාණ්ඩයට අන්තර්ගත කර ඇත.

**3.4 සංචාරක බංගලා ඉදිකිරීමට පෙර සතුන්ගේ පැවැත්මට හානියක් නොවන ආකාරයට නිසි අධ්‍යනයකින් පසුව පමණක් සංචාරක බංගලා ඉදි කිරීමත්, සතුන්ට නිදහසේ හැසිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තහවුරු කිරීමත් සුදුසු බව නිර්දේශ කෙරේ.**

වනජීවී රක්ෂිතයක් තුළ සංචාරක නිවාස මෙන්ම වෙනත් ඕනෑම ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී එමගින් එම ප්‍රදේශය වාසස්ථානය කර ගත් වනසතුන්ට කිසියම් හෝ බාධාවක් ඇතිවීම් වලකින ලෙස අදාළ ඉදිකිරීම සැළසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ සඳහා දැනටමත් අංක 01/2019 හා 2019.01.31දිනැති චක්‍රලේඛය නිකුත් කර ඇත. තව ද එම සැලසුම් කටයුතු සඳහා නිලධාරින් ලබා ඇති දැනුම ද යොදා ගැනීම මගින් අදාළ කාර්යය ඵලදායී කරගැනීමට අරමුණු කරගෙන ඇත.

ඊට අමතරව වනසතුන්ට භාවිතා කිරීමට නොහැකි ආකාරයට භූමි පරිහරණය කිරීම සහභාගීත්ව වනජීවී රක්ෂිත තුළ ද වෙනස් කිරීමට කිසිදු අයුරකින් දිරි ගැනීමක් නොහැකිවන වන අතර රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැළසුම් පිළියෙල කිරීමේ දී එකී සැළසුම් සඳහා සහභාගීත්ව කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කරීම මගින් වනසතුන්ට ඇතිවන බාධා හානි අවම කර ගැනීමට ද අපේක්ෂිතය.

**3.5 අලිමංකඩවල් හඳුනාගැනීමට කටයුතු කිරීම හා හඳුනාගෙන ඇති අලිමංකඩ 16 ගැසට් කිරීමට නිර්දේශ කෙරේ.**

වනඅලින් සඳහා රක්ෂිත ප්‍රදේශ අතර පිවිසුම් මාර්ග ස්ථාපිත කිරීම සඳහා ලැබුනු අමාත්‍ය මණ්ඩල අනුමැතීන් සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය පහත දක්වනු ලැබේ.

| අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව /සටහන සම්බන්ධ තොරතුරු | අමාත්‍ය මණ්ඩල තීරණයේ දිනය | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| අංකය:අමප/012/708/0954/16/ දිනය20/05/2016 : | 31/05/2016 | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ක්‍රියාත්මක කිරීමට අදාළව යෝජිත වනඅලි සංක්‍රමණික මාර්ගවල පදිංචි ජනතාව පරිස්ථාන ගත කිරීම සඳහා මූලික සමීක්ෂණ කටයුතු සිදුකිරීම පේරාදෙණිය විශ්ව විද්‍යාලයට පවරා ඇත. එම සමීක්ෂණයේ ප්‍රතිඵල ලෙස යෝජිත අලිමංකඩ 09ක් පිළිබඳ සකස් කළ තොරතුරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදී ඇත. |
| අංකය:අමප-012/708/2104/16/I දිනය06/10/2016 : | 18/10/2016 | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් පරිදි වනජීවී භාරයට අදාල සමීක්ෂණ කටයුතු සිදුකිරීමට හැකියාවක් නොමැති බව අනාවරණය වූ පසුව එම සමීක්ෂණ කටයුතු 31/05/2016 අමාත්‍ය මණ්ඩල තීරණ වලට අනුකූලව පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ලබා දී ඇත . |

ඒ අනුව හඳුනාගෙන ඇති වනඅලි පිවිසුම් මාර්ග සම්බන්ධ ප්‍රගතිය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ඇමුණුම VI මගින්ද මෙම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලසුම ඇමුණුම VII ලෙසද ඉදිරිපත් කරනු ලැබේ.

**3.6. අලින් ගැවසෙන ප්‍රදේශවල කසළ කළමණාකරණ ඒකක වලට වන අලින් ඇතුලුවීම වැලැක්වීම සඳහා විශේෂිත ආරක්ෂිත වැටක් ඉදිකිරීමට සහ ඒවා නිසි පරිදි නඩත්තු කිරීමට නිර්දේශ කෙරේ.**

වනඅලින්ගේ විසුම්පරාසය (HomeRange) තුල පිහිටි රක්ෂිත ප්‍රදේශවලට කසළ බැහැර කිරීම නිසා වනඅලින් එම ස්ථානවල ඇති කසළ පරිභෝජනයට පෙළඹීමෙන් ඇතිවන අහිතකර තත්වයන් මැඩලීමට පියවර ගැනීමට තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ නිරීක්ෂණ හා යෝජනා ක්‍රියාත්මක කිරීම අංක: අමප/17/1057/708/014 හා 2017 මැයි 30 දිනැති අනුමැතිය ලැබී ඇත. එම අනුමැතිය අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්මේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. වනසතුන් ජීවත්වන ප්‍රදේශ ආශ්‍රිතව කසළ බැහැරකරන ස්ථාන 54ක් හඳුනාගෙන ඇති අතර ඉන් ස්ථාන 3ක්, එනම් බුද්ධංගල, පානම- කුඩුම්බිගල හා ඇලහැර යන කසළ බැහැර කරන ස්ථාන පමණක් වනජීවී අභයභූමි තුල පිහිටා ඇති අතර ඉතිරි ස්ථාන 51න් බහුතරයක් පිහිටා ඇත්තේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව වේ. වනජීවී රක්ෂිත ප්‍රදේශ තුල කසළ බැහැර කිරීම වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතට පටහැනිවන නිසා වනජීවී රක්ෂිත තුල කසළ බැහැර කරන පලාත් පාලන ආයතන ඒ සම්බන්ධයෙන් දැනුවත්කර වනජීවී රක්ෂිත තුලට කසළ බැහැර කිරීම නවතා දැමීමට කටයුතු කරන ලෙසට වනජීවී කලාපභාර සහකාර අධ්‍යක්ෂවරුන්ට උපදෙස් ලබා දී ඇත.

2. සෝමාවතිය ප්‍රදේශයේ ස්ථාපනය කර ඇති පිළිසරු ව්‍යාපෘතිය තුලට වනසතුන්ට පිවිසීමට නොහැකිවන අකාරයට විදුලි වැටක් හා අගලක් ස්ථාපනය කර ඇත. අනෙකුත් ස්ථාන සඳහා ස්ථානීයව සුදුසු පියවර ගැනීමට අදාල ආයතන සමඟ ඉදිරියේදී කටයුතු කිරීමට නියමිතය. තවද වනජීවී රක්ෂිත තුලට කසළ බැහැර කරන ආයතනවලට එරෙහිව නීතියක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

3. පලාත් පාලන ආයතනයන්ද රජයේ තවත් ආයතනයන් වන බැවින් එම ආයතන සමඟ සාකච්ඡා කරවන සතුන්ට හානි නොවන අයුරින් කසළ බහාලන ස්ථාන පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් අනුමැතිය ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණ ඇතිව ක්‍රියාකාරී සැළසුමක් පිළියෙල කරන ලදී. (ඇමුණුම VIII)

**3.7 ආයතනයේ ඇති සමස්ත පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා සේවාස්ථ ගැටළුව නිරාකරණයකිරීමට සුදුසු හා ඉක්මන් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.**

වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව දැනට පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මේ වන විටත් නිසි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ඒ අනුව දැනට පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කටයුතු පිළිබඳ ප්‍රගතිය ඇමුණුම IX මගින් ඉදිරිපත් කරනු ලැබේ.

මෙයට අමතරව වනජීවී සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයේහිලා නව ප්‍රවනතාවයන් සලකා බලා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය හඳුනා ගැනීමට දැනටමත් කටයුතු අරඹා ඇත. මෙසේ හඳුනා ගන්නා ලද කාර්ය මණ්ඩලය සඳහා නිසි අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. මේ ආකාරයට හඳුනාගන්නා ලද කාර්ය මණ්ඩලය සම්බන්ධව පිළියෙල කරන ලද වාර්තාවේ පිටපතක් ඇමුණුම X ලෙස ඉදිරිපත් කරනු ලැබේ

**3.8 වනජීවී සංරක්ෂණයට මුල් තැනදී ,සංචාරක ව්‍යාපාරය හා සෆාරි සේවාවට දෙවෙනි තැනදී සෆාරි සඳහා නීතිරීති පද්ධතියක් හා පාලනයක් ඇති කිරීම හා යාල ජාතික වනෝද්‍යානයට දිනකට ඇතුළු කරන වාහන සංඛ්‍යාව සීමා කළයුතු අතර වනසතුන්ගේ නිදහස් හැසිරීම් රටාවට බාධාවක් නොවන අකාරයෙන් සංචාරකයින්ගේ හැසිරීම් සම්බන්ධයෙන් විධිමත් නීතිරීති මාලාවක් හඳුන්වා දියයුතු බව නිර්දේශ කෙරේ.**

යාල ජාතික උද්‍යානය යනු වැඩිම සංචාරක පැමිණීමක් වාර්තාවන සහ එම නිසාම රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත සංචාරක සේවා මගින් වැඩිම ආදායමක් සඳහා දායක වන රක්ෂිත ප්‍රදේශයක් ද වේ. මෙසේ අධික සංචාරක පැමිණීමත් සමග ඇතිවිය හැකි ගැටළු සම්බන්ධව පුරෝකථනයක් කර ඒ සඳහා උපාය මාර්ගයන් සහිත සැලසුමක් පිළියෙළ කරන ලදී. මෙම සැලසුම් දැනට ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව අධික සංචාරකයින්ගේ පැමිණීම හේතු කරගෙන ඇතිවිය හැකි හානිය අවම කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගනු ලැබේ.

1. සංචාරක කලාපය තුළ මාර්ග පද්ධතියේ මුර සංචාර සඳහා වාහනයක් යෙදවීම.
2. උද්‍යාන නීති උල්ලංගනය කිරීමට එරෙහිව දඩුවම් පැමිණවීම.
3. සංචාරක කටයුතු සම්බන්ධව වනජීවී නිලධාරීන්ගේ ධාරිතාව වර්ධනය සඳහා කටයුතු කිරීම
4. මාර්ග පද්ධතිය සඳහා වේග සීමා පැනවීම
5. වේග සීමාවන් උල්ලංගනය කිරීම්වලට එරෙහි වේගමාන භාවිතය.

6. විවිධ ස්ථාන වල තදබදයන් ඇතිවීම වැළැක්වීමට පෙ.ව.5.30 සිට බලපත්‍ර කවුළුව විවෘත කර තැබීම.
7. සංචාරක කලාපය භාවිතය කාලය අනුව සීමා කිරීම (උද්‍යානය සංචාරකයින් සඳහා දෛනිකව පෙ.ව.6.00 සිට ප.ව. 6.00 දක්වා විවෘතය. කෙසේ නමුත් උද්‍යානය තුළ මධ්‍යහන 12.00 සිට ප.ව. 2.00 දක්වා මාර්ග පද්ධති භාවිත කිරීමට අවසර නැත. එම කාලය තුළදී සියළුම වාහන පරණ තොටුපළ හා පටනංගල යන ස්ථාන වල ගාල්කර තැබිය යුතුය.)
8. සනීපාරක්ෂක පහසුකම් සහ මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ගල්ගේ පිවිසුමෙන් සංචාරකයින්ට ඇතුළුවීම පහසුකිරීමට ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම පරිගණකගත කිරීම වැනි සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම.

වර්ෂ 2019 සිට ඉදිරියට යාල ජාතික උද්‍යානය තුළ සංරක්ෂණ කටයුතු වලට ප්‍රමුඛතාවය දෙන අතර සංචාරක සේවාවද පවත්වාගෙන යාම සඳහා විවිධ කළමණාකරණ පැතිකඩවල් ඔස්සේ පහත සඳහන් ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත.

1. වනජීවී වාසස්ථානවල ප්‍රශස්ථ මට්ටමින් ජලය තිබීම සඳහා යාල ජාතික උද්‍යානය තුළ පිහිටි වැව් පද්ධතිය පිළිසකර කිරීම.
2. සංචාරකයින් සඳහා මාර්ග දෙපස පැහැදිලිව පෙනෙන ලෙසද වනසතුන්ට උලාකෑම සඳහා ආහාර ද්‍රව්‍ය බහුල කිරීම සඳහාද යටිකැලය ඉවත් කිරීම.
3. සංචාරකයින්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව විවරණ කටයුතු ස්ථාපිත කිරීම.
4. සංචාරක මාර්ගෝපදේශකයින් සහ ජීප්රථ සේවා සපයන්නන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**3.9 අලි මිනිස් ගැටුමට පිළියමක් වශයෙන් උඩවලව, ලුණුගම්වෙහෙර හා බුන්දල ජාතික වනෝද්‍යාන සම්බන්ධ කරගනිමින් අලි ඇතුන්ගේ සංක්‍රමණික රටාවන් හඳුනාගෙන වනාන්තර ප්‍රදේශ ජාල ගත කිරීම අරමුණු කරගෙන දැනටමත් හඳුනාගෙන ඇති මත්තල වන අලි කළමනාකරණ රක්ෂිතය කඩිනමින් ප්‍රකාශයට පත් කිරීමට නිර්දේශ කෙරේ.**

හම්බන්තොට ප්‍රදේශයේ සිදු කරන විශාල සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් ප්‍රදේශය ආවරණය වන පරිදි උපාය මාර්ගික පරිසර අධ්‍යයනයක් (Strategic Environment Assessment) සිදු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. ඒ අනුව හම්බන්තොට මහා සංවර්ධන සැලැස්ම (Greater Hambanthota Development Plan ) යටතේ 2010 වර්ෂයේ දී එම උපාය මාර්ගික පාරිසරික අධ්‍යයනය සිදු කරන ලදී.

මෙම උපාය මාර්ගික පරිසර අධ්‍යයනයට සහභාගී වූ විශාල සංඛ්‍යාවක් වූ පාර්ශවකරුවන් විසින් මත්තල කළමනාකරණ අලි රක්ෂිතය ස්ථාපනය කළ යුතු බව හඳුනා ගන්නා ලදී. තවද මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල සඳහා පිළියෙල කළ පරිසර බලපෑම් ඇගයුමේ දී ද (Environment Impact Assessment) මෙම කළමනාකරණ අලි රක්ෂිතය ස්ථාපිත කිරීම අවශ්‍ය බව හඳුනාගන්නා ලදී.

ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් යුතු පාර්ශවකරුවන් ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් යෝජිත කළමනාකරණ අලි රක්ෂිතයේ මායිම් හඳුනා ගන්නා ලද අතර ඉන් පසු මෙම යෝජනාව විවිධ පාර්ශවකරුවන් වෙත ද, අවසානයේ හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ද ඉදිරිපත් කරන ලදී. මෙකී සියලුම පාර්ශවකරුවන්ගේ එකඟතාවය මත වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මත්තල කළමනාකරණ අලි රක්ෂිතය සඳහා සිතියම, මායිම් උප ලේඛණය සහිත ගැසට් නිවේදනයේ කෙටුම්පත සහ අමාත්‍යමණ්ඩල පත්‍රිකාවේ කෙටුම්පත පිළියෙල කරන ලදී.

මෙකී සියලු ලේඛන ඉදිරි කටයුතු සඳහා සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එම ලේඛණ වල පිටපතක් ඇමුණුම XI ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

**3.10 විදුලිවැට ඉදිකිරීම වෙනුවට ඒ සම්බන්ධයෙන් වෙනත් විකල්ප ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතු බව නිර්දේශ කෙරේ.**

වන අලි මිනිස් ගැටුම මැඩ පැවැත්වීම සඳහා මධ්‍ය කාලීන හා දිගුකාලීන උපාය මාර්ග ලෙස වන අලීන් හා මිනිසුන් ගැටුමට යොමුවීම වැළැක්වීම සඳහා එකී පාර්ශව වෙන්කර තැබීමේ විවිධ උපක්‍රම භාවිතයට පැමිණි අතර, ඒවා අතුරින් බහුලව භාවිතා කළ උපක්‍රම පහත දැක්වෙන පරිදි වේ.

1. විදුලිවැටඉදිකිරීම
2. අගල් කැපීම
3. ජීව වැට ඉදිකිරීම

කෙසේ නමුත් භාවිතයේ ප්‍රායෝගික කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය සලකා බැලූ කල, විදුලිවැට ඉතා ඉදිරියෙන් වූ බැවින්, එම උපක්‍රමයි වනඅලි මිනිස් ගැටුම මැඩලීම සඳහා බහුලව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගනිමින් පවතී.

විදුලිවැටක් මුලින්ම හඳුන්වා දුන් කාලයේදීම විදුලිය ධාරාවක් නිසා අලියෙකුට දැනෙන සංවේදනය උපයෝගීකරගත් මානසික බාධකයක් ලෙස සලකා සැලසුම් සකස් කරන ලදී. තවද, විදුලි වැටක් ඉදිකිරීමේ ප්‍රායෝගික පහසුව වැඩිදියුණු කිරීමට වැටකණු සඳහා කොන්ක්‍රීට් කණු වෙනුවට ලී කණු භාවිතයට ගන්නා ලදී. පසුකාලීනව කණු සඳහා විවිධ ආදේශක අත්හදා බැලුවද මේ දක්වා ලී කණුවලට සාර්ථක විකල්පයක් හඳුනාගෙන නැත.

තවද, විදුලිවැටේ විදුලි ධාරිතාවය වෙනස් කරමින් හා වැටේ ඉදිකිරීම් ආකෘතිය වෙනස් කරමින් විදුලිවැට වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.

මේ ආකාරයට විදුලිවැට ඉදිකිරීමට සාපේක්ෂව වඩාත් සාර්ථක උපක්‍රමය ලෙස වනඅලි මිනිස් ගැටුම මැඩලීම සඳහා භාවිත කළද වෙනත් උපක්‍රම අත්හදා බැලීම සම්බන්ධව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අවධානය යොමුකරන ලදී. එහෙත් අත්හදා බැලූ ක්‍රමවේද සම්බන්ධ නිරීක්ෂණ පහත දක්වමි.

| ක්‍රමවේදය | නිරීක්ෂණ |
|---|---|
| ජීවවැට | තල්, හණ, බෝගන්විලා ආදී ශාක වර්ග යොදා ගනී. පැල වර්ධනයට ගතවන කාලය දීර්ඝ වීම, පසේ තත්වය අනුව වර්ධනය සීමා වීම ආදී කරුණු මෙන්ම විදුලිවැට මෙන් මානසික බාධකයක් නොවීම නිසා විදුලිවැටට සාපේක්ෂව සාර්ථක බවින් අඩුය. විදුලිවැට සමඟ එක්ව යොදාගැනීම සුදුසුය. |
| අගල් කැපීම | නියාමන ව්‍යාපෘති අනුරාධපුර හා මොණරාගල දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක කරන ලදී. ශුෂ්ක කාලගුණික තත්ත්ව අනුව සුදුසු වුවද, මෝසම් වැසි වලින් අනතුරුව හා පසේ ස්වභාවය අනුව නඩත්තුව සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවේ. |
| එල්ලෙන විදුලි වැට | - විදුලිවැටේ වෙනස්කල ආකෘතියකි.<br>- තාක්ෂණික ඇගයුමක් සිදුකිරීමට නියමිතය. |

දැනට වාර්තා වී ඇති පරිදි විදුලි වැට ඵලදායි බවින් අඩුවීමට බලපා ඇති හේතුව වන්නේ මනා නඩත්තුවක් සිදුකිරීමට අවශ්‍යතා මානව සම්පත් හිඟයයි. මේ සඳහා පිළියම් යෙදීමට දැනට කටයුතු කරන අතර, එමගින් විදුලිවැට අලින් සඳහා සාර්ථක මානසික බාධකයක් ලෙස පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

**3.11 ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ හා සංචාරක බංගලා වෙන් කිරීමේ ක්‍රමවේදයේ අවභාවිතයන් පවතින බව නිරීක්ෂණය වී ඇති බැවින් එය ප්‍රතිව්‍යුහගත කර නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කල යුතු බව නිර්දේශ කෙරේ.**

පරිගණක ආශ්‍රිත මෙවැනි පද්ධති විධිමත් ලෙස භාවිතය සඳහා නිසි අභ්‍යන්තර පාලනයක් සහිත මිනිස් ශ්‍රමයේ මැදිහත්වීමක් අත්‍යාවශ්‍යය. ඒ අනුව මෙම පද්ධතිය භාවිතය විධිමත් කිරීම සහ චක්‍රලේඛ සහ ලිපි කිහිපයක් නිකුත් කර ඇත. පසුවිපරම් වලදී පෙනී ගොස් ඇත්තේ අධීක්ෂණ කාර්යාවලියේ අඩුපාඩු මෙකී පද්ධති අවභාවිතය කිරීමට හේතු වී ඇති බවය. එබැවින් අදාල නිලධාරීන්ට නිසි උපදෙස් නිකුත් කර ඇති අතර අභ්‍යන්තර විගණකවරු මඟින් නිරන්තර විගණනයක් සිදු කරනු ලැබේ.

මෙකී පාලන ක්‍රම මගින් ඉහත කී අවභාවිතයන් අඩු කර ගැනීමට හැකියාව ඇත. මෙම පද්ධතීන් නිවැරදි ආකාරයට භාවිතා කිරීම සඳහා උපදෙස් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ ලිපි පහත දැක්වේ.

| චක්‍රලේඛ අංකය | දිනය | විෂයය |
|---|---|---|
| 02/2012 | 2011.03.09 | ණයවර කාඩ්පත් මගින් ආදායම් එකතු කිරීම, පරිගණක ජාලය නඩත්තු කිරීම සහ ගිණුම්ගත කිරීම. |
| 06/2016 | 2016.10.14 | පරිගණක මෘදුකාංගය මගින් සංචාරකයින් හට කුවිතාන්සි නිකුත් කරන ජාතික උද්‍යානවල වාර්තා පවත්වාගෙන යාම හා ඉදිරිපත් කිරීම. |
| 05/2017 | 2017.12.28 | පරිසනක මෘදුකාංගය මගින් සංචාරකයින්ට අවසරපත්‍ර නිකුත් කිරීමේ කටයුතු විධිමත් කිරීම. |

**3.12.** හඳුනාගත් සෑම වටිනා ඇතෙකු වෙනුවෙන් වගකිවයුතු එක් ක්ෂේත්‍ර නිලධාරියෙක් පත් කළ යුතු අතර, එම ඇතාගේ තොරතුරු හා ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන්ට වගකීම පැවරිය යුතු අතර ඒ සම්බන්ධයෙන් පැහැදිළි අධීක්ෂණයක් ඉහළ කළමනාකරණය මගින් සිදු කල යුතු බව නිර්දේශ කෙරේ.

ඇතා යනු දිනකට සැලකියයුතු දුරක් (කි.මී. 20 – 30 පමණ) ගමන්ගන්නා විශාල විසුම් පරාසයක් සහිත සතෙකි. ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අඩවි බල ප්‍රදේශ කීපයක් පුරා ඇතෙකුගේ විසුම් පරාශ පැතිරී තිබිය හැක.

මෙවැනි තත්ත්වයන් යටතේ දළ ඇතෙකුගේ දෛනික චර්යාව නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීම වඩා ප්‍රයෝගීක ක්‍රමවේදයන් සැලසුම් කරන ලද අතර, ඒ යටතේ යම් අඩවි බල ප්‍රදේශයක දක්නට ලැබෙන දළ ඇතුන් ලයිස්තුගත කිරීම, එම දළ ඇතුන් අදාල අඩවි බල ප්‍රදේශ වල දක්නට ලැබෙන කාල වකවානු පිළිබඳව දත්ත හා තොරතුරු රැස්කර තබා ගැනීම් හා හුවමාරු කිරීම, දෛනික නිරීක්ෂණයන් ප්‍රධාන කාර්යාලයේ දත්ත ගබඩාවට ඇතුලත් කිරීම, ඇතුන් සම්බන්ධ නිරීක්ෂණ රැස් කිරීමට ජංගම දුරකථන යෙදුමක් (Mobile Phone Application) නිර්මාණය කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඒ අනුව අදාල තොරතුරු එක්රැස් කිරීම, යොමු ගත කිරීම හා විශ්ලේෂණ කටයුතු සඳහා ප්‍රාදේශීය කාර්යාල වල හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් පත් කිරීමටද සැලසුම් කර ඇත.

**3.13** වනජීවී ප්‍රාදේශීය කාර්යාල සඳහා සන්නිවේදනය සම්බන්ධව වගකීම් පවරන ලද නිලධාරියකු හා රියදුරන් සෑම අවස්ථාවකදීම කටයුතු කිරීමට හැකිවන පරිදි සේවයේ යෙදවීම නිර්දේශ කෙරේ.

දෙපාර්තමේන්තුවේ සන්නිවේදන කටයුතු සඳහා පහත ක්‍රමවේද භාවි

- ගුවන් පණිවුඩ ජාලය.
- කාර්යාලීය දුරකථන.
- ජංගම දුරකථන (දීමනා ගෙවනු ලබන)

මෙම ක්‍රමවේද අතරින් ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශිය කළාප කාර්යාල අතර සන්නිවේදන කටයුතු සඳහා ගුවන් පණිවුඩ ජාලය,කාර්යාලීය දුරකථන සහජංගම දුරකථන (දීමනා ගෙවනු ලබන) යන ක්‍රමවේද ත්‍රිත්වයම භාවිතා කරයි.ප්‍රධාන කාර්යාලය උද්‍යාන මූලස්ථාන අතර සන්නිවේදන කටයුතු සඳහා ගුවන් පණිවුඩජාලය,කාර්යාලීය දුරකථන යන මාධ්‍ය දෙක භාවිතා කරයි.ප්‍රධාන කාර්යාලය සහ අනෙකුත් ක්ෂේත්‍ර කාර්යාල අතර සන්නිවේදනය සඳහා කාර්යාලීය දුරකථන භාවිතා කරයි.මීට අමතරව ප්‍රධාන කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන 1992 ක්ෂණික දුරකථන අංකය මගින් ද ප්‍රධාන කාර්යාලය සහ සියළුම ක්ෂේත්‍ර කාර්යාල අතර සන්නිවේදනය සඳහා සහසුකම් සපයනු ලබයි.

ක්ෂේත්‍රයේ සන්නිවේදන කටයුතු සඳහා යොදවා ඇති මාධ්‍යන් හා ඒවායේ සංයුතිය පහත දැක්වේ.

| මාධ්‍ය | ඒකක ගණන |
|---|---|
| කාර්යාලීය දුරකථන. | 101 |
| ජංගම දුරකථන (දීමනා ගෙවනු ලබන) | 025 |
| කාර්යාලීය ගුවන් පණිවුඩ යන්ත්‍ර | 023 |
| ජංගම ගුවන් පණිවුඩ යන්ත්‍ර | 025 |
| ගමන් කථන යන්ත්‍ර | 168 |

මෙම සන්නිවේදන පද්ධතිය ප්‍රධාන කර්යාලයේ ගුවන් විදුලි පණිවිඩ ඒකකය මගින් දෛනිකව පැය 24 පුරාම ක්‍රියාත්මක කරනු ලබයි.

එම්.ජී.සී.සූරියබණ්ඩාර
වනජීවී අධ්‍යක්ෂ ජනරාල්

එම්. ජී. සී. සූරියබණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අංක: 811/ඒ, ජයන්තිපුර පාර.
බත්තරමුල්ල.

එස්. හෙට්ටිආරච්චි,
ලේකම්,
සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
සංචාරක සංවර්ධන, වනජීවී හා
ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය
6 වන මහල, "රක්ෂණ මන්දිරය",
නො. 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

12

**ඇමුණුම 06**

**සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනුරුත්ථාපනය කර සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව**

ඉ) නිර්දේශ ක්‍රියාත්මක කිරීම :-

| නිර් දේශ අංකය | නිර්දේශය | නිර්දේශ ක්‍රියාත්මක කරන ආකාරය | එම විසඳුම ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාල රාමුව | ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| 9.1 | වර්ෂ 140 ක් පමණ පැරණි 1877 අංක 16 දරණ බන්ධනාගාර ආඥාපනත වර්තමානයට, දේශියව හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කිරීම. (යොමුව 8.1 ඡේදය) | බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලද සංශෝධිත බන්ධනාගාර පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | 2019.12.31 | 1. අතිරේක ලේකම් (නීති)<br>අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |
| 9.2 | පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාලව 1956 වර්ෂයේ සිදු කරන ලද සංශෝධනයන්හි 179 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව සිරකරුවෙකු සඳහා පැවතිය යුතු අවම ඉඩකඩ හා පහසුකම් සහිත සිර මැදිරි, වාට්ටු හා ගොඩනැගිලි ඉදිකිරීමට කඩිනමින් පියවර ගත යුතු අතර එමගින් සිරකරුවන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම. (යොමුව 8.2 ඡේදය) | බන්ධනාගාර විතැන් කිරීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව බන්ධනාගාර ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ව්‍යාපෘති අවසන් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් කාල රාමුව, ඇස්තමේන්තුව හා මේ වන විට ප්‍රගතිය පහතින් දැක්වේ.<br>බන්ධනාගාරය / කාල රාමුව / ඇස්තමේන්තුව / ප්‍රගතිය<br>යාපනය බන්ධනාගාරය / 2012-2019 / රු.මි.1140 / 93%<br>මාතර බන්ධනාගාරය / 2020-2024 / රු.මි.2950 / 0%<br>වාරියපොළ බන්ධනාගාරය / 2020-2024 / රු.මි1244.6 / 0%<br>තවද මෙම ව්‍යාපෘතිය යටතේ අනුව වැලිකඩ බන්ධනාගාරය, ගාල්ල බන්ධනාගාරය. ත්‍රිකුණාමලය බන්ධනාගාරය මඩකලපුව බන්ධනාගාරය, මීගමුව බන්ධනාගාරය හා වව්නියාව බන්ධනාගාරය යන | 2019.12.31<br>2024.12.31<br>2024.12.31<br>වර්ෂ 7ක් තුල | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්) |

4

| | | | | |
|---|---|---|---|---|
| | | බන්ධනාගාර ආයතන වැඩිදියුණු කර විතැන් කිරීමට යෝජිතව පවතින අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව ගොඩනැගිලි ඉදිකිරීමටත් විතැන් කිරීමටත් කටයුතු කිරීම. | | |
| 9.3 | පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාලව 1956 වර්ෂයේ සිදු කරන ලද සංශෝධනයන්හි 178 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව බන්ධනාගාරයේ ඉඩ පහසුකම් ඇති ආකාරයට එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වර්ගීකරණය කර වෙන වෙනම රඳවීමට කටයුතු කිරීම. (යොමුව 8.3 ඡේදය) | මේ වන විටද බන්ධනාගාරයන් තුල සිටින රැඳවියන් ස්ත්‍රී/ පුරුෂ හා වයස් අනුව වර්ගීකරණය කොට රඳවා ඇති අතර ප්‍රමාණවත් ඉඩකඩ නොමැති කම හේතුවෙන් වරදේ ස්වභාවය අනුව වර්ග කර රැඳවීමේ අපහසුතාවය පවතී. තවද මෙම රැඳවියන්ගෙන් 25.5%ක ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වරදකරුවන් ලෙස බන්ධනාගාර ගතවී ඇත. ඒ අනුව ඉදිරියේදී බන්ධනාගාර නවීකරණය කිරීමෙන් අනතුරුව මත්ද්‍රව්‍ය වැරදි කරුවන් වෙනම රැඳවීමට කටයුතු කිරීමට සැලසුම් කිරීම. තවද එක් සිරකරුවෙකු විවිධ වැරදි මත චෝදනා ලබා සිරගතවීම මතද මෙසේ වෙන් කිරීම ගැටළු සහගතව පවතී. ඉහත 9.2 නිරීක්ෂණය මගින් පෙන්වා ඇති පරිදි නව බන්ධනාගාර ඉදිකිරීමේදී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වෙන් වෙන් වශයෙන් රැඳවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | 9.2 නිරීක්ෂණයේ දක්වා ඇති කාල රාමුව තුල | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්)<br>3. බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) |
| 9.4 | වර්තමානය වන විට වසා දමන ලද ගම්පහ වතුපිටිවල පිහිටි තරුණ වරදකරුවන් යසස්ථාපනය කිරීමේ විශෝධන මධ්‍යස්ථානය වැනි මධ්‍යස්ථානයක් නැවත ආරම්භ කර තරුණ වරදකරුවන් වෙනම රඳවා තබා පුනරුත්ථාපනය කිරීමට කටයුතු කිරීම. (යොමුව 8.4 ඡේදය) | දැනට වටරැක බන්ධනාගාරය තුල මෙවැනි මධ්‍යස්ථානයක් ස්ථාපනය කර ඇති අතර එයට අතිරේක වශයෙන් කොළඹ පිහිටි බන්ධනාගාර පරිශ්‍රයන් ඉවත් කරන්නේ නම් ඒ සඳහා විකල්පයක් ලෙස වටරැක බන්ධනාගාරය අංග සම්පූර්ණව ප්‍රමිතියට අනුකූලව නවීකරණය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා ඇත.<br>1939 අංක 28 දරණ තරුණ වරදකරුවන් පුහුණු කිරීමේ ආඥා පනතේ විධිවිධාන අනුව තරුණ වරදකරුවන් මෙම මධ්‍යස්ථානය වෙත යොමු කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ගරු විනිශ්චකාරතුමන්ලාගේ අවධානය යොමු කරවීම. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් අනතුරුව<br>මාස 6 ක් ඇතුළත | 1. අතිරේක ලේකම් (බන්ධනාගාර) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය<br>2. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>3. අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් |

5

| | | | | |
|---|---|---|---|---|
| 9.5 | අබලන්ව ඇති සිර මැදිරි, වාට්ටු හා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර යථා පරිදි පවත්වාගෙන යාමටත් බන්ධනාගාර විතැන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ අත්පත් කර ගෙන ඇති ඉඩම්වල නව ඉදිකිරීම් වර්තමානයට, දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන ආකාරයෙන් ප්‍රමිතිගතව සිදු කිරීමත් නව ඉදිකිරීම් සඳහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් අත්පත් කර ගැනීම හා අදාල ඉදිකිරීම් ආරම්භ කිරීම කඩිනම් කිරීමත් මගින් බන්ධනාගාර තදබදය අවම කිරීමට ක්‍රියාමාර්ග ගැනීම. (යොමුව 8.5.1, 8.5.2 ඡේද) | බන්ධනාගාර විතැන් කිරීමේ ප්‍රතිපත්තිය යටතේ නව බන්ධනාගාර ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ හා ඉදිකිරීම් වල ස්වභාවය පහතින් දැක්වේ. | | |
| | | වැලිකඩ බන්ධනාගාරය - සුදුසු ඉඩමක් තෝරා ගැනීමට කටයුතු කරමින් පවතී. | අවස්ථානුකූලව | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්)<br>4. බන්ධනාගාර කොමසාරිස් (පාලන) |
| | | මාතර බන්ධනාගාරය - 2019 වර්ෂයේදී මූලික සැලසුම් සකස් කිරීම සඳහා ප්‍රතිපාදන රු.මි.50ක් ඉල්ලා ඇත. | 2022 | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්)<br>4. බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |
| | | ගාල්ල බන්ධනාගාරය - ඉදිකිරීමට යෝජිත භූමිය බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු වන අතර ඉදිකිරීම් සඳහා මූලික සැලසුම් සහ ඇස්තමේන්තු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් පිළියෙල කර ඇති අතර එම ඇස්තමේන්තු අධික බැවින් ඒ සඳහා අඩු ඇස්තමේන්තුවක් ලබාදෙන ලෙස අමාත්‍යාංශය විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත දන්වා ඇත. | 2024 | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්) |
| | | ත්‍රිකුණාමලය බන්ධනාගාරය - මෙම බන්ධනාගාරය ඉදිකිරීමට යෝජිත හෙක්ටයාර් 4.5ක ඉඩම බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ උපදේශන ආයතනය වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය පත්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඔවුන් විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් | වසර 4ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| | අනතුරුව රේටයන් අධික බැවින් නව ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඇස්තමේන්තු සංශෝධනය කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම. | | |
| | මඩකලපුව බන්ධනාගාරය - මෙම බන්ධනාගාරය ඉදිකිරීමට යෝජිත හෙක්ටයාර් 4.5ක ඉඩම බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ උපදේශන ආයතනය වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය පත්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඔවුන් විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රේටයන් අධික බැවින් නව ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඇස්තමේන්තු සංශෝධනය කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ඇත. | වසර 4ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්) |
| | මීගමුව බන්ධනාගාරය - මෙම බන්ධනාගාරය ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් සිරිංගිපොත ගොවිපොළ පිහිටි ඉඩම ලබාගැනීම සඳහා සාකච්ඡා කරමින් සිටී. | වසර 7ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්) |
| | වව්නියාව බන්ධනාගාරය - සුදුසු ඉඩමක් තෝරාගෙන ඇති අතර එම ඉඩම සඳහා උතුරු පළාත් සභාව වෙතින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිර්දේශ ලබාදී ඇත. එම ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | වසර 4ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්) |
| | වාරියපොළ බන්ධනාගාරය - බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු ඉඩම තුල දැනට පිහිටි බන්ධනාගාරය අංග සම්පූර්ණ පහසුකම් සහිතව ප්‍රමිතියට අනුකූලව වැඩිදියුණු කිරීම සඳහා ලබාදුන් | වසර 4ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු) |

7

| | | | | |
|---|---|---|---|---|
| | | අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ උපදේශන ආයතනය ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තෝරාගෙන ඇති අතර ප්‍රසම්පාදන ලියවිලි පිළියෙල කර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | | 3. අධ්‍යක්ෂ (සැලසුම්) |
| 9.6 | මූලස්ථාන කාර්යාල ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කඩිනම් කර ඉදිකිරීම් පිරිවැය අවම කර ගැනීමටත්, මූලස්ථාන කාර්යාල පරිශ්‍රයෙහි තදබදය අවම කිරීමටත් කටයුතු කිරීම. (යොමුව 8.5.4 ඡේදය) | ඉදිකිරීම් කටයුතු ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව යටතේ පවතින රෙඩිකෝ ආයතනයට පවරා දී තිබූ අතර මෙම ගොඩනැගිල්ල නිම කිරීම සඳහා දීර්ග කාලයක් එම ආයතනය වැය කිරීම හේතුවෙන් රු.මි.13ක් වූ හිඟ බිල්පත ගෙවීම ප්‍රමාදවී ඇත. එසේම එම ගොඩනැගිල්ලේ ඉදිරි කටයුතු නිම කිරීම සඳහා අතිරේක මිලියන 7ක්ද ඇතුළුව රු.මි.20.5ක අතිරේක ප්‍රතිපාදන ඉල්ලා 2019.06.06 දින අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් මගින් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත දක්වා ඇත. එම අතිරේක ප්‍රතිපාදන ලැබෙන තෙක් 2019 වර්ෂයේ 232-1-1-0-2001 වැය විෂය සඳහා වෙන් කර ඇති මුදලින් මෙම කාර්යය කඩිනම් කිරීමට උපදෙස් ලබාදී ඇත. | මාස 6ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්)<br>4. බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |
| 9.7 | අධිකරණය සමඟ සාකච්ඡා කර ගත් පරදි සිරකරුවන් විසින් ඉදිරිපත්කර ඇති අභියාචනා කැඳවීම කඩිනම් කර ගැනිම සහ අවසන් කර ගැනිම සඳහා ක්‍රියාමාර්ග ගැනිම.<br>(යොමුව 8.6 ඡේදය) | අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු කර මේ පිළිබඳ කඩිනම් පියවර ගැනීම | කඩිනමින් | 1. අතිරේක ලේකම් (නීති) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>2. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් |
| 9.8 | බන්ධනාගාරය තුල අධිකරණයක් ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගැනිමෙන් හා Tele Conference නවීන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිත කිරීම තුලින් සිරකරුවන් අධිකරණය වෙත ගෙන යාමෙන් තොරව ඔවුන්ගේ නඩු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනිම<br>(යොමුව 8.6 ඡේදය) | දැනට කොළඹ බන්ධනාගාර ආශ්‍රිතව දරුණු ගණයේ අපරාධකරුවන්ගේ නඩු කටයුතු බන්ධනාගාර පාතාල උසාවිය මගින් සිදු කරන අතර ඒ සඳහා නඩු යොමු කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාව තුල පවතින නෛතික තත්වය අනුව දිවයිනේ අනෙකුත් බන්ධනාගාර ආශ්‍රිතව මෙවැනි ක්‍රමවේදයන් ඇති කිරීම අපහසුවේ. | | |

8

| | | | | |
|---|---|---|---|---|
| 9.9 | වයස්ගත සිරකරුවන්, වයසට යාම හා රෝගී තත්වන්යන් මත එක්තැන්වූ සිරකරුවන්, සුව කල නොහැකි හා නිදන්ගත රෝග හේතුවෙන් පිඩා විදින සිරකරුවන් ඔවුන්ගේ භාරකරුවන් වෙත භාර දීමට ඇති හැකියාව සොයාබලා ඒ පිළිබඳව නිර්දේශයන් ඉදිරිපත් කර ක්‍රියාමාර්ග ගැනිම තුලින් රජයේ වියදම් අවම කිරිම.<br>(යොමුව 8.7 ජෙදය) | බන්ධනාගාර ආඥා පනතේ බන්ධනාගාර අනු නිති 80 අනුව මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හැකියාව බන්ධනාගාර වෛද්‍යවරයා වෙත පවරා ඇත. ඒ අනුව මෙම පනත ප්‍රකාරව කටයුතු සිදු කරනු ලබයි. | | 1. ප්‍රධාන වෛද්‍ය නිලධාරී |
| 9.10 | සිරකරුවන් අඛණ්ඩව පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරිම සඳහා දීර්ඝකාලින පුනරුත්ථාපන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරිම කෙරෙහි අවධානය යොමු කිරිම හා එමගින් නැවත නැවත බන්ධනාගාර ගත වන සිරකරුවන්ගේ ප්‍රමානය හා සිරපැනයාම් අවම කර ගැනිමට ක්‍රියාමාර්ග ගැනීම.<br>(යොමුව 8.8.1 ජෙදය) | දීර්ඝ කාලින සිරකරුවන් සඳහා වෘත්තිය පුහුණු අධිකාරිය හා සම්බන්ධ වී රැකියා පුහුණුවක් ලබා දෙනු ලබයි. නමුත් සිරගත වන්නන්ගෙන් බොහෝ පිරිසක් කෙටිකාලින සිරකරුවන් වන බැවින් අවුරුද්දකට අඩු කාලයක් ඔවුන් සිර මැදිරි තුල ගත කරයි. මේ හේතුවෙන් ඔවුන් සඳහා මාස 06ක පුහුණුවක් ලබා දෙයි. මේ වන විට පල්ලෙකැලේ බන්ධනාගාරය, දළුපත බන්ධනාගාරය, තල්දෙන බන්ධනාගාරය ආදී බන්ධනාගාර ගණනක මැහුම්, වයරින්, වැල්ඩින්, වඩු, පෙදරේරු වැනි පාඨමාලා පවත්වන අතර ඒ පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් පසු සහතික පත්‍ර ලබාදීම සිදු කරනු ලබයි. | | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) |
| 9.11 | වාර්ෂිකව සිරගත වන සිරකරුවන්ගෙන් වැඩි ප්‍රමානයක් වයස අවුරුදු 40 වඩා අඩු වයසේ පසුවන්නන් බැවින් ඔවුන් පුනරුත්ථාපනය සඳහා විශේෂ අවධානය යොමුකොට සැලැසුම් සකස් කිරිම හා එම ශ්‍රම බලකාය රටේ සංවර්ධනය සඳහා දායක කර ගැනිමේ විධිමත් වැඩ පිළිවෙලක් සකස්කර ක්‍රියාත්මක කිරිම.<br>(යොමුව 8.8.2 ජෙදය) | දීර්ඝ කාලින සිරකරුවන් සඳහා වෘත්තිය පුහුණු අධිකාරිය හා සම්බන්ධ වී රැකියා පුහුණුවක් ලබා දෙනු ලබයි. නමුත් සිරගත වන්නන්ගෙන් බොහෝ පිරිසක් කෙටිකාලින සිරකරුවන් වන බැවින් අවුරුද්දකට අඩු කාලයක් ඔවුන් සිර මැදිරි තුල ගත කරයි. මේ හේතුවෙන් ඔවුන් සඳහා මාස 06ක පුහුණුවක් ලබා දෙයි. මේ වන විට පල්ලෙකැලේ බන්ධනාගාරය, දළුපත බන්ධනාගාරය, තල්දෙන බන්ධනාගාරය ආදී බන්ධනාගාර ගණනක මැහුම්, වයරින්, වැල්ඩින්, වඩු, පෙදරේරු වැනි පාඨමාලා පවත්වන අතර ඒ පාඨමාලා | | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්පූර්ණ කිරීමෙන් පසු සහතික පත්‍ර ලබාදීම සිදු කරනු ලබයි. තවද තරුණ සේවා සභාව විසින් බන්ධනාගාර ආයතන වල තරුණ සේවා සභා පිහිටුවා ඇත. ඒ අනුව වැඩසටහන් ක්‍රමය යටතේ සිරකරුවන් සේවයේ යොදවනු ලබයි. | | |
| 9.12 | බන්ධනාගාර ගත වන්නන්ගෙන් බහුතරය 08 වන ශ්‍රේණිය දක්වා පමණක් සමත් සිරකරුවන් බැවින් ඔවුනගේ සාක්ෂරතාවය ඉහල නැංවීම සඳහා ක්‍රමවත් අධ්‍යාපන වැඩ පිළිවලක් සැලැසුම් කොට ක්‍රියාත්මක කිරිම. (යොමුව 8.8.3 ඡේදය) | සෑම බන්ධනාගාරයක් තුලම වැඩිහිටි අධ්‍යාපන අංශයක් ක්‍රියාත්මක වන අතර එමගින් ඔවුන්ගේ සාක්ෂරතාවය වර්ධනය කිරීමට කටයුතු කර ඇත. | - | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) |
| 9.13 | සිරකරුවන්ගේ ශ්‍රම දායකත්වයෙන් නිෂ්පාදනය කරනු ලබන කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවියෙන් උපයන ලාභයෙන් කොටසක් සිරකරුවන්ගේ සුභසාධනයට යෙදවීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇතිකර ගැනිමට කටයුතු කිරිම (යොමුව 8.8.5 ඡේදය) | දෙපාර්තමේන්තුවේ කාර්මික හා කෘෂිකාර්මික අංශය භාණ්ඩාගාරය විසින් අනුමත කරන සීමාවන් තුල කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමක් යටතේ පාලනය කරනු ලබයි. අත්තිකාරම් ගිණුම් පිළිබඳ භාණ්ඩාගාරයේ චක්‍රලේඛන හා මුදල් රෙගුලාසි අනුව වාර්ෂිකව උපයනු ලබන ආදායම රජයේ ආදායමට බැර කරයි. එම හේතුවෙන් කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ ලාභය සිරකරුවන්ගේ සුභසාධනයට යෙදවීමට හැකියාව ලැබී නොමැත. ඒ අනුව මේ සඳහා ක්‍රමවේදයක් නොමැත. | | |
| 9.14 | අපරාධ ගණයෙහිලා නොසැලකෙන හා කෙටි කාලපරිච්ඡේදයකට බන්ධනාගාර ගත කරනු ලබන සිරකරුවන් අනෙකුත් සිරකරුවන් සමඟ බන්ධනාගාර ගත කිරිම වෙනුවට පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරිමට පහසුවන පරිදි වෙනත් විශෝධන මධ්‍යස්ථාන වෙත යොමු කිරිමට ක්‍රියාමාර්ග ගැනිම. (යොමුව 8.9 ඡේදය) | මේ අනුව බන්ධනාගාර වැඩකඳවුරු සඳහා අවුරුදු 5ට අඩු දඬුවම් නියම වූ එනම් කෙටිකාලීන සිරකරුවන් යොමුකිරීම සිදු කරනු ලබයි. වීරවිල බන්ධනාගාරය මේ සඳහා වැඩිදියුණු කිරීමට මෙම වසරේ ප්‍රතිපාදන ලැබී ඇත. | වසර 2 ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්)<br>3. බන්ධනාගාර කොමසාරිස් (කර්මාන්ත)<br>4. අධ්‍යක්ෂ (ඉංජිනේරු)<br>5. අධ්‍යක්ෂ (සැලසුම්) |

| | | | | |
|---|---|---|---|---|
| 9.15 | බන්ධනාගාර පරිශ්‍රය තුල භාවිතා කිරීම තහනම් කර ඇති ද්‍රව්‍ය හෝ වෙනත් උපකරණ බන්ධනාගාර තුලට ගෙන ඒම වැලැක්වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදීම, ක්‍රියාත්මක කිරීම හා නවීන උපකරණ භාවිතයටත් ආයතන සෝදිසි කිරීම්වලදී ගිණුම් කටයුතුභාවය ආරක්ෂා කිරීමටත් කටයුතු කිරීමෙන් බන්ධනාගාරගත වන සෑම සිරකරුවකුටම බන්ධනාගාරය තුලදී කිසිදු නීති විරෝධී ක්‍රියාවක් සිදු කිරීමට ඇති ඉඩකඩ ඇහිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම (යොමුව 8.10 ඡේදය) | බන්ධනාගාර ආයතන වල සෝදිසි කිරීම් පුද්ගල පරීක්ෂා කිරීමේ යන්ත්‍ර හා පාර්සල් පරීක්ෂා කිරීමේ යන්ත්‍ර බන්ධනාගාර ආයතන වෙත ලබාදීමේ වැඩසටහන දැනටමත් ක්‍රියාත්මකව පවතින අතර එම වැඩසටහන කඩිනම් කිරීම සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම. | ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්) |
| 9.16 | බන්ධනාගාර තුලට ඇතුළු වන බන්ධනාගාර කාර්යය මණ්ඩල නිලධාරීන් ඇතුළු සියළු පිටස්තර පාර්ශවයන් තරාතිරම නොබලා අනිවාර්යය පරීක්ෂාවකට ලක් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතු අතර මේ සඳහා බන්ධනාගාර නිලධාරීන් නොවන වෙනත් පළපුරුදු හා විශේෂ නිපුණතාවයක් ඇති නිලධාරීන් යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලා ක්‍රියාමාර්ග ගැනීම (යොමුව 8.10.6 ඡේදය) | ඉදිරියේදී බන්ධනාගාර ආයතන තුලට ඇතුළුවන සියළුම නිලධාරීන් හා පිටස්තර පාර්ශවයන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බන්ධනාගාර තුලට ඇතුළු කිරීමට බන්ධනාගාර ආයතන වෙත උපදෙස් ලබා දීම හා ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබාදීම. | කඩිනමින් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) |
| 9.17 | සාර්ථක පුනරුත්ථාපන ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් සිරකරුවන්ට ඇති පීඩනය අවම කර ඔවුන් තුල බන්ධනාගාර ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසය ඇති කිරීමෙන් හා නිලධාරීන් තුල ධනාත්මක චින්තනයක් ගොඩනැගීමෙන් සිර පැනයාම් අවම කර ගැනීමත් නැවත අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය පසුවිපරම් කිරීමෙන් නැවත අත්අඩංගුවට ගන්නා ප්‍රමාණය උපරිම කර ගැනීමටත් කටයුතු කිරීම (යොමුව 8.11) | වැඩිදියුණු කරන ලද පුනරුත්ථාපන ක්‍රමයක් ඉදිරියේදී හඳුන්වාදීමට සැලසුම් කර ඇත. | කඩිනමින් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) |
| | | නිලධාරීන් අභිප්‍රේරණය කිරීමේ ක්‍රමවේදයක් මේ වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක නොවන බැවින් ඒ සඳහා ප්‍රසාද දීමනා ලබාදීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | 2019 වසර තුල | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අතිරේක බන්ධනාගාර |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කොමසාරිස් ජනරාල් 3. බන්ධනාගාර කොමසාරිස් (පාලන) |
| 9.18 | මත්ද්‍රව්‍යවලට වැරදිකරුවන් වී බන්ධනාගාර ගත වන්නන් අනෙකුත් සිරකරුවන් සමග සිරගත කිරීම වෙනුවට වෙනත් විශෝධන මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීම සඳහා අධිකරණය සමග එක්ව ක්‍රියාමාර්ග ගැනීම (යොමුව 8.12.2 ඡේදය) | මේ සම්බන්ධයෙන් වීරවිල බන්ධනාගාරය තුළ විශෝධන මධ්‍යස්ථානයක් සකස් කිරීමට යෝජනාවී ඇති අතර දළුපත බන්ධනාගාරය තුළ තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයක් පවතී. | | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් 2. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) |
| 9.19 | කාන්තාවන් සමග බන්ධනාගාරගත වන දරුවන්ගේ වයස් සීමාව අවුරුදු 05ට වඩා අඩු වයස් මට්ටමකට ගෙන ඒමට නීතිමය සංශෝධනයන් සඳහා ක්‍රියාමාර්ග ගැනීම (යොමුව 8.13 ඡේදය) | අධිකරණය විසින් ලබාදුන් තීරණ මත මව සමග බන්ධනාගාරය තුළ රැඳීමට දරුවන්ට අවකාශය ලැබී ඇති අතර මෙම වයස් සීමාව අධිකරණය මගින් තීරණය කර ඇත. මෙය ජාත්‍යන්තර ළමා ප්‍රඥප්තිය අනුව තීරණය වූවක් වන අතර මානව අයිතිවාසිකමක්ද වේ. | | |
| 9.20 | හඳුන්වාදී මේ වන විට වසර 05ක් පමණ ගතව ඇති බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය සියලු බන්ධනාගාර ආයතන තුළ ක්‍රියාත්මක කිරීම කඩිනම් කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීම (යොමුව 8.14 ඡේදය) | 2018.12.31 දිනට බන්ධනාගාර ආයතන 13ක් ජාලගත කර සම්පූර්ණ කර ඇති අතර ඉතිරි බන්ධනාගාර ආයතන 15 ජාලගත කිරීම මෙම වසර තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.42ක් ඇස්තමේන්තු කර තිබුණද, වාර්ෂික ඇස්තමේනස්තුව තුලින් වෙන් කර ඇති මුදල රු.මි.10කි. මහා භාණ්ඩාගාරය වෙතින් මෙම අතිරේක ප්‍රතිපාදන ඉල්ලා ඇත. | | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් 2. බන්ධනාගාර කොමසාරිස් (මුදල්) 3. අධ්‍යක්ෂ (සැලසුම්) |
| 9.21 | සිරවාට්ටු හා සිරමැදිරි තුළ පිරිසිදු ප්‍රියමනාප පරිසරයක් ඇති කිරීමටත් ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමටත් මීයන්, මකුණන් වැනි සතුන්ගෙන් ඇති වී ඇති පීඩා අවම කිරීමටත් කටයුතු කිරීමෙන් සිරකරුවන්ට වැළඳිය හැකි රෝග වලක්වා ගැනීම තුලින් රජයේ වියදම් අවම කර ගැනීමට කටයුතු කිරීම (යොමුව 8.315.1 ඡේදය) | නගරාශ්‍රිත බන්ධනාගාර විතැන් කිරීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ ඉදිවන නව බන්ධනාගාර ප්‍රමිතියට අනුකූලව ඉදිකිරීමට සැලසුම් කර ඇත. | | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් 2. අධ්‍යක්ෂ (ඉංජිනේරු) 3. අධ්‍යක්ෂ (සැලසුම්) |

12

| | | | | | |
|---|---|---|---|---|---|
| 9.22 | වසර 34 ක වඩා පැරණි චක්‍රලේඛයක රේටයන් පදනම් කරගෙන ගෙවනු ලබන සිර වේතන වර්තමානයට ගැලපෙන ආකාරයට වැඩි කිරීමට ක්‍රියාමාර්ග ගැනීම තුලින් සාධාරණ වේතනයක් ගෙවීමට කටයුතු කිරීමට කටයුතු කිරීම හා නිදහස්ව යන සිරකරුවන්ට යහපත් පුරවැසින් ලෙස සමාජයේ ජීවත් වීමට වඩා වැඩි අවස්ථාවක් ලබා දීමට කටයුතු කිරීම.<br>(යොමුව 8.15.2 ඡේදය) | කර්මාන්ත වල නියැලෙන සිරකරුවන්ට රුපියල් 1ත් රුපියල් 2.50ත් අතර සිර වේතන ගෙවනු ලබයි. මෙම සිරකරුවන් සමාජ විරෝධී ක්‍රියාවන් හේතුවෙන් බන්ධනාගාර ගත කරන අතර ඔවුන්ව කර්මාන්ත කටයුතු වල යෙදවීමේ අපේක්ෂාව වනුයේ පුනරුත්ථාපනය කිරීමේදී ඔවුන්ගේ දැක්ම හා කුසලතා පිරිපුන් කිරීම මෙන්ම ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින් ඔවුන්ට වෘත්තිය පලපුරුද්ද ලබාදීම මත යහපත් පුද්ගලයින් ලෙස සමාජගත කිරීමයි. තවද ඔවුන් නිදහස් වී යාමේදී ලබා ඇති පුහුණුව හා අත්දැකීම් අනුව රැකියා අවස්ථාවක් ඇතිකර ගැනීම සඳහා එයට අවශ්‍ය උපකරණ ලබා දීමත් සිදු කරනු ලබන බැවින් ඔවුනට යහපත් සමාජ තත්වයක් ගතකිරීමේ හැකියාව පවතී. මේ වන විට සිරකරුවන් වෙනුවෙන් නාමික වේතනයක් ගෙවනු ලබන අතර බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඔවුන්ව රැකබලාගැනීමට විශාල මුදලක්. එනම් රු.676/= ක් පමණ (2017 සංඛ්‍යාලේඛන දත්ත අනුව) දෛනිකව වියදම් දරණු ලැබේ. දඩුවම් වශයෙන් සිරගතවන රැඳවියන් වෙත සිර වේතන ගෙවීමේ මුදල වැඩිකරන්නේ නම් වර්තමාන සමාජයට ගැලපෙන මුදලකින් වැඩි කලයුතු අතර එසේ වැඩිකිරීම මගින් පවතින ආර්ථිකයට විශාල පිරිවැයක් බවට පත්වේ. | | | |
| 9.23 | සිරෙන් නිදහස්ව සමාජ ගත කරනු ලබන සිරකරුවන්ගේ ජීවන පැවැත්ම පිළිබද තොරතුරු මෙන්ම නැවත සිරගත වන ප්‍රමාණය, වරදේ ස්වභාවය, සිරගත වන කාලය පිළිබද තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.<br>(යොමුව 8.16.1 ඡේදය) | දැනට මේ පිළිබඳව තොරතුරු ලබාගත හැකි ක්‍රමවේදයක් නොපවතින අතර සිරකරුවන් පිළිබඳ තොරතුරු ඇතුළත් කර පිළියෙල කරනු ලබන පරිගණක ජාල ගත වැඩසටහන යටතේ මේ පිළිබඳව තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම. | වසර 1 ක් | | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන)<br>3. අධ්‍යක්ෂ (සැලසුම්) |

13

| | | | | |
|---|---|---|---|---|
| 9.24 | දීර්ඝකාලීන දඬුවම් ලද සිරකරුවන්ගේ දඬුවම් කාලය ලිහිල් කිරීම සඳහා පවතින ක්‍රමවේදයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගැනීම (යොමුව 8.16.2 ඡේදය) | දඬුවම් ලිහිල් කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34(1) වගන්තිය ප්‍රකාරව පැවරී ඇත්තේ ජනාධිපතිතුමන් වෙතය. ඒ අනුව ජනාධිපතිතුමන්ගේ අභිමතය පරිදි සිරදඬුවම් ලිහිල් කිරීම සිදුකරන අතර බන්ධනාගාර ආඥාපනතේ (40) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ජනාධිපතිතුමන් වෙත ඒ සඳහා අවශ්‍ය වාර්තා අඛණ්ඩව ඉදිරිපත් කරනු ලබයි. තවද අධිකරණ අමාත්‍යාංශය මඟින් දීර්ඝකාලීන සිරකරුවන්ගේ දඬුවම් ලිහිල් කිරීම පිළිබඳව සලකා බැලීමට කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ මත ඉදිරියේදී කටයුතු සිදු කරනු ලැබේ. | | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) |
| 9.25 | නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ කර බන්ධනාගාර ආයතනවල දෛනික රාජකාරී කටයුතු බාධාවකින් තොරව සිදු කිරීමට අවශ්‍ය පරිසරය සැකසීම. විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් ලබා දීම සඳහා බන්ධනාගාර නිලධාරීන් දිරිගැන්වීම හා පුහුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. (යොමුව 8.17.1 ඡේදය) | දෙපාර්තුමේන්තුවේ කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නිලධාරීන් උසස් කිරීම, නව බඳවා ගැනීම් සිදු කිරීම හා දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නිලධාරීන් ඉල්ලුම් කිරීම.<br>තවද බන්ධනාගාර නිලධාරීන් දිරිගැන්වීම හා පුහුණු කිරීම සඳහා සාර්ථක ක්‍රමවේදයක් මේ වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක නොවන බැවින් ඒ සඳහා නිසි ක්‍රමවේදයක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කිරීම | වසර 1 ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>3. බන්ධනාගාර කොමසාරිස් (පාලන) |
| 9.26 | බන්ධනාගාර නිළධාරීන් දිරිගැන්වීම සඳහා හා වෙනත් අකාර වලින් මුදල් ඉපයීම අවම කර ගැනිම සඳහා රාජකාරී ස්වභාවය මත ගෙවනු ලබන දීමනා වෙනුවට කාර්යක්ෂමතාවය හා දෙපාර්තමේන්තුවට එකතුකරනු ලබන වටිනාකම (Value added) මත පදනම්ව ගෙවන දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දීම හා අනුමතකර ගැනිම. (යොමුව 8.17.2 ඡේදය) | නිලධාරීන්ගේ රාජකාරී ඇගයීම සඳහා හා දිරි ගැන්වීම සඳහා ඵලදායි දීමනා ක්‍රමයක් අනුගමනය කිරීම. | මාස 2 ක් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2. අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>3. බන්ධනාගාර කොමසාරිස් (පාලන)<br>4. බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |

| | | | | |
|---|---|---|---|---|
| 9.27 | ගරා වැටුනු නිල නිවාස අළුත්වැඩියාව, අඩු පහසුකම් සහිත හා ඉතා පැරණි ආම්පන්න සහිත ජනාරක්ෂිත කාර්යාල පරිශ්‍රවල ඇති අඩුපාඩු සම්පූර්ණ කිරීම, අඩු පහසුකම් සහිත හා මකුණන් බෝවී ඇති නිළධාරි බැරුක්කවල ගැටලු විසඳීම තුලින් නිළධාරින්ගේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට කටයුතු කිරීම. (යොමුව 8.17.3 ඡේදය) | බන්ධනාගාර විතැන් කිරීමේ කටයුතු කඩිනම් කිරීම හා ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා දෙපාර්තමේන්තුව වෙත ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතු කිරීම. | කඩිනමින් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් 2. අධ්‍යක්ෂ (ඉංජිනේරු) 3. අධ්‍යක්ෂ (සැලසුම්) 4. බන්ධනාගාර කොමසාරිස් (මුදල්) 5. මූලස්ථාන අධිකාරී |
| 9.28 | සිරකරුවන්ට සැලකීමේ එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන් සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල තත්වය ඉතා අඩු මට්ටමක පවතින බැවින් හැකි තරම් එම ප්‍රමිතීන්ට ළඟාවීමට උත්සාහ කිරීමෙන් එම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම. (යොමුව 8.2, 8.3, 8.8, 8.10, 8.13, 8.15 ඡේද) | දැනට පවතින බන්ධනාගාර විතැන් කිරීමේ වැඩසටහන අනුව බන්ධනාගාර තුල පවතින ඉඩකඩ ප්‍රසාරණය කිරීමට කටයුතු සිදු කර ඇත. | කඩිනමින් | 1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් 2. අධ්‍යක්ෂ (ඉංජිනේරු) 3. අධ්‍යක්ෂ (සැලසුම්) |

ටී.එම්.ජේ.ඩබ්ලිව්.තෙන්නකෝන්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**ටී.එම්.ජේ.ඩබ්ලිව්. තෙන්නකෝන්**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**

ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල
ලේකම්
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
2019.06.24

**ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල**
**ලේකම්**
**අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**
**උපරිමාධිකරණ සංකීර්ණය**
**කොළඹ 12.**

15

**(ඇමුණුම 07)**

## විලයත්තියිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය සම්බන්ධයෙන් වන විශේෂ විගණන වාර්තාව

5.12 වන රක්ෂිතයේ පදිංචි කිරීම සඳහා නිවාස හා පාරවල් ඉදිකිරීම සඳහා "ඔමේගා කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්" (Omega construction Company (pvt)Ltd) අංක 34 කඩුමායන්කුලම් පාර පුත්තලම යන ආයතනය විසින් ඉටු කරමින් සිටි අතර රජයේ මූල්‍ය දායකත්වයක් නොමැති බවට තහවුරු විය.(ඇමුණුම -21)

5.13 වන රක්ෂිතයේ පවුල් පදිංචිය සඳහා වන රක්ෂිතය හෙළිපෙහෙළි කිරීමේදී ඉවත් කරන දැව සංස්ථාව වෙත භාරදිය යුතුව තිබුණි. කෙසේ වුවද, දැව සංස්ථාවට ලබාදී තිබුණු මුළු දැව ප්‍රමාණය පලු, බුරුත සන මීටර් 12.5 ක් පමණක් වූ අතර වන රක්ෂිතයේ හෙළි නොකළ ප්‍රදේශ පරීක්ෂා කිරීමේදී එය විය නොහැකි තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

6. නිර්දේශ

----------

6.1 උතුරු නැගෙනහිර සිවිල් යුද්ධය හේතුකොටගෙන අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේදී ඉඩම් අහිමි වූ අයවළුන් නිවැරදිව හඳුනාගෙන ඔවුන් හට ජාතික ප්‍රතිපත්තීන්ට සහ පවතින නීතියට අනුකූල වන පරිදි ප්‍රමාණවත් ඉඩම් කොටසක් ලබාදීමට කටයුතු කිරීම.

6.2 රක්ෂිත වනාන්තර හෝ පාරිසරික වටිනාකමක් සහිත ප්‍රදේශ හෙළිපෙහෙළි කර පුද්ගලයන් පදිංචි කිරීම සඳහා යොදා නොගැනීමට කටයුතු කිරීම.

6.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(14) ව්‍යවස්ථාවේ නියමයන් පරිදි "ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කොට වැඩි දියුණු කළ යුතුය." ඒ සඳහා පවතින නෛතික විධිවිධාන ප්‍රමාණවත් නොවන බැවින්, අවශ්‍ය විධිවිධාන පැනවීමට කටයුතු කිරීම.

6.4 විලත්තියිකුලම රක්ෂිත වනාන්තරයේ ඉදිකර තිබුණු නිවාසවල පදිංචි වී නොමැති සහ නිවාස ඉදිකර නොමැති බිම් කට්ටි ප්‍රමාණය, මුළු වෙන්කළ ඉඩම් ප්‍රමාණයෙන් සියයට 80 පමණ වන අතර ස්ථිරව පදිංචිවී ඇති ඉතිරි සියයට 20 ක ඉඩම්වල පදිංචි පවුල්වලට වෙනත් සුදුසු ඉඩම් ලබාදී රක්ෂිත වනාන්තරය පෙර පරිදිම පවත්වා ගෙන යෑමට කටයුතු යෙදීම.

6.5 අවතැන්වූ පවුල් සඳහා නිවාස ඉදිකිරීම යටිතල පහසුකම් සැලසීම හා ඔවුන්ගේ ජනජීවිතය නගා සිටුවීම රජයේ පූර්ණ මැදිහත් වීමෙන් හා නියාමය කිරීමෙන් සිදු කළ යුතු වේ. දේශීය හෝ විදේශීය රාජ්‍ය නොවන සංවිධාන මගින් සිදුකරන මූල්‍ය දායකත්වයන් හා සංවර්ධන කටයුතු ජාතික ප්‍රතිපත්තින්ට අනුකූලව සිදු කිරීමට කටයුතු යෙදීම.

7. **නිගමන**

7.1 2012 මැයි 21 දිනැති අංක 1759/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් "විලත්තිකුලම රක්ෂිත වනාන්තරය" ලෙස ප්‍රකාශයට පත්කර ඇති වනාන්තරයෙන් අක්කර 650 ක කොටසක් පුද්ගලයන් පදිංචි කිරීම සඳහා වන රක්ෂක විසින් නිදහස් කර තිබුණද, එය පවතින නීතියට පටහැනි බවට නිගමනය කරනු ලැබේ.

7.2 රක්ෂිත වනාන්තරයේ කොටසක් හෙළිපෙහෙළි කිරීමෙන් සිදුවිය හැකි පරිසර හානිය සම්බන්ධයෙන් පවතින නීතියට අනුව පාරිසරික බලපෑම පිළිබඳව ඇගයීමක් (Environmental Impact Assessment) කළ යුතු වුවද, එසේ සිදු කර නොතිබුණු හෙයින් වන රක්ෂිතයට සිදුවූ හා ඉදිරියේදී සිදුවන පරිසර හානිය සම්බන්ධයෙන් පියවර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිගමනය කරනු ලැබේ.

7.3 රක්ෂිත වනාන්තරය තුළ ඉදිකළ නිවාස වල පදිංචිවීමේ තත්ත්වය සහ පවුල් සඳහා වෙන්කළ බිම් කට්ටිවල දීර්ඝ කාලීනව නිවාස ඉදි නොකිරීම සැලකිල්ලට ගැනීමේදී ඉඩම් නොමැති අවතැන් වූ පවුල් සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණු බව නිගමනය කරනු ලැබේ.

7.4 උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන්වූ තම ඉඩම් අහිමි වූ පවුල්වලට තමන් පෙර පදිංචි මුල් ඉඩම් ලබාදීම ජනාධිපති කාර්යසාධන බලකායේ ප්‍රධාන අරමුණ වුවද, එයට පටහැනිව ඉඩම් අහිමි නොවූ එහෙත් ඔවුන්ගේ දෙවන හා තුන්වන පරම්පරාවල පවුල්වලට ප්‍රමාණවත් ඉඩම් නොමැති බවට කරුණු දක්වා මෙම වන රක්ෂිතයෙන් ඉඩම් ලබාදීම එකී අරමුණට පටහැනි බවට නිගමනය කරනු ලැබේ.

7.5 මෙම වාර්තාව විගණකාධිපති සතු බලතල, සම්පත් සහ කාලය යන විෂය සීමා තුළ සිදුකරන ලද හෙයින් එහි විෂය පථය ඉක්මවා ගොස් විගණකාධිපතිට නිගමනය කළ නොහැකි මට්ටමේ නීති විරෝධි හෝ සාපරාධි කටයුතු සිදු වී ඇද්ද යන්න මාගේ පරීක්ෂාවට ලක් නොකෙරුණි. එබැවින් එවැනි පරීක්ෂාවක් කළ යුතු යැයි හැඟී යන්නේනම් ඒ සඳහා විශේෂිත වූ ආයතනයන්ගේ සහාය ලබා ගැනිම සුදුසු බව නිගමනය කරනු ලැබේ.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති
13/12/2017

[redacted]

**ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**
காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சு
**Ministry of Lands & Parliamentary Reforms**

"මිහිකත මැදුර",
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

"மிஹிகத்த மெதுர",
காணிச் செயலகம்
1200/6, இராஜமல்வத்தை வீதி,
பத்தரமுல்லை.

"Mihikatha Medura",
Land Secretariat,
1200/6, Rajamalwatte Avenue,
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. 4-2/4/12/6
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2019.06 15

ලේකම්
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

**<u>2019.05.10 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග විලත්තිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය සම්බන්ධයෙන් කරන විශේෂ විගණන වාර්තාව.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද 2019.05.16 දිනැති ලිපියට මා විසින් 2019.05.31 දින ලබා දුන් වාර්තාවට වැඩිමනත් වශයෙන් ඉදිරිපත් කරමි.

එම ලිපිය මඟින් විලත්තිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් 2019.05.20 දින පැවති රජයේ ගිණුම් කාරක සභා රැස්වීමේ දී ලබා දුන් නියෝග ඇතුළත් කර අප වෙත යොමු කරන ලද වාර්තාවේ අංක 02, 03 සහ 04 යටතේ දැක්වෙන කරුණු වලට අදාළව යොමු කරන ලෙසට දන්වා ඇති වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

02. වන සංරක්ෂණ ජනරාල් විසින් අවතැන් වූ මුස්ලිම් ජනතාව නැවත පදිංචි කිරිම සඳහා නිදහස් කර ඇති අක්කර 650 ට අමතරව නිදහස් කර ඇති රජයේ ඉඩම් අක්කර 30 පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් මුසලි ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති නමුත් මෙතෙක් මාවෙත අදාල වාර්තාව ලබා දී නොමැත. එබැවින් ගිණුම් කාරක සභාව වෙත පිළිතුරු යොමු කිරිම සඳහා එම වාර්තාව කඩිනමින් යොමු කිරීමට ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලෙසට මගේ අංක 4-2/4/12/6 හා 2019.06.13 දිනැති ලිපියෙන් මන්නාරම දිස්ත්‍රික් ලේකම් වෙත දැනුම් දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

ලේකම් / செயலாளர் / Secretary — දුරකථන /தொலைபேசி /Telephone - 011- 2888907; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011- 2887404
කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන /தொலைபேசி /Telephone -011- 2797500; ෆැක්ස් / பொது /Fax - 011- 2887445

"ඵලදායිතා ප්‍රවර්ධනය තුළින් විශිෂ්ටතම රාජ්‍ය සේවයක් කරා"
"உற்பத்தித் திறனூடாக அதிசிறந்த அரச சேவை"
"Towards an Excellent Public Service through Productivity Promotion"

03. අවතැන් වූ මුස්ලිම් ජනතාව පදිංචි කිරීම සඳහා විලත්තිකුලම් රක්ෂිතයෙන් නිදහස් කළ ඉඩම් සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමට අනුමැතිය ලබා දීම සම්බන්ධ තොරතුරු

| Gn division | Kachcheri approval date | Land extent | Land extent Per one |
|---|---|---|---|
| Veppankulam | 2013.04.11 | 76/2 | ½ A |
| Veppankulam | 2013.04.02 | 226 | ½ A |
| S.ppotkerny | 2013.04.11 | 78/2 | ½ A |
| Pp potkerny | 2013.04.11 | 78/2 | ½ A |
| Akaththimuripu | 2013.04.11 | 136 | ½ A |
| Maruthamadu | 2013.04.02<br>2013.04.11 | 35<br>16 | 20 perch<br>½ A |
| Total | | 646/2 | |

ඉඩම් කට්ටි බෙදාදීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දින සහ ස්ථාන සම්බන්ධයෙන් 2019.05.28 දින අතිරේක ලේකම් (ඉඩම්)ගේ ප්‍රධානත්වයෙන් හා ඉඩම් කොමසාරිස් ජනරාල්, පළාත් ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශිය ලේකම් (මුසලි), ප්‍රාදේශිය ලේකම් (මාන්තායි-බටහිර) ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ සාකච්ඡාවේ දී ලබා ගත් තොරතුරු අනුව පහත දත්ත ඉදිරිපත් කරමි.

| Village | Date | Received Application | Attended Applicants | Absent | Rejected | Selection list | Place |
|---|---|---|---|---|---|---|---|
| Veppankulam | 2013.05.11 | 161 | 159 | 02 | 06 | 153 | RDS building |
| Veppankulam | 2013.04.13 | 436 | 436 | - | 88 | 348 | RDS building |
| S.ppotkerny | 2013.05.09 | 156 | 156 | - | 02 | 154 | RDS building |
| Pp potkerny | 2013.05.08 | 157 | 154 | 03 | 05 | 149 | RDS building |
| Akaththimuripu | 2013.05.10 | 257 | 257 | - | 31 | 226 | RDS building |
| Maruthamadu | 2013.04.02 | 251 | 251 | - | 41 | 210 | RDS building |
| Total | - | 1418 | 1413 | 05 | 173 | 1240 | - |

(II) උක්ත සඳහන් එක් එක් ඉඩම් කච්චේරි සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලද සියලුම අයදුම්කරුවන් ප්‍රසිද්ධ දැන්වීම් මඟින් කැඳවීම් කර ඉඩම් කච්චේරි පැවැත්වූ නිලධාරීන්ගේ නාම ලේඛනය ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කරමි.

(III) ඉඩම් කච්චේරි පවත්වා ප්‍රතිලාභීන් තෝරා ගැනීමට පදනම් කරගත් නිර්නායකයන් ලෙස පහත නිර්නායකයන් දක්වන ලදී.

01. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2008/04 හා 2008.08..20 දිනැති චක්‍රලේඛය අනුව (ඇමුණුම 02)

02. ජනාධිපති කාර්ය සාධන බලකාය මඟින් ලබා දුන් උපදෙස් අනුව - (ඇමුණුම 03)

(IV) සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම සඳහා පවුල් ඒකකයේ සිටින ළමයින් සංඛ්‍යාව සහ ජීවිකාව ගෙන යාම සඳහා පවුල් ඒකකයට ඇති ඉඩම් ප්‍රමාණය සලකා බලන ලද බව ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත.

සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වූවන්ගෙන් පහත දක්වා ඇති ආකාරයට ඉඩම් කච්චේරියේදී ප්‍රතික්ෂේප වී ඇති බව ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත.

| Gn division | Rejected / Absent number |
|---|---|
| Veppankulam | 08 |
| Veppankulam | 88 |
| Seppotkerny | 02 |
| Pp potkerny | 08 |
| Akaththimuripu | 31 |
| Maruthamadu | 41 |
| Total | 178 |

(V) ප්‍රතික්ෂේප වීමට හේතු.

1. ඉඩම් කච්චේරිය සඳහා සහභාගී නොවීම
2. වෙනත් ඉඩමක් සඳහා හිමිකම් කීම.
3. අවිවාහක පුද්ගලයෙකු වීම

ඒ අනුව ඉඩම් කච්චේරි තුලින් බලපත්‍ර 1155ක් සකස් කර ඇති අතර ඉන් පුද්ගලයින් 838 ක් වෙත බලපත්‍ර ලබා දී ඇත. ඉන් පුද්ගලයින් 311 දෙනෙකු භුක්තිය දරන නමුත් සත්‍ය වශයෙන්ම වර්තමානයේ පුද්ගලයින් 283 දෙනෙකු පදිංචිව සිටින බවත් වර්තමානයේදී විශාල වශයෙන් ඉඩම් කැබලි සංවර්ධනය කර නැති බවත් මුසලි ප්‍රාදේශීය ලේකම් විසින් ඔහුගේ සමාංක Mu/DS/LB/copa/2019 සහ 2019.06.10 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත.

ඉඩම් කච්චේරි පවත්වා තෝරාගත් පුද්ගලයන්ගේ අවසන් තේරීම් ලැයිස්තුව ඇමුණුම 4 මගින් ඉදිරිපත් කරමි.

04. **විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ සහ නිගමන සම්බන්ධයෙන් පහත කරුණු ඉදිරිපත් කරමි.**

**නිර්දේශ 6.1**

එකඟ වෙමි.

**නිර්දේශය 6.2**

පවතින අණපනත් ප්‍රකාරව කටයුතු කිරීමට

**නිර්දේශය 6.3**

මේ සඳහා 2019.05.31 දිනැතිව වාර්තාව යොමු කර ඇත.

**නිර්දේශය 6.4**

ඒ සම්බන්ධයෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත ප්‍රකාරව ක්‍රියාත්මක වීමට මුසලි ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී ඒ පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදුකර එහි ප්‍රගතිය මා වෙත වාර්තා කරන ලෙස 2019.06.14 දිනැතිව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත උපදෙස් ලබා දී ඇත.

**නිර්දේශ 6.5**

එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් අමාත්‍යාංශය හා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත පැවරෙන වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඉදිරියේදී අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී.

**නිගමනය 7.1**

අදාල නොවේ.

**නිගමනය 7.2**

අදාල නොවේ.

**නිගමනය 7.3**

මෙම ඉඩම්ලාභීන් විධිමත් පරිදි තෝරා ගෙන ඇති බව මුසලි ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා ඇති අතර මේ පිළිබඳව වැඩිදුරටත් සොයා බලා ඉඩම් වල පදිංචි නොවූවන් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත ප්‍රකාරව කටයුතු කරන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත උපදෙස් ලබා දී ඇත.

**නිගමනය 7.4**

විස්තෘත පවුල් සඳහා ඉඩම් බෑහැර කිරිමට ජනාධිපති කාර්යය සාධන බලකායේ 2012.11.22 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇති බැවින් දෙවන හා තෙවන පරම්පරා වල ඉඩම් නොමැති පවුල් සඳහා ඉඩම් ලබා දී ඇත. (ඇමුණුම 3)

**අංක 04 සඳහා වන යෝජනා සැකවීන් පහත දක්වමි.**

ශ්‍රී ලංකාව තුළ පවතින රක්ෂිත වන ගහණය අවම වන බැවින් වන රක්ෂිත ඉඩම් බෑහැර නොකිරීම සහ පවතින රජයේ ඉඩම් අවශ්‍යතාවය කළමණාකරණය කර ගැනීම පිළිබඳව ඉදිරියේදී වැඩි අවධානයක් යොමු කල යුතු බව නිරීක්ෂණය වේ. වන සංරක්ෂණ හා වනජීවී රක්ෂිත ප්‍රදේශ ආසන්නයේ පිහිටි රජයේ ඉඩම්, ජනතාවට බෙදා දීම සඳහා ඉඩම් කච්චේරි යෝජනා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීමේදී, දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශය ද, පරිසර සංරක්ෂණය හා පාරිසරික පනත්වල ප්‍රතිපාදන සපුරා ඇති බවට, ප්‍රාදේශීය ලේකම්ගේ හා පළාත් ඉඩම් කොමසාරිස් නිර්දේශය ලබා දීම පිළිබඳව විශේෂ අවධානය යොමු කර තීරණ ගැනීම සුදුසු බව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දැන්වීමට කටයුතු කරන ලදී.

ඩබ්ලිව්. එච්. කරුණාරත්න
ලේකම්
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

[redacted]

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு
Ministry of Mahaweli Development and Environment

"සොබාදම් පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சொபாதம் பியச", இல. 416/சி/1, ரொபர்ட் குணவர்தன மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Sobadam Piyasa", No. 416/C/1, Robert Gunawardana Mawatha, Battaramulla, Sri Lanka.
Gen. Tel. +94-11-2034100

ලේකම් / செயலாளர் / Secretary +94-11-2034121
ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2879944

මගේ අංකය / எனது இல / My No: MMDE/06/FR/02(2)-1 Vol.II
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.06.13

Original

ලේකම්
රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

**2019.05.10 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබා දුන් නියෝග - විලත්තිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය සම්බන්ධයෙන් සිදු කරන ලද විශේෂ විගණන වාර්තාව**

උක්ත කරුණට අදාලව ඔබගේ 2019.05.16 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව 2019.05.20 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ ලබා දුන් නියෝගවල සාකච්ඡා අංක 04 යටතේ විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ හා නිගමන සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තාව පහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

නිර්දේශ පිළිබඳ වාර්තාව

6.1 එකඟ වේ.

6.2 පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා භූමින් තේරීමේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු ආයතනවල සහභාගීත්වය සහිත කමිටුවක් මගින් සුදුසු ඉඩම් තෝරා ගැනීමට කටයුතු කිරීමෙන් රක්ෂිත හෝ පාරිසරික වටිනාකමක් සහිත ප්‍රදේශ නැවත පදිංචිය සඳහා යොදා නොගැනීමට කටයුතු කිරීම.

6.3 වන සංරක්ෂණ ආඥා පනත සංශෝධනයේ දී "ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කොට වැඩි දියුණු කළ යුතුය," යන කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් නෛතික විධිවිධාන ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. (සවිස්තර වාර්තාව රජයේ ගිණුම් කාරක සභාව වෙත යවා ඇත.)

6.4 විලයිත්තිකුලම රක්ෂිත වනාන්තරයෙන් මෙම කාර්ය සඳහා අක්කර 650 ක බිම් ප්‍රමාණයක් 2013.05.08 දින මුසලි ප්‍රාදේශීය ලේකම් වෙත බැහැර කිරීමට කටයුතු කරන ලදී. එම බිම් ප්‍රමාණයට අදාල භූමිය මැනීමේදී මැනුම් දෙපාර්තමේන්තුව විසින් අංක MU/DS/Land/SR/07/2013 හා 2013.02.18 දින ඉදිරිපත් කරන ලද මැනුම් වාර්තාවට අනුව අක්කර 666.641 ක් (හෙක්ටයාර 269.8953 කි) වන ලෙසට මැනීම් සිදු කර ඇත.

මෙම බිම් ප්‍රමාණය ඉහත කට්ටි සැලැස්මට අනුව පහත පරිදි වෙන් කර ඇත.

| යොදා ගැනීමට අදාල කාර්යය | හෙක්ටයාර ප්‍රමාණය | අක්කර ප්‍රමාණය |
|---|---|---|
| පදිංචිය සඳහා (බිම් කට්ටි 941) | 190.4584 | 470.4322 |
| පොදු කාර්ය සඳහා | 17.0100 | 42.0147 |
| ප්‍රවේශ මාර්ග සඳහා | 62.4269 | 154.1944 |
| මුළු ඉඩම | 269.8953 | 666.6413 |

මෙම විගණන වාර්තාව සකස් කිරීමේ දී මෙම ස්ථානය පරීක්ෂා කර ඇත්තේ 2017 වර්ෂයේ ජනවාරි මස වන අතර, එවකට පැවති තත්වය අනුව පදිංචිය සඳහා වෙන් කල භූමියෙන් 80% ක පමණ භූමි ප්‍රමාණයක පදිංචිව නොසිටි බව සඳහන් වුව ද, 2019.06.05 වන දින වන විට පදිංචිය සඳහා බිම් කට්ටි යොදා ගෙන ඇති ආකාරය පහත පරිදි වේ. (සිතියම අමුණා ඇත.)

| කාර්යය | කට්ටි ගණන | ප්‍රමාණය | |
|---|---|---|---|
| | | හෙක්ටයාර | අක්කර |
| පදිංචිය සඳහා යෝජිත මුළු ප්‍රමාණය | 941 | 190.4584 | 470.4322 |
| මේ වන විට පදිංචිය සඳහා යොදා ගෙන ඇති (2019.06.05 දිනට) | 574 | 116.1776 | 286.9587 |
| පදිංචිය සඳහා යොදා නොගෙන ඇති | 367 | 74.2808 | 183.4736 |

ඒ අනුව මේ වන විට පදිංචිය සඳහා යොදා නොගෙන ඉතිරිව ඇති බිම් ප්‍රමාණය 40% ක් පමණ වන අතර, ඉහත නිර්දේශයේ සඳහන් පරිදි 80 % ක් නැවත රක්ෂිතයට පවරා ගැනීමට නොහැකි වේ.

දැනට ඉතිරි බිම් කට්ටි ප්‍රමාණයෙන් රක්ෂිතයට මායිම්ව ඇති අඛණ්ඩ බිම් ප්‍රමාණය පමණක් නැවත රක්ෂිතයට යා කිරීමේ හැකියාව ඇත. නමුත් මෙම බිම් කට්ටි තුල අඛණ්ඩව නිවාස ඉදි කිරීම් සිදුවන බැවින් මෙම තත්වය ද වෙනස් විය හැකිය.

ඒ අනුව මෙසේ ඉතිරි බිම් නැවත රක්ෂිතයට ඇතුල් කරන්නේ නම් දිස්ත්‍රික් ලේකම් මගින් තවදුරටත් නිවාස ඉදි කිරිම වහාම අත්හිටුවීමට කටයුතු කල යුතුය.

6.5 එකඟ වේ.

නිගමන පිළිබඳ වාර්තාව

7.1 යුද්ධයෙන් පසු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නැවත උතුරේ රාජකාරී ආරම්භ කලේ 2011 වසරේ අගෝස්තු මාසයේ දීය. මේ වන විට උතුරේ බොහෝමයක් ප්‍රදේශ වසර 30 ක මිනිස් ක්‍රියාකාරකම්වලින් තොරවූ බැවින් බොහෝ ස්ථාන වනාන්තර තත්වයට පත්ව තිබුනි.

තවද එම අවස්ථාව වන විටත් බිම් බෝම්බ ඉවත් කිරීම් වැනි කටයුතු අවසන්ව නොතිබූ නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ රාජකාරී, කාර්යාලයන් තුලට සීමා විය.

යුද්ධය අවසානයත් සමගම විවිධ ආයතන හා පුද්ගලයින් මෙම වනාන්තර සහිත භූමින් තමන් සතු යැයි පවසමින් කැලෑ එළි කරමින් විවිධ කාර්යයන් ආරම්භ කරන ලදී.

මේ අවස්ථාවේ දී සියළු ඉඩම් වනාන්තර තත්ත්වයේ පැවති බැවින් රජය සතු හා පුද්ගලික ඉඩම් හඳුනා ගැනීම අසීරු වූ අතර, පුද්ගලික අයිතිය ඇතැයි ඉදිරිපත් වූ අයද මෙම අයිතිය තහවුරු කිරීම සඳහා පැවති ලේඛන, යුද සමයේ අස්ථානගත වූ බව පැවසීමත් රජයේ කාර්යාල වල පවා එම ලේඛන නොපැවති නිසාත්, මෙම පුද්ගලික යැයි කියනු ලබන ඉඩම්, ක්ෂේත්‍රයේ හඳුනා ගැනීම අපහසු විය.

මෙම ඉඩම් බොහෝමයක් වන සංරක්ෂණ ආඥා පනතට අනුව, ප්‍රකාශිත වනාන්තර නොවූ බැවින් නෛතික කටයුතු කිරීම ද අපහසු විය. ඒ වන විට මෙම ප්‍රදේශයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත රක්ෂිත වනාන්තර පැවතියේ දෙකක් පමණි. (මාවිල්ලු හා වෙප්පල් රක්ෂිත වනාන්තර) මෙම ප්‍රකාශිත රක්ෂිත මායිම්වලට පිටතින් පිහිටි වනාන්තර බිම් වන සංරක්ෂණ ආඥා

පනතට අනුව ප්‍රකාශිත රක්ෂිත වනාන්තර නොවූ බැවින්, නෛතිකව මෙම එළි කිරීම් නැවැත්වීම අසීරු විය.

මෙම කරුණු සලකා බලා එවකට ගරු විෂයභාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කර, ඔහුගේ අනුමැතිය මත වනාන්තර ආරක්ෂා කිරීමේ පියවරක් වශයෙන් උතුරේ පැවති සියළු වනාන්තර බිම් රක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන ලදී.

රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමේ අනුමත ක්‍රමවේදයට අනුව බිම් මැනුමකින් රජයේ රක්ෂිත මායිම් හා පුද්ගලික ඉඩම් හඳුනාගෙන එම මායිම් සිතියම් ගත කර, ඒ අනුව රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම සිදු කරන නමුත් පැවති හදිසි අවශ්‍යතාවය සහ ක්ෂේත්‍රයේ පැවති අවහිරතා නිසා මෙම ක්‍රමවේදයට අනුව මෙම කටයුතු සිදු කිරීමට නොහැකි විය.

මෙයට පිළියමක් ලෙසට මෙම රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමේ දී උතුරේ වනාන්තර ආවරණ සිතියමට (Forest Cover Map) ඇතුලත් සියළු වනාන්තර වල මායිම ජී. පී. එස් (භූ මිතික) ඛණ්ඩාංක අනුව හඳුනා ගෙන එම මායිම් අනුව රක්ෂිත ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම මායිම් තීරණය කිරීම සඳහා භාවිතා කලේ 2010 වසරේ ලංකාවේ වනාන්තර ආවරණ සිතියම වන අතර, මෙම සිතියම සකස් කිරීමට යොදා ගෙන තිබුනේ 2008 වසරේ චන්ද්‍රිකා ඡායාරූප වේ. ඒ අනුව 2012 වසරේ උතුරේ ප්‍රකාශයට පත් කල සියළු රක්ෂිත වල මායිම වනුයේ 2008 වසරේ පැවති කැළෑ මායිම් වේ.

මෙම වනාන්තර සීමාවට පුද්ගලික ඉඩම් ද ඇතුලත් විය හැකි අතර, එම මායිම් හඳුනාගත නොහැකි විය. මෙම තත්වයට පිළියමක් ලෙස ඉහත මායිමට ඇතුලත් සියළු රජයේ වනාන්තර ඉඩම් පමණක් රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම විගණන වාර්තාවට ඇතුලත් විලත්තිකුලම් වනාන්තරය ද 2012.05.21 දින අංක 1759/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ඉහත ක්‍රමවේදයට අනුව, රක්ෂිත වනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

උතුරේ යුද්ධය අවසාන වීමත් සමගම අනාථ කඳවුරුවල ජීවත් වූ යුද්ධය නිසා අවතැන් වූ මුස්ලිම්, ද්‍රවිඩ හා සිංහල ජනයා නැවත පදිංචි කිරීම රජයේ ප්‍රමුඛ කාර්යයක් විය. මේ සඳහා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන පිළිබඳ කොමිසමේ නිර්දේශ (LLRC) හා එක්සත් ජාතීන්ගේ ජිනීවා සමුළු නිර්දේශ ද ලැබී තිබුනි.

මේ වන විට උතුරේ සිවිල් පාලනයක් නොතිබූ බැවින් මෙම කාර්යන් පවත්නා නීතිමය රාමුව තුල සිදු කිරීම සඳහා රජය මෙම කාර්ය සඳහා අවශ්‍ය වන සියළු අමාත්‍යාංශ ලේකම්වරුන් (අමාත්‍යාංශ 15 ක) හා ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ගේ ද සාමාජිකත්වයෙන් යුත් ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවා (2009.05.07 දින) එහි අනුමැතීන් හා නිර්දේශ මත මෙම කාර්යයන් ආරම්භ කරන ලදී.

මෙම කමිටුව මගින් තෝරාගනු ලබන ස්ථාන ආරක්ෂක හමුදාව මගින් එළි පෙහෙලි කර අවතැන් වූවන් සඳහා නිවාස ඉදි කිරීම් සිදු කරන ලදී.

මෙම ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් විලයිත්තිකුලම් ප්‍රදේශයෙන් අක්කර 865 ක බිම් ප්‍රමාණයක් නැවත පදිංචි කිරීම් සඳහා ලබා දීම අනුමත කර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී.

2

මෙම විලත්තිකුලම රක්ෂිතයෙන් යෝජිත අක්කර 865 බිම් ප්‍රමාණය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වයෙන් බැහැර කිරීම සම්බන්ධව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විරුද්ධත්වය ප්‍රකාශ කල ද දිගින් දිගටම මේ සම්බන්ධව සාකච්ඡා පැවති අතර, මෙම ඉඩම් 2012 වසරේ රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම ප්‍රදේශවාසීන් හේන් ගොවිතැන් හා වගා කටයුතු සඳහා යොදා ගන්නා ලද භූමින් බවට කරුණු ඉදිරිපත් කරන ලදී. 2013.05.07 දින ගරු විෂයභාර අමාත්‍යවරයා සමග පැවති රැස්වීමක දී ජනාධිපති කාර්ය සාධක බලකායේ නිර්දේශ මත මෙම ප්‍රදේශයෙන් අවම ලෙස අක්කර 650 ක ඉඩම් ප්‍රමාණයක් මෙම කාර්ය සඳහා යොදා ගැනීම සඳහා බැහැර කිරීමට ගරු විෂයභාර අමාත්‍යතුමන් විසින් නියෝග දෙන ලදී.

ඒ අනුව ඒ වන විටත් මෙම කාර්ය සඳහා එළ පෙහෙලි කිරීම් සිදු කර තිබූ බිම් ද ඇතුලත්ව ප්‍රදේශවාසීන්ගේ කුඹුරු ඉඩම්වලට සහ මාර්ගයට යාබදව පිහිටි අක්කර 650 ක බිම් ප්‍රමාණය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වයෙන් බැහැර කිරීමට කටයුතු කරන ලදී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව රජයේ වනාන්තර ඉඩම් කළමනාකාරිත්වය සිදු කරනු ලබන අතර, එම ඉඩම් වල හිමිකාරිත්වයක් නොදරයි. රජයේ අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී පමණක් මෙම ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වයෙන් බැහැර කරනු ලබයි.

ඒ අනුව ඉහත කරුණු මත මෙම කාර්යයේ දී වන සංරක්ෂක ජනරාල් වෙත පැවරී ඇති වගකීම අනුව, රජයේ අත්‍යාවශ්‍ය සහ ප්‍රමුඛ කටයුත්තක් සඳහා රජයේ බිම් ප්‍රමාණයක් ජනාධිපති කාර්ය සාධක බලකායේ අනුමැතින් හා විෂයභාර අමාත්‍යතුමන්ගේ නියෝග මත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වයෙන් බැහැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර, නිගමන 7.1 යටතේ සඳහන් කර ඇති පරිදි මේ සඳහා වන සංරක්ෂක ජනරාල් වෙත අධිකාරී බලයක් හෝ නෛතික බලයක් නොතිබූ බව පිළිගත නොහැක.

7.2 1988 අංක 56 දරණ ජාතික පරිසර සංශෝධිත පනත මගින් පාරිසරික බලපෑම් ඇගයීම හඳුන්වා දෙන ලද්දේ රට පුරා අඛණ්ඩ සංවර්ධනයක් පවත්වාගෙන යාමේ දී මධ්‍යම පරිසර අධිකාරිය මගින් පනවන ලද නෛතික ක්‍රියාදාමයක් වශයෙනි.

පරිසර ඇගයීමකින් සිදු කෙරෙනුයේ එම ව්‍යාපෘතිය මගින් සිදු කෙරෙන පාරිසරික හානිය හඳුනාගෙන එය අවම කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමයි.

මෙම පාරිසරික ඇගයීම සිදු කල යුත්තේ අදාල ව්‍යාපෘතිය සිදු කරනු ලබන ආයතනය හෙවත් ව්‍යාපෘති යෝජක විසිනි. මෙම නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබුවේ මෙම කාර්ය සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකාය විසිනි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති යෝජක වනුයේ ජනාධිපති කාර්ය සාධක බලකාය වේ.
පරිසර ඇගයීමක් සිදු කල යුතු බව නියම කළ ව්‍යාපෘතීන් 1993.06.24 දින අංක 772/22 දරණ ගැසට් නිවේදනයේ ලැයිස්තු ගත කර තිබේ.

ඒ අනුව අංක 772/22 දරණ ගැසට් නිවේදනයේ උප ලේඛණයේ 1 වැනි කොටසෙහි අංක 12 යටතේ සඳහන්ව ඇත්තේ "හදිසි අවස්ථාවලදී කරන ලද නැවත පදිංචි කරවීම් හැරුණු විට පවුල් 100 වැඩි ගණනක් නිරුත්සාහයෙන් නැවත පදිංචි කරවීම." ද පාරිසරික ඇගයීමක් සිදු කල යුතු ව්‍යාපෘතියක් බවයි.

මෙම නැවත පදිංචි කිරීමේ කටයුතු ජාතික (උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාව) සහ ජාත්‍යන්තර යෝජනා (එක්සත් ජාතීන්ගේ ජිනීවා සමුළු නිර්දේශ) මගින් ඉතා කඩිනමින්

3

අවසන් කල යුතු බවට කරුණු දන්වා තිබුනි. ඒ අනුව මෙය හදිසි කටයුත්තක් නිසාත්, මෙම කටයුත්ත අවැතැන්වූවන්ගේ කැමැත්ත මත සිදු වූවක් නිසා ද, ඒ වන විටත් ඇතැම් බිම් කොටස් එළි කිරීම් සිදුව තිබූ නිසාත්, ව්‍යාපෘතියෝජක විසින් මෙම පාරිසරික ඇගයීම් කටයුතු සිදු කර නොමැත. නමුත් මෙම භූමිය තේරීමේ දී රක්ෂිත වනාන්තර භූමියට අවම හානියක් වන ලෙසට මේ වන විටත් වගා කටයුතු සිදු කරනු ලබන වාරි පහසුකම් සහිත කුඹුරු වගාවලට යාව හා මාර්ගයට යාව රක්ෂිත වනයේ කෙලවරකින් මෙම භූමිය තෝරා ගැනීම මගින් පාරිසරික ඇගයීමකින් පසුව ගතයුතු තීරණයට අනුකූල ලෙස මෙම භූමිය තෝරා ගැනීමට කටයුතු කර ඇත.

එබැවින් 7.2 නිගමනයේ සඳහන් පරිදි සේවයේ හදිසි අවශ්‍යතාවය මත, පරිසර ඇගයීමක් සිදු කර නොමැති වූව ද පරිසර ඇගයීමකින් ඉටුවිය යුතු අරමුණු ද ඉටු කර ගනිමින් මෙම රාජ්‍ය අවශ්‍යතාවය සම්බන්ධව ව්‍යාපෘති යෝජක විසින් කටයුතු කර ඇත.

*7.1 සහ 7.2 නිගමනවලට අදාලව ඉහත ඉදිරිපත් කරන ලද වාර්තාවට අමතරව, ඉහත කරුණු සනාථ කිරිම සඳහා මෙම සිද්ධියට අදාලව ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩු විභාගයක විස්තර ද පහතින් කාරුණිකව ඉදිරිපත් කරමි.*

මෙම නැවත පදිංචි කිරීම් සඳහා රක්ෂිත ඉඩම් නිදහස් කිරිම, පරිසර ඇගයීමක් සිදු නොකර තිබීම සහ තවත් කරුණු ඇතුලත් ව පෙත්සම්කාර පාරිසරික සංවිධාන දෙකක් (වනජීවී හා ස්වභාව සංරක්ෂණ සංගමය සහ සීමාසහිත පාරිසරික පදනම) විසින් 2017.03.30 දින ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ අංක S.C.F.R. 130/2017 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම, ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුවරුන් තුන් කට්ටුවක් ඉදිරියේ විභාගයට ගන්නා ලදී. එහි දි වන සංරක්ෂක ජනරාල් ඇතුළු රජයේ වගඋත්තරකාර පාර්ශ්ව වෙනුවෙන් පෙනී සිටි නීතිපතිවරයා විසින් ඉහතින් දක්වා ඇති කරුණු සහ අදාල වෙනත් කරුණු ඉදිරිපත් කරමින් මෙම වගඋත්තරකාර රජයේ නිළධාරීන් රජයේ අත්‍යාවශ්‍ය හදිසි කටයුත්තක් එවකට පැවති තත්වයන් යටතේ ප්‍රමාදයකින් තොරව පවත්නා නීතිරීති තුල ඉටු කර ඇති බවට කරුණු ඉදිරිපත් කල අතර, දෙපාර්ශ්වයේ ම කරුණු විමසා බලා මෙම නඩුව තවදුරටත් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් කරුණු නොවන බැවින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලේ ඒකමතික තීරණය මත මෙම නඩුව 2017.08.04 දින විභාගයට නොගෙන නිශ්ප්‍රභා කරන ලදී. (පිටපත අමුණා ඇත)

ඒ අනුව මෙම යුද්ධය නිසා අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ දී වන සංරක්ෂක ජනරාල් ඇතුළු අනෙකුත් වගඋත්තරකරුවන් නීතියට පටහැනිව කටයුතු කර නොමැති බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇති බව ද කාරුණිකව දන්වමි.

**7.3** – **7.4** යුද්ධය නිසා අවතැන් වූ පවුල් තේරීම සම්බන්ධව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වීමක් සිදු නොවුනි.

**7.5** අදාල නොවේ.

යෝජනා

යුද්ධය නිසා අවතැන්වූවන් නැවත පදිංචිය සඳහා මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වයෙන් බැහැර කරන ලද මෙම විලත්තිකුලම් ප්‍රදේශයට අමතරව පහත සඳහන් ස්ථානවලින් ද නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් බැහැර කර ඇත.

4

| ස්ථානය | ප්‍රමාණය (අක්කර) |
|---|---|
| පලායිකුලි | 100 |
| මරිච්චුකට්ටි | 100 |
| කරඩික්කුලි | 80 |
| සිලාවතුර - මරිච්චුකඩ්ඩි මාර්ගය දෙපස | 770 |

මෙම ස්ථානවලින්ද මෙතෙක් නැවත පදිංචිය සඳහා යොදා නොගත් ඉඩම් පවතින අතර, මෙම ඉඩම් සම්බන්ධවද සමීක්ෂණයක් සිදු කර ඉදිරි තීරණයක් ගැනීම වඩාත් සුදුසු බවද කාරුණිකව දන්වා සිටිමි.

අනුර දිසානායක
ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

පිටපත: විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය-කා.දැ.ගැ.ස.

5

**(ඇමුණුම 08)**

**උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ විගණකාධිපති විශේෂ විගණන වාර්තාව**

**07.** නිර්දේශ

7.1 ව්‍යාපෘතියට අදාළව ගිවිසුම් වලට එළඹීමට ප්‍රථම නීතිපති නිෂ්කාශනයන් ලබා ගැනීමට කටයුතු කළ යුතු බව.

7.2 ව්‍යාපෘතියේ කටයුතු සැළසුම්ගත අයුරින් සිදු කරගැනීමට හැකිවන පරිදි කොන්ත්‍රාත්කරුට අවශ්‍ය පහසුකම් නිසි ලෙස ලබාදිය යුතුබව.

7.3 ව්‍යාපෘති සඳහා උපදේශකයින් පත්කර ගැනීමේදී ලබැදියාවන් පිළිබඳ ප්‍රශ්නගත තත්වයක් (Conflict of Interest) උද්ගත නොවන අයුරින් ව්‍යාපෘතියට අදාළ පාර්ශව කටයුතු කළයුතු බව

7.4 විදේශ අරමුදල් සම්පාදනය කර ගැනීමේදී යෝජනාවක් හා ඉල්ලීමක් නොමැති (Unsolicited) පදනමින් කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම වෙනුවට ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේ එකිනෙක ක්‍රම හා ඒවායේ යෝග්‍යතාවය පිළිබඳ නැවත සමාලෝචනය කළ යුතු බව.

7.5 මෙවැනි ව්‍යාපෘතිවලට අදාලව සියළුම වැදගත් තොරතුරු හා ලිපිලේඛන ලිඛිතමය ආකාරයෙන් සුරක්ෂිතකොට තබාගැනීමේ අවශ්‍යතාවය නීතිමය වශයෙන් තහවුරුකර ඒ පිළිබඳව අදාළ ආයතන හා නිලධාරීන්ට නිශ්චිතව වගකීම් පැවරිය යුතු බව.

7.6 විදේශ අරමුදල් ලබාගැනීමට අපේක්ෂිත ව්‍යාපෘති පිළිබඳව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය හා මැදිහත් වීම ආරම්භයේ සිටම පවත්වාගත යුතු බව.

7.7 ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය ශක්තිමත් කර ව්‍යාපෘති ගැටළු හඳුනාගෙන අවශ්‍ය කාලීන විසඳුම් හා උපදෙස් ලබාදිය යුතු බව.

7.8 ශක්‍යතා අධ්‍යයන වාර්තා හා පාරිසරික අනුමැතින් ලබාගැනීමකින් තොරව මෙවැනි ව්‍යාපෘති ආරම්භ නොකළ යුතු වන බව.

73

08. නිගමන

8.1 මහවැලි මහ සැලැස්මෙන් ඉවත් වී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් සහ පාරිසරික අධ්‍යයනයක් සිදුකර නොතිබීම හා කොන්ත්‍රාත්කරුට එකඟ වූ පහසුකම් මෙන්ම ගැටළුවලට විසඳුම් කාලීනව ලබාදී නොතිබීම මෙම ව්‍යාපෘතියේ වර්තමාන ගැටළුකාරී තත්ත්වයට හේතු වන බව නිගමනය කරමි.

8.2 යෝජනාවක් හා ඉල්ලීමක් නොමැති (Unsolicited) පදනමින් කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම විනිවිදභාවයකින් තොරව සිදුකර ඇති බව නිගමනය කරමි.

8.3 මෙම ව්‍යාපෘතියට අදාලව 2017 ජුනි 30 වන විට වන්දි ලෙස ගෙවා තිබූ රුපියල් මිලියන 1404.38 ක මුදල කොන්ත්‍රාත්කරු වෙතින් හැකි ඉක්මනින් අයකර ගැනීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතු බව නිගමනය කරමි.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

2018 අප්‍රේල් 23 දින

**උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය - මූලස්ථායි වැඩ**
**වැඩ නිම කිරීමේ කාල රාමුව ඇතුළත් ක්‍රියාත්මක සැලැස්ම - ජූනි 2019**

| අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය 2019-05-31 දිනට (%) | ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනය |
|---|---|---|---|
| 1 | පුහුල්පොල රෝල සම්පීඩිත කොන්ක්‍රීට් වේල්ල - උස මීටර 35 (Puhulpola dam) | 92.46 | 2019 දෙසැම්බර් |
| 2 | ඩයරබා රෝල සම්පීඩිත කොන්ක්‍රීට් වේල්ල - උස මීටර 50 (Dyraaba dam) | 92.36 | 2020 අප්‍රේල් |
| 3 | ජලාශ සම්බන්ධිත උමඟ - දිග කි.මී 3.7 (Link Tunnel) | 96.58 | 2019 ඔක්තෝබර් |
| 4 | ප්‍රධාන උමඟ - දිග කි.මී 15.4 (Headrace Tunnel ) | 83.39 | 2020 මාර්තු |
| 5 | කැළඹුම් ළිඳ - උස මීටර් 150 (Surge Tank) | 69.18 | 2019 ඔක්තෝබර් |
| 6 | ජල පීඩන සිරස් උමඟ - උස මීටර් 618 (Vertical Pressure Shaft) | 94.21 | 2019 නොවැම්බර් |
| 7 | භූගත ජල විදුලි බලාගාරය (Power House) - 120 MW | 91.22 | 2020 අප්‍රේල් |
| 8 | ප්‍රධාන ප්‍රවේශ උමඟ සහ ප්‍රවේශ උමං (Main Access Tunnel and Other Access Tunnel ) | 94.77 | 2020 අප්‍රේල් |
| 9 | මාර්ග (Roads) | 78.51 | 2020 ඔක්තෝබර් |
| 10 | 132 kV විදුලි සම්ප්‍රේෂණ මාර්ගය - දිග කි.මී. 22.7 (Transmission Line) | 87.27 | 2020 ජූලි |
| 11 | ජලය පිටකරන උමඟ - දිග කි.මී. 3.6 (Tail Race Tunnel) | 95.86 | 2019 දෙසැම්බර් |
| | **2019-05-31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය %** | 90.91 | |
| | ව්‍යාපෘතියේ මෙහෙයුම් ආරම්භය | | 2020 ඔක්තෝබර් |

ආචාර්ය ඉංජි. එන්. එස්. කේ.එන් ද සිල්වා
ව්‍යාපෘති අධ්‍යක්ෂ
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
2019-06-28

ව්‍යාපෘති අ...
උමා ඔය බහුකාර්ය සංවර්ධ...
නො. 26, ජාවත්ත පාර,
කොළඹ 05.

**(ඇමුණුම 09)**

**ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනුරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**

අවසර නොලත් තැන්පතු බාර ගන්නා ආයතන වලට එරෙහිව ගත් නීතිමය පියවර

1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ ප්‍රතිපාදනයන්ට පටහැනිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම සහ පරීක්ෂණ සඳහා තොරතුරු නොසැපයීම

| අංකය | ආයතනයේ නම | අධ්‍යක්ෂ මණ්ඩලය | මුදල් මණ්ඩලය මගින් නිශ්චය කල දිනය | නඩු අංකය | අධිකරණය | වරද | නඩු පැවරූ දිනය | විස්තරය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඔකඳ ෆිනෑන්ස් (පුද්.) සමාගම | මානික්කු බඩතුරුගේ ඔකඳ සිල්වා | 19.09.2008 | 57898 | මහේස්ත්‍රාත් අධිකරණය - කොළඹ | පරීක්ෂණය සඳහා තොරතුරු ලබා නොදීම | 28.02.2003 | එක් එක් අධ්‍යක්ෂවරයකු වරදකරුවන් කරමින් 2011.09.29 දින එක් අයකුට රු. 300,000.00 බැගින් දඩ අයකර ඇත. |
| | | තේජා දිලානි සවුන්දගේ සිල්වා | | 58928 | මහේස්ත්‍රාත් අධිකරණය - ගල්කිස්ස | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | 31.03.2011 | අධ්‍යක්ෂවරුන් වරදකරුවන් කරමින් 2013.02.15 දින දී නියෝග කර ඇත. විත්තිකරුවන් හට දඩ නියම කර ඇත. |
| 2 | රුරල් ඩිවලොප් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | සෙල්ලදුරයි රාජන් | 28.10.2003 | 95776 | මහේස්ත්‍රාත් අධිකරණය - මහනුවර | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | 14.07.2006 | අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකු වරදිකරුවන් කරමින් 2017.06.12 දින නියෝග නිකුත් කර එක් අයකුගෙන් රු. 50,000.00 බැගින් අයකර ගැනීමට නියෝගය 2019.07.05 දින නිකුත් කර ඇත. |
| | | රාමයියා ඉන්ද්‍රභාති | | | | | | |
| | | සෙල්ලදුරයි ධනරාජා | | | | | | |
| | | ජී ඩී බාලසූරිය | | | | | | |
| | | කේ ඩබ් අනුර කුමාර | | | | | | |
| | | එම් එස් සමරවික්‍රම | | | | | | |
| | | එස් සෙල්වාමනි | | | | | | |
| 3 | ලංකාවින් ෆිනෑන්ස් කොම්පැනි ලිමිටඩ් | එච් කේ එච් ගාල්ලගේ | 11.03.2004 | 84053 - 84064 | මහේස්ත්‍රාත් අධිකරණය - මහනුවර | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | 11.10.2005 | නඩු අංක 84054 යටතේ අධ්‍යක්ෂවරුන් වරදකරුවන් කරමින් එක් අයකුට රු. 750,000.00 බැගින් දඩ අය කිරීමට 2014.07.25 දින නියෝග නිකුත් කර ඇත. නඩු අංක 84057 යටතේ අධ්‍යක්ෂකවරයකුගෙන් රු. 80,000.00 බැගින් අයකර ගැනීමට නියෝගය 2018.08.31 දින නිකුත් කර ඇත. නඩු අංක 84061 යටතේ දෙවන විත්තිකරු වරදකරු කරමින් 2017.12.12 දින රු. 1,000,000.00 ක දඩයකට යටත් කර ඇත. එකම අධ්‍යක්ෂකවරුන්ට එකම වරද යටතේ අනිකුත් නඩු වලින් වරදකරුවන් කර ඇති හෙයින් මහේස්ත්‍රාත්වරයාගේ උපදෙස් පරිදි අනිකුත් නඩු 2018.09.06 දින නැවත නඩු පැවරීමේ අයිතිය රඳවාගනිමින් ඉල්ලා අස්කර ගෙන ඇත. |
| | | ආර් එම් පී ඩී එන් රත්නායක | | | | | | |
| | | තිරොස් ඔසාමු | | | | | | |
| | | ටෙරුකෝ මොටොයෝෂි | | | | | | |

| අංකය | ආයතනයේ නම | අධ්‍යක්ෂ මණ්ඩලය | මුදල් මණ්ඩලය මගින් නිශ්චය කල දිනය | නඩු අංකය | අධිකරණය | වරද | නඩු පැවරූ දිනය | විස්තරය |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | ජනහද ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් | එච් ඩී එන් ජේ ගුණසේකර<br>වී පී ගුණසේකර<br>පී යසරත්න<br>අයි ඩී ඊ ආර් දයාරත්න<br>එන් එම් වී එන් කුමාරසිංහ<br>ආර් එම් එස් පී බණ්ඩාර | 28.04.2004 | 74191 | මහේස්ත්‍රාත් අධිකරණය - හම්බන්තොට | අධිකාරි බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | 24.07.2006 | 2019.08.09 දින අධ්‍යක්ෂකවරුන් වරදකරුවන් කරමින් නියෝග නිකුත් කර ඇත. දෙවන විත්තිකරු වන ගුණසේකර මයා රු. 1,000,000.00 ක ද අනිකුත් අධ්‍යක්ෂවරුන් එක් අයකුට රු. 150,000.00 ක දඩයකට යටත් කර ඇත. දෙවන විත්තිකරු දඩගෙවීම ප්‍රතික්ෂේප කල බැවින් ඔහු වසර 2 ක සිරදඬුවමකට යටත් කර ඇත. |
| 5 | රූරල් ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කොම්පැනි ලිමිටඩ් | එච් ඩී කේ ඊ රණසිංහ<br>පී ඩී අයි පුෂ්පලතා<br>එස් එම් එන් ජයරත්න<br>එම් ආර් සංජීව<br>ඊ තිලකරත්න<br>කේ ඩබ් ආර් අයි සඳමාලි<br>එස් අශෝකරත්න | 26.07.2005 | 54486 | මහේස්ත්‍රාත් අධිකරණය - අනුරාධපුර | අධිකාරි බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | 26.07.2006 | අධ්‍යක්ෂකවරුන් වරදකරුවන් කරමින් 2017.04.03 දින නියෝග නිකුත් කර ඇත පළමු හා දෙවන විත්තිකරුවන් රු. 250,000.00 බැගින්ද අනිකුත් විත්තිකරුවන්ට රු. 50,000.00 බැගින් ද දඩයකට යටත් කර ඇත. |
| 6 | එමරල්ඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | අජේල සිදත් ලියනාරච්චි<br>පාලිත ප්‍රියදර්ශන වෙල්ලන්ගිරිය<br>තෙන්නකෝන්ලාගේ සමරසිංහ පියරත්න මල්කොටුවගේ<br>වාහලතන්ත්‍රීගේ ප්‍රියන්ත පෙරේරා<br>සවරයිමුත්තු රෙජී ඩෙමියන්<br>ගීතා රේණුකා කුමාරී ලියනාරච්චි | 28.03.2005 | 81200 සහ 81201 | මහේස්ත්‍රාත් අධිකරණය - මහනුවර | අධිකාරි බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | 21.12.2006 | විත්තිකාර අධ්‍යක්ෂවරුන් විසින් තැන්පත්කරුවන් සමග සමථයකට පැමිණ 2009 වසර වන විට තැන්පතු ගෙවා නිම කර ඇත. ඊ අනුව නඩුව 2011.09.02 දින අවසන් කර ඇත. |

| අංකය | ආයතනයේ නම | අධ්‍යක්ෂ මණ්ඩලය | මුදල් මණ්ඩලය මගින් නිශ්චය කල දිනය | නඩු අංකය | අධිකරණය | වරද | නඩු පැවරූ දිනය | විස්තරය |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | ගෝල්ඩන් ෆයිනෑන්ෂල් සර්විසස් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | එම් යූ ඩී පෙරේරා<br>ඊ ඊ එන් පෙරේරා<br>එස් එස් කුමාරදාස<br>ඩබ් ඒ ධර්මසිරි<br>ජේ එන් පී හෙට්ටිආරච්චි<br>වයි ඩබ් බුලත්සිංහල<br>එම් එච් එන් අසේල ශාන්ත | 24.10.2005 | 12784 | මහේස්ත්‍රාත් අධිකරණය - කඩුවෙල | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | | විත්තිකරුවන් විසින් තැන්පත්කරුවන් සඳහා ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව 2011.10.25 දින කටයුත්ත සමථයකට පත් කර නඩුව අවසන් කර ඇත. |
| 8 | පූර්ණ ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් | ඊ කේ පී ඒකනායක<br>සී පී දිසානායක<br>ඩී එම් ජේ සී පී ජයරත්න<br>ජී ඊ ගුණවර්ධන<br>එච් අයි රිසානා<br>ජී එම් කේ ගුණවර්ධන | 03.01.2006 | 61262 | මහේස්ත්‍රාත් අධිකරණය - ගම්පොල | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | 08.01.2009 | නඩුව වැඩිදුර විභාගය සඳහා යොමු කර ඇත. පැමිණිල්ලේ සාක්ෂි කොටසක් අවසන් කර ඇත. මීළඟ නඩු දිනය 2019.10.04 වේ. |
| 9 | ජන ශ්‍රී ෆයිනෑන්ෂල් කෝපරේෂන් කම්පැනි ලිමිටඩ් | ජනක විජයනාත් රිටිගහපොල<br>ශාන්ති ස්ටෙලා රාජපක්ෂ<br>මිල්ලෑව ගමගේ බන්දුල සෙනෙවිරත්න<br>කරුණාසේන ධර්මසේන<br>වැලිවේ පතිරණගේ සෝමපාල<br>නිරෝෂනා දිවාමනී දහනායක | 08.09.2003 | 29334/06/08 | මහේස්ත්‍රාත් අධිකරණය - කොළඹ | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | 15.09.2008 | නඩුව වැඩිදුර විභාගය සඳහා යොමු කර ඇත. පැමිණිල්ලේ සාක්ෂි කොටසක් අවසන් කර ඇත. මීළඟ නඩු දිනය 2019.10.14 වේ. |
| 10 | සේඩන්ට් ෆයිනෑන්ෂල් සර්විසස් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | එම් ජී ඩී සිසිර නවරත්න<br>එම් එම් රම්‍යාවතී මැණිකේ<br>ආර් කේ පවිත්‍ර විජය බුද්ධික<br>සී නාමල් ද සිල්වා | නිශ්චය කර නැත | 58803/03 | මහේස්ත්‍රාත් අධිකරණය - කොටුව | පරීක්ෂණය සඳහා තොරතුරු ලබා නොදීම | 2003 | අධ්‍යක්ෂවරුන් වරදකරුවන් කරමින් 2013.05.02 දින නියෝග නිකුත් කර ඇත. පළමු හා හතරවන විත්තිකරුවන්ට රු. 100,000.00 බැගින් දඩ හා වසරක අත්හිටවූ සිරදඬුවම් නියමකරන ලද අතර දෙවන හා තෙවන විත්තිකරුවන්ට රු. 100,000.00 බැගින් දඩයකට හා වසරක සිරදඬුවමකට යටත් කර ඇත. |

| අංකය | ආයතනයේ නම | අධ්‍යක්ෂ මණ්ඩලය | මුදල් මණ්ඩලය මගින් නිශ්චය කල දිනය | නඩු අංකය | අධිකරණය | වරද | නඩු පැවරූ දිනය | විස්තරය |
|---|---|---|---|---|---|---|---|---|
| 11 | රූරල් එන්ටර්ප්‍රයිසස් ඩිවලොප්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ෂල් සර්විසස් කොම්පැනි ලිමිටඩ් | ඩී එම් යූ ආර් රත්නායක<br>ජේ ඒ එස් සී ජයවීර<br>ජී එම් පුෂ්පකුමාර<br>ඩබ් එම් යූ වනිගසේකර<br>ඩබ් ඒ ප්‍රදීප් වීරසිංහ<br>ඩී එම් සී එන් දිසානායක<br>එම් ජී යූ ඒ කරුණාරත්න<br>ඩී සී කුමාරසිරි | නිශ්චය කර නැත | 65600 | මහේස්ත්‍රාත් අධිකරණය - කුරුණෑගල | පරීක්ෂණය සඳහා තොරතුරු ලබා නොදීම | 19.07.2006 | අධ්‍යක්ෂවරුන් වරදකරුවන් කරමින් 2017.09.29 දින තීන්දුව ප්‍රකාශයට පත් කර ඇත. පළමු හා දෙවන විත්තිකරුවන් රු. 250,000.00 බැගින් දඩයකට ද අනිකුත් විත්තිකරුවන් රු. 50,000.00 බැගින් දඩයකට ද යටත් කර ඇත. තුන්වන විත්තිකරු නිදහස් කර ඇත. |
| 12 | ශ්‍රියාවි හෝම්ස් ඇන්ඩ් ලෑන්ඩ්ස් | නාරංගොඩ ලියනගේ දොන් මිනෝල් හසන්ත නාරංගොඩ | 19.09.2008 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| 13 | සක්විති හවුස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | අභයරණසිංහ මුදියන්සේලාගේ චන්දන වීරකුමාර<br>ජම්බුරුකුඹොඩගමගේ කුමාරි අනුරාධිනී<br>බඩ්දුව ආරච්චිගේ අසිත ප්‍රභාත්<br>කේ බී කේසර සාමකුමාර | 19.09.2018 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| 14 | ඩී කේ උදයසිරි | දෙලන් කච්චාරියලාගේ උදයසිරි | 19.09.2018 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| 15 | එල් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කොම්පැනි ලිමිටඩ් | ජීවක ලලිත් භූපේන්ද්‍ර කොතලාවල<br>සිසිලි ප්‍රියා කාමිනී කොතලාවල<br>ඩී මර්වින් ජයසිංහ<br>කේ ඒ සුනිල් ජයතිස්ස<br>මාලා සබරත්නම්<br>පී ඩී එස් ඩබ් රාජපක්ෂ<br>කේ එම් එස් පෙරේරා<br>යූ ජී ප්‍රියන්ත කේ ධර්මසිරි<br>ජේ ඩී ආර් ඒ නානායක්කාර<br>චාලක සංජී පෙරේරා | 03.11.2011 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ආර් ජී සමන්තිකා ජයසේකර | | | | | | |
| අංකය | ආයතනයේ නම | අධ්‍යක්ෂ මණ්ඩලය | මුදල් මණ්ඩලය මගින් නිශ්චය කල දිනය | නඩු අංකය | අධිකරණය | වරද | නඩු පැවරූ දිනය | විස්තරය |
| 16 | ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | ජීවක ලලිත් භූපේන්ද්‍ර කොතලාවල | 03.11.2011 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| | | සිසිලි ප්‍රියා කාමිනී කොතලාවල | | | | | | |
| | | ඩී මර්වින් ජයසිංහ | | | | | | |
| | | මාලා සබරත්නම් | | | | | | |
| | | ඩී ආර් සේනානායක | | | | | | |
| | | පී ඩී එස් ඩබ් රාජපක්ෂ | | | | | | |
| | | කේ ඒ සුනිල් ජයතිස්ස | | | | | | |
| | | කේ එච් එස් ජයතිස්ස | | | | | | |
| | | කේ එම් එස් පෙරේරා | | | | | | |
| | | යස්මින් අයි මොහමඩ් | | | | | | |
| | | ආර් ජී සමන්තිකා ජයසේකර | | | | | | |
| 17 | සීඅයිඑෆ්එල් ෆිනෑන්ස් ඇන්ඩ් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | සුරෙන් කුමාර ලියනගේ | 03.11.2011 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| | | උපුල් කුමාර ද සොයිසා | | | | | | |
| | | රාජපක්ෂ පතිරණගේ අතුල රාජපක්ෂ | | | | | | |
| | | රොහාන් වීර ද සොයිසා | | | | | | |
| | | දේවමුණිගේ සරත් ඩයස් | | | | | | |
| | | මහේන්ද්‍ර ජයන්තිපාල් චන්ද්‍රිම අමරසූරිය | | | | | | |
| | | මල්ලව ආරච්චිගේ දිප්ති පෙරේරා | | | | | | |
| | | උතුමන්ගේ ගාමිණී සරත් | | | | | | |
| | | වත්තකුවත්ත වඩුමේස්ත්‍රිගේ දොන් ටොරින්ටන් ෂර්ලි පෙරේරා | | | | | | |
| | | ලක්ෂ්මන් රංජිත් අමරසේකර | | | | | | |
| | | හර්බට් පෝෂිත ජනක ද සිල්වා | | | | | | |

| කය | ආයතනයේ නම | අධ්‍යක්ෂ මණ්ඩලය | මුදල් මණ්ඩලය මගින් නිශ්චය කල දිනය | නඩු අංකය | අධිකරණය | වරද | නඩු පැවරූ දිනය | විස්තරය |
|---|---|---|---|---|---|---|---|---|
| | | ධම්මික මීගාර සිරිවර්ධන | | | | | | |
| 8 | ජයතිබම් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | රවින්ද්‍රකුමාර රාසයියා<br>කජේන්තිරන් කරුපයියා<br>නිමල් ඒකනායක | 22.10.2012 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| 19 | සෙලින්කෝ ඉන්ටර්නැෂනල් රියැලිටි (ප්‍රයිවට්) ලිමිටඩ් | ජීවක ලලිත් භූපේන්ද්‍ර කොතලාවල<br>සංක රවි විජේසිංහ<br>හිරාන් ලාල් ගුණසේකර<br>එම් එල් පී ජයතිලක<br>කේ පී හේමලාල් ප්‍රියංකර | 03.11.2011 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| 20 | ෆස්ට් ග්ලෝබල් ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ස් ලිමිටඩ් | මුහම්මද් ඉක්රම් තව්ෆික්<br>මොහොමඩ් අලි මොහොමඩ් ෂුක්රි<br>ජුමාකමිස් අල්ෂාවනි<br>අහමඩ් රෂ් අසීස් | 21.03.2013 | X | X | අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරයන් හි නිරත වීම | X | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

**(ඇමුණුම 10)**

**ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනුරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**

**2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නීතිවිරෝධී මුදල් ව්‍යාපාර ලෙස මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරන ලද ආයතන.**

| අංකය | ආයතනයේ නම | නිශ්චය කල දිනය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01 | එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් | 2011.11.03 | නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත. තැන්පත්කරුවන් විසින් පවරා ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී. |
| 02 | පිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි ප්‍රොපටි ඩිවෙලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 2011.11.03 | නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත. තැන්පත්කරුවන් විසින් පවරා ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී. |
| 03 | සී අයි එෆ් එල් ෆයිනෑන්ස් ඇන්ඩ් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 2011.11.03 | නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත. |
| 04 | සෙලින්කෝ ඉන්ටර්නැෂනල් රියලිටි ප්‍රයිවට් ලිමිටඩ් | 2011.11.03 | නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත. |
| 05 | හම්බන්තොට ෆිෂරීස් ඉකොනොමික් එන්ටර්ප්‍රයිසස් ඩිවලොප්මන්ට් සෙන්ටර් | 2011.11.15 | 1972 අංක 5 දරන සමූපකාර පනත යටතේ ලියාපදිංචි කර නීත්‍යානුකූල තත්ත්වය ලබා ඇත. |
| 06 | ජෙයදිබම් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | 2012.10.22 | නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත. |
| 07 | ෆස්ට් ග්ලෝබල් ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංස් ලිමිටඩ් | 2013.03.21 | නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත. |
| 08 | සෙලින්කෝ කොමර්ෂල් ප්‍රොපටි ඩිවලෝපර්ස් ලිමිටඩ් | 2014.10.27 | නඩු පැවරීම සඳහා යොමු කල යුතුය. |
| 09 | සහන සේවා කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් | 2018.03.20 | නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත. |
| 10 | ද ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් | 2018.10.30 | තැන්පත්කරුවන් විසින් පවරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමෙ තීන්දු ප්‍රකාරව රජය මගින් ලබා දුන් අරමුදල් යොදා ගනිමින් තැන්පත්කරුවන්ගේ මුදලින් 41% ක් ගෙවීම සිදු කරමින් පවතී. |

**(ඇමුණුම 11)**

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 01. Timeline for the Legal Amendments to implement the e-Motoring Project

| | | Due Date | Duration |
|---|---|---|---|
| 01 | The Report of the Legal Officer of the Department of Motor Traffic-<br>Legal Officer of D.M.T will prepare a report after initial examination of all process in the User Requirement Specification of e-Monitoring project and handover to the Commissioner General of Motor Traffic.<br>This report may include;<br>i. The identified areas/ Sections of the Motor Traffic Act to be amended.<br>ii. The identified Regulations published under the Motor Traffic act to be amended.<br>iii. The areas of the URS which is recommended to reconsider as such areas are identified as not practical or inconsistent with other existing laws.<br>iv. Other recommendations | 2019/09/27 | 1 week |
| 02 | i. C.G.M.T. will appoint a committee to consider the proposed amendment with the URS<br>ii. C.G.M.T. and the staff officers will Consider the recommendation in 01(iii) and 01(iv) above and come in to a firm decision on the identified areas with implementation strategies. | 2019.10.04 | 1 week |
| 03 | i. The committee appointed by C.G.M.T. to consider the report of the legal officer with URS will make their suggestions or Recommendations to C.G.M.T. | 2019.10.18 | 2 weeks |

### 02. Timeline for the Amendments of the Motor Traffic Act

| | | | |
|---|---|---|---|
| | Finalizing the M.T.A. amendment document (with the suggestions and recommendations of the committee) and send the draft to the Ministry of Transport & Civil Aviation. | 2019.10.25 | 1 week |

| | | | |
|---|---|---|---|
| 02 | Submitting Initial Cabinet paper and take cabinet approval to amend the required parts of the Motor Traffic Act. | 2019.11.08 | 3 weeks |
| 03 | The Secretary and the staff of the Ministry of Transport & Civil Aviation will review the proposed amendments and send the draft to the Legal Draftsman's Department with the recommendations of the ministry. | 2019.11.08 | 2 weeks |
| 04 | Legal Draftsmen's department will prepare the draft amendment and send the draft to the Secretary of the Ministry of Transport and C.G.M.T for their observations. | 2019.12.13 | 5 weeks |
| 05 | C.G.M.T & Secretary will send their observation on the Draft Motor Traffic (Amendments) Act to the Legal Draftsman's Department. | 2019.12.20 | 1 week |
| 06 | Legal Draftsman will finalize the draft with observations and send the final draft to Hon. Attorney General & the secretary of the Ministry of Transport & Civil Aviation. | 2019.12.31 | 10 days |
| 07 | Hon Attorney General's approval to the Draft Motor Traffic (Amendments) Act after considering conformity with the constitution. | 2020.01.07 | 1 week |
| )8 | Draft amendment with Hon. Attorney General's approval will be forwarded to the cabinet for cabinet approval. | 2020.01.21 | 2 weeks |
| | After Cabinet approval send the Draft to the Government Printer requesting to be published in the Government Extraordinary Gazette and forwarded the same to the parliament for approval. | 2020.01.28 | 1 week |
| | Process of the Parliament to approve the Motor Traffic (amendment) Act after one month from the publication in Extraordinary Gazettes. | 2019.03.10 | |

## 03. Timeline for the Amendments to the Regulations published under the Motor Traffic Act

| | | | |
|---|---|---|---|
| 01 | Identifying and drafting the initial drafts of regulations by relevant divisions of the D.M.T. | 2019.11.08 | 2 weeks |
| 02 | Obtaining required approvals from other institutions (Ex- Ministry of Finance) | 2019.12.05 | 1 month |
| 03 | Finalization the draft regulations with the relevant approvals and send the drafts to the Ministry of Transport & Civil Aviation. | 2019.12.26 | 3 weeks |
| 04 | The Secretary and the staff of the Ministry of Transport & Civil Aviation will review the proposed draft regulations and send the draft regulations to the legal Draftsman's Department with the recommendations of the ministry. | 2020.01.09 | 2 weeks |
| 05 | Legal Draftsmen's department will prepare the draft regulations and send the draft regulations to the Secretary of the Ministry of Transport and C.G.M.T for their observations. | 2020.02.06 | 1 month |
| 05 | C.G.M.T & Secretary will send their observation on the draft regulations to the legal Draftsman's Department. | 2020.02.20 | 1 week |
| 06 | Legal Draftsman's Department will finalize the draft regulations with observations and send the final draft regulations the secretary of the Ministry of Transport & Civil Aviation. | 2020.03.05 | 2 weeks |
| 07 | Hon. Minister of the Ministry of Transport & Civil Aviation will published the draft regulations in Extraordinary Gazette Notification after the relevant amendment to the Motor Traffic Act was approved by the Parliament. | 2020.03.10 | 5 days |

## The planned timelines for completing the e-Motoring building infrastructure

| # | Activity | Expected date of Completion |
|---|---|---|
| **(A) Design Tasks** | | |
| 1 | Recognizing the building design requirements as per e-Motoring new process workflows | Completed |
| 2 | Inviting proposals for the Design work | Completed |
| 3 | Technical Evaluation | Completed |
| 4 | Financial Evaluations | Completed |
| 5 | Selection of a Design Firm | 2019-09-27 |
| 6 | Interim Report/s of the Designs | 2019-10-21 |
| 7 | Design Completion | 2019-11-08 |
| **(B) Renovation Tasks** | | |
| 8 | Decision to handover the renovation work to CECB | 2019-10-19 |
| 9 | Start renovation as per the proposed Designs | 2019-11-01 |
| 10 | Renovation Completion | 2019-12-31 |
| **(C) Furnishing Tasks** | | |
| 11 | Prepare Procurement Documents | 2019-10-21 |
| 12 | Selection of a Supplier | 2019-11-29 |
| 13 | Supply, Delivery and Commissioning | 2020-01-15 |

2019/09/20

D. Thushara F. Suraweera
Commissioner
(Information & Communication Technology)
Department of Motor Traffic
Colombo 05.

**(ඇමුණුම 12)**

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

| දෙපාර්තමේන්තුගත තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | ඒකාබද්ධ සේවාවකට අන්තර්ග්‍රහණය කිරීමට නොහැකිවීම පිළිබඳ හේතු (නිරීක්ෂණ හා නිර්දේශ) |
|---|---|---|---|---|
| සහකාර කොමසාරිස් (කාර්මික) | 1 | 1 | - | මෝටර් වාහන පරීක්ෂක තනතුරේ උසස්වීමකි.බඳවා ගැනීම් පරිපාටියේ පිටපතක් අමුණා එවන අතර එහි පවරා ඇති රාජකාරි හා අනිකුත් විස්තර සියල්ල සඳහන් වේ.විධායක නිලධාර ගණයේ තනතුරකි. |
| නීති නිලධාරී | 1 | 1 | - | දෙපාර්තමේන්තුගත විධායක නිලධාර ගණයේ තනතුරකි. |
| ප්‍රධාන මෝටර් වාහන පරීක්ෂක | 16 | 2 | 14 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මෝටර් වාහන පරීක්ෂක තනතුරේ උසස්වීමකි.බඳවා ගැනීම් පරිපාටියේ පිටපතක් අමුණා එවන අතර එහි පවරා ඇති රාජකාරි හා අනිකුත් විස්තර සියල්ල සඳහන් වේ.මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරකි. |
| පරිගණක වැඩසටහන් සම්පාදක | 2 | 1 | * | බඳවා ගැනීම් පරිපාටියේ පිටපතක් අමුණා එවන අතර එහි පවරා ඇති රාජකාරි හා අනිකුත් විස්තර සියල්ල සඳහන් වේ.මෙම තනතුරු නිලධාරියාට පමණක් පෞද්ගලික වනසේ අනුමත කර ඇති අතර විශ්‍රාම යාම සමග අහෝසිවේ. ශ්‍රී.ලං.තො.තා.සේවයට අන්තර්ග්‍රහනය වී නොමැති නිලධාරීන් විශ්‍රාම යන තුරු දැනට දරණ තනතුරුවලම සේවයේ යෙදවීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011(iii)මගින් අවස්ථාව ලබා දී ඇත. |
| මෝටර් වාහන පරීක්ෂක | 114+25 | 99 | 40 | බඳවා ගැනීම් පරිපාටියේ පිටපතක් අමුණා එවන අතර එහි පවරා ඇති රාජකාරි හා අනිකුත් විස්තර සියල්ල සඳහන් වේ.බඳවා ගැනීම් සඳහා 2019.09.12 දින ගැසට් පත්‍රයේ බඳවා ගැනීම් නිවේදනයේ පළකර ඇත. |
| පරිගණක පද්ධති ක්‍රියාකරු | 2 | 1 | * | සේවා ව්‍යවස්ථාවේ පිටපතක් අමුණා එවන අතර එහි පවරා ඇති රාජකාරි හා අනිකුත් විස්තර සියල්ල සඳහන් වේ.මෙම තනතුරු නිලධාරියාට පමණක් පෞද්ගලික වනසේ අනුමත කර ඇති අතර විශ්‍රාම යාම සමග අහෝසිවේ. ශ්‍රී.ලං.තො.තා.සේවයට අන්තර්ග්‍රහනය වී නොමැති නිලධාරීන් විශ්‍රාම යන තුරු දැනට දරණ තනතුරුවලම සේවයේ යෙදවීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011(iii)මගින් අවස්ථාව ලබා දී ඇත. |
| පරි.ද.ස.ක්‍රියා./ තොර.තා.සන්.තා.සහකාර | 09 | 10 ( ඒකාබද්ධ සේවයේ 05+ දෙපාර්තමේන්තු සේවයේ 05) | - | සේවා ව්‍යවස්ථාවේ පිටපතක් අමුණා එවන අතර එහි පවරා ඇති රාජකාරි හා අනිකුත් විස්තර සියල්ල සඳහන් වේ. මෙම තනතුරු නිලධාරියාට පමණක් පෞද්ගලික වනසේ අනුමත කර ඇති අතර විශ්‍රාම යාම සමග අහෝසිවේ. ශ්‍රී.ලං.තො.තා.සේවයට අන්තර්ග්‍රහනය වී නොමැති නිලධාරීන් විශ්‍රාම යන තුරු දැනට දරණ තනතුරුවලම සේවයේ යෙදවීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011(iii)මගින් අවස්ථාව ලබා දී ඇත. |
| සංවර්ධන සහකාර | 123+200+03 =326 | 121+167 =288 | | රා.පරි.ච.10/2012 හා 2012.05.08 දිනැති චක්‍රලේඛයට අනුව ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන නිලධාරීන්ට ඔවුන් දැනට දරණ තනතුරේ තවදුරටත් සේවය කිරීමට අවස්ථාව දී ඇත.<br>දෙපාර්තමේන්තුගත තනතුරු දරණ නිලධාරීන් රා.පරි.ච.23/2018 හා 2018.08.20 දිනැති චක්‍රලේඛයට අනුව ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම් 7ක් මගින් නඩු ගොණුකර ඇති අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් උක්ත චක්‍රලේඛයේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමේ නියෝගයක් 2019.09.23 දින දක්වා නිකුත් කර ඇත. |
| දෙපාර්තමේන්තු ලිපිකරු | 72 | 72 | | |
| දෙපාර්තමේන්තු කම්කරු | 18 | 18 | | |
| පිළිගැනීමේ නිලධාරී | 01 | 01 | | |
| සනීපාරක්ෂක කම්කරු | 02 | 01 | | |

ඇමුණුම -01

<u>ආශ්‍රිත සේවා ගණයේ තනතුරු - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව</u>

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ ආශ්‍රිත සේවා ගණයේ තනතුරු පහත දැක්වෙන පරිදි අනුමතව පවතී.

| අනු අංකය | තනතුර | අදාළ වන සේවය | වැටුප් කේත අංකය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | MN 4 | 200 |
| 2. | විමර්ශන හා සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | MN 4 | 123 |
| 3. | නීති සහකාර | ආශ්‍රිත සේවා | MN 4 | 3 |
| | | | | 326 |

1. අංක 1745/11 සහ 2012.02.14 දිනැති රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද වැඩසටහන් නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථාව 2011.08.21 දින සිට ක්‍රියාත්මකය. රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මත 1994 සිට සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින (2011.08.01) දක්වා කාලය තුළ විවිධ තනතුරු නාම යටතේ රාජ්‍ය සේවයට බඳවාගත් සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ මත MN 4-2006 (ඒ) වැටුප් ක්‍රමය ලබා දී ඇති නිලධරයන් වැඩසටහන් නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 යටතේ විධිවිධාන සලසා ඇත. (ඇමුණුම i)

2. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2012(I), 10/2012(II) හා 10/2012(III) යටතේ වැඩසටහන් නිලධාරී සේවයට හා පසුව සංවර්ධන නිලධාරී ව්‍යවස්ථාව ක්‍රියාත්මක කළ පසු එම සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද කාලසීමාව දීර්ඝ කර ඇත. (ඇමුණුම ii,iii,iv)

3. නමුත්, එම චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එම වැඩසටහන් නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන නිලධාරීන්ට ඔවුන් දැනට දරන තනතුරේම තවදුරටත් සේවය කිරීමට ඉඩ සලසා ඇත.

4. ඒ අනුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වැනි ප්‍රතිලාභ සහිත ස්ථානවල සේවය කරන ඉහත ආශ්‍රිත සේවා ගණයේ නිලධාරීන් දක්වා ඇති පරිදි එවකට වැඩසටහන් නිලධාරී සේවයට හා පසුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකළහොත් එම ස්ථානයේම රැදී සිටීමට තවදුරටත් හැකියාව පවතී. එම තත්වය එවැනි ප්‍රතිලාභ සහිත ස්ථානවලට සුදුසු නොවන බව නිරීක්ෂණය කරමි. එමෙන්ම, එම තනතුරු සඳහා දෙපාර්තමේන්තුගත ලෙස තනතුරු ඇති කිරීම හෝ නව බඳවා ගැනීම් සිදුකිරීම සුදුසු නොවන බව වැඩිදුරටත් නිරීක්ෂණය කරමි.

5. ඉහත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012හි විධිවිධාන පරිදි එම චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගනිමින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකළ යුතුවේ. එමනිසා ඉහත දැක්වෙන පරිදි ප්‍රතිලාභ සහිත ස්ථානවල ආශ්‍රිත සේවා ගණයේ සිටින සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන නිලධාරීන් සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විමසා කටයුතු කිරීම සුදුසු බව නිරීක්ෂණය කරමි. තවද, එම තීරණය මත පදනම්ව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවද වැඩිදුරටත් නිරීක්ෂණය කරමි.

**(ඇමුණුම 13)**

මධ්‍යම පළාත් සභාව

4.3 සෞඛ්‍ය අමාත්‍යාංශය

(අ) හඟුරන්කෙත ගෝනගන්තැන්න ප්‍රාදේශීය රෝහලේ මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානය 2004 සිට 2017 දක්වා කාලය තුළදී අධියර 03 කින් ඉදිකර තිබුනු නමුත් 2019 අගෝස්තු වන විටත් භාවිතයට නොගෙන වල්වැදී තිබුණි. මෙසේ වර්ග අඩි 2000 ක පමන වන බිම් මහල 2003 වර්ෂයේ රු. ......................ක් වැයකර ඉදිකර 2004.02.15 දින විවෘත කර තිබුනු නමුත් සායන ආරම්භ කර නොතිබුණි. පසුව 2016 සහ 2017 වර්ෂ වලදී රු. 6,916,173 ක් වැයකර පළමු මහල ඉදිකර වහල සවිකොට වැඩ නිමකර තිබුණි.

පිළිතුර :

මෙම රෝහල නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත මැතිවරණ කොට්ඨාශයේ පිහිටා ඇති සී වර්ගයේ ප්‍රාදේශීය රෝහලකි. ගම් 05 ක් හා ජනගහනය 4878 දෙනෙකුගෙන් සමන්විත වූ පෝෂිත ප්‍රදේශයක මෙම රෝහල පිහිටා ඇත. බාහිර රෝගීන් 50000 ක් හා නේවාසික රෝගීන් 8000 ක් පමණ වාර්ෂිකව මෙම රෝහලේ ප්‍රතිකාර ලබන අතර මීට අමතරව විවිධ සායන මහින්ද ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය සේවය සපයයි. එබැවින් මෙම ප්‍රදේශයේ ජනතාවට ඉහළ සෞඛ්‍ය සේවාවක් ලබාදීමේ අරමුණින් 2004 වර්ෂයේ සංවර්ධන සැලැස්මට නව ගොඩනැගිල්ල සඳහා ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාත්මක කරන ලදී.

2004 වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා බිම් මහළ පමණක් ඉදිකරන ලදී. 2017 වර්ෂයේදී රු. මිලියන 4.8 ක් වැයකර දෙවන මහළද වැඩ නිමකරන ලදී. පැරණි ගොඩනැගිල්ලේ පවත්වා ගෙන යන රෝගී සත්කාර සේවාවන් (වාට්ටු) නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කර සේවා සැපයීම සඳහා තවදුරටත් රු. මිලියන 10 ක අමතර ප්‍රතිපාදන අවශ්‍ය වන බැවින් 2020 සංවර්ධන සැලැස්මට මෙම ව්‍යාපෘතිය ඇතුළත් කර රෝගී සත්කාර සේවාවන් සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් සපයා 2020 වර්ෂයේ ජනතා අයිතියට පවරා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

බී. එච්. එන්. ජයවික්‍රම
ලේකම්
...ශීය වෛද්‍ය, සමාජ සුභසාධන
...ාරක්ෂක සේවා අමාත්‍යාංශය
...ළාත් සභාව.

4.3 <u>සෞඛ්‍ය අමාත්‍යාංශය</u>

(ආ) හඟුරන්කෙත නගරයේ නව දෙමහල් ආයුර්වේද රෝහලක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේදී සැලසුම් සකස් කර රුපියල් ලක්ෂ 25 ක් පමණ වැයකර වර්ග අඩි 1500 පමණ වන බිම් මහළ පමණක් ඉදිකර කොන්ක්‍රීට් තට්ටුව දමා තිබුණ නමුත් ඉතිරි වැඩ නිම නොකර මේ දක්වා අභාවිතව තිබුණි.

<u>පිළිතුර :</u>

උක්ත ව්‍යාපෘතිය සඳහා 2002 වර්ෂයේ සැලසුම් කර ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2005 වර්ෂයේදී වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුව රු. මිලියන 2.5 ක් වෙන්කරන ලදී. ඇස්තමේන්තු මුදල රු. මිලියන 6 ක් වුවද, 2002-2004 වර්ෂ වලදී මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 3 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ අනුව රු. මිලියන 2.5 ක් වැයකර බිම් මහළේ වැඩ නිමකර ජනතා අයිතියට පවරා ඇත.

මෙම යෝජිත ආයුර්වේද රෝහල ඉදිරිපිට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව මඟින් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යනු ලබයි. මෙලෙස දෙපාර්තමේන්තු දෙකක් මඟින් එකම කාර්යයකට අදාළ ආයතන දෙකක් පාලනය වීම ප්‍රායෝගික නොවන නිසා 2011.06.22 දින අමාත්‍ය මණ්ඩල තීරණ අනුව යෝජිත ආයුර්වේද රෝහල සඳහා ඉදිකල ගොඩනැගිල්ල හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව වෙත පවරා දී ඇත.

හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව විසින් එම ගොඩනැගිල්ල මහජන සේවාවන් සඳහා යොදවා ගනු ලබන බවට මා වෙත වාර්තා කර ඇත.

මෙම ගොඩනැගිල්ලේ ඉතිරි සංවර්ධන කටයුතු ප්‍රාදේශීය සභාව මඟින් ඉටුකර ගැනීම සුදුසු බව තවදුරටත් යෝජනා කරමි.

බී. එච්. එන්. ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන
හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය
මධ්‍යම පළාත් සභාව.

**4.3 <u>සෞඛ්‍ය අමාත්‍යාංශය</u>**

**(ඇ)** මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බලපෑමට ලක්වන රජයේ ආයතනයක් ලෙස දැනුවත්ව තිබූ කෝන්ගහවෙල ප්‍රාදේශීය රෝහල 2016 වර්ෂයේදී රු. 2,738,410 ක් වැයකර හදිසි අනතුරු ඒකකයක් ඉදිකර තිබුණු නමුත් එම රෝහල මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතියට යටත් වූ බැවින් එම ඉදිකිරීම් සඳහා වැය වූ මුදල නිශ්ඵල වී තිබුණි.

<u>පිළිතුර :</u>

කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට යෝජිතව තිබූ මොරගහකන්ද ජලාශයට යටවන භූමියක මෙම රෝහල පිහිටා ඇත. මෙම ජලාශය ඉදිකරන කාල රාමුව නිශ්චිතව නොතිබුණු බැවින් 2010 වර්ෂයේදී දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ දිවයිනේ රෝහල් වල හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපිත කිරීමේ සැලැස්ම අනුව මෙම රෝහලටද හදිසි ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණද, මොරගහකන්ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවිනිශ්චිතතාවය මත මෙම හදිසි ප්‍රතිකාර ඒකකය වසරින් වසර ප්‍රමාද වීම නිසා මෙම ප්‍රදේශයේ ජීවත් වන පවුල් 2000 කට අයත් ජනතාවට ඉහළ සෞඛ්‍ය සේවාවක් ලබාගැනීමට තිබූ අවස්ථාව මග හැරුණි. මෙම තත්වය වළක්වා ගැනීම සඳහා ජලාශය ඉදිකිරීමේ නිශ්චිත කාල රාමුවක් නොතිබූ බැවින් මෙම ව්‍යාපෘතියට මුදල් වෙන්කර ඇති බව දන්වමි. වසර 03 ක පමණ කාලයක් මහජන සේවාවන් සඳහා මෙම රෝහල විවෘතව තිබුණි.

මොරගහකන්ද ජලාශයේ උපරිම ජල ධාරිතාවයකින් පිරවූ විට මෙම රෝහලේ පිවිසුම් මාර්ගය පමණක් යටවන නමුත් මෙම රෝහලේ පැරණි සහ නව ගොඩනැගිලි වලට කිසිදු හානියක් සිදු නොවේ. සුන්දර පරිසයක පිහිටා ඇති බැවින් මෙම ගොඩනැගිලි මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දී කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයක් හෝ සංචාරක නිවාඩු නිකේතනයක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි බව කාරුණිකව දන්වමි. මේ පිළිබඳව අදාළ ආයතන දැනුවත් කර ඇත.

බී. එම්. එන්. ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන
පෝෂණ හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය
මධ්‍යම පළාත් සභාව

**4.3 <u>සෞඛ්‍ය අමාත්‍යාංශය</u>**

(ඇ) පල්ලේපොල ප්‍රාදේශිය රෝහලේ 2004 වර්ෂයේදි රු.................. වැය කර ඉදි කල නව සායන ගොඩනැගිල්ල ගිලා බැසීමට ලක්ව තිබෙන බැවින් එම ගොඩනැගිල්ල විවෘත කිරිමට නොහැකිව පැවතුනි.

<u>පිළිතුර :</u>

මෙම ව්‍යාපෘතිය 1994 සංවර්ධන සැලැස්මට අනුව රු.මිලියන 1.4 ක් පමණ වැයකරන ලද ව්‍යාපෘතියක් වේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල කාල සීමාව තුල ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් නිර්දේශය ලබා ගැනිමේ අවශ්‍යතාවයක් නොතිබු බැවින් ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත ගොඩනැගිල්ල ඉදි කර ඇත.

එහෙත් පසු කාලීනව මෙම ගොඩනැගිල්ල ඉදි කල භූමියේ අභ්‍යන්තර පාෂාණ අස්ථාවරත්වයන් මතු විම හේතුවෙන් ගොඩනැගිල්ල වර්තමානය වන විට ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයේ පවතින බව කාරුණිකව දැනුම් දෙමි.

මෙම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් 2017 වර්ෂයේ ලබාගන්නා ලද වාර්තාවද මේ සමඟ ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.(ඇමුණුම - 01)

බී. එච්. එන්. ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන
පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය
මධ්‍යම පළාත් සභාව.

ඇමුණුම - 01 (4)

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
அனர்த்த முகாமைத்துவ அமைச்சு
Ministry of Disaster Management

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவனம்
NATIONAL BUILDING RESEARCH ORGANISATION

දුරකථන / தொலைபேசி / Telephone: 011-2588946, 011-2503431, 011-2500354
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 011-2505149
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2502611
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.nbro.gov.lk
ඊමේල් / மின்னஞ்சல் / E-mail: nbro@sltnet.lk

99/1, ජාවත්ත පාර, කොළඹ 5.
99/1, ஜாவத்தை வீதி, கொழும்பு 5.
99/1, Jawatta Road, Colombo 5.

මගේ අංකය / எனது இல. / Our Ref.: NBRO/LRRMD/SPI/ML/17/31/35963
ඔබේ අංකය / உமது இல. / Your Ref.: සිපිසි/එමඑච/03/01/05/08
දිනය / திகதி / Date: 2017.12.21

සමාජ සුබසාධන ... රජය ... 22 DEC 2017 ... මධ්‍යම පළාත් සභාව

ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන,
පරිවාස හා ළමා රක්ෂක සේවා අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

**මූලික භූ සමීක්ෂණ වාර්තාව** : මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් පල්ලෙපොල ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධව.

**හැඳින්වීම** : උක්ත කරුණ සම්බන්ධයේ ඔබ විසින් යොමු කරණ ලද අංක සිපිසි/එමඑච/03/01/05/08 දරණ 2017.11.28 දිනැති ලිපිය හා බැඳේ.

**GPS ඛණ්ඩාංක** : N 7⁰ 37' 35.7"
E 80⁰ 36' 07.4"

**නිරීක්ෂණ** :

- උතුරු බටහිර දිශාවට බෑවුම් වන ආනතිය අංශක 20 -25 පමණ වන ඒකාකාර බෑවුමක මධ්‍ය කොටසේ මෙම ප්‍රදේශය පිහිටා ඇත.ස්ථානීයව ජීර්ණය වූ පසකින් සමන්විත වන මතුපිට පාංශු ස්ථරයේ සංයුතිය සියුම් කැට සහිත මැටි මිශ්‍ර ලිහිල් වැලි පසක් වන අතර එය රතු දුඹුරු පැහැති වේ. බහුතරයක් වූ පාංශු ස්ථරයන් බොහෝ දුරට එක සමාන ස්වරූපයක් පෙන්නුම් කරයි. පාංශු ස්ථරයේ ඝනකම පාංශු වර්ගය සහ පාංශු ජල ප්‍රමාණය සමහර අවස්ථාවලදී ඍතුමය හා වාර්ෂික ඇළ මාර්ග වල වෙනස් වීම් අනුව වෙනස් වේ .
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 1:50000 පරිමාණයේ නායයෑම් අවදානම් කලාප සිතියමට අනුව මෙම ප්‍රදේශය අඩු අවදානම් කලාපයට අයත් වේ. එනමුත් මෙම ප්‍රදේශයේ භූ රූපණ පිහිටීමට අනුව දැඩි වර්ෂා කාලයකදී අක්‍රමවත් ඉඩම් පරිහරණ රටා හේතුවෙන් මෙම ප්‍රදේශයේ ඇතැම් ස්ථාන ආශ්‍රිතව අස්ථාවරතා ඇති විය හැක.
- පල්ලෙපොල ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය බිම් මහලකින් පමණක් සමන්විත වන අතර මෙහි බටහිර කොටසේ ගෙබිම හා බිත්ති මත ආනති පැළුම් නිරීක්ෂණය විය. මෙම පැලුම් 30mm පමණ වේ.
- මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති භූමිය ජලය රැඳෙන (WATER CLOGGING) භූමියකි .
- වැඩිමනක් ජලය මඟින් සිදුවිය හැකි පාංශු ඛාදනය සහ අස්ථාවර වීම් වළක්වා ගැනීම සඳහා ක්‍රමවත් කාණු පද්ධතියක් නොමැති බව නිරීක්ෂණය විය.

ඇමුණුම (01)

සත්‍ය පිටපතක් ඔබට යොමු කරමි.

මුදල් සහකාර
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන සහ
පරිවාස හා ළමා රක්ෂක සේවා අමාත්‍යාංශය

නිගමන : ක්ෂේත්‍ර පරීක්ෂණයේදී ලබා ගත් දත්ත හා නිරීක්ෂණයන්ට අනුව මෙම භූමිය ...තුමය වෙනස්වීම් මත භූගත ජල මට්ටම වෙනස්වන ප්‍රදේශයකි. පසේ ඉසුළුම් ...ක්‍යාව වෙනස්වීම හේතුවෙන් සහ සුදුසු අත්තිවාරම් ව්‍යූහයක් සැලසුම් නොකිරීමෙන් හෝ නියමිත ප්‍රමිතියට අනුව ඉදිකිරීම් නොකිරීම හේතුවෙන් හෝ මෙම අස්ථාවර වීම සිදු වී ඇත. තවද මෙම භූමිය මත නිසි ප්‍රමිතියට අනුව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ශක්‍යතාවය ඇත.

නිර්දේශ :

- මෙම භූමිය ආශ්‍රිතව නව ගොඩනැගිල්ලක් සැලසුම් කිරීමට ප්‍රථම විස්තරාත්මක භූ තාක්ෂණික අධ්‍යයනයක් සිදු කළ යුතුය. එහි ප්‍රතිඵල මත පදනම්ව ගොඩනැගිල්ලේ පාදම සැලසුම් කළ යුතුය.
- මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලයට (MOH) නිරිත දෙසින් පවතින පොල් වගා කර ඇති කොටසේ මධ්‍ය ප්‍රදේශය ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු සඳහා භූ විද්‍යාත්මක වශයෙන් පෙර යෝජිත භූමියට වඩා සුදුසු වන අතර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය පිරිවැය අවම කර ගත හැකිය.
- කුමන ස්ථානයක ගොඩනැගිල්ල ඉදි කළද ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර ගොඩනැගිලි සැලැස්ම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනුමැතිය ලබා ගත යුතු වේ.
- මෙම ප්‍රදේශයේ ඉඩම් පරිහරණ රටාවන් විධිමත් කළ යුතුය.
- මනාව කොන්ක්‍රීට් ආස්ථරණය කරන ලද ක්‍රමවත් කාණු පද්ධතියක් ඉදිකිරීම මගින් වැඩිමනක් ජලය මගින් සිදුවන පාංශු ඛාදනය වීම සහ අස්ථාවර වීම වළක්වා ගත යුතුය.

පරීක්ෂා කිරීම, දත්ත විශ්ලේෂණය සහ වාර්තාව සැකසීම.

අයි.ජී.ඩී.ඩී. ඉහළගෙදර (භූ විද්‍යාඥ)

B.C. Amunugama
Scientist / Geologist
Landslide Studies and Services Divisio
National Building Research Organizatior

.................................

බී.සී.අමුණුගම.
දිස්ත්‍රික් බලයලත් නිළධාරී/භූ විද්‍යාඥ,
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,
දිස්ත්‍රික් කාර්යාලය,
මාතලේ.

සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

මුද්‍රිත සහකාර
... ප්‍රකාශන සහ
පරිවාස හා ... සේවා අංශය

**(ඇමුණුම 14)**

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**DEPARTMENT OF COMPUTER SCIENCE & ENGINEERING**
**Faculty of Engineering**
**University of Moratuwa**
**Moratuwa, Sri Lanka**

*Tel: +94-11-2651198 Ext. 3101*
*DID: +94-11-2650475*
*Fax: +94-11-2650912*
*E-mail: shehan@cse.mrt.ac.lk*

**Amal Shehan Perera**, *Ph.D./M.Sc. (NDSU), B.Sc. in CS (Hons) (UoC)*

30[th] September 2019

Commissioner General
Dept. of Inland Revenue,
Ministry of Finance,
Colombo 03

Through – Vice-Chancellor, University of Moratuwa

for

Prof. P. K. S. Mahanama
Deputy Vice-Chancellor
University of Moratuwa
Sri Lanka

Dear Sir,

**Re: Requesting A Report on Current State of Operation of RAMIS at Dept. of Inland Revenue**

With reference to the letter MFI/02/17/IRD/42 dated 27.09.2019 requesting a status report about RAMIS operations at the Dept. of Inland Revenue (IRD), I would like to inform you the following.

**Background -**

The Dept. of Computer Science and Engineering (CSE), University of Moratuwa (UoM) has provided its expertise to review the RAMIS test scenarios during the period of September 2015 to June 2017 in which Phase I and Phase II of RAMIS modules were reviewed and recommendations were provided to IRD and the RAMIS vendor in order to improve the system before deploying for live operation. Both parties complied with the given recommendations to the best of the possibility, satisfying the functional and non-functional requirements and service parameters required before RAMIS live operations. The Dept. of CSE issued the final report for go-live indicating the RAMIS fitness for operation, subject to the maintenance and change requests implementation as in the standard practice.

During the financial years 2016 and 2017, major reforms were introduced to the tax policy, which resulted in significant changes to the already designed and developed modules of RAMIS. To comply with the new policy changes, RAMIS underwent major structural and architectural changes. However, RAMIS staff at IRD and the RAMIS Vendor managed to cope with this unprecedented change during the middle of the project. The expert team from the Dept. of CSE recognized and appreciates the extra effort every stakeholder had to put in towards making a more resilient RAMIS despite the changes.

Considering these modified requirements, RAMIS scope and the project schedules had to be modified and extended. The IRD informed the Dept. of CSE, UoM to provide continual expertise in reviewing the final phase of RAMIS development (Proposed RAMIS 2.0) incorporating required modifications. We have indicated our willingness to provide such expertise as we did previously. Once the Memorandum of Understanding (MoU) between the IRD and UoM is signed, we can officially provide the required third-party review for the modified RAMIS modules testing and UAT.

Since June 2017, RAMIS core team and the Dept. of CSE expert team had several discussions about building IRD competencies to face the 2020 handover of the RAMIS. The key areas looked in to were, infrastructure upgrade, human resources and capacity building, and organizational structural support

is the RAMIS becomes the core enterprise solution of IRD. As of now, a draft organizational structure proposal is in progress, and infrastructure assessment is ongoing (to replace depreciated infrastructure and required hardware, network, and resource upgrades).

With reference to the specific questions in the letter:

**1) The readiness of Dept. of Inland Revenue to implement the RAMIS 2020 handover?**

We have noted that RAMIS 2020 handover was initially planned at the time of project agreement between the IRD and RAMIS vendor. This deliverable point would have been realistic if the RAMIS development and maintenance schedules were followed without significant interference from requirement changes leading to rework and modifications to the RAMIS architecture. Therefore, considering the following factors:

a) The pending cycle of RAMIS 2.0 (modifications)
b) The warranty period of extended modules in RAMIS 2.0
c) Maintenance of RAMIS 2.0 codebase and operational integration
d) Adequate infrastructure upgrade, competency building for RAMIS 2.0, and training and development;

It is recommended to reconsider the timeline of RAMIS 2020 handover and prepare a more realistic new deadline for the system handover incorporating, *inter-alia*, the above a)-d) requirements. Until such time, a suitable extension of the agreements with maintenance can be suggested.

**2) The current state of RAMIS operations?**

RAMIS system started its operations in modular manner since December 2015. RAMIS Phase I and Phase II modules are in successful operation at least for over three years. Considering the relatively large scope and complexity of the RAMIS system, it is noted that the current RAMIS state is satisfactory (compared to legacy and manual operations IRD used to have). You may use specific RoI and growth figures of RAMIS operation at IRD to confirm this view. However, as with any large-scale information system, continual service monitoring and maintaining a fault-free system infrastructure is strongly recommended to meet the service level agreement of RAMIS and to offer a user-friendly and dependable service to IRD employees and to the general public. This can be examined along with the plans for RAMIS sustainability and handover.

RAMIS is one of the largest information systems that the Sri Lankan government invested in, and we have reasonable evidence and observations to consider it as one of the few systems in the government sector (of comparable scale and complexity), which are relatively successful.

I hope this brief report provides answers to your questions sufficiently. More detailed analysis is only possible with a comprehensive system audit, which requires time and expert resources. Considering the state of current RAMIS operations and the successful service provision it has been offering throughout, such detailed system audit is not warranted at this stage but maybe recommended before RAMIS handover after the RAMIS 2.0 phase completion in the future.

Thank You.
Yours truly,

Dr A.S. Perera,
Head/ Dept. of CSE,
The University of Moratuwa.

Dr. Amal Shehan Perera
Head/Dept. of Computer Sci.& Eng.
Faculty of Engineering
University of Moratuwa

**(ඇමුණුම 15)**

**ශ්‍රී ලංකා රේගුව**

(V) නියෝග අංක 6 (15)

රේගුවේ තොරතුරු ව්‍යාජ ලෙස වෙනස් කර වාහන 07 ක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ගිණුම් කාරක සභාවේදී අවධානය යොමු වූ කරුණු සම්බන්ධයෙන් CIB/MISC/05/2019 යටතේ විමර්ශනයක් ආරම්භ කර ඇති අතර මීට අමතරව D/INV/52 B /2007 මුල් විමර්ශන ලිපිගොනුව අනුව ද පහත කරුණු අනාවරණය වේ.

1. D/INV/52B /2007 විමර්ශන ලිපිගොනුව අනුව රේගු විමර්ශනයක් පවත්වා රේගු පරීක්ෂණයකදී වැසි අංක : FE63EE560790, SK22V204068, FE53EB565387, NPR72L7407358, KR42-0069509, SK22V204016 දරණ වාහන රේගු පරීක්ෂණයක් අවසානයේ රු.7,500,000 ක දණ්ඩනයකට යටත්ව නිදහස් කර ඇත.

2. එම රු.7,500,000 ක දණ්ඩනය ගෙවීමෙන් පසු මෙම වාහන 06 සාමාන්‍ය වාහන ලියාපදිංචිය සාමාන්‍ය වාහන ලියාපදිංචි ක්‍රමය යටතේ ඉහත 1 හි දැක්වෙන වැසි අංක සහිත වාහන ලියාපදිංචිය සඳහා විරෝධතාවයක් නොමැති බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට දන්වා ඇත.

3. ඉහත එක් එක් වාහනය සඳහා මෙවැනි එක් ලිපියක් බැගින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

4. මෙම වාහන ලියාපදිංචිය කිසිදු ඉලෙක්ට්‍රොනික ආකාරයකින් අදාල දඩ මුදල් ගෙවීමෙන් පසු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට දත්ත සම්ප්‍රේෂණයක් කිසිදු නිලධාරියෙක් සිදුකර නොමැත. ඒ අනුව ඉහත වාහන 06 සඳහා රේගු සටහන්කර ඉදිරිපත් කර තිබීම නිසා සාමාන්‍ය පැවති ක්‍රමය යටතේ ලියාපදිංචිය සිදුවී ඇත.

5. ඉහත වැසි අංක 06 සඳහා පිළිවෙලින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පහත ලෙස ලියාපදිංචිය සිදුවී ඇත. එම ලියාපදිංචිය පිළිබඳ වාර්තා ශ්‍රී ලංකා රේගුව විසින් ලබාගෙන ඇත.

| ලියාපදිංචි වාහන අංකය | වැසි අංකය | රේගු සටහන්කර අංකය | ආනයන ආයතනය |
|---|---|---|---|
| PE-8333 | KR42-0069509 | I 3099 of 07.02.2007 | සෙරන්ඩිබ් ට්‍රේඩර්ස්, 51, 2 වන මහල, පැරකුම්බා මාවත, කුරුණෑගල |
| LK-1456 | NPR72L7407358 | I 3095 of 07.02.2007 | - එම - |
| LH-4660 | FE53EB565387 | I 3096 of 07.02.2007 | - එම - |
| PE-1963 | SK22V-204068 | I 3101 of 07.02.2007 | - එම - |
| LH-4650 | FE63EE560790 | I 3100 of 07.02.2007 | - එම - |
| PB-5902 | SK22V-204016 | I3471 of 12.02.2007 | - එම - |

6. තවද, D/INV/52B /2007 ලිපිගොනුව පරීක්ෂාකිරීමේදී වෙනත් වාහන ලියාපදිංචිය සඳහා කිසිදු ලේඛණයක් මෙම ලිපිගොනුව අනුව ශ්‍රී ලංකා රේගුවෙන් නිකුත් කර නොමැත.
7. CIB/MISC/05/2019 යටතේ විමර්ශන ආරම්භ කිරීමෙන් පසුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පහත සඳහන් වාහන සඳහා ලේඛණ කැඳවන ලදි. එම වාහනවල චැසි අංකය, මාදිලිය හා ලියාපදිංචි අංකය පහත දැක්වේ.

| වාහන මාදිලිය | චැසි අංකය |
|---|---|
| ඩීසල් වෑන් | LH1721020273 |
| ඩීසල් වෑන් | LH1720023768 |
| ටොයෝටා ඩීසල් ප්‍රාඩෝ ජීප් | KD/J/1200041412 |
| ටොයෝටා ඩීසල් ප්‍රාඩෝ ජීප් | JTEBZ29J600174611 |
| ටොයෝටා ඩීසල් ප්‍රාඩෝ ජීප් | JTEBZ29j600083578 |
| ටොයෝටා ඩීසල් ප්‍රාඩෝ ජීප් | KDJ1200013009 |
| බෙන්ස් කාර් | WDB2100552A020496 |

8. ඉහත 7 හි සඳහන් වාහනවල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ "Customs details maintenance report" අනුව එහි D/INV/52B /2009 යන අංකය දැකිය හැක.
9. ඉහත 7 හි සඳහන් වාහන අතුරින් චැසි අංක JTE3Z29J 600083578 දරණ ටොයොටා ලෑන්ඩ් කෲෂර් ජීප්රථය සම්බන්ධයෙන් රේගු විමර්ශන ලිපිගොනු අංක :PREV/FPO/4003/2015 යටතේ විමර්ශනයක් පවත්වා රු.5,500,000 දණ්ඩනයකට යටත් කර ඇත.
10. ඉහත 7 හි සඳහන් වාහන අතුරින් චැසි අංක LH172-0023768 යන වාහනය සම්බන්ධයෙන් රේගු සටහන් කර අංක I 13823 20.06.2007 දිනැති සටහන්කරය මගින් රු.1,799,777 රේගු බදු සහ අනෙකුත් බදු ලෙස ගෙවා ඇත.
11. ඒ අනුව ඉහත 7 හි සඳහන් ව්‍යාජ ලේඛණ උපයෝගී කර ගෙන ලියාපදිංචි වී ඇතැයි කාරක සභාව මගින් දන්වා ඇති වාහන අතුරින් චැසි අංක JTEBZ29J 600083578 යන අංකය KL 4365 යන අංකය යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබියදී ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගෙන විමර්ශන කටයුතු අවසන් කර ඇත. තවද, LH172-0023768 දරණ රථය සඳහා නියමිත රේගු බදු ගෙවා ඇත.
12. ඉහත කරුණු අනුව ඉහත 7 හි වාහන අතුරින් ඉතිරි වාහන 5 සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දත්ත ලබාගෙන විමර්ශන කටයුතු සඳහා වර්තමාන අයිතිකරුවන් ලේඛණ සමඟ ශ්‍රී ලංකා රේගුවේ පෙනී සිටින ලෙස කැඳවා ඇත.
13. ඒ අනුව ඉහත 7 හි සඳහන් වාහන 7 සම්බන්ධයෙන් රේගු විමර්ශන ලිපිගොනු අංක CIB/MISC/05/2019 යටතේ සිදුකරනු ලබන විමර්ශනයේදී එම වාහන අතුරින් 6 ක් සඳහා ලියාපදිංචියට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් මෝටර් රථ දෙපාර්තමේන්තුවට ඉලෙක්ට්‍රොනිකව හෝ යම් ලේඛණ හෝ ලියාපදිංචිය සඳහා නිකුත් කර නැති බව ප්‍රකාශ කළ හැක.

(IV) නියෝග අංක 6 (15)

විගණන නියෝග අංක (06/15) 8 වන ඡේදය යටතේ දක්වා ඇති පරිදි එක් අංශයක් විසින් තහනමට ගන්නා ලද භාණ්ඩයක් තවත් අංශයක් මගින් නැවත තහනමට ගැනීම වළක්වා ගැනීම සඳහා දැනටමත් රේගු මධ්‍යම විමර්ශන අංශය විසින් විද්‍යුත් මධ්‍යම සිද්ධි ලේඛණයක් (Electronic Central Case Register) පවත්වාගෙන යනු ලබයි. දෙපාර්තමේන්තුවේ සියලු අංශ මගින් ආරම්භ කරනු ලබන විමර්ශණ මෙම ලේඛණයේ ලියාපදිංචි කළ යුතු අතර එකම ආනයනයකට සම්බන්ධ නඩු කටයුතු දෙකක් ලියාපදිංචි කිරීම වැලැක්වීම මෙවැනි විද්‍යුත් මධ්‍යම සිද්ධි ලේඛණයක් පවත්වා ගැනීමෙ එක් මූලික අරමුණකි. එසේ වුවත් යම් විශේෂ අවස්ථාවකදී එක් අංශයකින් තහනමට ගෙන නිදහස් කරන ලද යම් භාණ්ඩයක්, යම් වංචනික අරමුණකින් නිදහස් කර ඇත්නම් (Collusive) හෝ යම් වංචාවක ප්‍රතිඵලයක් ලෙස එසේ නිදහස් කර ඇත්නම් එවැනි භාණ්ඩයක් නැවත තහනමට ගැනීමට රේගු ආඥා පනතේ 47 වගන්ති ප්‍රකාර හැකියාවක් ඇත. මේ බව සීමාසහිත Toyota Lanka සමාගමට එරෙහිව S.A.C.S.W. ජයතිලක සහ තවත් අය (SC Appeal No.46/2008) හි මෙසේ විස්තර කර ඇත.

(47 "but if such goods shall not agree with particulars in the bill of entry the same shall be forfeited...." apply to a situation in which by means of a wrongful entry goods are conveyed by stealth to evade payment of Customs duties or dues or contrary to prohibitions or restrictions. In such a situation of a wrongful entry and evasion, since the consequence of forfeiture is by operation of law. Even if the officer had delivered the goods upon the submission of a CusDec, such goods may be seized at any subsequent stage in terms of Section 125.

**(ඇමුණුම 16)**

## උතුරු මැද පළාත් සභාව

**උතුරු මැද පළාත් සභාව (2019/09/24 වකුගඩු රෝග හා R.O. යන්ත්‍ර පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී කාරක සභාව ලබාදුන් නියෝග**

පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ ලේකම්ගේ අංක රා.ගි.කා.ස/8/3/2019 හා 2019 සැප්තැම්බර් 30 දිනැති ලේකම්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය, ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත් සභාව සහ ලේකම්, සෞඛ්‍ය අමාත්‍යංශය, උතුරු මැද පළාත ඇමතූ ලිපිය හා බැඳේ. ඊට අදාල තොරතුරු ලිපිගොනුව අනුව පහත පරිදි ඉදිරිපත් කරමි.

01. රේඛීය සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා - I)ගේ 2015 පෙබරවාරි මස වකුගඩු රෝග වැළැක්වීමේ වැඩසටහන යටතේ උතුරු මැද පළාත් රෝහල් 05 ක නව රුධිර කාන්දුකරණ ඒකක 05 ක් ස්ථාපිත කිරීමටත් ඊට අවශ්‍ය RO පද්ධති මිළදී ගැනීමටත් රු.මි. 78 ක් වෙන් කර දී තිබුණි. ( තඹුත්තේගම, මැදවච්චිය, කැබිතිගොල්ලෑව, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ)

02. එහිදී RO පද්ධති 05 ක් මිළදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු පළාත් සෞඛ්‍ය අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කල අතර ප්‍රසම්පාදන කටයුතු නිම වීමෙන් පසු පළාත් සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම්ගේ අංක NCP/HISP/A4/1/8 හා 2015/07/22 දිනැති ලිපිය මඟින් ප්‍රසම්පාදන තීරණය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලබා දෙන ලදී.

03. එම තීරණය අනුව RO පද්ධති මිළදී ගැනීම සඳහා කොළඹ 08, ඇල්විටිගල මාවත, ලිපිනයෙහි ඇනලිටිකල් පුද්ගලික සමාගම තෝරාගෙන තිබූ අතර AXEON RI-4140/USA මාදිලියේ RO පද්ධතියක් රු. 2,617,900.00 (වැට් බදු රහිත) කට මිළදී ගැනීමටත් වසරක නොමිලේ ලබා දෙන වගකීම් කාලය අවසානයේදී වර්ෂයකට රු. 280,000.00 (වැට් බදු රහිත) වටිනාකමට මෙම ආයතනය සමඟ ගිවිසුම් ගත වී නඩත්තු හා සේවා ඉටුකර ගැනීමටත් තීරණය කර තිබුණි

04. ඉන් පසු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඇනලිටිකල් ඉන්ස්ට්‍රමන්ට් පුද්ගලික සමාගම වෙත 2015/08/05 දිනැති ලිපියෙන් ගිවිසුම් ගත වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනයකින් වසර 01 ක කාලයකට වලංගු රු. 1,308,950 (ගිවිසුම් ගත මුදලින් 10%) ක වටිනාකමින් යුතු කාර්යය සාධන ඇප බැඳුම්කරයක් රැගෙන එන ලෙස දැනුම් දී තිබුනි.

05. ඒ අනුව එම ආයතනය විසින් ජාතික සංවර්ධන බැංකුවෙන් ( NDB බැංකුව) ලබා ගත් 2016/12/06 දක්වා වලංගු (මාස 16 කට වලංගු) රු. 1,308,950 ක් වටිනා කාර්යය සාධන ඇප බැඳුම්කරයක් ඉදිරිපත් කල අතර 2015/08/10 වන දින ගිවිසුම් ගත වන ලදී.

06. ඒ අනුව අදාල ආයතනය විසින් එම යන්ත්‍ර සති 08 ක් තුල සවිකල යුතුව තිබුණි. නමුත් එම ආයතනය 2015/11/02 දිනැති ලිපිය මඟින් RO පද්ධති සවි කිරීමට නියමිත ස්ථාන 05 හි පූර්ව අවශ්‍යතා කඩිනමින් සම්පූර්ණ කර දෙන මෙන් ඉල්ලා තිබූ අතර අදාල ස්ථාන තවමත් සූදානම් කර නොමැති බැවින් එම යන්ත්‍ර සැපයීමේ දිනය (Delivery date) දීර්ඝ කර දෙන ලෙස ඉල්ලා තිබුණි.

07. ඉන් පසු 2015/06/20 දිනැති ඇනලිටිකල් ආයතනයේ ලිපිය මඟින් පළමු RO පද්ධතිය මැදිරිගිරිය රෝහලේ සාර්ථකව ස්ථාපිත කොට කොමිෂනින් (Commissioning) කළ බවත් දන්වා තිබුණි. ඒ අනුව ඊට අදාලව රු. 2,905,869.00ක් 2016/12/30 වන දින ගෙවන ලදී.

08. නමුත් ඉතිරි රෝහල් අතරින් හිඟුරක්ගොඩ, මැදවච්චිය හා කැබිතිගොල්ලෑව යන රෝහල්වල RO පද්ධති 2016/05/28 දින වන විට සපයා සවිකොට ස්ථාපිත කර තිබුණු අතර (Commissioning) තඹුත්තේගම රෝහලේ විදුලි සැපයුම සම්බන්ධ ගැටළුව හේතුවෙන් RO පද්ධතිය සපයා සවිකර තිබුණද ස්ථාපිත කිරීමට (Commissioning) නොහැකි වී තිබුණි. ඉන් පසු සම්පූර්ණයෙන්ම ස්ථාපිත රෝහල් 03 හි RO යන්ත්‍ර සඳහා රු.9,031,755.00ක් 2018/07/31 වන දින ගෙවීම් සිදුකරන ලදී.

**වර්තමාන තත්ත්වය.**

09. මැදිරිගිරිය, හිඟුරක්ගොඩ සහ මැදවච්චිය රෝහල් වල ස්ථාපිත යන්ත්‍ර 03 මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඒ සඳහා වාර්ෂික සේවා ගිවිසුම්ද අත්සන් කොට පවත්වා ගෙන යනු ලැබේ.

10. වෛද්‍ය කාර්යය මණ්ඩලය නොමැති වීම මත කැබිතිගොල්ලෑව රෝහලේ රුධිර කාන්දුකරණ කටයුතු මෙතෙක් ආරම්භ කිරීමට නොහැකි වූ අතර ඉදිරියේදී එහි කටයුතු ආරම්භ කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කරමි.

11. තඹුත්තේගම රෝහලේ පවතින දුර්වල විදුලි පද්ධතිය නිවැරදි වී නොතිබීම මත එහි රුධිර කාන්දුකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. දැනට විදුලි පද්ධතිය අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතී.

12. තවද මෙම RO පද්ධති පවත්වාගෙන යාමේදී උත්ගතවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලය අප්‍රමාදිව ක්‍රියාත්මක වී නඩත්තු සේවා කටයුතු ඉටුකර දෙන බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත.

ආර්.එම්.එච්. ර...
ප්‍රධාන ගණකාධිකාරී
පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත.

**(ඇමුණුම 17)**

උතුරු මැද පළාත් සභාව

i. විධිමත් සාම්පල විශ්ලේෂණය කිරීමට පෙර විශ්ලේෂණ ක්‍රමයක් රසඥ වරු විසින් ගොඩනගා (Method development) validate කළ යුතුවේ. එසේ නැතහොත් පවතින සම්මත ක්‍රමයක් සොයාගෙන එය verify කලයුතුය එසේ නැතහොත් පවතින සම්මත ක්‍රමයක් modify කර validate කර ගත යුතුය ඒ සඳහා මාස ගණනාවක් වසරක් හෝ ඊට වඩා වැඩි කාලයක් ගතවීමට ඉඩ ඇත. එසේ නොමැතිව උපකරණය සැපයුම් කරුවන් විසින් විශ්ලේෂණ ක්‍රමවේදය සපයනු නොලබයි පුහුණුව ලබාදෙන්නේද උපකරණය යොදවාගන්නා ආකාරය පමණි (application training) එසේම එක් එක් සාම්පල වර්ගය සඳහා වෙනස් ක්‍රමවේද ගොඩ නැගිය යුතුවේ එවැනි ක්‍රමවේදයක් අත්හදා බලා වෙනත් රසායනාගාර හා සංසන්දනාත්මක අධ්‍යයනයක් කර(inter laboratory comparision) එම ක්‍රමවේදය රසායනාගාරයේ ස්ථාපිත කළ යුතුය. එසේ නොකර විශ්ලේෂණය වාර්ථා නිකුත් කිරීම නොකල යුතුවේ. මෙම වාර්ථාවේ සඳහන් ආකාරයට විශාල සාම්පල සංඛ්‍යවක් විශ්ලේෂණය කළ හැකි වන්නේ උක්ත සඳහන් කළ ක්‍රියාදාමය අවසන්වී රසඥ වරු මනා නිපුනත්‍රාවක් ලබා ගැනීමෙන් පසුව වේ. එසේම මෙම උපකරණයෙන් නිසි පරිදි හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා එක් රසඥවරයකු ඒ වෙනුවෙන්ම යෙදවිය යුතුය.

ඝන ආහාර විශ්ලේෂණය සඳහා Microwave digestion ක්‍රියාදාමය අනුගමනය කළ යුතුවේ. ඒ සඳහා පෙර සඳහන් කළ පරිදිම එක් එක් සාම්පල වර්ගයට විශේෂිත වූ ක්‍රමවේදයක් ගොඩනැගිය යුතුය ඒ සඳහාද දිගු කාලයක් ගතවේ.

එසේම රසඥ වරුන්ගේ මූලික රාජකාරිය ආහාර පණතට අදාලව ආයතනය වෙත ගෙන එනු ලබන අධිකරණ කටයුතු සඳහා යොමු කරන ආහාර සාම්පල විශ්ලේෂණය වන අතර, ආයතනයේ වර්තමානයේ සේවය කරනුයේ දැනට වසර 20 ට පෙර අවශ්‍යතාව මත ඇති කරන ලද රසඥ කාර්ය 4 ක් වන අතර වර්තමානයේ සේවයේ යෙදී සිටිනුයේ රසඥ වරු දෙදෙනෙක් පමණි. දිවයිනේ පලාත් 4 ට අදාල රාජකාරී ඔවුන් දෙදෙනා විසින් ආවරණය කරනු ලබයි. සීමාවකින් තොරව ආයතනය වෙත ආහාර සාම්පල රැගෙන ඒම නිසා එම විශ්ලේෂණය කටයුතු සඳහා මූලිකත්වය ලබාදීමට සිදුවේ. ආහාර විශ්ලේෂණය කටයුතු හා ICP MS යන්ත්‍රය මගින් බැර ලෝහ විශ්ලේෂණයන්ද සිදුකරමින් ආයතනයේ කටයුතු සැලකියයුතු කාර්යක්ෂමතාවයකින් වත්වාගෙන යාම සඳහා අවම වශයෙන් දැනට ආයතනයේ පවතින රසඥ පුරප්පාඩු 2 වක් සම්පූර්ණ කළ යුතු වේ.

ii. උපකරණයේ ආරක්ෂාව හා මනා ක්‍රියාකාරීත්වය සඳහා (optimum performance) විශ්ලේෂණය සිදුකරන අවස්ථාවේදි මෙන්ම විශ්ලේෂණය සිදු නොකරන අවස්ථාවේදීත් 22 $^{0}C$ පමණ කාමර උෂ්ණත්වයක උපකරණය තැබිය යුතුය. ඒ සඳහා විදුලි බලය සැපයීම අනිවාර්ය වේ. මේ අවස්ථාව

වන විට වෙනත් උපකරණ කිහිපයක් ආයතනය තුල ස්ථාපිත කළ බැවින් සමස්ථ විදුලි බලය පාරිභෝජනය ඉහල යාමට එයද හේතු වී ඇත.

iii. සැපයුම් කරුවන් විසින් උපකරණය ක්‍රියාකාරී තතත්වයට ගෙන ඒම සඳහා Argon gas සිලින්ඩර කිහිපයක් භාවිතා කරන ලදී. එසේම රසඥ වරු උපකරණය භාවිතය පුහුණු වීම සඳහාද fortified sample හා heavy metal standards භාවිතා කර method verification සඳහා උත්සාහ කිරීමට ද Argon gas වැයවී ඇත. සම්මත විශ්ලේෂණ ක්‍රම verification / validation ක්‍රියාවලි සිදු කර සොයා ගතයුතු බැවින් මූලික අත්හදා බැලීම් සඳහා Argon gas අධි ප්‍රමාණයක් භාවිතාවේ. නමුත් නිසි ක්‍රමවේදයක් ගොඩනගා ගත් පසු gas පාරිභෝජනය අඩු කර ගත හැකිවේ. කෙසේ උවද මෙම උපකරණය සාමාන්‍ය භාවියේදී වූවද දෛනිකව tune up කිරීම හා performance check කිරීම සිදු කරන බැවින්ද, ඒ සඳහා ගතවන කාලය නිෂ්චිතව සඳහන් කළ නොහැකි බැවින්ද, වැයවන Argon gas ප්‍රමාණය විශ්ලේෂණ කරන ලබන සාම්පල ප්‍රමාණය මත මුළුමනින්ම රඳා නොපවතී.

iv. මෙම උපකරණය රසායන විද්‍යාගාරයේ භාවිතා කරන උපකරණයක් වේ එහි විශ්ලේෂණ කටයුතු සඳහා ආහාර පණතින්ම බලය පවරා ඇත්තේ රසඥ වරු වෙත පමණි. MLT නිලධාරීන් සෘජුවම අනුයුක්ත කර ඇත්තේ ක්‍ෂුද්‍ර ජිව රසායනාගාරය වෙතයි. එසේම ඔවුන් වසර 1 ½ න් පමණ වෛද්‍ය රසායනාගාර වෙත ස්ථාන මාරුවීම් ලබා ගන්නා බැවින් මෙවැනි උපකරණ සඳහා පුහුණුවීම් ලබාදීම නිෂ්ප්‍රයෝජන වේ.

v. Method validation ක්‍රියාවලි සඳහා අවශ්‍ය විශ්ලේෂණ කටයුතු සති අන්ත රාජකාරි මගින් සිදු කටයුතු සිදු කෙරෙමින් පවති. නමුත් උපකරණයෙ හි vacuum pump හි සිදුවී ඇති යාන්ත්‍රික දෝෂයක් නිසා තාවකාලිකව උපකරණය පරිහරණය කිරීම නවතා ඇති අතර ඒ පිළිබඳව අදාල සැපයුම් කරු වෙත දන්වා යවා ඇත.

vi. සම්පූර්ණ Method validation ක්‍රියාවලියක් සිදුනොකර ලබා ගන්නා විශ්ලේෂණ ප්‍රතිඵල විද්‍යාත්මකව නිරවද්‍ය නොවන බැවින් එක් එක් සාම්පල වර්ග සඳහා Method validation සිදුකිරීම අනිවාර්ය කටයුත්තක් වේ. මෙය අඛණ්ඩව සිදුකිරීම සඳහා පූර්ණ කාලීනව රසඥ වරයකු යෙදවීමට නොහැකි වීම නිසා දිගු කාලයක් ගතවී ඇත.

vii ආයතනය වෙත නවක රසඥ වරු දෙදෙනකු බඳවා ගැනීම් සිදු කර ඇති අතර ඔවුන් දෙදෙන අප ආයතනය වෙතම අනුයුක්ත කිරීමට කටයුතු කිරීම මගින් ICP MS යන්ත්‍රය මගින් සිදුකරන විශ්ලේෂණ කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ රසඥ වරයකු පූර්ණ කාලීනව යෙදවීමට එමගින් හැකියාව ලැබේ.

viii දැනට ඉල්ලුම් කැර ඇති පරිදි අඛණ්ඩව Argon හා Helium වායු සැපයුම් පද්ධතිය හා බාදාවකින් තොරව අඛණ්ඩව විදුලිය ලබාගැනීම සඳහා විදුලි ජනකයද සැපයීම මගින් ICP- MS යන්ත්‍රය මගින් සිදුකරන විශ්ලේෂණ කටයුතු අඛණ්ඩව සිදු කළ හැකි වේ.

**(ඇමුණුම 18)**

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

Annexture 18

ඇමුණුම 1

Proposed Project Schedule

Metropolitan Advance Technologies

| ID | | Task Mode | Task Name | Start | Finish | % Complete |
|---|---|---|---|---|---|---|
| 1 | | | **Sri Lanka - E - Motoring Project of Department of Motor Traffic (July 2018)** | Thu 7/19/18 | Tue 3/10/20 | 18% |
| 2 | | | Phase - Contract Signature and Project Plan | Thu 7/19/18 | Tue 10/2/18 | 91% |
| 9 | | | Phase - Site Readiness | Mon 9/24/18 | Wed 12/4/19 | 2% |
| 31 | | | Phase - URS | Mon 7/30/18 | Fri 6/7/19 | 74% |
| 39 | ✓ | | Phase Data migration | Mon 8/13/18 | Tue 10/30/18 | 100% |
| 42 | | | Phase Hardware Design | Mon 10/29/18 | Fri 3/22/19 | 88% |
| 45 | | | Phase - Detail Design | Mon 12/3/18 | Thu 3/28/19 | 53% |
| 83 | | | Phase - Solution Build and Test | Fri 1/11/19 | Tue 12/24/19 | 5% |
| 84 | | | Software development | Fri 1/11/19 | Mon 8/12/19 | 6% |
| 108 | | | Phase - Documentation | Tue 7/30/19 | Tue 8/20/19 | 0% |
| 115 | | | Solution Conformance Testing with DMT | Wed 8/21/19 | Tue 12/24/19 | 0% |
| 135 | | | Phase - eMotor System Deployment | Fri 11/8/19 | Fri 1/24/20 | 0% |
| 144 | | | Phase - Procurement | Fri 8/16/19 | Thu 11/28/19 | 0% |
| 147 | | | Phase - Installation Phase | Thu 9/26/19 | Fri 12/20/19 | 0% |
| 161 | | | Phase - Training | Mon 1/27/20 | Mon 3/9/20 | 0% |
| 166 | | | Phase - User Acceptance Testing with DMT | Tue 12/17/19 | Wed 2/12/20 | 0% |
| 173 | | | Final Data Migration | Wed 1/29/20 | Fri 2/14/20 | 0% |
| 174 | | | Go Live | Tue 3/10/20 | Tue 3/10/20 | 0% |




Project: SriLankaMV_ProjectPlan
Date: Wed 8/21/19

Task · Split · Milestone · Summary · Project Summary · Inactive Task · Inactive Milestone · Inactive Summary · Manual Task · Duration-only · Manual Summary Rollup · Manual Summary · Start-only · Finish-only · External Tasks · External Milestone · Deadline · Progress · Manual Progress

(c) Metropolitan Advance Technologies — Page 1 — 17 August 2018

# සූචිය


| | පිටු අංකය |
|---|---|
| **අ** | |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 56,117 |
| අධ්‍යාපන අමාත්‍යාංශය- (කායික හා මානසික සමබරතාවයෙන් යුතු සිසු පරපුරක් බිහිකිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ ඉදිරිපත් කළ පරිගණක දෘශ්‍ය වැඩසටහන) | 69 |
| **උ** | |
| උතුරු මැද පළාත් සභාව | 150,162 |
| **ජ** | |
| ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | 132 |
| **ද** | |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 37,153 |
| දුම්රිය දෙපාර්තමේන්තුව | 110 |
| දිඹුලාගල ප්‍රාදේශීය සභාව | 114 |
| **බ** | |
| බස්නාහිර පළාත් සභාව | 128 |
| බස්නාහිර පළාත් සභාව (වත්තල මාබෝල නගර සභාවේ පර්චස් 79ක ඉඩම විකිණීම සම්බන්ධව විශේෂ කාරක සභා රැස්වීම) | 167 |
| **ම** | |
| මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 11 |
| මධ්‍යම පළාත් සභාව | 136 |
| මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 102 |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 13,134 149,164 |
| **ර** | |
| රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 122 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 20 |
| රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව- (පරිගණක දෘශ්‍ය වැඩසටහන) | 83 |
| **ව** | |
| වයඹ පළාත් සභාව | 77 |
| විදේශ කටයුතු අමාත්‍යාංශය | 22 |

**ශ**

| | |
|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 45 |
| ශ්‍රී ලංකා රේගුව | 25,157 |
| ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු අතර ක්‍රියාත්මක කිරීමට යෝජිත ස්වයංක්‍රීය පරිගණක සැසඳුම් පද්ධතියේ කටයුතු ප්‍රමාද වීම පිළිබඳ සොයා බැලීමේ සාකච්ඡාව | 65 |

**ස**

| | |
|---|---|
| සබරගමුව පළාත් සභාව | 93 |
| සුරාබදු දෙපාර්තමේන්තුව | 28 |
| සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 39 |

**විශේෂ විමර්ශන**


- ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාර්යසාධන විගණන වාර්තාව 16
- කිරි ගවයින් ආනයන ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව 50
- කොළඹ මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව විශේෂ විගණන වාර්තාව 53
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව පරීක්ෂාව 60,68,84
- සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව 61
- විලත්තියිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය සම්බන්ධයෙන් වන විශේෂ විගණන වාර්තාව 70
- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ විගණකාධිපති විශේෂ විගණන වාර්තාව 81
- සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය විසින් සිදු කරනු ලබන වෛද්‍ය සැපයීම්, සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණකාධිපති විශේෂ විගණන වාර්තාව 88
- ආබාධිත පුද්ගලයන් අධ්‍යාපන හා වෘත්තීය වශයෙන් සවිබල ගැන්වීම වෙනුවෙන් රාජ්‍ය ආයතනවල මැදිහත් වීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව 145